# ලොව ජය ගැනීමට
# සූදානම්



**ශ්‍රී ලංකා වරාය අධිකාරිය**

වාර්ෂික වාර්තාව 2017

# ලොව ජය ගැනීමට සූදානම්

වසර 40කට ආසන්න කාලයක් තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය කලාපීය වශයෙන් වැදගත් වෙළඳ හා වාණිජ කේන්ද්‍රස්ථානයක් බවට වර්ධනය වෙමින් ප්‍රගතියක් අත්පත් කර ගනිමින් සිටී. සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වෙළඳපොල කොටස සැලකිය යුතු ප්‍රමාණයකින් සීඝ්‍රයෙන් වර්ධනය කරගෙන ඇති බව දැනගැනීමෙන් වරාය අධිකාරිය උද්දාමයට පත්වේ.

කොළඹ වරායේ නැගෙනහිර බහළු පර්යන්තයෙහි වැඩ නිමවීමට ආසන්නව තිබියදීම ත්‍රිකුණාමලය, ගාල්ල හා කන්කසන්තුරය යන වරායන් ත්‍රිත්වයෙහි ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් නිම කිරීමට නියමිතව ඇති හෙයින් පසුගිය වසර කිහිපය තුළ විශාල ප්‍රගතියක් දක්නට ලැබේ.

නව ව්‍යාපාර අවස්ථාවන් රාශියක් සහ පරදූභාරකරුවන්ගේ හවුල්කාරීත්වය අප සමීපයටම ලබා දිය හැකි දේශීය හා ජාත්‍යන්තර වෙළඳාම උත්පාතය කිරීමේ අපේක්ෂාව පෙරදැරිව ගෝලීය සේවා සැපයුම් කේන්ද්‍රස්ථානයක් බවට පත්වීමේ දැක්ම ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ. නවෝත්පාදනය, කාර්යක්ෂමතාවය, කාර්මික හා තාක්ෂණික විශේෂඥතාවය මෙන්ම වඩාත්ම වැදගත් කොට සලකනු ලබන විශිෂ්ට සේවාවන් සැපයීම කෙරෙහි ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අවධානය නිරතුරුවම යොමු කර සිටින්නෙමු.

වසරින් වසර අප සංවර්ධන කටයුතු වඩා පුළුල්ව හා යහපත් ලෙස පවත්වාගෙන යාම අවශ්‍ය වේ. අපගේ වරායෙහි මනා පිහිටීම හා සම්පත් මෙන්ම ශක්තිය හා නිපුණතාවය අප සතුව පවතින බව විශ්වාස කරමු. ව්‍යාපාර විශිෂ්ටත්වය සඳහා අප සන්නද්ධව ඇති බවත් අනාගතයට මුහුණ දීමට හා ලොව ජය ගැනීමට සූදානම් බවත් අප දනිමු.

## පටුන


| | |
|---|---|
| අපේ දැක්ම සහ මෙහෙවර | 3 |
| අභිලාෂයන් | 4 |
| සාමූහික අරමුණු | 5 |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය යනු | 6 |
| මෙහෙයුම් වැදගත් තොරතුරු | 7 |
| මූල්‍ය වැදගත් තොරතුරු | 10 |
| අපේ අමාත්‍යවරු | 11 |
| සභාපතිතුමාගේ සමාලෝචනය | 12 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 16 |
| කළමනාකාරීත්වය සහ විගණන කමිටුව | 21 |
| ව්‍යාපාර සංවර්ධනය | 24 |
| වැදගත් සංධිස්ථාන | 26 |
| මෙහෙයුම් සමාලෝචනය | 31 |
| මූල්‍ය සමාලෝචනය | 80 |
| මානව ප්‍රාග්ධනය | 84 |
| සංස්ථාපිත සමාජ වගකීම් | 85 |
| ආයතනික පාලන වාර්තාව | 86 |
| වරාය සංඛ්‍යාලේඛන | 92 |
| මූල්‍ය ප්‍රකාශනයන් | 97 |
| අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව | 98 |
| මූල්‍ය කටයුතු වාර්තා කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම | 101 |
| විගණන කමිටු වාර්තාව | 102 |
| ව්‍යවස්ථාපිත අනුකූලතා ප්‍රකාශය | 103 |
| වැදගත් මෙහෙයුම් කරුණු | 104 |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 105 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 106 |
| ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශනය | 107 |
| මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය | 108 |
| පොදු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් | 109 |
| මූල්‍ය ප්‍රකාශනයට අදාළ සටහන් | 124 |
| ප්‍රස්ථාරික සමාලෝචනය | 147 |
| විගණකාධිපති වාර්තාව | 150 |
| සංස්ථාපිත තොරතුරු | 171 |

# දැක්ම

## "සේද මාවතේ විශිෂ්ඨතම සමුද්‍රීය සේවා සැපයුම්කරු බවට පත්වීම"

ශ්‍රී ලංකාවේ වරායයන්හි අනාගතය කෙරෙහි අවධානය යොමු කරමින්, අභියෝග මෙන්ම අවස්ථාවන් රාශියකට මඟ සලසන ජාත්‍යන්තර වෙළඳාමේ උත්පාතය අපේක්ෂා කරමින්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය එහි විශිෂ්ඨතම, බහළු කේන්ද්‍රස්ථානය බවට පත්වීමේ අදහසේ සිට ගෝලීය වශයෙන් සේවා සැපයුම්හි විශිෂ්ටතම කේන්ද්‍රස්ථානය දක්වා වර්ධනය වෙමින් සිටී. ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික තත්ත්වය සංවර්ධනය කිරීමෙහිලා, ජාතික හා අන්තර්ජාතික වශයෙන් යෝග්‍ය ක්‍රියාමාර්ග සෑම අංශයකින්ම පවත්වාගෙන යාම සඳහා, සියළු තොරතුරු ක්ෂණිකව ලබාගැනීමේ සේවා සැපයුම ක්‍රමවත් ප්‍රවාහයක් ලෙස ශක්තිමත් කිරීමටද ශ්‍රී ලංකා වරාය අධිකාරිය අපේක්ෂා කර සිටී.

# මෙහෙවර

## "තිරසර පරිසරයක් තුළ ජාත්‍යන්තර මට්ටමේ සමුද්‍රීය සේවාවන් සැපයීම"

ශ්‍රී ලංකාව තුල ගෝලීය සැපයුම් කේන්ද්‍රීය වරායක් නිර්මාණය කිරීමේ අදහසින්, විශිෂ්ට සමුද්‍රීය ප්‍රවේශයකින් යුත් ගැඹුරු මුහුදක් සහිත වරායක් ඉදි කරමින්, සේවා සැපයුම් ක්‍රියාවලි සමුදායක් ඒකාබද්ධ කරන බහුමානික සැපයුම් පද්ධතියක් නිර්මාණය කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය අපේක්ෂා කරයි.

වරාය සහ කලාපය යන අංශ දෙකෙහිම සංඛ්‍යාත්මක සීඝ්‍ර වර්ධනයක් අපේක්ෂා කරමින්, අනාගත ව්‍යාපෘතිය සඳහා, විභව්‍යතාව හා වපසරියක් සහිත, නාගරික සීමා මායිම් වලින් විනිර්මුක්ත නවීනතම වරායක් ලෙස වරාය, නාවික, කාර්මික හා සේවා සැපයුම් යන සියළු අංශයන්හි දැවැත්තයින් හට සේවා සැපයීම සඳහා අවශ්‍ය වේදිකාව නිර්මාණය කිරීමට හා කළමනාකරණය කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය සැලසුම් කරමින් සිටී.

ජාතියට මහඟු සම්පතක් වෙමින්, වරායයන්හි සහ පර්යන්තයන්හි පහසුකම් අතින් අංග සම්පූර්ණ, ආර්ථික වශයෙන් කාර්යක්ෂම හා මනා පරිසරයකින් යුතු වරායක් ලෙස මෙහෙයුම් සිදුකිරීම තුළින්, අප විසින් සේවය සලසන දහස් ගණනක් වූ පරදු භාරකරුවන් වෙත උසස් මට්ටමේ සේවාවක් ලබාදෙමින්, වරාය අධිකාරිය විසින් ප්‍රතිඥා දී ඇති ගුණාත්මකභාවය තවදුරටත් රැකගනිමින් ඉදිරියට ගෙන යනු ඇත.

## 2020 වනවිට . . . .

- විශිෂ්ට සමුද්‍රීය සේවා සැපයුම් මධ්‍යස්ථානයක් බවට පත්වීම.
- ටොන් මිලියන 200ක නැව් භාණ්ඩ මෙහෙයවීමේ ඉලක්කය සපුරා ගැනීම.
- ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් බිලියන එකක ආදායමක් ඉපැයීම.
- ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් බිලියන 10 ක ආයෝජනයන් අත්කර ගැනීම. (වරායන් අතර)
- ජාතික ආර්ථිකයේ ප්‍රධාන පෙළේ දායකයෙකු බවට පත්වීම.
- පරිසර හිතකාමී හරිත වරාය මෙහෙයුම්කරුවෙකු බවට පත්වීම.

## උපාය මාර්ග

- කොළඹ නගරයේ යටිතල පහසුකම් සහ සුපිරි ව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීම.
- සමුද්‍රීය විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානය ලෙස කොළඹ වරායේ ශ්‍රේණිගත කිරීම තහවුරු කිරීම.
- වරාය ක්ෂේත්‍රයට විශේෂිත වූ අළෙවිකරණ සහ ව්‍යාපාර සංවර්ධන වැඩසටහන් හඳුන්වා දීම.
- මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය ජාත්‍යන්තර සේවාවන් සපයන කාර්මික හා බහුළ මෙහෙයුම් වරායක් ලෙස  සංවර්ධනය කිරීම.
- නැව් භාණ්ඩවල සහ වරාය භාවිතා කරන්නන්ගේ  සුරක්ෂිතභාවය හා ආරක්ෂාව වැඩි කිරීම.
- උපායමාර්ගික මධ්‍යස්ථාන වලදී අපගේ ගෝලීය නියෝජනය සනිටුහන් කිරීම.
- ආයතනික පරිපාලනමය ක්‍රියාපටිපාටි ප්‍රතිව්‍යුහගත කිරීම හා ප්‍රති සැලසුම් කිරීම.
- උසස් මූල්‍ය කළමනාකරණ ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- පරිසරයට මුදාහැරෙන කාබන් ප්‍රමාණය අඩු කිරීම.
- ස්වකීය ශක්තියේ සහ තරඟකාරීත්වයේ වාසිදායක තත්ත්වයන් අනුව අනෙකුත් ප්‍රාදේශීය වරායන් සංවර්ධනය කිරීම.
- ව්‍යාපාර කටයුතු විවිධාංගීකරණය කිරීම.
- තෙල් සහ වායු සැපයුම්  සඳහා පහසුකම් සැලසීම.
- නෞකා ඉලක්ක කරගත් කාර්යක්ෂම සේවාවන් සැපයීම.
- සංස්ථාපිත සමාජ වගකීම්හි අවධානය වැඩි කිරීම.

- ශ්‍රී ලංකාවේ වාණිජ වරායයන් තුළ අති නවීන මෙහෙයුම් පහසුකම් සංවර්ධනය කිරීම හා අඛණ්ඩව පවත්වාගන යාම.

- ඵලදායී සහ කාර්යක්ෂම අයුරින් වරාය සේවාවන් පවත්වාගෙන යාම.

- පිරිවැය ඵලදායී, කාර්යක්ෂම සහ විශ්වාසදායි සේවාවන් සැලසීම තුළින් ආනයන සහ අපනයනකරුවන්ට තරඟකාරීමය වශයෙන් වඩා වාසිදායක තත්ත්වයක් උදාකර දීම.

- නැව්, නැව්බඩු, වරාය සේවාලාභීන් සහ වරාය යටිතල පහසුකම්වල ආරක්ෂාව හා සුරක්ෂිතභාවය සහතික කිරීම.

- සියළුම පාර්ශ්වකරුවන් සඳහා හිතකාමී කාර්යය හා සේවා පරිසරයක් සැලසීම.

- රජයේ ජංගම හා ප්‍රාග්ධන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලට දායකවීම.

- නෞකා මෙහෙයුම් වේගවත් කිරීම පිණිස ඵලදායි ප්‍රමිතීන් උසස් මට්ටමින් පවත්වාගන යාම.

- වැඩි රැකියා අවස්ථාවන් උත්පාදනය කරමින් සමුද්‍රීය කටයුතු හා සම්බන්ධ උපයෝගී සේවාවන් වැඩිදියුණු කිරීම.

- උසස් මට්ටමේ පාරිභෝගික සේවා සැලසීම මගින් කාර්යක්ෂම හා විශ්වාසවන්ත වරාය මෙහෙයුම්කරුවෙකු වශයෙන් වාණිජ වාරායයන් තුල ලාභ උපදවන මෙහෙයුම් පවත්වාගෙන යාම හා මනා කීර්තියක් ගොඩනැගීම.

- නැවෙන් නැවට අන්තරාල වෙළඳාම්, බැඳුම්කර කටයුතු හා නැව්වලට අවශ්‍ය වන ආම්පන්න සැපයීම ඇතුළු ප්‍රතිනැව්ගත කිරීමේ අවස්ථාවන් ආකර්ෂණය කිරීම පිණිස බහළු මෙහෙයුම් සම්බන්ධයෙන් තරඟකාරී හා උසස් මට්ටමේ සේවාවන් සැලසීම සඳහා වරාය ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම.

- සමුද්‍රාසන්න ප්‍රදේශයන්හී සංවර්ධනයේ ගාමක බලය ලෙස ක්‍රියාත්මක වීම පිණිස අවශ්‍ය කරන වරාය පහසුකම් සැලසීම තුළින් ශ්‍රී ලංකාව තුළ කලාපීය සංවර්ධනය උදෙසා දායකවීම.

- අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීම හා මිනිස් බල අවශ්‍යතාවයන් තක්සේරු කිරීම ඇතුළුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිපාලනමය හා සංවිධානමය කාර්යයන් පුළුල් කිරීම. විදේශ රැකියා මගින් රටෙහි ආර්ථිකයට සැළසෙන ප්‍රතිලාභ සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්ය මණ්ඩලය හට වැටුප් රහිත නිවාඩු මත විදේශ රැකියා සඳහා යොමුකිරීමේ පිළිවෙත නැවත වරක් ක්‍රියාත්මක කිරීම දිරිගැන්වීම හා මෙමගින් නිර්මාණය වන අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස මහපොළ අභ්‍යාස ආයතනය විසින් කාර්ය මණ්ඩලය තවදුරටත් පුහුණු කිරීම හා නැවත පුහුණු කිරීම.

- මුහුදේ දී සිදුකරනු ලබන සේවාවන්, නෞකා සඳහා තෙල් සැපයීමේ කටයුතු, මිරිදිය සැපයුම් හා බහළුම් අළුත්වැඩියා ආදිය වරාය විෂය ක්ෂේත්‍රයට අදාළ කටයුතු වලට ප්‍රභේද කිරීම.

- උපරිම බඳු කාර්යක්ෂමතාවයෙන් යුතු කළමනාකරණයක් පදනම් වූ මූල්‍ය ප්‍රතිසංස්කරණ වලදී වඩා හොඳ කාර්ය කළමනාකරණයක් හා දැඩි පිරිවැය පාලනයක් ක්‍රියාත්මක කිරීම.

1979 අංක 51 දරණ ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත මඟින් 1979 අගෝස්තු 01 වන දින ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිහිටුවන ලද අතර 1984 අංක 7 සහ 35 දරණ පනත් මඟින් සංශෝධනය කරන ලදී.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතේ 6 (1) වගන්තියෙන් එහි අරමුණු සහ කාර්යයන් පහත සඳහන් පරිදි නිර්වචනය කර ඇත.

- නැව් භාණ්ඩ වාහක, නැව්ගත කිරීම් සහ ප්‍රතිනැව්ගත කිරීම්, ගොඩබෑම් හා ගුදම්ගත කිරීම්, වාප්පු කටයුතු, නෞකා වලට ජලය, ඉන්ධන සහ විදුලිය සැපයීම, නෞකා වලට හා නෞකා වලින් ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදන සහ ලිහිසි තෙල් මෙහෙයුම් කිරීම බන්කර් සහ ඉන්ධන ගබඩා අතර කාර්යයන්, නියමු කටයුතු සහ නෞකා බැඳතැබීමේ කටයුතු, කිමිදුම් සහ නෞකා දිය යටදී අළුත්වැඩියා කිරීම හා එවැනි වෙනත් අනුශාංගික වූ ඕනෑම කාර්යයක් සඳහා කාර්යක්ෂම හා විධිමත් සේවා සැපයීම.
- සැසඳුම් හා ආරක්ෂක සේවා කාර්යක්ෂමව හා නිත්‍ය ලෙස සැපයීම.
- වරාය සීමාව තුළ හා වරාය ප්‍රවේශ මාර්ගයන්හි නැව් ගමනාගමනය විධිමත් කිරීම හා පාලනය කිරීම.
- වරාය ගොඩනැගිලි නඩත්තු කිරීම හා ඒවාහි භාවිතය ප්‍රවර්ධනය කිරීම, වරායයන් වැඩිදියුණු කිරීම හා සංවර්ධනය කිරීම.
- කිසියම් නියමිත වරායක් තුළ රේගු දෙපාර්තමේන්තුවට අදාල කාර්යයන් හැර අනෙකුත් සියළුම කටයුතු සම්බන්ධීකරණය කිරීම හා නියාමනය කිරීම.
- ඒ ඒ වරායන් තුළට හා ඉන් පිටතට යාත්‍රාකිරීම සඳහා නෞකාවලට මඟ පෙන්වීම හා ආරක්ෂාව සැපයීම සඳහා අවශ්‍ය ප්‍රදීපාගාර හා වෙනත් මාධ්‍යයන් ශ්‍රී ලංකා වෙරළෙහි හා ඉන් ඔබ්බෙහි ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම.
- වරාය අධිකාරිය පනත මඟින් පනවනු ලබන වෙනත් ඒහා සමාන කාර්යයන් ඉටුකිරීම.
- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වත්කම් ප්‍රතිසම්පාදනය කිරීමටත්, නව ආයෝජන වල යෙදවීමටත්, අධිකාරියේ වියදමට නොඅඩු ආදායමක් ලැබෙන පරිදි වරාය අධිකාරිය පනතේ විධිවිධාන වලට අනුකූලව අධිකාරිය විසින් සපයනු ලබන සේවාවන් වෙනුවෙන් සුදුසු පරිදි ගාස්තු අයකර ඒවා අධිකාරියේ ආදායමට බැර කර ප්‍රමාණවත් පොදු මූල්‍ය සංචිතයක් ඇති කර පවත්වාගෙන යාමට හැකිවන ආකාරයෙන් වරාය අධිකාරියේ කටයුතු පවත්වාගෙන යාම සහ;
- වරාය අධිකාරිය පනතෙහි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, සියළු විශේෂිත වරායන් බාහිර අධාර අපේක්ෂාවෙන් තොරව, ඒ ඒ වරාය විසින්ම ස්වකීය ව්‍යවසාය ලෙස පවත්වාගෙන යාමර ප්‍රයන්ත දැරීම.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතෙහි 5 (1) වගන්තිය ප්‍රකාරව, වරාය අධිකාරියෙහි අධ්‍යක්ෂ මණ්ඩලය, ගරු අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන අධ්‍යක්ෂවරුන් 09 දෙනෙකුගෙන් සමන්විත වේ.

සභාපතිවරයා ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි ප්‍රධාන විධායක නිලධාරියා වන අතර එහි සමස්ත පරිපාලනය ඔහු භාරයේ පවතී.

**නෞකා පැමිණීම (සියළුම වරායයන්)**

| විස්තරය | 2016 | 2017 | වෙනස (%) |
|---|---|---|---|
| කොළඹ වරාය | 4,405 | 4,329 | -1.7 |
| ත්‍රිකුණාමලය වරාය | 216 | 233 | 7.9 |
| ගාල්ල වරාය | 96 | 87 | -9.4 |
| කන්කසන්තුරය පේදුරුතුඩුව,මයිලිඩ්ඩි, හාකරෙයිනගර් | 25 | 63 | 152.0 |
| මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය | 281 | 230 | -18.1 |
| **එකතුව** | **5,023** | **4,942** | **-1.6** |

**කොළඹ වරායේ බහළු මෙහෙයුම් ධාරිතාවය ( විස්සේ සම ඒකක)**

| විස්තරය | 2016 | 2017 | වෙනස (%) |
|---|---|---|---|
| ශ්‍රී ලංකා වරාය අධිකාරි (SLPA) | | | |
| ආනයන | 255,557 | 208,948 | -18.2 |
| අපනයන | 227,552 | 179,334 | -21.2 |
| ප්‍රතිනැව්ගත කිරීම | 1,607,792 | 1,609,114 | 0.1 |
| තැන් මාරු මෙහෙයුම් | 9,216 | 13,306 | 44.4 |
| **එකතුව** | **2,100,117** | **2,010,702** | **-4.3** |
| දකුණු ආසියා ද්වාර පර්යන්තය (SAGT) | | | |
| ආනයන | 152,194 | 179,321 | 17.8 |
| අපනයන | 165,513 | 196,623 | 18.8 |
| ප්‍රතිනැව්ගත කිරීම | 1,294,631 | 1,406,265 | 8.6 |
| තැන් මාරු මෙහෙයුම් | 19,869 | 27,626 | 39.0 |
| **එකතුව** | **1,632,207** | **1,809,835** | **19.3** |
| කොළඹ ජාත්‍යන්තර බහළු පර්යන්ත (CICT) | | | |
| ආනයන | 244,217 | 300,903 | 23.2 |
| අපනයන | 254,817 | 318,422 | 25.0 |
| ප්‍රතිනැව්ගත කිරීම | 1,452,838 | 1,726,203 | 18.8 |
| තැන් මාරු මෙහෙයුම් | 50,727 | 43,003 | -15.2 |
| එකතුව | **2,002,599** | **2,388,531** | **19.3** |
| කොළඹ වරාය | | | |
| ආනයන | 651,968 | 689,172 | 5.7 |
| අපනයන | 647,882 | 694,379 | 7.2 |
| ප්‍රතිනැව්ගත කිරීම | 4,355,261 | 4,741,582 | 8.9 |
| තැන් මාරු මෙහෙයුම් | 79,812 | 83,935 | 5.2 |
| **එකතුව** | **5,734,923** | **6,209,068** | **8.3** |

නැව් බඩු මෙහෙයුම් ධාරිතාවය (සියළුම වරායයන්)

| විස්තරය | 2016 | 2017 | වෙනස (%) |
|---|---|---|---|
| සමස්ත නැව් බඩු මෙහෙයුම් ධාරිතාවය (මෙ. ටො. මි.) | 86.5 | 93.9 | 8.6 |

කොළඹ වරායේ නැව් බඩු ගොඩබෑම - ශ්‍රී.ල.ව.අ. (ටොන් දහසේ ප්‍රමාණයෙන්)

| විස්තරය | 2016 | 2017 | වෙනස (%) |
|---|---|---|---|
| බහළුගත | 14,516 | 14,167 | -2.4 |
| තොග කඩන | 863 | 814 | -5.7 |
| වියළි තොග | 2,572 | 2,501 | -2.8 |
| දියර තොග | 4,654 | 5,759 | 23.7 |
| **එකතුව** | **22,605** | **23,241** | **2.8** |

කොළඹ වරායේ නැව් බඩු පැටවුම් - ශ්‍රී.ල.ව.අ. (ටොන් දහසේ ප්‍රමාණයෙන්)

| විස්තරය | 2016 | 2017 | වෙනස (%) |
|---|---|---|---|
| බහළුගත | 12,459 | 11,625 | -6.7 |
| තොග කඩන | 16 | 29 | 81.3 |
| වියළි තොග | 0 | 0 | - |
| දියර තොග | 92 | 106 | 15.2 |
| **එකතුව** | **12,567** | **11,760** | **-6.4** |

කොළඹ වරායෙන් මෙහෙය වූ සමස්ත නැව් බඩු ප්‍රමාණය - ශ්‍රී.ල.ව.අ (ටොන් දහසේ ප්‍රමාණයෙන්)

| විස්තරය | 2016 | 2017 | වෙනස (%) |
|---|---|---|---|
| බහළුගත | 26,975 | 25,792 | -4.4 |
| තොග කඩන | 879 | 843 | -4.1 |
| වියළි තොග | 2,572 | 2,501 | -2.8 |
| දියර තොග | 4,746 | 5,865 | 23.6 |
| **එකතුව** | **35,172** | **35,001** | **-0.5** |

ත්‍රිකුණාමලය වරායෙන් මෙහෙය වූ නැව් බඩු ප්‍රමාණය - ( ටොන් දහසේ ප්‍රමාණයෙන්)

| විස්තරය | 2016 | 2017 | වෙනස (%) |
|---|---|---|---|
| ගොඩබෑම් | 2,825 | 3,119 | 10.4 |
| පැටවීම් | 689 | 778 | 12.9 |
| **එකතුව** | **3,514** | **3,897** | **10.9** |

**ගාල්ල වරාය මගින් මෙහෙය වූ නැව් බඩු ප්‍රමාණය - ( ටොන් දහසේ ප්‍රමාණයෙන්)**

| විස්තරය | 2016 | 2017 | වෙනස (%) |
|---|---|---|---|
| ගොඩබෑම් | 771 | 712 | -7.7 |
| පැටවීම් | 0 | 0 | 0 |
| **එකතුව** | **771** | **712** | **-7.7** |

**කන්කසන්තුරය,මයිලිඩ්ඩි,පේදුරුතුඩුව හා කරෙයිනගර් වරායයන් මගින් මෙහෙය වූ නැව් බඩු ප්‍රමාණය - (ටොන් දහසේ ප්‍රමාණයෙන්)**

| විස්තරය | 2016 | 2017 | වෙනස (%) |
|---|---|---|---|
| ගොඩබෑම් | 27 | 23 | -14.8 |
| පැටවීම් | 0 | 0 | 0 |
| **එකතුව** | **27** | **23** | **-14.8** |

**මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය මගින් මෙහෙය වූ නැව් බඩු ප්‍රමාණය - ( ටොන් දහසේ ප්‍රමාණයෙන්)**

| විස්තරය | 2016 | 2017 | වෙනස (%) |
|---|---|---|---|
| ගොඩබෑම් | 220 | 156 | -29.1 |
| පැටවීම් | 135 | 57 | -57.8 |
| **එකතුව** | **355** | **213** | **-40.0** |

**සමස්ත සේවක සංඛ්‍යාව**

| විස්තරය | 2016 | 2017 | වෙනස (%) |
|---|---|---|---|
| කොළඹ වරාය | 8,892 | 8,625 | -3.0 |
| ත්‍රිකුණාමලය වරාය | 402 | 401 | -0.2 |
| ගාල්ල වරාය | 348 | 351 | 0.9 |
| **එකතුව** | **9,642** | **9,377** | **-2.7** |

**සියළුම වරායයන්**

(රු.මිලියන)

| විස්තරය | 2017 | 2016 | වෙනස (%) |
|---|---|---|---|
| **ආදායම සහ වියදම** | | | |
| සමස්ත ආදායම | 45,609 | 44,080 | 3.5 |
| විදේශ ණය මත පොලී සහ විදේශ විනිමය (ලැබීම්/(පාඩු)) වලට පෙර සමස්ත වියදම | (28,099) | (28,704) | 2.1 |
| විදේශ ණය මත පොලී සහ විදේශ විනිමය (ලැබීම්/(පාඩු)) වලට පෙර ලාභ/ (පාඩු) | **17,510** | **15,376** | **13.9** |
| විදේශ ණය මත පොලීය | (2,082) | (4,302) | 51.6 |
| විදේශ විනිමය (ලැබීම්/(පාඩු)) | (2,206) | (10,038) | 78.0 |
| **බදු වලට පෙර සහ විදේශ විනිමය ලැබීම්/(පාඩු) වලට පසු ලාභ/ (පාඩු)** | **13,222** | **1,036** | **1,176.6** |
| **බදු** | | | |
| ආදායම් බදු | - | - | - |
| උපකල්පිත ලාභාංශ බදු | - | - | - |
| විලම්භිත බදු | 102.0 | - | 100 |
| සමාජ වගකීම් බදු | - | - | - |
| **බදු සඳහා ප්‍රතිපාදන සැලසීමෙන් පසු ශුද්ධ ලාභ/(පාඩු)** | **13,324** | **1,036** | **1,186.5** |
| **ශේෂ පත්‍රය** | | | |
| ජංගම නොවන වත්කම් | 388,452 | 314,052 | 23.7 |
| ජංගම වත්කම් | 144,978 | 35,762 | 305.4 |
| ජංගම වගකීම් | 119,212 | 28,069 | (324.7) |
| ස්කන්ධ සහ වෙනත් ප්‍රාග්ධන | 7,591 | 7,591 | 0.0 |
| සංචිත හා ප්‍රතිපාදන | 302,655 | 70,428 | 329.7 |
| ජංගම නොවන වගකීම් | 103,972 | 243,726 | 57.3 |
| **අනුපාත** | | | |
| ආදායමට මෙහෙයුම් මගින් ලාභ | 36.2 | 32.5 | |
| වාර්ෂික ආදායම් වර්ධනය | 3.5 | 8.0 | |
| ප්‍රාග්ධන යෙදවුම් මත ලාභය | 5.1 | 18.4 | |

## මහින්ද සමරසිංහ

ගරු වරාය හා නාවික අමාත්‍ය

## නිශාන්ත මුතුහෙට්ටිගම

ගරු වරාය හා නාවික නියෝජ්‍ය අමාත්‍ය

වරාය මෙහෙයුම් හා මූල්‍ය ආදායම සම්බන්ධයෙන් පමණක් නොව ජාත්‍යන්තර නාවික ක්ෂේත්‍රය තුළද සැලකිය යුතු ජයග්‍රහණ රාශියක් අත්කර ගෙන සිටින ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට හැකිවීම පිළිබඳව මා අතිශයින් සතුටට පත්වෙමි.

වරායේ සාපේක්ෂ වැදගත්කම ඉහළ නැංවීමේ අපගේ දැක්ම වර්ෂය තුළදී පල දරා ඇත. දකුණු ආසියානු කලාපයේ විශිෂ්ඨතම සබඳතාවයෙන් යුත් වරාය යන නාමය උසුලන කොළඹ වරාය, 2017 වර්ෂය තුළදී සිදු කල "ඩෲරි මැරිටයිම් රිසර්ච්" පර්යේෂණයේදී කොළඹ වරාය ගෝලීය බහළු සම්බන්ධිත දර්ශකයේ 18 වන ස්ථානයේ සිට 13 වන ස්ථානය දක්වා ඉදිරියට පැමිණීමට සමත් වී ඇත.

2016 වර්ෂය හා සැසඳීමේ දී 2017 වර්ෂයේ දී කොළඹ වරාය බහළු විස්සේ සම ඒකක මිලියන 6.2 ක් මෙහෙයවමින් හා බහළු මෙහෙයුම් සම්බන්ධයෙන් 8.3% ක වර්ධන වේගයක් වාර්තා කරමින් ජාත්‍යන්තර බහළු මෙහෙයුම් ශ්‍රේණිගත කිරීමේ 23 වන ස්ථානයෙහි පසුවේ. ආසියානු කලාපයේ ප්‍රධාන පෙළේ කේන්ද්‍රීය වරායක් ලෙස හැඳින්වෙන ක්ලෑන් වරාය පවා 9% ක ඍණාත්මක ප්‍රතිශතයක් වාර්තා කරද්දී, ලොව පුරා පිහිටි බහළු මෙහෙයවන ඉහළ පෙළේ වරායන් 30 අතුරින් කොළඹ වරාය 5 වන ඉහළම වර්ධනයක් වාර්තා කල වරාය බවට පත්වී තිබීම සුවිශේෂී වූ කරුණක් බව සඳහන් කල යුතුය.

වර්ෂය තුළ ලබාගත් මෙම ජයග්‍රහණය එළඹෙන වසර 03 ඇතුළත කොළඹ වරාය ලෝකයේ බහළු මෙහෙයවන ඉහළම මට්ටමේ වරාය 20 අතර ශ්‍රේණිගත කිරීමට හැකි මට්ටමකට දියුණු කිරීමේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දැක්ම යථාර්ථයක් බවට පත්වීමේ සුබ ලකුණක් බව සඳහන් කල හැක.

## වරාය මෙහෙයුම් හා කළමනාකරණය

සමාලෝචිත වර්ෂය තුළදී මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් සුවිශේෂී වූ ව්‍යාප්තියක් හා වර්ධනයක් ඇතිවූ අතර සියළුම වරායයන්හි වසර තුළ මෙහෙයුම් කරන ලද මුළු ටොන් ප්‍රමාණය 8.5% කින් වැඩිවූ අතර කොළඹ සහ ත්‍රිකුණාමලය වරායයන් හි මෙහෙයුම් ධාරිතාවය පිළිවෙලින් 8.7% කින් හා 10.9% කින් වර්ධනය විය.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආදායමට 40% කින් දායක වෙමින් ජය බහළු පර්යන්තය හා සමගි බහළු පර්යන්තය සුවිශේෂී සේවයක් ඉටු කරන ලදී. මෙහෙයුම් ධාරිතාවය සම්බන්ධයෙන් කළම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් (CICT) සමාගම විසින් විස්සේ සම ඒකක මිලියන 2.3 ක් මෙහෙයවන ලද අතර, සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) සමාගම සමස්ත මෙහෙයුම් වර්ධනයට නියමිත රාජ්‍ය භාගය ලබාදෙමින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආදායමට සුවිශේෂී වූ දායකත්වයක් ලබා දෙන ලදී.

කොළඹ වරායේ මෙහෙයවන ලද දේශීය හා ප්‍රතිඅපනයන නැව්බඩු මෙහෙයුම් ප්‍රමාණයන් පිළිවෙලින් 6.4% කින් හා 8.9% කින් වැඩි විය. 2016 වර්ෂයේ සිට ජය බහළු පර්යන්තයේ දොඹකර යාත්‍රා හා නැංගුරම් ඵලදායීතාවයේද වැඩිවීමක් දක්නට ඇත.

අළෙවි හා ව්‍යාපාර සංවර්ධන ක්‍රමෝපායන්හි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට 2017 වර්ෂයේදී නැව් සේවා සමාගම් සමඟ නව පර්යන්ත සේවා ගිවිසුම් (TSAs) හතරකට එළඹීමට හැකිවිය. එමඟින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ පවතින ජය බහළු පර්යන්තයට ප්‍රධාන නැව් සේවා සමාගම් හතරක් හා පෝෂක සේවා සමාගම් 03 ක් ආකර්ෂණය කර ගැනීමට හැකි විය.

2016 වර්ෂය හා සසඳා බැලීමේදී 2017 වර්ෂය තුළ හම්බන්තොට වරායට පැමිණි මුළු නෞකා සංඛ්‍යාවේ -18.1% ක පසුබෑමක් සිදුවූ අතර නැව් බඩු මෙහෙයුම් ටොන් ප්‍රමාණයේද -39.9% ක අඩුවීමක් වාර්තා විය. 2016 වර්ෂය හා සසඳා බැලීමේදී රෝ රෝ මෙහෙයුම් වල -40.9% ක හා ප්‍රතිඅපනයන මෙහෙයුම් වල -56.0% ක පසුබෑමක් වාර්තා කලද 2017 වර්ෂයේ දේශීය නැව් බඩු

මෙහෙයුම් ප්‍රමාණය 30.7% කින් වැඩි විය. 2017 වර්ෂයේදී ගාලු වරායේ නෞකා පැමිණීම -9.4% ක හා නැව්බඩු මෙහෙයුම් -7.8% ක ඍණ වර්ධනයක් වාර්තා විය.

2016 වර්ෂය හා සසඳා බැලීමේදී 2017 වර්ෂයේදී ත්‍රිකුණාමල වරායේ නෞකා පැමිණීම හා නැව්බඩු මෙහෙයුම් ටොන් ප්‍රමාණය පිළිවෙලින් 10.4% කින් හා 7.9% කින් ඉහළ යාමක් වාර්තා කරන ලද බව දැනගැනීමට ලැබීම දිරිගන්වන සුළු කරුණකි. අෂ්රෆ් ජැටියෙහි ව්‍යාපාර ධාරිතාවයේ ඉහළ යාම හේතුකොට ගෙන වසර ගණනාවක් පුරා පාඩු විඳි ත්‍රිකුණාමල වරාය දෙවන වරටත් 2017 වර්ෂයේදී ලාභ උපයන ලදී.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා චයිනා මර්චන්ට් පෝට් හෝල්ඩිංස් සමාගම අතර අත්සන් කරන ලද හම්බන්තොට වරාය සහන ගිවිසුම ක්‍රියාත්මක වීමත් සමඟම, වාර්ෂිකව රුපියල් බිලියන 09 ක ණය වාරික ගෙවීමෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට නිදහස් වීමට හැකිවූ අතර, එමඟින් මහා පරිමාණයේ සංවර්ධන ව්‍යාපෘති භාර ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට හැකි විය. රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වයක් යටතේ හම්බන්තොට වරායේ මෙහෙයුම් කටයුතු සඳහා දිගුකාලීන කළමනාකරණ ක්‍රම වේදයක් වශයෙන් නව වරාය කළමනාකරණ ව්‍යුහයක් නිර්මාණය කරන ලදී.

## මූල්‍ය ක්‍රියාකාරීත්වය

2016 වර්ෂයේ සුවිශේෂී ජයග්‍රණයක් වන රුපියල් බිලියන 01 ක ලාභය හා සසඳා බැලීමේදී 2017 වර්ෂයේ විදේශ විනිම උච්චාවචනයෙන් හා බදු ගෙවීමෙන් පසුව රුපියල් බිලියන 13.2 ක ලාභයක් වාර්තා කිරීමට ආයතනය සමත් වී ඇත. 2017 වර්ෂයේ දී ශ්‍රී ලංකා වරාය අධිකාරිය රුපියල් බිලියන 45.6 ක ආදායමක් උපයා ඇත. මෙය 2016 වර්ෂය හා සසඳා බැලීමේදී 3.5% ක වැඩිවීමකි. 2017.07.25 දිනැති කැබිනට් තීරණය පරිදි හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා ලබාගන්නා ලද ණය මුදලේ වාරික ගෙවීම (ප්‍රාග්ධනය හා පොළිය) මහා භාණ්ඩාගාරය විසින් භාර ගෙන ඇත. එබැවින්, ශ්‍රී ලංකා වරාය අධිකාරියට සතුටුදායක මූල්‍ය ප්‍රතිලාභයක් හිමිවන අතර සුවිශාල වාර්ෂික විදේශ විනිමය බරකින් නිදහස් වීමට හැකිවී ඇත.

ත්‍රිකුණාමල වරාය හා ගාලු වරාය 2017 වර්ෂයේදී ලාභ උපයා ඇත. විශිෂ්ඨ සේවා හා ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් සලසමින් ලාභදායීතාවය හා පාරිභෝගික පදනම ඉහළ නැංවීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාරීත්වය අවශ්‍ය පියවර ගෙන ඇත.

## මානව සම්පත් සංවර්ධනය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පුහුණු මානව සම්පත වරායේ මෙහෙයුම් කටයුතු වල සාර්ථකත්වයට පදනම් වී ඇති ප්‍රධානතම අංගයක් බව සඳහන් කල යුතුව ඇත. වරාය කාර්යය මණ්ඩලය පුහුණු කිරීම හා ඔවුන්ගේ කුසලතා ඉහළ නැංවීම තුළින් විශේෂ සේවා සැපයුමක් කරා වරාය මෙහෙයවීම සඳහා සුවිශේෂී ආයෝජනයක් කර ඇත. මෙහිදී, හඳුන්වාදෙන ලද මානව සම්පත් තොරතුරු පද්ධතිය ආයතනයේ අරමුණු ඉටු කරගැනීම සඳහා උපරිම මට්ටමින් ක්‍රියාත්මකවෙමින් පවතී.

තවද, සමුද්‍රීය අංශයේ සිසුන්ගේ ක්ෂේත්‍රය පිළිබඳ දැනුම පුළුල් කරගැනීම සඳහා අවස්ථාව සැලසීම මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය විසින් නොකඩවා සිදු කරමින් සිටී. වසර ගණනාවක් පසුවී තිබුණද දිවංගත අමාත්‍ය ගරු ලලිත් ඇතුලත් මුදලි මැතිතුමා විසින් වරායේ සංවර්ධනය උදෙසා ඉටු කරන ලද සේවය අද දවසේද අනුස්මරණය කර අගය කිරීමට ලක් කල යුතුය.

තවදුරටත් ඉදිරියට යමින්, සියළුම වරාය සේවකයින්හට වඩා හොඳ පහසුකම් සැලසීම පිණිස නවීන තාක්ෂණය උපයෝගී කෙරෙනු ඇති අතර එමගින් සේවක පැමිණීම, නිවාඩු ගැනීම, පුහුණුවීම් කටයුතු කිරීම, ලේඛන කටයුතු වල නියැලීම ආදී කාර්යයන් සඳහා විද්‍යුත් තාක්ෂණය (e-technology) යොදා ගැනීම මානව සම්පත උසස් මට්ටමකට ගෙන ඒමේදී විශාල වටිනාකමක් හිමිවනු ඇත.

ආයතනික අරමුණු ඉටුකර ගැනීම හා ඵලදායීතාවය වැඩි දියුණු කිරීම සඳහා සේවකයින් පෙළඹවීමේ මූලික අරමුණ ඇතිව වසර තුළදී මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය මගින් සේවකයින් සඳහා වැඩ සටහන් රාශියක් පවත්වන ලදී.

## වැඩි දියුණු කිරීම් සඳහා උපාය මාර්ග

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහාත්, වරාය භාවිතා කරන්නන්හට උසස් මට්ටමේ සේවාවන් සැපයීම සඳහාත් නවෝත්පාදන ක්‍රියාකාරී සැලසුම් ගනණාවක් ආරම්භ කර ඇත. පවතින පර්යන්ත කළමනාකරණ පද්ධතිය නවීනතම තාක්ෂණය සමඟ ඒකාබද්ධ කොට ඉහළ මට්ටමකට ගෙන ඒම ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ආරම්භ කර ඇති අතර එය ප්‍රධානතම තොරතුරු තාක්ෂණික සමාරම්භකයන් අතුරින් එකක් වේ. තොරතුරු පද්ධති ඉහළ මට්ටමකට ගෙන ඒම තුළින් ගෙවීම් කටයුතු ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් සිදු කිරීමේ (EDI) පහසුකම් පුළුල් කිරීම, B2C සහ B2B ගණුදෙනු, පරිගණක මාර්ගයෙන් බිල්පත් සැකසීමේ කටයුතු, පරිගණක මාර්ගයෙන් ලේඛන හුවමාරු කිරීම ආදිය ශ්‍රී ලංකා වරාය අධිකාරිය මඟින් ඉටු කිරීමට හැකි වන අතර සියළුම වරාය භාවිතා කරන්නන්හට ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සපයනු ලබන සියළුම සේවාවන් ඉතා සුවිශේෂී ලෙස වර්ධනය කරමින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ එහි පරදු භාරකරුවන් අතර මනා සබඳතාවයක් ඇති කිරීමට කටයුතු කරනු ලබයි.

ORACLE මූල්‍ය හා ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතියෙහි මාර්ගගත ව්‍යාපාර පද්ධතිය වැඩි දියුණු කිරීම හා යාවත්කාලීන කිරීම 2016 වර්ෂයේ ආරම්භ කරන ලද තවත් එක් වැදගත් ව්‍යාපෘතියකි. මෙම ක්‍රමය මඟින් මූල්‍ය කටයුතු සඳහා ශුන්‍යපාද අයවැය ක්‍රමය හඳුන්වා දෙන ලදී. මෙම ශුන්‍ය පාද අය වැය ක්‍රමය මේ වන විට ගාල්ල වරායට සහ ත්‍රිකුණාමලය වරායට ද මේ වන විට හඳුන්වාදෙනු ලැබ ඇත.

ගණුදෙනුකරුවන් වැඩි වශයෙන් ආකර්ෂණය කරගැනීම සඳහා වැඩි දියුණු කරන ලද ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නිල වෙබ් අඩවිය ප්‍රශස්ත මට්ටමින් කාර්යක්ෂමව ක්‍රියාත්මක වෙමින් පවතී. විවිධ වැදගත් පද්ධති සඳහා ජංගම යෙදවුම හඳුන්වා දී ඇත.

වරාය මෙහෙයුම් කටයුතු වල ආරක්ෂාව තහවුරු කරනු පිණිස දියුණු ආරක්ෂක පද්ධතියක් සියළුම වරායයන් වෙත හඳුන්වා දීමට සැලසුම් කර ඇති අතර, වරාය තුළට වාහන ඇතුළුවීම හා වරායෙන් පිටවීම වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා RFID තාක්ෂණය භාවිතයට ගෙන දැනට පවතින ආරක්ෂක හා බලපත්‍ර නිකුත් කිරීමේ පද්ධතියද වැඩි දියුණු කිරීමට කටයුතු කරනු ලැබේ.

සියළුම ගුදම් ස්වයංක්‍රිය කිරීම පිණිස නවීන ගුදම් කළමනාකරණ පද්ධතියක් හඳුන්වාදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් සකස් කෙරෙමින් පවතී. මෙමඟින් ගණුදෙනුකරුවන්හට බොහෝ කටයුතු විද්‍යුත් ක්‍රමටය සිදුකර ගැනීමට හැකිවනු ඇත.

## අනාගත සංවර්ධන කාර්යයන්

වර්ධන ගම්‍යතාවය තහවුරු කරනු වස් සියළුම වරායයන් සංවර්ධනය කිරීම හා ඒවා තිරසාර ලාභ උපයන මධ්‍යස්ථාන බවට පරිවර්තනය කිරීමේ අරමුණ ඇතිව තුන් අවුරුදු කෙටිකාලීන සංවර්ධන සැලැස්මක් දියත් කර ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය මඟින් කොළඹ වරාය ඇතුළත ක්‍රියාත්මක කරන කඩිනම් වැඩ පිළිවෙලක් යටතේ සුපිරි ව්‍යුහ හා යටිතල ව්‍යුහ (Superstructure and infrastructure) සංවර්ධනය කිරීමට පියවර ගෙන ඇත.

කොළඹ වරාය භාවිතා කරන්නන්හට වඩා හොඳ සේවයක් සපයනු පිණිස පෙර ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩ සටහන් බොහෝමයක් වේගවත් කරන ලදී.

- ♦ නැගෙනහිර බහළු පර්යන්තය (ECT) ඉදිකිරීම, ජය බහළු පර්යන්තයේ V පියවර දීර්ඝ කිරීම, ජය බහළු පර්යන්තයේ උපකරණ වැඩි දියුණු කිරීම, විවිධ රාජ්‍ය සඳහා නැවබඩු

රැස්කිරීම හා අර්ධ පූර්ණ බහළු සඳහා නව සේවා සැපයුම් මධ්‍යස්ථාන පිහිටුවීමේ කටයුතු සිදු වෙමින් පවතී.

- ♦ සාම්ප්‍රදායික නැව්බඩු මෙහෙයුම් කිරීම සඳහා සමගි බහළු පර්යන්තය, විජය කුමාර පාලම, නියමු පාලම හා බණ්ඩාරනායක පාලම වැඩි දියුණු කිරීමෙ කටයුතු සිදු වෙමින් පවතී.

- ♦ කෲස් පර්යන්තය(Cruise Terminal) සංවර්ධන කිරීම, බහු මාදිලි අන්තර් භූවමාරු මධ්‍යස්ථානයක් පිහිටුවීම සහ නාවික හා සමුද්‍රීය මධ්‍යස්ථාන ගොඩනැගිල්ලක් ඉදිකිරීමද සිදු වෙමින් පවතී.

ගාලු වරාය, ත්‍රිකුණාමල වරාය, ඔලුවිල් වරාය සහ කන්කසන්තුර වරාය යන සෙසු වරායයන්ද තවදුරටත් සංවර්ධනය කිරීමට නියමිතව ඇත. මෙම සංවර්ධන හා වැඩි දියුණු කිරීමේ කටයුතු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සීඝ්‍ර වර්ධනයට දායක වන අතර එහි සෙසු තරඟකාරී වරායන් අතර සංවර්ධනයටද හේතු වනු ඇත. මෙම ජයග්‍රහණයන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ඉටු කරනු ලබන මෙහෙය ඇගයීමට ලක් කිරීමට වැදගත් වනවා පමණක් නොව ශ්‍රී ලංකාවේ වරාය වල සංවර්ධනයේ නියමුවා, අයිතිකරු, නියාමනකරු හා ශ්‍රී ලංකාවේ සියළුම වරාය වල මෙහෙයුම්කරු යන වඩා පුළුල්වූ සන්දර්භයකින් වැදගත් කොට සැලකිය හැක.

**සමාප්තිය**

ගෝලීය සමුද්‍රීය අංශයේ තරඟකාරීත්වයට මුහුණ දීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය කාලෝචිත පියවර රාශියක් ගෙන ඇති අතර, එමඟින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධීක්ෂණය යටතේ නිරන්තර පහසුකම් සලසමින් ලාභදායීතාවය හා නිර්මාණාත්මක පදනම ඉහළ මට්ටමක පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.

ධනාත්මක වර්ධන සංඥාවන්ගෙන් දිරිමත්ව ශ්‍රී ලංකා වරාය අධිකාරියට ඉදිරි වසර වලදී සිය කාර්යසාධනය සහ සේවා සැපයීම් ඉහළ මට්ටමක පවත්වාගෙන යාමට හැකි වන බව සඳහන් කිරීමට කැමැත්තෙමි.

ගරු වරාය හා නාවික අමාත්‍යතුමා, ගරු වරාය හා නාවික නියෝජ්‍ය අමාත්‍යතුමා, අමාත්‍යාංශ ලේකම්තුමා, කළමනාකාරීත්වය, අධ්‍යක්ෂ මණ්ඩලය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) සහ කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් (CICT) යන ආයතන වල මාණ්ඩලික නිලධාරීන් හා සේවක මහත්ම මහත්මීන් විසින් මෙන්ම දේශීය ආනයන හා අපනයන සහ ජාත්‍යන්තර සමුද්‍රීය කර්මාන්තයේ සියළුම පරදු භාරකරුවන් විසින් අර්ථාන්විතව සහ සාමූහිකව අප වෙත ලබාදුන් සහාය සහ මඟ පෙන්වීම පිළිබඳව මාගේ කෘතඥතාවය පළකිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා අතරම, කලාපීය සමුද්‍රීය ව්‍යාපාර තුළ දිදුලන අනාගතයක් කරා ලංකාවේ වෙළඳ වරාය ක්ෂේත්‍රය යොමු කිරීම සඳහා අප කෙරෙහි විශ්වාසය තබා අප හා අත්වැල් බැඳගැනීම පිළිබඳව මාගේ කෘතඥතාවය පලකිරීමටද මම මෙය අවස්ථාවක් කර ගනිමි.

**ආචාර්ය පරාක්‍රම දිසානායක**
**සභාපති**

## ආචාර්ය පරාක්‍රම දිසානායක මහතා
**සභාපති**

නාවික ආර්ථික විශේෂඥයකු වන ආචාර්ය පරාක්‍රම දිසානායක මහතා 2017 ජූනි 01 වෙනි දින සිට ක්‍රියාත්මක ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබීය.

2002 වර්ෂයේ ජනවාරි මාසයේ සිට 2004 දක්වා කාල සීමාව තුළ ඔහු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපතිත්වය දැරීය. එංගලන්තයේ Dun & Bradstreet සමාගම විසින් ලැයිස්තුගත කරන ලද රාජ්‍ය ආයතන සහ පෞද්ගලික සමාගම් අතුරින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය ශ්‍රී ලංකාවේ වඩාත්ම ලාභදායී ආයතනය ලෙස ශ්‍රේණිගත කරන ලද්දේ සිය නිල කාලය තුළදීය.

1911 වර්ෂයේදී ආරම්භ කර 1913 වර්ෂයේදී රාජකීය සන්නස් පත්‍රය පිරිනමනු ලැබූ එක්සත් රාජධානියේ වරලත් නැව් තැරව්කරුවන්ගේ ආයතනයේ, බ්‍රිතාන්‍ය ජාතිකයකු නොවන එකම අන්තර්ජාතික සභාපතිවරයා ලෙස මෑතකදී ඔහු පත් කරනු ලැබීය.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපතිවරයා ලෙස පත්වීමට පෙර ඔහු "එයිට්කන් ස්පෙන්ස් මැරිටයිම්, පෝට්ස් ඇන්ඩ් ලොජිස්ටික්ස්" (Aitken Spence Maritime, Ports and Logistics) සමාගම් සභාපති/ ප්‍රධාන විධායක නිලධාරි ලෙස හා එයිට්කන් ස්පෙන්ස් පීඑල්සී සමාගම් හි (Aitken Spence PLC) ප්‍රධාන අධ්‍යක්‍ෂක මණ්ඩල සාමාජිකයෙකු ලෙසද කටයුතු කර ඇත. වරාය කළමනාකරණය සඳහා විදේශීය සබඳතා ඇති කළ පළමු ශ්‍රී ලාංකීක සමාගම ලෙස හා විදේශීය වරායන් සමඟ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වයන් ඇති කර ගත් පළමු ශ්‍රී ලාංකීය සමාගම ලෙසද Aitken Spence Ports International සමාගමට සිය නායකත්වය ලබා දෙන ලදී.

ආචාර්ය දිසානායක මහතා ක්‍ෂේත්‍රයට අදාළව දරා ඇති ප්‍රධාන තනතුරු අතර, සේවා සැපයුම් හා ප්‍රවාහන කටයුතු පිළිබඳ වූ වරලත් ආයතනයේ (ශ්‍රී ලංකා) සභාපතිත්වය, නැව් තැරව්කරුවන්ගේ වරලත් ආයතනයේ (ශ්‍රී ලංකා) සභාපතිත්වය, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ උපදේශක සභාවේ සභාපතිත්වය, වරාය, ගුවන් හා සේවා පහසුකම් පිළිබඳ ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයෙහි සභාපතිත්වය යන මේවා ද ඇතුලත් වේ.

සාමාන්‍ය කළමනාකරණය (General Management) සහ අළෙවි කළමනාකරණය (Marketing Management) පිළිබඳව ඔහු සතු විවිධ අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව, නාවික ක්ෂේත්‍රයේ ඉහළම වරලත් සුදුසුකම වන එක්සත් රාජධානියේ FICS, සේවා සැපයුම්/ ප්‍රවාහනය පිළිබඳ එක්සත් රාජධානියේ FCILT සහ අළෙවිකරණ පිළිබඳ එක්සත් රාජධානියේ FCIM සුදුසුකම් ඔහු සතුව ඇති අතර නෝර්වේ රාජ්‍යයේ නාවික විද්‍යායතනය (Norwegian Shipping Academy) (OSLO) වෙතින් උපාධියක්ද ලබා ඇත.

ආචාර්ය දිසානායක මහතා, එක්සත් රාජධානියේ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ වාණිජ විද්‍යාර්ථයකු වන අතරම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේද ආදි විද්‍යාර්ථයකු වන්නේය. තවද ඔහු නොරාඩ් සහ ජයිකා (JICA) හා ඇමෙරිකා එක්සත් ජනපදයේ හාවඩ් Business School හි සාමාජිකත්වයද ලබා ඇත.

## පී ජී දසනායක
**උප සභාපති**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ උප සභාපතිවරයා වන පී ජී දසනායක මහතා **CICT, SAGT** හා **JCT** හි අධ්‍යක්‍ෂ මණ්ඩල වල සාමාජිකයකු වශයෙන්ද කටයුතු කරයි.

ඔහු සතු වැව්ලි ක්ෂේත්‍රයේ ව්‍යාකූල දැනුමක් හා පළපුරුද්දක් ඇති අතර ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාව සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලය වැනි රාජ්‍ය වැව්ලි අංශය ආයතනයන්හි උසස් තනතුරු රාශියක්

හොබවා ඇත. තවද, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරයකු වශයෙන් කටයුතු කිරීම තුළින් සිය දැනුම සහ පළපුරුද්ද ඉහළ නංවාගැනීමට අවස්ථාව හිමි වී ඇත. ඉන්පසු ඔහු පශු සම්පත් හා කෘෂිකර්ම සමාගමේ සභාපතිවරයා ලෙස පත් කරන ලද අතර එම සමාගමේ දියුණුව සහ වර්ධනය වෙනුවෙන් ඔහු ලබා දුන් දායකත්වය විශාල වශයෙන් පිළිගැනීමට ලක් විය.

ඉන්පසු, දිසානායක මහතා ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ සභාපතිවරයා වශයෙන් පත් කරන ලදී. ජර්මානු තාක්ෂණික පුහුණු ආයතනය සහ රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ සභාපතිත්වය ද ඔහු විසින් හොබවන ලද අතර එමඟින් සිය දැනුම අත්දැකීමක් ලෙසට පරිවර්තනය කර ගැනීමට ඔහුට හැකියාව ලැබී ඇත.

ඉන්පසුව, ස්වාධීන රූපවාහිනී සේවයේ (ITN) ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා ලෙස පත්වූ අතර පසුව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ (NAITA) උප සභාපතිවරයා ලෙසද කටයුතු කරන ලදී. සිය කීර්තිමත් වෘත්තීය දිවිය තුළ ලබාගත් පළපුරුද්ද සහ දැනුම භාවිතයෙන් ඔහු ආයතනයේ සංවර්ධනය උදෙසා ඉමහත් දායකත්වයක් සපයන ලදී. සිය දිගු සේවා කාලය තුළ මෙම ආයතනයන් වෙනත් විවිධ කර්මාන්තයන්හි යෙදවූ අතර, එමඟින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සුවිශේෂී දායකත්වයක් ලබා දෙන ලදී.

### එච් ඩී ඒ එස් ප්‍රේමචන්ද්‍ර මහතා
### කළමනාකාර අධ්‍යක්ෂ

කළමනාකාර අධ්‍යක්ෂ එච් ඩී ඒ එස් ප්‍රේමචන්ද්‍ර මහතා ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධිධරයකු වන අතර, බෙල්ජියමේ ඇන්ට්වර්ප් (Antwerp) විශ්වවිද්‍යාලයේ වරාය කළමනාකරණය සහ වරාය පරිපාලනය පිළිබඳ පලමුවන පන්තියේ සාමාර්ථයක් සහිත ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. ඔහු 1978 වසරේ ඔක්තෝම්බර් මාසයේ දී කළමනාකාර අභ්‍යාසලාභියෙකු ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරියට බැඳුනු අතර, විවිධ තනතුරු වලට උසස්වීම් ලබමින් 2001 වසරේ ජනවාරි මාසයේ දී අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ තනතුරට පත් කරන ලදී. වසර 25ක පූර්ණ සේවා කාලයකින් පසු 2004 වසරේ දී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවයෙන් ඉවත්වන තුරුම ඔහු එම තනතුර හෙබවීය.

ප්‍රේමචන්ද්‍ර මහතා ෆුජයිරා (Fujairah) වරායේ පර්යන්ත සම්බන්ධීකාරකවරයෙකු ලෙස 1991 සිට 1992 දක්වා සේවය කල අතර, මලයාසියාවේ වෙස්ට්පෝට් (Westport) හි තාක්ෂණික උපදේශකවරයෙකු සහ එහි බහළු පර්යන්ත දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස 1999 සිට 2000 දක්වා සේවය කරන ලදී.

ලෝකයේ තුන්වන විශාලතම නැව් සේවය වන CMA-CGM SA සමාගමෙහි ආසියානු කලාපයේ ප්‍රාදේශීය කළමනාකරු (වරාය සහ පර්යන්ත) ලෙස පත්ව එහි සේවය සඳහා නිවාඩු අයදුම් කර ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් නික්ම යන ලදී. 2004 අගෝස්තු මාසයේ දී එම සමාගමේ ස්ථිර සේවය සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවයෙන් සමුගත්හ.

කළමනාකරණ අධ්‍යක්ෂවරයා ලෙස 2015 දෙසැම්බර් 01 වන දින නැවත ශ්‍රී ලංකා වරාය අධිකාරියට පත්වීමට ප්‍රථම ඔහු කුආලාලම්පූර් (KualaLumpur) සහ මුම්බායි හි පිහිටි CMA-CGM Terminal Link සහ CMA Terminals යන සමාගම් වල සේවය කරන ලදී. මෙම කාලසීමාව තුළ, පර්යන්තයන්හි ආයෝජනය සඳහා CMA CGM සමාගමට සහාය දක්වමින්, පූර්ණ ස්වයංක්‍රීය පහසුකම් වලින් සමන්විත බහළු පර්යන්ත සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම මෙන්ම, මැද පෙරදිග, අප්‍රිකාව, ඇමරිකා එක්සත් ජනපදය සහ යුරෝපය ඇතුළු ලොව පුරා පිහිටි නැව් සමාගම් වල කාර්යසාධනය වැඩි දියුණු කිරීම සඳහා සහාය දක්වමින් වරායයන් ගණනාවකම සේවය කරන ඇත.

**එච්. ඒ. විමලසූරිය මහතා**
**විධායක අධ්‍යක්ෂ**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විධායක අධ්‍යක්ෂ එච්.ඒ විමලසූරිය මහතා පොලොන්නරුව මධ්‍ය මහා විද්‍යාලයෙන් ප්‍රාථමික අධ්‍යාපනය ලබා ඇති අතර උසස් අධ්‍යාපනය සඳහා හොරණ විද්‍යාර්ථ විද්‍යාලයට ඇතුළු විය. ශාස්ත්‍රපති උපාධිය කොළඹ විශ්ව විද්‍යාලයෙන් ලබා ගත් අතර නීති උපාධියේ පළමු සහ දෙවන අදියරයන් සමත් වී ඇත. මීට අමතරව, ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පුවත්පත් කලාව පිළිබඳ ඩිප්ලෝමාවක් සාර්ථකව සම්පූර්ණ කර ඇත. විමලසූරිය මහතා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ස්වේච්ඡා බලකායේ ගුවන්භටයකු වශයෙන් හා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මූලස්ථානයට අනුයුක්තව සුභසාධක නිලධාරියකු වශයෙන් සේවය කර ඇත. රාජ්‍ය සේවයේ නිරත වන අතරතුර ආපදා කළමනාකරණ සහ වැවිලි කර්මාන්ත යන අමාත්‍යාංශ වල අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩල වල සේවය කර ඇත. තේ, පොල්, රබර් පාලන මණ්ඩල වල සභාපතිවරයා ලෙස හා කුසලතා සංවර්ධන අරමුදල (Skill Development Fund) හි සභාපති ලෙස ද කටයුතු කළ අතර මෙම ආයතනයන්හි දියුණුව උදෙසා විශාල දායකත්වයක් ලබාදෙන ලදී. තවද, ඔහුගේ පුළුල් දැනුම හා පළපුරුද්ද භාවිතා කරමින් විදේශ රැකියා කාර්යංශයේ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා, නැව් සංස්ථාව, පොල් වගා කිරීමේ මණ්ඩලය සහ පොල් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ද කටයුතු කර ඇත. මේ වන විට විමලසූරිය මහතා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විධායක අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරමින් වරායෙහි සංවර්ධනය සඳහා උපරිම දායකත්වයක් ලබා දේ. ඔහුගේ කාර්යබහුල ජීවිතයේ කටයුතු කළමනාකරණය කරන අතරතුරදීම පුවත්පත් කලාවට ඇති ලැදියාව පෙන්නුම් කරමින් ග්‍රන්ථ 03 රචනා කර ප්‍රකාශයට පත් කර ඇත.

**ජී එස් එම් චාල්ස් මහත්මිය**
**අධ්‍යක්ෂිකා**

වත්මන් රේගු අධ්‍යක්ෂ ජනරාල් තනතුර හොබවන ජී.එස්.එම්. චාර්ල්ස් මහත්මිය ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරිනියකි.

ප්‍රථම ශාස්ත්‍රපති උපාධිය (ගෞරව) 1983 දී ලබාගත් අතර පසුව ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව, විද්‍යාවේදී උපාධිය සහ කළමනාකරණවේදී උපාධිය සමත් වී ඇත.

1992 වර්ෂයේදී ශ්‍රී ලංකා පරිපාලන සේවයට බැඳී වව්නියාව හා මඩකලපුව දිස්ත්‍රික්ක වල දිසාපති වශයෙන්ද කටයුතු කර ඇත.

වව්නියාව දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරිය වශයෙන් කටයුතු කළ අවධියේ, රටෙහි දරිද්‍රතාවය තුරන්කිරීමේ වැඩපිළිවෙලේ වව්නියාව දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් ඉහළම අනුපාතිකයක් ලබා කර ගැනීමට ඇය සමත්වූ අතර එය ප්‍රතිශතයක් වශයෙන් 2.3% ක් විය.

චාර්ල්ස් මහත්මිය ලෝක ආපදා කළමනාකරණ නායකත්ව ජාලයේ පූර්ණ සාමාජිකත්වය දරමින් කටයුතු කර ඇත.

ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ පැවති සිවිල් යුද්ධයේ අවසන් අදියරෙන් පසුව අභ්‍යන්තර අවතැන් පුද්ගලයින්ගේ අවශ්‍යතා ඉටුකිරීමේ මානුෂීය සම්බන්ධීකාරකවරිය මෙන්ම, අපදා අවදානම් කළමනාකරණයේ දිස්ත්‍රික් පරිපාලන නිලධාරිනිය වශයෙන්ද චාර්ලිස් මහත්මිය කටයුතු කලාය.

ඇය විසින් යුනිසෙෆ් ආයතනයේ සහයෝගය ඇතිව අවතැන් වූ ළමුන් සඳහා පවුලේ ඥාතීන් සෙවීමේ හා නැවත සම්බන්ධ කිරීමේ වැඩ සටහනක් ආරම්භ කරන ලද අතර එමඟින් විශාල පවුල් සංඛ්‍යාවක් නැවත එක්කිරීමේ හැකිවිය.

ඇය මඩකලපුව දිස්ත්‍රික්කය තුළ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දියුණු කිරීමේ කාර්යයෙහි නියුතුව සිටි අතර දිස්ත්‍රික්කයේ කාන්තා ව්‍යවසායකයින්ගේ දියුණුව ලඟාකර ගැනීමේ අරමුණ ඇතිව දිස්ත්‍රික්කයේ කාන්තා ස්වයං රැකියා සංවර්ධන මධ්‍යස්ථාන අධීක්ෂණය කිරීමේ හා මඟ පෙන්වීමේ කටයුතු මෙහෙය වූවාය.

මඩකලපුව නගරය අලංකරණය කිරීමේ ව්‍යාපෘතිය හා කොටුව ප්‍රදේශය අලංකරණය කිරීමේ ව්‍යාපෘතිය සහ වෙනත් සංවර්ධන ව්‍යාපෘති රාශියක් භාරව කටයුතු කළ චාර්ල්ස් මහත්මිය මඩකලපුව දිස්ත්‍රික්කයේ ස්වභාවික විපත් අවම කිරීමේ ව්‍යාපෘතිය භාරව ද කටයුතු කර ඇති අතර මඩකලපුව දිස්ත්‍රික්කයේ සංචාරක සංවර්ධන කටයුතු වල කැපීපෙනෙන කාර්යයන් රාශියක් ඉටුකර ඇත.

කාන්තා කළමනාකරණ ආයතනය විසින් සංවිධානය කරන ලද වාර්ෂික දීප ව්‍යාප්ත සම්මාන ප්‍රදානෝත්සවයේදී 2012/2013 වර්ෂයේ විශිෂ්ටතම කාන්තාවට හිමි සම්මානයෙන් චාල්ස් මහත්මිය පිදුම් ලැබුවාය.

### එච් ජී සුමනසිංහ මහතා
### අධ්‍යක්ෂ

2016 වර්ෂයේදී සුමණසිංහ මහතා මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත් කරන ලදී. ඊට අමතරව, 2015 වසරේ සිට මහා භාණ්ඩාගාරයේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නියෝජිතයා ලෙසද පත්කරනු ලැබ ඇත. මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත් කරනු ලැබීමට ප්‍රථමයෙන් ඔහු මුදල් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්(මානව සම්පත් සංවර්ධන) වශයෙන් සේවය කර ඇත.

මීට පෙරාතුව සුමනසිංහ මහතා ආනයන හා අපනයන දෙපාර්තමේන්තුවේ ආනයන අපනයන පාලක ජනරාල්වරයා ලෙස කටයුතු කර ඇත. ඊට ඉහත දී රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ මුදල් අමාත්‍යාංශයේ සහාය අධ්‍යක්ෂ ආදී ලෙස මහා භාණ්ඩාගාරයේ විවිධ තනතුරු දරා ඇත.

සුමණසිංහ මහතා කොළඹ විශ්වවිද්‍යාලයයේ කළමනාකරණ අධ්‍යයන හා මූල්‍ය පීඨයෙන් වාණිජවේදී උපාධිය ලබා ඇති අතර, ඔස්ට්‍රේලියාවේ ෆ්ලින්ඩර්ස් (Flinders) විශ්වවිද්‍යාලයෙන් රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳව ශාස්ත්‍රපති උපාධියක් ද ලබා ඇත.

### ජගත් පී විජේවීර මහතා
### අධ්‍යක්ෂ

ජගත් පී විජේවීර මහතා 2017 වසරේදී අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත් කරනු ලැබීය. වර්තමානයේ ඔහු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස කටයුතු කරනු ලබයි.

ඔහු කැළණිය විශ්වවිද්‍යාලයෙන් ලලිතකලා විශේෂවේදී උපාධියක් ලබා ඇති අතර පසුව කොළඹ විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව හා ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රපති උපාධි දෙකක් ද ලබා ඇත.

ඔහු 2006 සිට 2010 වසර දක්වා ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු වශයෙන් කටයුතු කරන ලද අතර පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජෙනරාල්වරයා ලෙසද කටයුතු කර ඇත. ඔහු 1987 වසරේ සිට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු ලෙස කටයුතු කරමින් සිටී.

**නිලාන් වික්‍රමසිංහ මහතා**
**අධ්‍යක්ෂ**

ආගන්තුක සත්කාරක හා සංචාරක ක්ෂෙත්‍රයේ වසර 30 කට වැඩි පළපුරුද්දකින් පෝෂිත වූ නිලාන් වික්‍රමසිංහ මහතා ක්ෂෙත්‍රයේ පවතින ඉහළ ඉල්ලුමට ප්‍රතිචාරයක් ලෙස 1999 වර්ෂයේදී "සුළු ප්‍රමාණයෙන් වැඩි ප්‍රමාණයට" යන තේමාව යටතේ ලයන් රෝයල් ටුවරිසම් හෙවත් "රාජකීය සිංහ සංචාරක ව්‍යාපාරය" සමාගමක් ලෙස නිර්මාණය කළේය. ප්‍රංශ සහ ජපන් සංචාරක ව්‍යාපාරය පිළිබඳ විශේෂඥතාවයෙන් යුත් මෙම සමාගම අද වන විට වික්‍රමසිංහ මහතාගේ සභාපතිත්වය යටතේ සම්මාන ලාභී ව්‍යාපාරයක් ලෙස පිළිගැනීමට ලක්ව ඇත. නිවාඩු විවේකයේ සාම්ප්‍රදායික අදහසට විප්ලවීය වෙනසක් සිදුකරමින් ඔහු ලයන් රෝයල් නිවාඩු නිකේතන හා සම්භාහන මධ්‍යස්ථාන ආරම්භ කළේය.

ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයේ ආර්ථික වර්ධනයට වික්‍රමසිංහ මහතා දැක්වූ දායකත්වය අගයනු පිණිස ඔහු ජාතික හා අන්තර් ජාතික මට්ටමින් ගෞරව සම්මානයට පාත්‍ර කරන ලද අතර, කුසලතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ ආගන්තුක සත්කාර හා සංචාරක ව්‍යාපාරය භාර අධ්‍යක්ෂවරයා ලෙස එහි අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කරන ලදී. එම නිල කාලය තුළ 2016 වර්ෂයේදී වෙනිසියුලා බොලිවේරියන් ජනරජයේ මාගරීටා දූපතේ පැවති නොබැඳි ජාතීන්ගේ සමුළුවටද විශේෂ නියෝජිතයෙකු ලෙස සහභාගී විය.

වික්‍රමසිංහ මහතා මේ වනවිට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජියෙකු ලෙසද, ජය බහළු පර්යන්තයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙසද, හම්බන්තොට ජාත්‍යන්තර වරායේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙසද, හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සර්විසස් (HIPS) හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙසද, හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් ගෲප් (HIPG) හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙසද පත් කර ඇති අතර, මාගම්පුර පෝට් මැනේජ්මන්ට් කන්සල්ටන්සි සර්විසස් (MPMC) ආයතනයෙහි කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙසද කටයුතු කරමින් සිටී.

**සුරංග පී හිඳැල්ලආරච්චි මහතා**
**අධ්‍යක්ෂ**

සුරංග පී හිඳැල්ලආරච්චි මහතා ශ්‍රී ලංකාවේ පරිපාලන හා සංවර්ධන අංශයන්හි විධායක කාර්යයන්හි නියැලීමෙන් ලද පලපුරුද්ද සහිතව වසර 2002 සිට ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද සමරසිංහ මහතා යටතේ සේවය කර ඇති අතර ඔහු කම්කරු හා විදේශ රැකියා, ආපදා කළමනාකරණ හා මානව හිමිකම්, වැවිලි කර්මාන්ත, මුදල්, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ වරාය හා නාවික යන අමාත්‍යාංශ ඇතුළුව රාජ්‍ය ආයතනයන්හි සම්බන්ධීරකණ ලේකම්, මාධ්‍ය ලේකම්, පුද්ගලික ලේකම්, සභාපති සහ අධ්‍යක්ෂ යන තනතුරු වල කටයුතු කර ඇත.

සුරංග මහතා 2011 සිට 2012 දක්වා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ "තුරු සවිය" අරමුදලෙහි සභාපති ලෙස සේවය කර ඇති අතර එම කාලය තුළ කුඩා රබර් වතු හිමියන් සඳහා ශ්‍රී ලංකාව තුළ ප්‍රථමවරට ණය ක්‍රමයක් හඳුන්වාදීමට ඔහුට සමත්වූ අතර රබර් මිල සහ නිෂ්පාදනයන්හි තත්ත්වය ඉහළ නැංවීම සඳහා කාණ්ඩ වශයෙන් රබර් පදම් කිරීමේ මධ්‍යස්ථාන ස්ථාපිත කරන ලදී. ඔහු ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ (NIPM) සභාපතිවරයා ලෙස කටයුතු කරන ලද අතර ව්‍යාපාර කළමනාකරණ පිළිබඳ ජාතික පාසලෙහි (NSBM) අධ්‍යක්ෂවරයා ලෙසද කටයුතු කරන ලදී.

**එස් ඒ එස් කේ ජයසේකර මහත්මිය**
**අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්**

## කළමනාකරණ කමිටුව

ආචාර්ය පරාක්‍රම දිසානායක මහතා
**සභාපති**

පී ජී දසනායක මහතා
**උප සභාපති**

එච්. ඩී. ඒ. එස්. ප්‍රේමචන්ද්‍ර මහතා
**කළමනාකාර අධ්‍යක්‍ෂ**

එච් ඒ විමලසූරිය මහතා
**විධායක අධ්‍යක්‍ෂ**

ඒ ඩී ටී ගුණසේකර මහතා
**අතිරේක කළමනාකාර අධ්‍යක්‍ෂ**

ශිරාණි වන්නිආරච්චි මිය
**අධ්‍යක්‍ෂ (මුදල්)**

ඩී. යූ. ඩබ්. ද සොයිසා මහතා
**අධ්‍යක්‍ෂ (සේවා සැපයුම්)**

පී. ඒ. ඒ. හේවාගීගන මහතා
**අධ්‍යක්‍ෂ (දක්‍ෂිණ වරාය සංවර්ධන)**

ඩී. ඒ. ජේ. අයි. පෙරේරා මහතා
**අධ්‍යක්‍ෂ (වරාය මෙහෙයුම්)**

ආචාර්ය ඩී. පී. එස්. ලොකුගේ
**අධ්‍යක්‍ෂ (තොරතුරු පද්ධති)**

මේජර් ජනරාල් නිශ්ශංක විජේසිංහ
**අධ්‍යක්‍ෂ (ආරක්‍ෂක)**

ඩී. ජී. අයි. සී. ලොකුහේවගේ මිය
**අධ්‍යක්‍ෂ (තාක්ෂණික)**

එල්. ප්‍රේමසිරි ද සිල්වා මහතා
**ප්‍රධාන අභ්‍යන්තර විගණක**

වෛද්‍ය ඩී. රාජකාන්තන් මිය
**ප්‍රධාන වෛද්‍ය නිලධාරි**

ඒ. ඒ. එස්. ආර්. අබේසිරිවර්ධන මහතා
**ප්‍රධාන ඉංජිනේරු (සැලසුම් හා සංවර්ධන)**

උපුල් ජයතිස්ස මහතා
**ප්‍රධාන කළමනාකරු (අළෙවි හා ව්‍යාපාර සංවර්ධන)**

ආර්. එම්. ඒ. එස්. රත්නායක මහතා
**ප්‍රධාන කළමනාකරු (පරිපාලන)**

එච්. ඒ. එන්. එස්. ප්‍රනාන්දු මහතා
**ප්‍රධාන ඉංජිනේරු (විදුලි - I)**

ඩබ්. එම්. ඩී. බී. විජේකෝන් මහතා
**ප්‍රධාන ඉංජිනේරු (විදුලි - II)**

එච්. එම්. යූ. බී. ගලගොඩ මහතා
**ප්‍රධාන කළමනාකරු (තොරතුරු පද්ධති)**

ඩබ්. එන්. ජයතිස්ස මහතා
**ප්‍රධාන කළමනාකරු (සුභසාධක හා කාර්මික සම්බන්ධතා)**

පී රණතුංග මහතා
**ප්‍රධාන කළමනාකරු**
(මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය)

අයි. කේ. ඥාණතිලක මහතා
**ප්‍රධාන කළමනාකරු (බහළු මෙහෙයුම්)**

කාන්ති ගුණවර්ධන මිය
**ප්‍රධාන මූල්‍ය කළමනාකරු**

ජී. වී. ටී. නානායක්කාර මහතා
**ප්‍රධාන ඉංජිනේරු (නාවික)**

අපර්ණා තිලකරත්න මිය
**ප්‍රධාන නීති නිලධාරිනී**

කපිතාන් ඒ හේවාවිතාරණ
හාබර් මාස්ටර්

කොමදෝරු ඩී. සී. ප්‍රේමරත්න මහතා
**ප්‍රධාන ආරක්ෂක කළමනාකරු**

එච්. එම්. ප්‍රභාත් ජයන්ත මහතා
**ප්‍රධාන කළමනාකරු (සේවා සැපයුම්)**

**ජේ.ඒ. චන්ද්‍රරත්න මහතා**
**ප්‍රධාන ඉංජිනේරු (යන්ත්‍රෝපකරණ වැඩ)**

එම් එස් ඒ පතිරගේ මහතා
**ප්‍රධාන ඉංජිනේරු (යන්ත්‍රෝපකරණ)**

පී ඒ ආර් ඩී පතිරාජ මහතා
**ප්‍රධාන කළමනාකරු (සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ)**

නලින් අපොන්සු මහතා
**ප්‍රධාන කළමනාකරු (සන්නිවේදන හා මහජන සම්බන්ධතා)**

ඩී ජී ආර් එම් පතිවිල මහතා
**ප්‍රධාන ඉංජිනේරු (සිවිල්)**

නිර්මාල් ද ෆොන්සේකා මහතා
**ප්‍රධාන මානව සම්පත් කළමනාකරු**

## විගණන කමිටුව

එච්. ජී. සුමනසිංහ මහතා
**සභාපති**

පී එස් එම් චාර්ල්ස් මහත්මිය
**සාමාජික**

නිලාන් වික්‍රමසිංහ මහතා
**සාමාජික**

කේ. පී. ජී. හේමරත්න මහතා
**සාමාජික**

ශිරාණි වන්නිආරච්චි මහත්මිය
**සාමාජික**

ඒ. ඩී. ටී. ගුණසේකර මහතා
**සාමාජික**

ඩී. ඒ. ජේ. අයි. පෙරේරා මහතා
**සාමාජික**

එල්. ප්‍රේමසිරි ද සිල්වා මහතා
**ලේකම්**

## 2017 වසරේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ වෙනස්වීම්

### ඉල්ලා අස්වීම් හා විශ්‍රාම ගැනීම්

**ජේ කේ පී කුරුකුලසූරිය මහතා -** අතිරේක කළමනාකාර (අධ්‍යක්‍ෂවරයා) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවයෙන් ඉල්ලා අස් වන ලදී.

**පී එම් එස් සෝමරත්න මහතා -** ප්‍රධාන කළමනාකරු (සිවිල්) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවයෙන් ඉල්ලා අස් වන ලදී.

**එල් එච් ආර් සේපාල මහතා -** අධ්‍යක්‍ෂ (මානව සම්පත්) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවයෙන් ඉල්ලා අස් වන ලදී.

**ජී එච් ඩී ධර්මරත්න මහතා -** ප්‍රධාන ඉංජිනේරු (යන්ත්‍රෝපකරණ වැඩ) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවයෙන් විශ්‍රාම යන ලදී.

**ර් ඒ ටී එදිරිසූරිය මහතා -** ප්‍රධාන කළමානකරු (සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවයෙන් විශ්‍රාම යන ලදී.

**විජිත අබේසුන්දර මහතා -** ප්‍රධාන කළමනාකරු (සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවයෙන් විශ්‍රාම යන ලදී.

**පත්කිරීම්**

**ඒ. ඩී. ටී. ගුණසේකර මහතා** අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

**ඩී. ජී. අයි. සී. ලොකුහේවගේ මිය** අධ්‍යක්ෂ (තාක්ෂණික) ලෙස පත් කරන ලදී.

**මේජර් ජනරාල් නිශ්ශංක විජේසිංහ මහතා** අධ්‍යක්ෂ (ආරක්ෂක) ලෙස පත් කරන ලදී.

**පී. රණතුංග මහතා** ප්‍රධාන කළමනාකරු (මහපොළ හා සමුද්‍රීය විද්‍යායතනය) ලෙස පත් කරන ලදී.

**ජේ. ඒ. චන්ද්‍රරත්න මහතා** ප්‍රධාන ඉංජිනේරු (යන්ත්‍රෝපකරණ වැඩ) ලෙස පත් කරන ලදී.

**එම්. එස්. ඒ. පතිරගේ මහතා** ප්‍රධාන ඉංජිනේරු (යන්ත්‍රෝපකරණ) ලෙස පත් කරන ලදී.

**පී. ඒ. ආර්. ඩී. පතිරාජ මහතා** ප්‍රධාන කළමනාකරු (සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ) ලෙස පත් කරන ලදී.

**නලින් අපොන්සු මහතා** ප්‍රධාන කළමනාකරු (සන්නිවේදන හා මහජන සම්බන්ධතා) ලෙස පත් කරන ලදී.

**ඩී ජී ආර් එම් පතිවිල මහතා** ප්‍රධාන ඉංජිනේරු (සිවිල්) ලෙස පත් කරන ලදී.

**නිර්මාල් ද ෆොන්සේකා මහතා** ප්‍රධාන මානව සම්පත් කළමනාකරු ලෙස පත් කරන ලදී.

ලෝකයේ සෙසු වරායයන් හා සැසඳීමේ දී කොළඹ වරාය 2017 වර්ෂය තුළ බහළු මෙහෙයුම් ධාරිතාවයෙහි වර්ධන අනුපාතය 8.3% කින් වැඩි කිරීමට සමත් වී ඇත. ඒකාබද්ධ කිරීම්, පවරාගැනීම් හා සන්ධාන ගතවීම් හේතු කොට ගෙන සමාලෝචිත වර්ෂය තුළ නාවික කර්මාන්තයට අස්ථාවරතාවයන් රාශියකට මුහුණ පෑමට සිදුවිය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රතිඅපනයන කේන්ද්‍රීය වරායක් වන කෙලාන් වරායේ (Port of Kelang) ඍනාත්මක වර්ධනයක් වාර්තා විය. කෙසේ වුවද, මෙම තත්ත්වය හමුවේ නාවික කර්මාන්තය තුළ ඉහළ යමින් පවතින ඉල්ලුමට සරිලන සැපයුමක් ඇති කරනු පිණිස ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ජාත්‍යන්තර මට්ටමේ අතිවිශාල පහසුකම් රාශියක් ඇති කරන ලද අතර, එමගින් කොළඹ වරාය කලාපයේ විශාලතම ප්‍රතිඅපනයන කේන්ද්‍රීය වරාය බවට පත්විය.

සමාලෝචිත වර්ෂය තුළදී වර්ෂයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා ප්‍රධාන පෙළේ නැව් සමාගම් සමඟ පර්යන්ත සේවා ගිවිසුම් 4 ක් අත්සන් කරන ලදී.

කොළඹ වරායේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ පාලනය වන ජය බහළු පර්න්තය 2017 වර්ෂයේදී නව බහළු නැව් සමාගමක් වන පෙන්ඩලම් එක්ස්ප්‍රස් ලයින්ස් සමාගම සහ සාමාන්‍ය පෝෂක නැව් සමාගමක් වන මිලාහා නැව් සමාගම ආකර්ෂණය කර ගැනීමට සමත් විය.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ගෝලීය නාවික කර්මාන්තයේ නව ප්‍රවණතාවයනට අනුකූලව වත්මන් වරාය ආංශික ගැටළුවලට විසඳුම් සෙවීම සඳහා තුන් අවුරුදු සංවර්ධන සැලසුමක් පිළියෙළ කිරීමේ කාර්යයෙහි යෙදී සිටී.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ පාලනය වන පර්යන්ත වලින් පහත සඳහන් ප්‍රතිඵල වාර්තා වී ඇත.

- ♦ ප්‍රතිඅපනයන බහළු මෙහෙයුම් ධාරිතාවය 0.1% කින් වැඩි වී ඇත.
- ♦ දේශීය බහළු මෙහෙයුම් ධාරිතාවය 19.6% කින් අඩුවී ඇත.
- ♦ ශ්‍රී ලංකා වරාය අධිකාරිය මඟින් පාලනය වන පර්යන්ත වල මෙහෙයුම් ධාරිතාවය 4.3% කින් පහත වැටී ඇත. (මෙය 2016 වර්ෂයේ පැවති 6.3% ක ඍනාත්මක අඩුවීම හා සැසඳීමේ දී ධනාත්මක වර්ධනයක් ලෙස සැලකිය හැක.)

සාමාන්‍ය නෞකා වලට වඩා වැඩි ගැඹුරින්/දිගින්/පළලින් යුත් අතිවිශාල ප්‍රමාණයේ නෞකා වල පැමිණීම, කළම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් (CICT) සමාගම වෙත ප්‍රධාන නැව් මාර්ග අහිමිවීම, ප්‍රධාන නැව් මාර්ග අහිමිවීම හේතුකොට ගෙන පෝෂක බහළු මෙහෙයුම් ධාරිතාවය අඩුවීම, නෞකා වල මෙහෙයුම් කටයුතු ක්ෂණිකව නිමකරන ලෙස වෙනත් නෞකා වලින් පැමිණෙන බලපෑම්, සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) සමාගම හා සසඳා බැලීමේදී ජය බහළු පර්යන්තය ගැඹුරු දියඹක් සහිත පර්යන්තයකින් සමන්විත නොවීම, නව සන්ධානයන් ගොඩනැගීම, නැගෙනහිර බහළු පර්යන්තය පිළිබඳව තබා තිබූ බලාපොරොත්තු ඉටුනොවීම හා වෙනත් පෞද්ගලික පර්යන්ත ක්‍රියාකරවන්නන් විසින් ඉදිරිපත් කරන තරඟකාරී ගාස්තු ආදී සාධක හේතුකොට ගෙන ශ්‍රී ලංකා වරාය අධිකාරියට එහි ධාරිතාවයන් අහිමි වී ඇත.

**සියළු වරායයන් සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රතිඵල වාර්තා වී ඇත;**

- ♦ නෞකා වල මුළු පැමිණීම 1.6% කින් අඩු වී ඇත.
- ♦ මෙහෙයුම් කරන ලද මුළු ටොන් ප්‍රමාණය 8.6% කින් වැඩි වී ඇත.

**කොළඹ වරාය විසින් පහත සඳහන් ප්‍රතිඵල වාර්තා කර ඇත;**

- ♦ කොළඹ වරායට පැමිණි මුළු නැව් ප්‍රමාණය 1.7% කින් අඩුවී ඇත.
- ♦ කොළඹ වරායේ මෙහෙයුම් කරන ලද ටොන් ප්‍රමාණය 8.7% කින් වැඩිවී ඇත.
- ♦ කොළඹ වරායේ සමස්ත බහළු මෙහෙයුම් වර්ධනය 8.3% කින් වැඩි වී ඇත.

- දේශීය බහළු මෙහෙයුම් වල ධාරිතාවය 6.4% කින් වැඩිවී ඇත.
- ප්‍රතිඅපනයන බහළු මෙහෙයුම් ධාරිතාවය 8.8% කින් වැඩි වී ඇත.

**හම්බන්තොට වරාය පහත සඳහන් ප්‍රතිඵල වාර්තා කර ඇත;**

- වරාය වෙත පැමිණි සමස්ත නෞකා සංඛ්‍යාව 18.1% කින් අඩු වී ඇත.
- මෙහෙය වන ලද සමස්ත රෝ රෝ නෞකා සංඛ්‍යාව 217ක් වන අතර, එය 18.7% කින් පහත වැටීමකි.
- මෙහෙය වන ලද සමස්ත වාහන සංඛ්‍යාව ඒකක 107,285 ක් වන අතර, එය 40.9% ක පහත වැටීමකි.
- මෙහෙය වන ලද සමස්ත දේශීය වාහන සංඛ්‍යාව ඒකක 41,188ක් වන අතර එය 30.7% කින් ඉහළ යාමකි.
- මෙහෙය වන ලද ප්‍රතිඅපනයන රථ වාහන සංඛ්‍යාව ඒකක 66,097ක් වන අතර මෙය 56% ක පහත වැටීමකි.
- වෙළඳපළ කොටස - ප්‍රතිනැව්ගත : 62% ක් වන අතර දේශීය 38% වේ.

**ත්‍රිකුණාමලය වරාය පහත සඳහන් ප්‍රතිඵල වාර්තා කර ඇත;**

- පැමිණි මුළු නෞකා සංඛ්‍යාව 7.9%කින් වර්ධනය විය.
- මෙහෙය වන ලද මුළු ටොන් ප්‍රමාණය 10.9%කින් වර්ධනය විය.

**ගාලු වරාය පහත සඳහන් ප්‍රතිඵල වාර්තා කර ඇත;**

- පැමිණි මුළු නෞකා සංඛ්‍යාව 9.4%කින් පහත වැටී ඇත.
- මෙහෙය වන ලද මුළු නැව්බඩු ටොන් ප්‍රමාණය 7.8%කින් පහත වැටී ඇත.

1505 පෘතුගීසීන් විසින් නාවික කඳවුරක්/වරායක් ලෙස භාවිතයට ගැනීම ආරම්භ කිරීමෙන් පසුව කොළඹ වරාය අපරදිග රටවල ප්‍රසිද්ධියට පත්විය.

1875 VII එඩ්වඩ් රජු විසින් දෙසැම්බර් 09 වන දින නිරිත දිග දියකඩනයට මුල් ගල තබන ලදී.

1882 කොළඹ වරාය පරිපාලනය කිරීම සඳහා වරාය මණ්ඩලය පිහිටුවන ලදී.

1885 මීටර් 1285 ක් දිග නිරිත දිග දියකඩනයේ ඉදිකිරීම් නිමකිරීම.

1898 මීටර් 335 ක් දිග ඊසාන දිග දියකඩනයේ ඉදිකිරීම නිම කරන ලදී.

1899 වියළි තටාකාංගයේ ඉදිකිරීම ආරම්භ කිරීම.

1906 මීටර් 814 ක් දිග අයිලන්ඩ් දියකඩනයේ ඉදිකිරීම් නිමකිරීම.

1906 වියළි තටාකාංගනයේ ඉදිකිරීම නිම කිරීම.

1909 වියළි තටාකාංගය සඳහා මීටර් 250 ක් දිග නියමු පාලම ඉදිකර නිමකිරීම (පළමු වැනි ගැඹුරු දිය අද්දර නැංගුරම් පොළ).

1912 වත්මන් ජයබහළු පර්යන්තය පිහිටි ස්ථානයේ ගල් අඟුරු ජැටි 18 ක් ඉදිකර නිමකිරීම.

1912 නිරිත දිග දිය කඩනයේ මීටර් 550 ක් දිග දිගුව ඉදිකර නිමකිරීම.

1913 වරාය සංවර්ධන හා නඩත්තු කටයුතු ඉටු කිරීම සඳහා කොළඹ වරාය කොමිෂන් සභාව පිහිටුවීම.

1922 ඛනිජ තෙල් මෙහෙයුම් පහසුකම් සැලසීමේ කාර්යය නිම කිරීම.

1950 මීටර් 9-11 දියඹක් සහිත අද්දර නැංගුරම්පළවල් පහළොවක් සහ මීටර් 7.5 ක දියඹක් සහිත වෙරළාසන්න යාත්‍රා නැංගුරම් පොළවල් දෙකක්ද, වර්ග මීටර 55.800ක යාබද මාර්ගස්ථ බඩු ගබඩා සහ ගුදම් ඉඩ පහසුකම් ඉදි කිරීම ආරම්භ කිරීම.

1954 නිරිතදිග දිය කඩනයෙහි ඉදිකර නිමකළ අද්දර නැංගුරම්පළවල් II වැනි එළිසබෙත් මහ රැජිණ විසින් විවෘත කිරීම සහ එය "එළිසබෙත් රැජින ජැටිය" යනුවෙන් නම් කිරීම. ("ගොතික්" රාජකීය රුවල් යාත්‍රාව එළිසබෙත් රැජිණ ජැටියෙහි නැංගුරම් ලෑ පළමු යාත්‍රාව විය)

1956 අද්දර නැංගුම්පළවල් 17 ක්, මාර්ගස්ථ බඩු ගබඩා හා ගුදම් තනා නිම කිරීම.

1958 කොළඹ වරායේ නැව්බඩු මෙහෙයුම් කටයුතු ජනසතු කර වරාය (නැව්බඩු) සංස්ථාව පිහිටුවීම.

1964 ගාලු වරායේ නැව්බඩු මෙහෙයුම් කටයුතු ජනසතු කිරීම.

1967 වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාව පිහිටුවීම.

1967 ත්‍රිකුණාමලය වරායේ නැව්බඩු මෙහෙයුම් කටයුතු ජනසතු කිරීම.

1979 කොළඹ වරාය කොමිෂන් සභාව, වරාය (නැව්බඩු) සංස්ථාව සහ වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාව ඒකාබද්ධ කොට ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිහිටුවීම.

1980 කොළඹ වරාය සඳහා ප්‍රධාන සැලැස්ම ජපන් රජයේ සහයෝගය ඇතිව පිළියෙළ කිරීම.

1980 එළිසබෙත් රැජිණ ජැටියේ නව පර්යන්තය උත්සවාකාරයෙන් ආරම්භ කිරීම.

1982 පළමු වැනි ග්‍රැන්ට් දොඹකරය - වැන්ගෝ 80 සේවය සඳහා යෙදවීම.

1982 නව බහාළු පර්යන්ත ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ජපානයේ පෙන්ටා ඕෂන් වකවිකු ඒකාබද්ධ සමාගම සමඟ අත්සන් කිරීම.

1983 සම්පූර්ණ උපකරණ සහිත බහාළු පර්යන්තයේ I වැනි අදියර ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම.

1984 සම්පූර්ණ උපකරණ සහිත අංග සම්පූර්ණ බහාළු පර්යන්තයේ II වැනි අදියරෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම.

1984 එළිසබෙත් රැජිණ ජැටියේ බහාළු නැංගුරම්පොළෙහි “හිටාචි” හුවමාරු දොඹකර හතරක් (04) සේවය සඳහා යොදා ගැනීම.

1985 ජයබහාළු පර්යන්තයේ 1 වැනි අදියර උත්සවාකාරයෙන් විවෘත කිරීම.

1987 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මහපොළ අභ්‍යාස ආයතනය ආරම්භ කිරීම.

1987 ජයබහාළු පර්යන්තයේ II වැනි අදියර විවෘත කිරීම.

1988 වෙරළෙන් ඔබ්බෙහි ඒක ලක්ෂිත බෝයා නැංගුරම්පළ ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම.

1994 නව වරාය ප්‍රවේශ මාර්ගය තනා නිම කිරීම.

1995 ජයබහාළු පර්යන්තයේ III වැනි අදියරවිවෘත කිරීම.

1996 ජයබහාළු පර්යන්තයේ IV වැනි අදියරවිවෘත කිරීම.

1998 සමගි බහාළු පර්යන්තය ආරම්භ කිරීම.

1998 අනුබද්ධිත වරාය සමුළුව පැවැත්වීම.

1999 නැගෙනහිර වෙරළ තීරයෙහි ඔලුවිල් ප්‍රදීපාගාරය ක්‍රියාත්මක කිරීම සහ ඔලුවිල් සමුද්‍රීය අභ්‍යාස පුහුණු ආයතනය විවෘත කිරීම.

1999 රැජිණ බහාළු පර්යන්තයේ සවුත් ඒෂියා ගේට්වේ ටර්නමිල් (SAGT) සංවර්ධන කටයුතු ආරම්භ කිරීම.

1999 ත්‍රිකුණාමල වරායේ අද්දර නැංගුරම්පළ ව්‍යාපෘතියේ ඉදිකිරීම ආරම්භ කිරීම.

2000 දකුණු කොළඹ වරාය ශක්‍යතා අධ්‍යයනය ආරම්භ කිරීම.

2000 ගාලු වරායේ නව නැංගුරම්පොළක් ආරම්භ කිරීම.

| | |
|---|---|
| 2000 | පෑලියගොඩ බහළු නැව්බඩු මධ්‍යස්ථානය ආරම්භ කිරීම. |
| 2000 | කළාපීය වරායක් වශයෙන් ගාලු වරාය සංවර්ධනය කිරීම සඳහා අවසන් වාර්තාව ඉදිරිපත් කිරීම. |
| 2000 | උතුරු පාලම සංවර්ධන ව්‍යාපෘතියෙහි II වැනි අදියර ආරම්භ කිරීම. |
| 2000 | තනි-නැවතුම් ලේඛණ කටයුතු මධ්‍යස්ථානය ආරම්භ කිරීම. |
| 2001 | ගාලු වරායේ නව ජැටිය ආරම්භ කිරීම. |
| 2003 | ඔලුවිල් වරාය ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම ආරම්භ කිරීම. |
| 2003 | අර්ධ පූර්ණ බහළු (LCL) සහ තොග-කඩන නැව්බඩු සඳහා ගණුදෙනුකාර සේවා මධ්‍යස්ථානය ආරම්භ කිරීම. |
| 2003 | ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමුද්‍රීය කෞතුකාගාරය විවෘත කිරීම. |
| 2003 | සිවිල් වැඩ කටයුතු සම්පූර්ණ වීමත් සමඟ සමඟි බහළු පර්යන්තය උත්සවාකාරයෙන් ආරම්භ කිරීම. |
| 2004 | සමඟි බහළු පර්යන්තයේ බහළු මෙහෙයුම් කටයුතු උත්සවාකාරයෙන් ආරම්භ කිරීම. |
| 2004 | ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 25 වන සංවත්සරික උත්සවය පැවැත්වීම. |
| 2004 | මහා පරිමාණ සේවා අංශයේ ජාතික ඵලදායීතා සම්මානය ජයබහළු පර්යන්තය විසින් දිනා ගැනීම. |
| 2004 | කොළඹ වරායේ බහළු දසලක්ෂ 2 ක් (මිලියන 02 ක්) මෙහෙයවීම. |
| 2005 | ඔලුවිල්හි වරාය හා නිවාස යෝජනා ක්‍රමයෙහි ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම. |
| 2005 | මධ්‍යම පරිමාන සේවා අංශය යටතේ කුසලතා සහතිකයක් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මහපොළ අභ්‍යාස ආයතනය වෙත ජාතික ඵලදායීතා ලේකම් කාර්යාලය විසින් ප්‍රදානය කිරීම. |
| 2006 | කොළඹ වරායේ බහළු ආරක්ෂක උපනයනයන් සහ මෙගා පෝර්ට් උපනයනයන් ක්‍රියාත්මක කිරීම. |
| 2006 | කොළඹ දකුණු වරාය ඉදිකිරීම සඳහා යෝජිත කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම. |
| 2006 | හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියෙහි අදියර I සඳහා විස්තරාත්මක සැලසුම් කටයුතු පිළිබඳ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම. |

2007 හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීම හා මූල්‍ය ගිවිසුම අත්සන් කිරීම.

2008 ඔලුවිල් වරාය ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීම.

2008 කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ වීම.

2008 හම්බන්තොට වරායෙහි නැව් තෙල් සැපයීමේ පහසුකම් සැලසීම සඳහා සහ තෙල් ටැංකි සංකීර්ණය ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරීම.

2009 හම්බන්තොට වරායේ නැව්තෙල් සැපයීමේ පහසුකම හා තෙල් ටැංකි ව්‍යාපෘතිය සහ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මුල්ගල තැබීම.

2009 ජයබහළු පර්යන්තයේ පර්යන්ත කළමනාකරණ පද්ධතිය “NAVIS” පද්ධතිය දක්වා වර්ධනය කිරීම.

2010 2010.08.15 හම්බන්තොට මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ වරාය ද්‍රෝණියට මුහුදු ජලය පිරවීමේ උත්සවය.

2010 2010.11.18 හම්බන්තොට මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය උත්සවාකාරයෙන් විවෘත කිරීම.

2010 ජයබහළු පර්යන්තයේ බහළු මිලියන 02 ක් මෙහෙයුම් කිරීම.

2010 කොළඹ වරායේ බහළු මිලියන 04 ක් මෙහෙයුම් කිරීම.

2011 නව ග්‍රැන්ට් දොඹකර 06 ක් සහ හුවමාරු දොඹකර 30 ක් වරායට ගෙන ඒම.

2011 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කොළඹ පිහිටි තෙල් පර්යන්තයේ ධාරිතාවය වැඩිකිරීම.

2011 පර්යන්ත ට්‍රැක්ටර් 50 ක් වරායේ සේවය සඳහා යෙදවීම.

2011 කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය යටතේ සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) සඳහා ගිවිසුම අත්සන් කිරීම.

2011 නව ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ පස් පිඩැලි කැපීමේ උත්සවය පැවැත්වීම.

2011 දකුණු බහළු පර්යන්තයේ ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීම සඳහා පස් පිඩැලි කැපීමේ උත්සවය පැවැත්වීම.

2012 මාගම් රුහුණුපුර මහින්ද රාජපක්‍ෂ වරායේ රෝ - රෝ නෞකා මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම

2012 බ්ලුමැන්ඩල් තෙල් ටැංකි සංකීර්ණයේ සිට කොළඹ වරාය දක්වා වූ ඉතා අබලන් තත්ත්වයේ පවතින ඉන්ධන නළ මාර්ගය නැවත එලීම.

2013 කිලෝ මීටර් 6.8 අතිවිශාල දියකඩනය සහ සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) සමඟ කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය උත්සවාකාරයෙන් ආරම්භ කිරීම.

2013 ඔලුවිල් වරාය උත්සවාකාරයෙන් ආරම්භ කිරීම.

2013 නැව්බඩු කළමනාකරණ පද්ධතියේ ආනයන පූර්ණ බහළු පැටවුම් මොඩියුලය ක්‍රියාත්මක කිරීම.

2013 මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ පරිපාලන ගොඩනැගිල්ල උත්සවාකාරයෙන් විවෘත කිරීම.

2014 මාගම් රුහුණුපර මහින්ද රාජපක්ෂ වරායේ නැව් තෙල් සැපයීමේ පහසුකම් සහ තෙල් ටැංකි සංකීර්ණය උත්සවාකාරයෙන් විවෘත කිරීම.

2014 කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම.

2015 නැගෙනහිර බහළු පර්යන්තය උත්සවාකාරයෙන් විවෘත කිරීම.

2015 තත්ත්ව කළමනාකරන පද්ධතිය සඳහා ISO 9001 – 2008 තත්ත්ව සහතිකය ලබා ගැනීම.

2015 මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය දෙවන අදියරෙහි වරාය ද්‍රෝණියේ කරදියවර පිරවීමේ මංගල්‍යය පැවැත්වීම.

2015 කොළඹ වරාය තුල බහළු විස්සේ සම ඒකක මිලියන 05 මෙහෙයවීම.

2016 CFS 1මෙහෙයුම් මධ්‍යස්ථානය ප්‍රති ස්ථාපිත කිරීම. (2016.08.10)

2016 යන්ත්‍රෝපකරණ වැඩ ඉංජිනේරු කොට්ඨාශය මගින් ජයබහළු පර්යන්තයේ උසින් අඩු නව ට්‍රේලරයක් නිෂ්පාදනය කිරීම. (2016.08.31)

2016 විශාලතම බහළු නෞකාව වන MSC Maya කොළඹ වරායේ, කොළඹ ජාත්‍යන්තර බහළු පර්යන්තය වෙත පැමිණීම. (2016.09.16)

2017 **පූර්ණ වශයෙන් නැවත ඉදි කරන ලද බහළු මෙහෙයුම් මධ්‍යස්ථානයේ 01-(**CFS-01) **මෙහෙයුම් ආරම්භ කිරීම (2017.05.31)**.

**2017 හම්බන්තොට වරායේ වරාය මෙහෙයුම් සඳහා චීනය සහ ශ්‍රී ලංකාව අතර සහන ගිවිසුම අත්සන් කිරීම (2017.07.29)**.

**2017 19 වැනි Internaltional Network of Affliated Ports (INAP) සම්මන්ත්‍රණය පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය අනුග්‍රහය දැක්වීම. (2017.11.07-08)**.

**2017 හම්බන්තොට වරායේ කොටස්කරුවන්ගේ ගිවිසුම (Shareholders Agreement) සහ ඉඩම බදු දීමේ ගිවිසුම (Land Lease Agreeement) අත්සන් කිරීම (2017.12.08)**.

**2017 ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ චයිනා මර්චන්ට් හෝල්ඩින්ස් සමාගම අතර හම්බන්තොට වරාය සහන ගිවිසුම යටතේ පළමු ගෙවීම සිදු කිරීම (2017.12.09)**.

**2017 කොළඹ වරාය විසින් විස්සේ සම ඒකක මිලියන 06 ක් මෙහෙයවීම (2017.12.20)**.



# මෙහෙයුම් සමාලෝචනය

# වාර්ෂික වාර්තාව 2017

# කොට්ඨාශයන්හි කාර්යසාධනය

## මෙහෙයුම් සේවා

### මෙහෙයුම් කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෙහෙයුම් කොට්ඨාශය විසින් 2017 වසරේ දී අත් කරගත් ඵලදායිතා තත්ත්වයන් තවදුරටත් වර්ධනය කරගැනීමට සහ ජය බහළු පර්යන්තය විසින් මෙහෙයවන බහළු ධාරිතාවය තවත් ඉහළ නැංවීම සඳහා පහත සඳහන් කටයුතු ක්‍රියාත්මක කරන ලදි.

- ජාත්‍යන්තර නැව් සේවාවන් අපේක්ෂා කරන පරිදි උසස් සේවාවක් ලබාදෙන අයුරු සහ තරඟකාරි ව්‍යාපාර පරිසරයක සාර්ථකත්වය අත්පත් කරගන්නේ කෙසේද යන්න පිළිබඳ සේවකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් අඛණ්ඩව පවත්වන ලදී. මෙම වැඩසටහන් තුළ 2017 වසරේ සහ ඉදිරි වර්ෂ තුළ ජය බහළු පර්යන්තය මුහුණදෙන අභියෝගයන් ජයගන්නා ආකාරය පිළිබඳව ද සාකච්ඡා කරන ලදී.

- 2017 වසරේ කාර්යක්ෂම සහ ඵලදායී පර්යන්ත මෙහෙයුම් සඳහා කණ්ඩායම් හැඟීමෙන් ක්‍රියා කරන සේවකයන් බවට පත්කිරීමේ අරමුණින් සහකාර ඒකක අධිකාරීවරුන්, කාර්යාල රියදුරන්, අංගණ සහායකවරුන් සහ රබර් ටයර් යෙදූ ගැන්ට්‍රි දොඹකර ක්‍රියාකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ජය බහළු පර්යන්තය විසින් පවත්වන ලදී.

- සේවකයින් නිකරුණේ ගත කරන කාලය අවම කිරීම සඳහා නිලධාරින්ගේ සෘජු අධීක්ෂණය යටතේ උපකරණ හුවමාරුව පර්යන්තයේදී, ජැටියේදී/අංගණයේදී පමණක් සිදු වන බව සහ බහළු මෙහෙයුම් උපකරණ මෙහෙයවන්නන් විසින් සිදු කරන බවට සහතික කිරීම සඳහා ක්‍රියාවලියක් ක්‍රියාත්මක කර ඇත. මෙම ක්‍රියාවලිය අඛණ්ඩව අධීක්ෂණය කරන අතර ඵලදායීතාවය සහ ධාරිතාවය ඉහළ නැංවීම සඳහා වසර පුරාම ක්‍රියාත්මක වේ.

- අන්තර්-පර්යන්ත හුවමාරු (ITT) මෙහෙයුම් කටයුතු විධිමත් කිරීම සහ ප්‍රතිනැව්ගත කිරීම් සහ දේශීය නැව් බඩු සඳහා අංගණය උපරිම ලෙස භාවිතා කිරීම සඳහා අංගණය එකම ඒකකයක් ලෙස සලකා කාර්යක්‍ෂම සහ ඵලදායී අංගණ කළමනාකරණයක් සිදු කිරීම මඟින් 2017 වසරේ මුල් කාර්තුව තුළ අංගණ සැලසුම් පිළිබඳ විශාල වෙනසක් පර්යන්තය තුළ සිදු කරන ලද අතර අවශ්‍ය අවස්ථාවන් වලදී අංගණ දොඹකර යෙදවීම මඟින් පර්යන්ත ප්‍රවේශය (terminal velocity) අවශ්‍ය මට්ටමින් පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී.

- 2017 වර්ෂයේ දෙවන කාර්තුවේ සිට අංගණ කාර්යක්‍ෂමතාවය ධනාත්මකව ඉහළ නැංවීමට පැදකවූ ප්‍රයිම් මූවර්/ රබර් ටයර් සහිත ගැන්ට්‍රි දොඹකර පහසුවෙන් ක්‍රියාකරවීමට හැකිවනු පිණිස අංගණයේ අඩුක්කු කිරීමේ (හිස්/පූර්ණ බහළු) ප්‍රදේශය ඇතුළුව ජැටි පෙදෙස, මාර්ග සහ ප්‍රතිසංස්කරණය කරන ලදී.

- ප්‍රධාන නැව් සේවාවන් සඳහා දොඹකර ඵලදායීතාවය (පැයකට බහළු මෙහෙයුම්) 2017 වසරේදී 27.20 වූ අතර 2016 වසරේදී එය 26.31 වාර්තා කළ අතර මෙය වසරින් වසර 3.4% ක වර්ධනයක් වූ අතර පෝෂක සේවාවන් සඳහා (පැයකට බහළු මෙහෙයුම්) 2017 වසරේ

24.28 ක් වූ අතර 2016 වසරේදී මෙම අගය 22.21 කි. මෙය වසරින් වසර 9.3% ක වර්ධනයකි.

- ප්‍රධාන පෙළේ නෞකා සේවාවන්ගේ (MSC, EMC, ZIM, HHM, KMT) විවිධ අංශයන්හි කාර්යක්ෂම සම්බන්ධතාවයක් ලබා ගැනීමේ සහ අතිරේක ආදායමක් උපයා ගැනීමේ අරමුණින් 2017 වසරේදී හිස් බහළු තටාක මෙහෙයුම්කරුවන් හඳුන්වාදෙන ලදී.

- හුවමාරු දොඹකර ක්‍රියාකරවන්නියන් රබර් ටයර් යෙදූ ගැන්ට්‍රි දොඹකර ක්‍රියාකරවීම සඳහා දිවා කාලය තුළ පර්යන්ත අංගණයේ යෙදවූ අතර ඔවුන්ගේ කුසලතා සහ සේවාවන්ගේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම උදෙසා හඳුන්වාදීමේ සහ දැනුවත්කිරීමේ වැඩසටහන් සාර්ථකව පවත්වන ලදී.

- සාම්ප්‍රදායික නැව්බඩු මෙහෙයුම් පර්යන්තයන්හි ගොඩබෑ සමස්ත තොග නැව් බඩු ටොන් ප්‍රමාණයද (බහළු නොවන) 2016 වර්ෂයේ ටොන් 8,089,000 සිට 2017 වසරේදී ටොන් 9,074,000 දක්වා ඉහළ ගිය අතර මෙය වසරින් වසර 11% ක ඉහළ යෑමකි.

- ද්‍රව තොග නැව්බඩු පැටවීම් වල 2016 වසරේදී ටොන් 92,000 සිට 2017 වසරේදී ටොන් 106,000 දක්වා වසරින් වසර 15.2% ක වැඩිවීමක් සිදු වූ අතර තොග කඩන නැව්බඩු පැටවීම් වල 2016 වසරේදී ටොන් 16,000 සිට 2017 වසරේදී ටොන් 29,000 දක්වා ඉහළ ගිය අතර මෙය වසරින් වසර 81.3% වැඩි වීමකි.

## සේවා සැපයුම් කොට්ඨාශය

සේවා සැපයුම් කොට්ඨාශයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ වරායට ගොඩබාන පූර්ණ බහළු පැටවුම් (FCL), අර්ධ පූර්ණ බහළු පැටවුම් (LCL), තොගකඩන, තොග ඇසුරුම් සහ මෝටර් රථ හා ව්‍යාපෘති නැව්බඩු ඇතුළු නැව්බඩු සියළු නැව්බඩු කාර්යක්ෂමව බෙදාහැරීමේ සහ ගණුදෙනුකරුවන් හට නැව්බඩු ආශ්‍රිත සේවා සැපයීමේ කටයුතු මෙහෙයවීම වේ.

2017 වසර තුළදී ද දවසේ පැය 24 පුරා සේවා සැපයීම තුළින් පූර්ණ බහළු විස්සේ සම ඒකක 191,966 ක් සෘජුවම බෙදාහරින ලද අතර පාරිභෝගික මධ්‍යස්ථානය මගින් එමගින් රුපියල් මිලියන 23,411.84ක ආදායමක් උපයාගන්නා ලදී. ගණුදෙනුකරුවන් හට සපයන සේවා පුළුල් කිරීමට සහ ලේඛන කටයුතු සඳහා වැය කරන කාලය අවම කිරීමට නැව්බඩු කළමනාකරණ පද්ධතිය සාර්ථකව භාවිතා කරන ලදී.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අර්ධ පූර්ණ බහළු විස්සේ සම ඒකක 27,740ක් සහ ප්‍රතිනැව්ගත බහළු විස්සේ සම ඒකක 740 ක් මෙහෙයවන ලදී. මේ අතුරින් විස්සේ සම ඒකක 8,164ක් සාමාන්‍ය/අන්තරාදායක නැව්බඩු වූ අතර, ගොඩබෑමේ මෙහෙයුම් සඳහා පැලියගොඩ බහළු මෙහෙයුම් මධ්‍යස්ථානයේ දී විස්සේ සම ඒකක 1,086ක පුද්ගල නැව්බඩු මෙහෙයවන ලද අතර, දේශීය, ප්‍රතිනැව්ගත, විවිධ රාජ්‍ය සඳහා නැව්බඩු එකලස් කිරීමේ මෙහෙයුම් (MCC) සඳහා සහ විශේෂ නැව්බඩු සඳහා වරායෙහි ගුදම්වල ඉඩ පහසුකම් සලසන ලදී. අර්ධ පූර්ණ බහළු ගොඩබෑම් සහ පැටවීම් ගාස්තු මගින් පිළිවෙලින් රුපියල් මිලියන 205.1 ක් සහ රුපියල් මිලියන 2,440.5 ක් උපයා ඇත. බහුරාජ්‍ය සඳහා නැව්බඩු එක්රැස් කිරීම මගින් රුපියල් මිලියන 173.82 ක් උපයා ඇත. මීට අමතරව, හිස් බහළු සඳහා ප්‍රමාද ගාස්තු සහ බහළුවල වර්ගය වෙනස්වීම වෙනුවෙන් අය කරන ගාස්තු ලෙස රුපියල් මිලියන 13 ක ආදායමක් උපයා ඇත.

බහළු මෙහෙයුම් මධ්‍යස්ථානය V (CFS-V) අළුත්වැඩියා කිරීම මගින් බැඳුම්කර නැව්බඩු සඳහා ගුදම් පහසුකම් දියුණු කිරීමත් සමඟ බැඳුම්කර ආයාත නිර්යාත සඳහා ඉල්ලුම වැඩි වූ අතර, එමගින් රුපියල් මිලියන 77.35ක සම්පූර්ණ ආදායමක් උපයා ඇත.

අත්හැර දැමූ නැව්බඩු බැහැර කිරීම සඳහා ප්‍රසිද්ධ ටෙන්ඩර් සහ වෙන්දේසි මගින් රුපියල් මිලියන 131.69ක ආදායමක් උපයාගෙන ඇති අතර, සී/ස ශ්‍රී ලංකා වරාය කළමනාකරණ සහ උපදේශක සේවා ආයතනය මගින් අබලි යකඩ, ඉවතලන තෙල් සහ පාවිච්චිකරන ලද ටයර් විකිණීමෙන් රුපියල් මිලියන 8.7ක අතිරික්ත ආදායමක් උපයා ඇත.

මෙම වසර තුළ දී, නිශ්කාෂන ඒජන්සි ආයතනවලට නව බලපත්‍ර 243ක් නිකුත්කරන ලද අතර, බලපත්‍ර 1,046ක් අළුත්කිරීමෙන් සමස්ත බලපත්‍ර 1,289ක් සඳහා රුපියල් මිලියන 25.33ක ආදායමක් උපයා ඇත. “ඒ” සහ “බී” බාණ්ඩයේ වාප්පු ලිපිකරුවන් හට වාප්පු හැඳුනුම්පත් නිකුත් කිරීමෙන් සහ අළුත්කිරීමෙන් රුපියල් මිලියන 8.67ක ආදායමක් උපයා ඇත. වසර තුළ නිකුත්කරන ලද සහ අළුත්කරන ලද “ඒ ” බාණ්ඩයේ බලපත්‍ර සංඛ්‍යාව 2,631ක් ලෙස වාර්තා වී ඇති අතර, “බී” බාණ්ඩයේ බලපත්‍ර 302ක් නිකුත් කරන ලදී.

2017 වසර තුළ දී සේවා සැපයුම් කොට්ඨාශය විසින් සපයන ලද සේවාවන් තුළින් උපයන ලද සමස්ත ආදායම රුපියල් මිලියන 5,691.37කි.

2017 වසර තුළ දී ප්‍රේෂණලාභීන් විසින් ගාස්තු සහන සඳහා වරාය හා නාවික අමාත්‍යාංශය හරහා ඉදිරිපත් කෙරුණු ඉල්ලුම්පත්‍ර 59න් 22ක් නිර්දේශ කරන ලද අතර, 16ක් ප්‍රතික්ෂේප කරන ලදී. ඉතිරි ඉල්ලුම්පත් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු අමාත්‍යාංශයේ තීරණයන්ට යටත්ව සිදු කරනු ඇත.

අර්ධ පූර්ණ බහළුගත නැව්බඩු හා ඍජුව භාරදෙන නැව්බඩු වලට අදාල ලේඛන විද්‍යුත් මාර්ගයෙන් භාරදීම 2017 වර්ෂය තුළදී පුළුල් කිරීමට පියවර ගනු ලබමින් පවතී. 2018 වර්ෂය තුළදි මෙය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වනු ඇත.

**2017 වසර තුළ සිදුකළ වැඩි දියුණු කිරීම් හා සංවර්ධන කටයුතු**

- වඩා ඵලදායී සහ කාර්යක්ෂම සේවාවක් ලබාදීමේ අරමුණින් බණ්ඩාරනායක ජැටියේ I,II,III සහ IV යන ගුදම්, සේවා සැපයුම් කොට්ඨාශයේ විෂය ක්ෂේත්‍රය යටතේ ඒකාබද්ධ කරන ලදී.

- වඩාත් පිරිවැය ඵලදායී සහ කාර්යක්ෂම බහළු ගොඩබෑම් මෙහෙයුම් සිදුකිරීම සඳහා සමර්හිල්හි පිහිටි රථවාහන අංගණය සමගි බහළු පර්යන්ත (UCT) අංගණය වෙත ගෙනයන ලදී.

- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පාරිභෝගිකයන් හට වඩා හොඳ සේවාවක් ලබා දීමේ අරමුණින් පාරිභෝගික පැමිණිලි සහ දුක්ගැනවිලි පිළිබඳ කටයුතු කිරීම සඳහා පාරිභෝගික සේවා මධ්‍යස්ථානයක් කැනල් අංගණයේ ස්ථාපිත කරන ලදී.

- තොරතුරු පද්ධති කොට්ඨාශය සහ ඇක්සස් පුද්ගලික සමාගම් කණ්ඩායමත් සමඟ ඒකාබද්ධව නේවිස් අර්ධ පූර්ණ බහළු පද්ධතියක් සකස්කිරීමට කටයුතු සිදුකරන ලදී.

- නැව්බඩු වල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා බණ්ඩාරනායක ජැටියේ ගුදම් තුළ ආරක්ෂක කැමරා (CCTV) පද්ධතියක් සවිකිරීමේ කටයුතු සිදු වෙමින් පවතී.
- ගුදම ඉදිකිරීමේ කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් කිරීමෙන් අනතුරුව CFS I ගුදම නිල වශයෙන් විවෘත කිරීම.
- CFS I ගුදමේ ගුදම් කළමනාකරණ පද්ධතිය ආරම්භ කරනු ඇත.
- සමගි බහළු පර්යන්තයට යාබදව සියළු පහසුකම් සහිත අංග සම්පූර්ණ සේවා සැපයුම් මධ්‍යස්ථානයක් ඉදි කිරීමට මූලික පියවරට අදාළ කටයුතු සිදු වෙමින් පවතී.

## නාවික කොට්ඨාශය

**නියමු සේවා**

සමාලෝචිත වසර තුළ දී කොළඹ වරායට පැමිණි සියළුම වර්ගයේ යාත්‍රා සඳහා සතියේ සෑම දිනකම පැය 24 පුරා නියමු සේවා සපයන ලදී.

| **නෞකා වර්ගය** | **නෞකා සංඛ්‍යාව** | **පැමිණි කාර්යය** | **නෞකා සංඛ්‍යාව** |
|---|---|---|---|
| බහළු | 3,683 | නැව් තෙල් සැපයීම | 44 |
| සාම්ප්‍රදායික | 56 | අළුත් වැඩියා කටයුතු සිදුකිරීම | 58 |
| වියළි තොග | 157 | මගී ප්‍රවාහනය | 44 |
| ද්‍රව තොග | 210 | වෙනත් සේවා සැපයීම් | 08 |
| රෝල් ඔන් රෝල් ඕෆ් | 67 | රෝල් ඔන් රෝල් ඕෆ් | |
| **වෙනත් නැව්බඩු** | 02 | | |
| **එකතුව** | | | **4,329** |

**ප්‍රධාන ටග් යාත්‍රාපති අංශය (CMT)**

සමාලෝචිත වර්ෂය තුළ ප්‍රධාන ටග් යාත්‍රාපති අංශය මගින් නෞකා සඳහා අඛණ්ඩ සහ කාර්යක්ෂම ටග් සේවාවක් ලබාදීම තුලින් සාර්ථක මෙහෙවරක් ඉටුකරන ලදී. මෙයට අමතරව, පහත සඳහන් කටයුතු ද ඉටුකරනු ලැබීය.

- රුවල් යාත්‍රා නැංගුරම් ලෑම සඳහා මෙහෙයුම් ටග් යාත්‍රා ලබාදීම
- වර්ගීකරණ අවශ්‍යතාවයනට හා අනුකූලව යාත්‍රාවල තට්ටු (ඩෙක්) අළුත්වැඩියා කිරීම සහ ටග් යාත්‍රාවල නඩත්තු කටයුතු කරගෙන යාම.
- ඉවත ලන නැව් බඳින කඹ වලින් ටග් යාත්‍රා සඳහා ලණු පැදුරු නිෂ්පාදනය කිරීම සහ ටග් යාත්‍රා සඳහා කැන්වස් වියන් නිෂ්පාදනය කිරීම.

නෞකා එහා මෙහා ගෙනයෑම සඳහා ප්‍රමාණවත් ටග් යාත්‍රා සංඛ්‍යාවක් දෛනිකව යෙදවූ අතර හදිසි අවශ්‍යතාවයන් සඳහා එක් ටග් යාත්‍රාවක් පොරොත්තු සේවයේ යොදවන ලදී.

**ටග් යාත්‍රා සඳහා සේවයේ යෙදවූ මුළු නෞකා ගණන**

නැංගුරම්ලැමේ ටග් යාත්‍රා මගින් නෞකා එහා මෙහා ගෙනයන ලද මුළු වාර ගණන 18,684ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

| ටග් යාත්‍රාවේ නම | වාර ගණන |
|---|---|
| රාජා මෝටර් යාත්‍රාව | 484 |
| නන්දිමිත්‍ර මෝටර් යාත්‍රාව (55 BP) | 3,217 |
| සුරනිමල මෝටර් යාත්‍රාව (65BP) | 2,983 |
| ගෝඨයිම්බර මෝටර් යාත්‍රාව (65BP) | 2,194 |
| විජයබාහු මෝටර් යාත්‍රාව | 1,700 |
| බරණ -II මෝටර් යාත්‍රාව | 43 |
| අයිරාවණ මෝටර් යාත්‍රාව | 931 |
| වරුණ මෝටර් යාත්‍රාව | 1,382 |
| රාවණා මෝටර් යාත්‍රාව | 2,893 |
| පණ්ඩුකාභය මෝටර් යාත්‍රාව | 2,857 |
| **එකතුව** | **18,684** |

**ආදායම් විස්තර - ටග් සේවා (කොළඹ වරාය)**

| වර්ෂය | රු: මිලියන |
|---|---|
| 2016 සත්‍ය ආදායම | 863 |
| 2017 ප්‍රතිශෝධිත ආදායම | 1,332 |
| 2018 ප්‍රක්ෂේපිත ආදායම | 1,236 |

**ප්‍රධාන ඉංජිනේරු නිලධාරි අංශය**

සියළුම ටග් යාත්‍රා, නියමු සහ මුවරිං දියත් යාත්‍රාවල මෙහෙයුම් හා අළුත්වැඩියා අවශ්‍යතාවයන් ඉටු කිරීම සඳහා 2017 වසරේදී අවශ්‍ය ප්‍රමාණයට සේවකයින් සේවයෙහි යොදවා ඇත.

යාත්‍රා ඇදගෙන යාම, නියමු කටයුතු හා මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය කරන යාත්‍රා දෛනික ගමන්වාර වල යෙදවීමට අමතරව මෙම අංශයේ කාර්ය මණ්ඩලය විසින් සුපුරුදු නඩත්තු කටයුතු ද සිදුකරන ලදී.

**වරාය ගිනි නිවීමේ ඒකකය (PFB)**

වරාය ගිනි නිවීමේ ඒකකය මගින් 2017 වර්ෂය තුළ දී, කාර්යක්ෂමව හදිසි සේවා අවශ්‍යතා සපුරාලීමට කටයුතු කරන ලද අතර ගිනි ආරක්ෂණ ප්‍රමිතීන් පවත්වාගෙන යමින් ගිනි නිවීම සහ වෙනත් හදිසි අවශ්‍යතාවයන්ගේ අයහපත් බලපෑම් අවම කිරීමට කටයුතු කරන ලදී.

සමාලෝචිත වර්ෂය තුළ වරාය ගිනි නිවීම් ඒකකය විසින් පහත සඳහන් සේවාවන් ඉටු කරන ලදී.

| | |
|---|---|
| ගිනි නිවීම සඳහා ප්‍රතිචාර | 30 |
| නාවික හමුදා පෙරහුරු කැඳවීම් | 02 |
| හදිසි කැඳවීම් | 23 |
| තෙල් නැව් සඳහා පොරොත්තු රාජකාරි | 191 |
| ගෑස් නැව් සඳහා පොරොත්තු රාජකාරි | 44 |
| නැව්වල අධිතාප වැඩ සඳහා පොරොත්තු රාජකාරි | 837 |
| අන්තරාදායක නැව්බඩු මෙහෙයවීමේ පොරොත්තු රාජකාරි | 01 |
| ජැටි/ගුදම් ආදිය සේදීම සඳහා ජලය සැපයීම | 26 |
| ජලය පිටතට පොම්ප කිරීම | 02 |
| තෙල් දූෂණය පාලනය කිරීමේ කාර්යයන් | 14 |
| තෙල් නැව් පරීක්ෂණ චාරිකා | 690 |
| ගිනි නිවීම සඳහා ටග් යාත්‍රා වෙත ජල බවුසර් සැපයීම | 126 |
| හදිසි අවස්ථාවන්හිදී පුද්ගලයන් ඉවත් කිරීමේ පෙරහුරු | 12 |

**ගිනි ආරක්ෂණ ක්‍රියාකාරකම්**

- සියළුම ගොඩනැගිලි/දොඹකර/යාත්‍රා/ප්‍රයිමුවර් රථ ආදියේ ගිනි ආරක්ෂණ උපකරණ පරීක්ෂා කිරීම් සිදු කරන ලදී.
- කොළඹ වරායේ සහ ගාලු වරායේ ගිනි නිවීමේ උපකරණ වසරකට දෙවරක් පරීක්ෂා කල අතර ප්‍රදීපාගාර සහ සංචාරක බංගලාවන්හි සවිකරණ ලද ගිනි නිවන උපකරණ වසරකට එක් වරක් පරීක්ෂා කරන ලදී.
- වසර තුළ ගිනි නිවීමේ උපකරණ 3,206 ක් පරීක්ෂා කරන ලදී.
- ඩොක්යාඩ් ගිනි නිවීමේ ඒකකය සමඟ ඒකාබද්ධව කොළඹ ඩොක්යාඩ්හිදී (Colombo Dockyard) ගින්නක් හට ගෙන ඇති බව මවාපාමින් ගිනි නිවීමේ අභ්‍යාසයක් පවත්වන ලදී.
- තෙල් බැංකුවේ කොළඹ ගිනි නිවන හමුදාව සමඟ ඒකාබද්ධව තෙල් බැංකුවේ ගිනි ගැනීමක් මවා පාමින් ගිනි නිවීමේ අභ්‍යාසයක් පවත්වන ලදී.

- සමුද්‍ර දූෂණය වැලැක්වීම සඳහා වන ජාතික සැලසුම(NOSCOP) සක්‍රීය කරමින් වරායේ තෙල් කාන්දුවක් ඇති වීම මවා පාමින් සමුද්‍රීය පරිසර දූෂණ අධිකාරිය (MEPA) සමඟ ඒකාබද්ධව තෙල් දූෂණය වැලැක්වීමේ අභ්‍යාසයක් පවත්වන ලදී.

- සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් සමාගමේ (SAGT) සේවක මණ්ඩලය හා ඒකාබද්ධව එහි ගිනි ගැනීමක් මවා පාමින් ගිනි නිවීමේ අභ්‍යාසයක් පවත්වන ලදී.

- වායු නෞකාවක සේවක මණ්ඩලය හා ඒකාබද්ධව ගෑස් නෞකාවක කෘතිම ගින්නක් ඇති කර ගිනි නිවීමේ අභ්‍යාසයක් පවත්වන ලදී.

2017 වර්ෂය තුළ වරාය ගිනි නිවීම් ඒකකය විසින් උපයන ලද ආදායම පහත දැක්වේ

| **විස්තරය** | **ඇ.එ.ජ.ඩො.** | **රුපියල්** |
|---|---|---|
| ගිනි නිවීම් සඳහා කැඳවීම් | 59,424 | 3,861,500 |
| තෙල් නැව් සඳහා පොරොත්තු රාජකාරි | 249,597 | |
| ගෑස් නැව් සඳහා පොරොත්තු රාජකාරි | 61,780 | |
| අධිතාප වැඩ සඳහා අයකිරීම් | 50,613 | |
| අන්තරාදායක නැව්බඩු සඳහා පොරොත්තු රාජකාරි | 38,440 | 126,000 |
| පරීක්ෂණ චාරිකා සඳහා අයකිරීම් | 8,240 | |
| තෙල් දූෂණ පාලනය සඳහා අයකිරීම් | 4,680 | 694,500 |
| හදිසි අවස්ථා | 1,440 | 20,000 |
| **මුළු ආදායම** | **474,214** | **4,702,000** |

**වරාය නිරාපද අංශය**

වරාය නිරාපද අංශය මගින් වරාය තුළ මෙහෙයවන සියළුම වර්ගයේ අන්තරාදායක නැව්බඩු පිළිබඳ වාර්තා තබා ගනිමින්, ආරක්ෂක මෙහෙයුම් ක්‍රියාවලිය නිරතුරුවම ක්‍රියාත්මක වන බවට සහතික වනු ලැබේ.

රසායනික ද්‍රව්‍ය ගලායෑම් සහ ගිනි ගැනීමේ සිද්ධීන් ගණනාවක් වරාය ගිනි නිවීම් ඒකකයේ සහයෝගයෙන් මැඩ පවත්වන ලදී. එමෙන්ම, අන්තරාදායක නැව්බඩු ගුදම් ඇතුළුව සාමාන්‍ය ගුදම් සහ බහළු පරීක්ෂා කිරීමේ කටයුතු ද කාලානුරූපව සිදුකරනු ලැබීය.

අධිතාප වැඩ සඳහා අවසර ලබාදීමට ප්‍රථම වැඩබිම් පරීක්ෂාව සිදුකළ අතර අනවසර අධිතාප වැඩ අනාවරණය කරගෙන ඒවා නවත්වන ලදී. තවද, සමුද්‍ර දූෂණ සම්බන්ධයෙන් ද පරීක්ෂාවන් සිදුකරන ලදී. සේවක හා සමුද්‍රීය පරිසරය සම්බන්ධයෙන් ඇතිවූ හදිසි අනතුරු පිළිබඳ විමර්ශන හා විශ්ලේෂණද සිදු කරන ලදී.

- 2017 වසර තුළ කොළඹ වරාය අනතුරුදායක නැව්බඩු (dangerous cargo) මෙ.ටො. 347,016.913 ක් මෙහෙයුම් කර ඇත.

- අන්තරායකාරී (Hazardous) ප්‍රතිඅපනයන නැව්බඩු ප්‍රවාහනය කරන බහළු 34,448 ක් මෙහෙයවන ලදී.

- මෙහෙයුම් කොට්ඨාශයයේ සේවකයින් සඳහා පැවැත්වූ පුහුණු සැසි හා දේශන තුලින් වරාය තුළ අන්තරාදායක නැව්බඩු මෙහෙයවීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම සහ ඊට අදාළ ආරක්‍ෂක ක්‍රියා මාර්ග හඳුන්වාදෙන ලදී.

- අධි පුපුරණ ද්‍රව්‍ය (GPIE) මෙ.ටො. 14,750 ක් සහ පුපුරණ ස්වභාවයේ ද්‍රව්‍ය (GPIAE/IIE) මෙ.ටො. 9,604.546 ක් මෙහෙයුම් කර ඇත.

- ජය බහළු පර්යන්තයේ සේවකයින්ගේ සහ නාවික කොට්ඨාශයට අනුයුක්ත යාත්‍රා බැඳ තැබීමේ නියුතු කම්කරුවන්ගේ පුද්ගලික ආරක්ෂාව සහකාර වරාය නිරාපද පරීක්ෂකයින්ගේ සහාය ඇතිව අධීක්‍ෂණය කරන ලද අතර, පුද්ගල ආරක්‍ෂණ උපකරණ භාවිතය පිළිබඳ දැනුවත්වීම ඉහළ නංවන ලදී.

විවිධ වර්ගයේ තෙල් නැව් 314ක් කොළඹ වරායට පැමිණි අතර පහත දැක්වෙන පරිදි තෙල්/වායු ආදී භාණ්ඩ ගොඩබාන ලදී.

| නැව් භාණ්ඩ වර්ගය | ප්‍රමාණය (මෙ.ටො) |
|---|---|
| ද්‍රව පෙට්‍රෝලියම් වායු | 384,912.179 |
| ගෑස් ඔයිල්/ජෙට් AI/ගැසොලින්/භූමිතෙල් | 3,159,572.857 |
| බොර තෙල් | 1,594,813.000 |
| ඉන්ධන තෙල් | 955,500.236 |
| ලිහිසි තෙල් | 24,203.387 |

**වෙරළ ප්‍රදීපාගාර අංශය**

ජාත්‍යන්තර නෞකා මාර්ගයන් හරහා විහිදෙන බස්නාහිර සහ දකුණු වෙරළ තීරය දිගේ පිහිටුවා ඇති ප්‍රදීපාගාර නිසි පරිදි නඩත්තු කිරීම සිදු කරන ලදී.

**ප්‍රවේශ ඇළ මාර්ගයන්හි ස්ථාපිත ආලෝක බෝයා**

ආලෝක බෝයා නිරන්තරයෙන් පරීක්‍ෂාකොට නඩත්තු කිරීම් සිදුකරන ලදී.

**ආදායම - ප්‍රදීපාගාර ගාස්තු (වරායයන් තුනෙහි)**

| | 2015<br>තත්‍ය ආදායම<br>රු.මිලියන | 2016<br>තත්‍ය ආදායම<br>රු.මිලියන | 2017<br>අයවැය<br>(ප්‍රතිශෝධිත)<br>රු.මිලියන |
|---|---|---|---|
| ආදායම - ප්‍රදීපාගාර ගාස්තු | 779 | 1,009 | 1,416 |

**වරාය යාත්‍රා අංශය**

වරාය යාත්‍රා අංශයේ කාර්යය වන්නේ ප්‍රධාන වශයෙන් කොළඹ වරායට පැමිණෙන නෞකා ආරක්ෂිතව බැඳ තැබීම/මුදා හැරීමට සහාය වීම පහසු කරවීම සඳහා නියමු දියත් යාත්‍රා සඳහා යාත්‍රා බැඳ තැබීමේ කණ්ඩායම් සැපයීම, දුපත් දියකඩනය, නිරිත දිග දියකඩනය වෙත විවිධ වැඩ කණ්ඩායම් ප්‍රවාහනය කිරීම, වරාය තුළ ජලය පිරිසිදුව තබා ගැනීම සහ ජිරාෆ් පාවෙන දොඹකර මගින් විශාල බර එසවීම් මෙහෙයවීම වේ. නියමු දියත් යාත්‍රාවල සහ මුවරින් දියත් යාත්‍රාවල දෛනික නඩත්තු කටයුතුද සාර්ථකව සිදු කරන ලදී.

**ජල ශාස්ත්‍රීය සමීක්ෂණ අංශය**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මෙහෙයුම් කරනු ලබන සියළුම වරායයන්හි ජල ශාස්ත්‍රීය සමීක්ෂණ මෙන්ම වරායේ අදාළ කොට්ඨාශයන් මගින් කරනු ලබන ඉල්ලීම් අනුව සිදු කෙරෙන සියළුම ඉඩම් මැනීම් කටයුතු මිනින්දෝරුවන් විසින් පහත සඳහන් වන පරිදි සිදු කරන ලදී.

**කොළඹ වරාය**

- ප්‍රවේශ ඇළ මාර්ගයේ ධ්වනි ගැඹුර මැනීම.
- දකුණු වරායේ ධ්වනි ගැඹුර මැනීම.
- ප්‍රධාන ප්‍රවේශ ඇළ මාර්ගයේ ගැඹුර මැනීම.
- ඇතුල් වරාය ද්‍රෝණියේ හා නැංගුරම් පොලවල ධ්වනි ගැඹුර මැනීම.
- ප්‍රවේශ ඇළ මාර්ගයේ බෝයාවන්ගේ පිහිටීම පිළිබඳ මිනුම් කටයුතු කිරීම.
- කොළඹ වරාය සිතියම සංශෝධනය කිරීම.
- වරාය අභ්‍යන්තර මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ මිනුම් කටයුතු සහ තල මිතික කටයුතු කිරීම.
- කල්බදු ගිවිසුම් සඳහා අවශ්‍ය මිනුම් කටයුතු සහ සැලසුම් කටයුතු කිරීම.

**ගාල්ල වරාය**

- උදම් සහ මිනුම් අධ්‍යයන විද්‍යා දත්ත මධ්‍යස්ථානයක් පිහිටුවීම.
- "බිම්සවිය" වැඩ සටහනට හා අදාළ කමිටු රැස්වීම්වලට සහභාගී වීම.
- රුවල් නැව් යාත්‍රා මධ්‍යස්ථාන හැරුම් ප්‍රදේශයේ ධ්වනි ගැඹුර මැනීම.
- කල්බදු ගිවිසුම් සඳහා මිනුම් සහ සැලසුම් කටයුතු සිදුකිරීම

**ත්‍රිකුණාමලය වරාය**

- කල්බදු සැලැසුම් සකස් කිරීම සඳහා සමීක්ෂණ සිදු කිරීම.
- උදම් සහ මිනුම් අධ්‍යයන විද්‍යා දත්ත මධ්‍යස්ථානය නිරීක්ෂණය කිරීම හා නඩත්තු කිරීම.
- සමස්ත බර්මා කඳවුර අවට ප්‍රදේශයේ අගාධමිතික සමීක්ෂණයක් පැවැත්වීම හා ස්ථානීය උස මැනීම
- බලහත්කාරයෙන් අල්ලාගත් ඉඩම් සඳහා හදිසි මිනුම් කටයුතු සිදු කිරිම
- යෝජිත දුම්රිය මාර්ගයේ හරස්කඩ පිහිටිම / මට්ටම් කිරිම සහ සවිස්තරාත්මක මිනුම් කටයුතු සිදු කිරිම
- අෂ්රෆ් ජැටියේ මට්ටම් කිරීමේ කටයුතු සිදු කිරීම

**හම්බන්තොට වරාය**

- ප්‍රවේශ ඇළ මාර්ගයන්හි බෝයාවල පිහිටීම පිළිබඳව සමීක්ෂණ සිදු කිරීම.
- ආයෝජකයන් වෙනුවෙන් බදු සැලැස්ම සකස් කිරීමට සමීක්ෂණ පැවැත්වීම.
- අදියර II යටතේ නැවත පදිංචි කිරීම - මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ මිනුම් කටයුතු සිදු කිරීම.
- ව්‍යාපෘති ඉංජිනේරුවන් විසින් පවරනු ලබන ලද අනෙකුත් අදාළ මිනුම් කටයුතු සිදු කිරීම.

**කන්කසන්තුරේ වරාය**

- වරාය මෙහෙයුම් සඳහා ඉඩම් හඳුනා ගැනීම
- නව ජැටියේ ජල ශාස්ත්‍රය සමීක්ෂණ කටයුතු හා තලමිතික කටයුතු සිදු කිරීම

**නාවික අංශය**

නැව් සේවා සපයන්නන්, දියත් යාත්‍රා ක්‍රියාකරවන්නන්, සමුද්‍රීය මිනුදෝරුවන්, සුළු හා මහා පරිමාණ අළුත්වැඩියාවන් සිදු කරන කම්හල්, තෙල් සහ තෙල් මිශ්‍රිත ජලය සහ අපවිත්‍ර ද්‍රව්‍ය එකතුකිරීමේ පහසුකම් සපයන්නන් සඳහා වාර්ෂික ලියාපදිංචි කිරීම සහ නැව් සේවා සපයන්නන්හට බලපත්‍ර නිකුත් කිරීම මෙම අංශය විසින් සම්බන්ධීකරණය කරන ලදී.

| බලපත්‍රයේ නම | නිකුත් කළ ගණන | ආදායම (රු) |
|---|---|---|
| නැව් අළුත්වැඩියා බලපත්‍ර | 145 | 12,781,742.93 |
| නැව් තටාකාංගන බලපත්‍ර | 69 | 2,872,888.61 |
| සමීක්ෂණ බලපත්‍ර | 48 | 3,343,764.36 |
| නැව් සේවා සැපයුම් බලපත්‍ර | 97 | 8,370,122.74 |
| බෝට්ටු බලපත්‍ර | 48 | 4,380,187.64 |
| එස්ජ්ජීටී සහ වෙනත් බලපත්‍ර | 10 | 446,056.08 |
| **එකතුව** | **417** | **32,194,762.36** |

## සංවර්ධන ව්‍යාපෘති

### සැළසුම් හා සංවර්ධන කොට්ඨාශය

**නැගෙනහිර බහළු පර්යන්තය (ECT) – අදියර I - කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය**

**ව්‍යාපෘතිය පිළිබඳ විස්තර**

නැගෙනහිර බහළු පර්යන්තය, විස්සේ සම ඒකක 2.4 ක වාර්ෂික ධාරිතාවයකින් හා මීටර් - 18 ක ගැඹුරින් යුත් මීටර් 1200ක ජැටි බැම්මකින් සමන්විතවූ දකුණු වරායේ ගැඹුරින් වැඩි දෙවැනි බහළු පර්යන්තය වනු ඇත. නැගෙනහිර බහළු පර්යන්තය සංවර්ධනය කොට මෙහෙයුම් සිදුකිරීම සඳහා; ඉදිකර, මෙහෙයුම් කර, පවරාදීමේ (BOT) සහනදායී ප්‍රදානයක් ලබාදීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය අදහස් කරයි. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් නැගෙනහිර බහළු පර්යන්තයේ ජැටි බැම්මේ මීටර් 440ක් ඊට යාබඳ අංගණ ප්‍රදේශය සහ ඒ හා සම්බන්ධ පහසුකම් ද සංවර්ධනය කර ඇත. ව්‍යාපෘතියෙහි ප්‍රසම්පාදන කටයුතු වලදී, ආසියානු සංවර්ධන බැංකුව ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි කාර්ය උපදේශක ලෙස පත්කරනු ලැබ ඇත.

**වර්තමාන ප්‍රගතිය**

“අභිප්‍රාය ප්‍රකාශ කිරීම” (Expression Of Interest) ප්‍රසිද්ධියට පත්කිරීමත් සමඟ ව්‍යාපෘතියේ පූර්ව සුදුසුකම් ක්‍රියාවලිය 2016 ජූනි 06 වැනි දින ආරම්භ කරන ලද අතර, 2016 සැප්තැම්බර් 20 දින අවසන් කරන ලදී. “අභිප්‍රාය ප්‍රකාශ කිරීම” පිළිබඳ ඇගයීම ආසියානු සංවර්ධන බැංකුවේ සහාය ඇතිව අවසන් කර ඇති අතර, තීරණය සඳහා ඉදිරිපත් කර ඇත.

ආසියානු සංවර්ධන බැංකුව විසින් සකස් කරන ලද අනුග්‍රාහක ගිවිසුමේ ප්‍රථම කෙටුම්පත ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සමාලෝචනය කරන ලද අතර, ඒ පිළිබඳව වන මත ප්‍රකාශයන් අවශ්‍ය සංශෝධනයන් සිදුකිරිම සඳහා ආසියානු සංවර්ධන බැංකුව වෙත යවා ඇත.

**ගාලු වරාය සංවර්ධන ව්‍යාපෘතිය – අදියර - I**

**ව්‍යාපෘතිය පිළිබඳ විස්තර**

සැලසුම් කටයුතු ඉටුකිරීම සඳහා ඔරියන්ටල් කන්සල්ටන් සමාගම (OCC) සමඟ නවීකරණ ගිවිසුමක් අත්සන් කරන ලදී. දියකඩනය ඉදිකිරීමේ කටයුතු ඉතිරිව ඇති JICA අරමුදල් භාවිතා කර සිදුකිරීමට සැලසුම් කර ඇති අතර දෙවන අදියරේ දී රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව පදනම (PPP) මත බහුකාර්ය නැංගුරම්පලක් ස්ථාපිත කිරීමට කටයුතු කර ඇත. ව්‍යාපෘතිය සඳහා අනුමත ණය මුදල ජපන් යෙන් මිලියන 14,495කි. ව්‍යාපෘතිය සඳහා UNESCO අනුමැතිය හිමිව ඇත.

**වර්තමාන ප්‍රගතිය**

දැනට ඉතිරිව ඇති මුදල් යොදවා ව්‍යාපෘතියේ කොටසක් ක්‍රියාත්මක කිරිම තුළින් එම ආයෝජනයෙන් අපේක්ෂිත මධ්‍ය පරිමාණ ප්‍රතිඵල අත්කර ගැනීමට නොහැකි වනු ඇති බව ශ්‍රී ලංකා රජයේ මතය වේ. එබැවින්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව (ERD) සහ JICA ආයතනය ඉහත සඳහන් ණය මුදල වසා දැමීමට කටයුතු කරමින් සිටී.

### ත්‍රිකුණාමල වරාය සංවර්ධන ව්‍යාපෘතිය

#### ව්‍යාපෘතිය පිළිබඳ විස්තර

ත්‍රිකුණාමල සෛද්ධාන්තික ප්‍රධාන සැලැස්ම කෙටි කාලීන සහ දිගු කාලීන ව්‍යාපෘති යෝජනා මත පදනම්ව සකස්කරන ලදී. "යෝජනා සඳහා කැඳවීම්" මගින් තෝරාගෙන නිර්දේශ කරන ලද ඕෂන්පික් සහ ඩීමෝ සමාගම්හි ආයෝජන යෝජනාවන් "ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව" වෙත ඉදිරිපත් කර ඇති අතර, මත්ස්‍ය වගාව සඳහා වූ යෝජනාව "ලේකම්වරුන්ගේ කමිටුව" විසින් අනුමත කරන ලදී.

ත්‍රිකුණාමලය වරායේ සිට ගල් අඟුරු සහ ක්ලින්කර් දුම්රිය මගින් ප්‍රවාහනය කිරීම ප්‍රමුඛ ව්‍යාපෘතියක් ලෙස හඳුනාගන්නා ලදී. ඉදිකල යුතු දුම්රිය මාර්ගය හඳුනාගැනීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ත්‍රිකුණාමලය දිසාපති සහ දුම්රිය දෙපාර්තමේන්තුව එක්ව කටයුතු කරයි. දුම්රිය දෙපාර්තමේන්තුව මගින් සමීක්ෂණයක් සිදුකරන අතර, මෙය නිමවීමෙන් අනතුරුව, අනාගත ප්‍රවේශ මාර්ගය සහ නැවත පදිංචි කිරීමේ සැලසුම ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සකස්කරනු ඇත.

ත්‍රිකුණාමල වරායෙහි නව ගුදමක් ඉදිකිරීම ආරම්භ කර ඇති අතර, මෑතකදී කඩා ඉවත් කරන ලද කොළඹ වරායේ CFS – II ගුදමෙහි වහල ව්‍යුහය සහ කුළුණු සුදුසු ලෙස වෙනස්කර යළි භාවිතා කිරීමට සැලසුම් කර ඇත. ත්‍රිකුණාමලය වරායේ ගුදම් 2 සහ 3 පිහිටා ඇති ස්ථානයේම නව ගුදම ඉදි කරනු ලබන අතර, එය ගල් අඟුරු, ක්ලින්කර් සහ සාමාන්‍ය නැව්බඩු ගබඩා කිරිමට භාවිතා කරනු ඇත. අත්තිවාරම දැමීම අවසන් කර ඇත.

ත්‍රිකුණාමලය වරායේ ප්‍රවේශ මාර්ගයේ වම්පස සහ දකුණුපස සඳහා ජලයේ ගිල්වා ඇති දම්වැල් භාවිතයෙන් බැඳ ඇති ස්වයංක්‍රියව දැල්වෙන සූර්ය ශක්තියෙන් ක්‍රියාකරන බල්බ සහිත චැනල් බෝයා 14ක් සවිකිරීමට සැලසුම් කර ඇත. තවද, මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රදීපාගාර ප්‍රතිසක්‍රිය කිරීමට නියමිත ය. ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය ජපන් යෙන් බිලියන 01කි. ව්‍යාපෘති කාර්යයන් සිදුකෙරෙමින් පවතී.

### කන්කසන්තුරය වරාය සංවර්ධනය

#### ව්‍යාපෘතිය පිළිබඳ විස්තර සහ වර්තමාන තත්ත්වය

කන්කසන්තුර වරායේ මෙහෙයුම් ආරම්භ කිරීම සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ එකඟත්වය සහිතව අක්කර 50ක භූමි ප්‍රමාණයක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත පවරාදීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී ඇත. ආරම්භයේ දී ගේට්ටු සංකීර්ණයක් සහ ගුදම් පහසුකම් සහිතව වරාය මෙහෙයුම් ආරක්ෂාකාරීව සිදුකිරීම සඳහා අක්කර 15ක භූමි ප්‍රමාණයක් වෙන් කිරීමට අනුමැතිය හිමි වී ඇත.

මෙම ප්‍රදේශ සඳහා මිනුම් සිතියම (Survey Map) යාපනය මිනුම්දෝරු දෙපාර්තමේන්තුවෙන් ලබාගත යුතුව ඇති අතර, මායිම් වැට ඉදිකිරීම ආරම්භ කිරීමට සහ ගේට්ටු සංකීර්ණය සහ ගුදම ඉදිකිරීම සඳහා මිනුම් සිතියම ලබාගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය අපේක්ෂාවෙන් සිටී.

## ජාතික වරාය ප්‍රධාන සැලැස්ම

### ව්‍යාපෘතිය පිළිබඳ විස්තර සහ වර්තමාන තත්ත්වය

ජාතික වරාය ප්‍රධාන සැලැස්ම සකස් කිරිම සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් ඇ.එ.ජ.ඩොලර් මිලියන 1.5ක තාක්ෂණික ආධාර ප්‍රදානයක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ලබා දී ඇත. ඒ අනුව, ආසියානු සංවර්ධන බැංකුවේ උපදේශක ආයතනය වන MTBS ආයතනය විසින් ජාතික වරාය ප්‍රධාන සැලැස්ම සකස් කරමින් සිටී. ව්‍යාපෘතිය 2016 නොවැම්බර් මස ආරම්භ වූ අතර, 2019 මැයි මස අවසන් විය යුතුව ඇත.

## දක්ෂිණ වරාය සංවර්ධන කොට්ඨාශය

2017 වසර තුළදී, හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ අදියර II යටතේ සිදු කරන ලද ප්‍රධාන සිවිල් ඉදිකිරීමේ කාර්යයන් අවසන් කිරීම දක්ෂිණ වරාය සංවර්ධන කොට්ඨාශය විසින් සිදු කරන ලදී.

සමාලෝචිත වර්ෂය තුළ මෙහෙයුම් උපකරණ බොහොමයක් මේ වන විට සපයා ඇති අතර ඉතිරි උපකරණ ආනයනය කිරීම 2018 වසරේ දෙවන කාර්තුව දක්වා සිදු කෙරෙනු ඇත. ඒ අනුව, ව්‍යාපෘතිය අවසන් කිරීමේ දිනය 2018 මැයි 15 වේ.

රජය විසින් නිකුත් කරන ලද උපදෙස් අනුව, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව පදනම (PPP) මත හම්බන්තොට වරාය මෙහෙයුම් කිරීමට චීන සමාගමක් විසින් (සීමාසහිත චයිනා මර්චන්ට් පෝට් හෝල්ඩිංග් සමාගම) ඉදිරිපත් කරන ලද යෝජනාවක් සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් පිළිගෙන ඇත. ඒ අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය/ ශ්‍රී ලංකා රජය සහ චයිනා මර්චන්ට් පෝට් හෝල්ඩිංග්ස් සමාගම/HIPG/HIPS අතර 2017 ජූලි 29 දින අනුග්‍රාහක ගිවිසුමකට එළඹෙන ලදී.

## කොන්ත්‍රාත් හා සැලසුම් කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සිදුකරනු ලබන සිවිල් ඉංජිනේරු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ වරාය ආශ්‍රිත ව්‍යුහයන් සැලසුම් කිරීම කොන්ත්‍රාත් සහ සැලසුම් කොට්ඨාශයේ ප්‍රධාන කාර්යභාරය වේ. ජැටි බැම්, පාලම්, ගොඩනැගිලි සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රධාන ව්‍යාපාර කටයුතු පහසුකිරීම සඳහා මාර්ග ආදී වරාය යටිතල පහසුකම් සඳහා ව්‍යුහයන් සැලසුම් කිරීම ද මෙයට අයත් වේ. තවද, සියළුම ප්‍රාදේශීය වරායයන් ඇතුළුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම කොට්ඨාශයන්හි සියළුම නඩත්තු සහ සංවර්ධන අවශ්‍යතාවයන්ගේ සැලසුම් කටයුතු කොන්ත්‍රාත් හා සැලසුම් කොට්ඨාශය විසින් ඉටුකරනු ලබයි. එම ව්‍යාපෘති වලට අදාළ ටෙන්ඩර් සම්බන්ධ කටයුතු, උපදේශක සේවා, ඉදිකිරීම් අධීක්ෂණය, තත්ත්ව පාලනය සහ කොන්ත්‍රාත් කළමනාකරණය ද ව්‍යාපෘති කළමනාකරණය සහ ක්‍රියාත්මක කිරීමට ඇතුළත් වේ.

ඉහත සඳහන් කටයුතු වලට අමතරව, කොළඹ වරායේ සුළු ඉදිකිරීම් කටයුතු එහි සෘජු කම්කරු ශ්‍රමය යොදවා සිදු කිරීම ද මෙම කොට්ඨාශය විසින් සිදුකරනු ලැබේ.

2017 වසර තුළ මෙම කොට්ඨාශය මගින් සිදුකරන ලද ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු පහත සඳහන් පරිදි සාරාංශගත කරනු ලැබේ.

**කොළඹ වරායේ අභ්‍යන්තර වරාය මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය**

දකුණු වරාය සංවර්ධන කටයුතු අවසන්වීමත් සමඟ වරාය පරිශ්‍රය තුළ ඇතිවිය හැකි යැයි අපේක්ෂා කරන මාර්ග තදබදයට මුහුණදීම සඳහා ඉඟුරුකඩේ හංදියේ සිට ගේට්ටු අංක 01 දක්වා දිවෙන මංතීරු 04කින් යුක්තව දැනට පවතින අභ්‍යන්තර වරාය මාර්ගය මංතීරු 06ක් දක්වා පුළුල් කිරීමට අවශ්‍යව ඇත. මාර්ගය පුළුල් කිරීමට සමගාමීව කොටුව ප්‍රදේශයේ ඇති පාලම් දෙක සහ වරාය පිවිසුම් මාර්ගයේ ඇති බ්ලූමැන්ඩල් මාර්ගය හරහා දිවෙන පාලම ද පුළුල් කිරීම අවශ්‍ය කටයුත්තක් වේ.

මංතීරු 06ක් දක්වා මාර්ගය පුළුල් කිරීම සඳහා පවත්නා ගොඩනැගිලි, කාර්යාල, කම්හල් හා උපකරණ ආදිය කඩා ඉවත් කර වෙනත් ස්ථානයක ඉදිකළ යුතුව ඇත. වරාය අභ්‍යන්තර මාර්ගය පුළුල්කිරීමේ කටයුතු 2013 වසරේ දී ආරම්භ කරන ලද අතර, ගොඩනැගිලි කඩා ඉවත් කිරීමේ කාර්යය සම්පූර්ණයෙන්ම අවසන් කර ඇති ප්‍රදේශයන්හි ඉදිකිරීම් කටයුතු, අදියර වශයෙන් සිදුකෙරමින් පවතී.

**ව්‍යාපෘති ප්‍රගතිය**

වරායේ අභ්‍යන්තර මාර්ග පුළුල් කිරීමේ කටයුතු අදියරින් අදියර සිදු කර ඇත. 2017 වසර තුළදී රුපියල් මිලියන 54.4 ක වැඩ (මූල්‍ය ප්‍රගතිය) අවසන් කර ඇත. 2017 දෙසැම්බර් මස දක්වා ව්‍යාපෘතියේ සමස්ත මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 756.97 කි.

මාර්ගයේ ඉදිකිරීම් චේන් 1 + 700 සිට මීටර් 2+ 060 දක්වා නිමකර ඇති අතර වසර අවසානයේ ප්‍රගතිය 68% ක් වේ. චේන් 3+340 සිට මීටර 4+ 020 දක්වා මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් ප්‍රචාරණය කර ප්‍රදානය කර ඇත. ඉදිරි චේන් 0+540 සිට මීටර 0+840 දක්වා මාර්ගය සැලසුම් හා නිර්මාණ අදියරේ පවතින අතර 2018 වසරේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය.

**වරාය පිවිසුම් මාර්ගය පුළුල් කිරීම**

වරාය ප්‍රවේශ මාර්ගය මංතීරු 4 සිට 6 දක්වා පුළුල් කිරීමට යෝජනා කර ඇත. මාර්ග විහිදුම දුර්වල පස් තට්ටුවක් මත පවතින හෙයින් මාර්ගය පුළුල් කිරීමේ කටයුතු ආරම්භ කිරීමට පෙර පස සංවර්ධනය කිරීම අවශ්‍ය වේ. පාංශු පරීක්ෂණ කටයුතු 2017 වසරේදී අවසන් කරන ලදී. ඒ අනුව පස සංවර්ධනය කිරීමේ සහ මාර්ගය පුළුල් කිරීමේ කටයුතු සඳහා මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යංශය (CECB) වෙතින් යෝජනාවක් ලබාගෙන ඇත. මාර්ගය ඉදිකිරීමේ කටයුතු මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යංශය (CECB) වෙත පවරන ලද අතර, ඉදිකිරීම් කටයුතු සිදු වෙමින් පවතී.

**ව්‍යාපෘති ප්‍රගතිය**

පස සංවර්ධනය කිරීමේ මූලික සැලසුම මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යංශය (CECB) විසින් ඉදිරිපත් කර ඇති අතර, සැලසුම් / නිර්මාණ අවසන් කිරීම සඳහා වරාය ප්‍රවේශ ගුවන් අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ (Port Access Elevated Project) මාර්ගය ඉදිවන ආකාරය පිළිබඳ අවසන් අනුරේඛය (final trace) මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යංශය වෙත ලබාදෙන ලෙස ඉල්ලා ඇත. අවශ්‍ය තොරතුරු මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලබාගැනීමට නියමිත අතර යෝජිත වරාය ප්‍රවේශ ගුවන් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය (Port Access Elecated Project) සමගාමීව සිදු කිරීමට නියමිතය.

**කොළඹ වරායේ පර්යන්ත / පාලම් ප්‍රතිසංස්කරණය කිරීම**

**නියමු පාලම සහ බණ්ඩාරනායක ජැටිය ගල් අතුරා තාර දැමීම**

සමස්ත අංගණ ප්‍රදේශයම ගිලාබැසීමට ලක්වී ඇති හෙයින් නියමු පාලම සහ බණ්ඩාරනායක ජැටියේ වැඩි දියුණු කිරීම් අවශ්‍ය බව හඳුනාගෙන ඇත.

**ව්‍යාපෘති ප්‍රගතිය**

නියමු පාලම ගල් අතුරා තාර දැමීමේ කටයුතු 2016 වසරේදී අවසන් කරන ලද එහි මුළු පිරිවැය රුපියල් මිලියන 51කි. බණ්ඩාරනායක ජැටිය ගල් අතුරා තාර දැමීමේ - අදියර 1, 2017 වසරේදී අවසන් කරන ලද අතර එහි මුළු පිරිවැය රුපියල් මිලියන 25.71 කි. බණ්ඩාරනායක ජැටියේ ගල් අතුරා තාර දැමීමේ කටයුතු - අදියර II සිදු කෙරෙමින් පවතින අතර 2017 වසරේදී වැඩ කටයුතු 95% අවසන් කරන ලදී.

**ජය බහළු පර්යන්තයේ 3 වැනි පර්යන්තය ප්‍රතිසංස්කරණය කිරීම - (R සහ S මංතීරු)**

බහළු අඩුක් කිරීමේ ප්‍රදේශ සහ මාර්ග බොහෝමයක ගිලා බැස්මට ලක්වී වලවල් සහිත ස්වභාවයකට පත්වී ඇති හෙයින් දැනට පවතින බහළු අඩුක් කිරීමේ අංගණය ද ඇතුළුව ජය බහළු පර්යන්ත - 3 හි ඇති මාර්ග ඇතුළු බහළු අඩුක් කිරීමේ අංගණය ප්‍රතිසංස්කරණය කිරීම අවශ්‍ය වේ. පර්යන්තයේ එදිනෙදා සිදු කෙරෙන බහළු මෙහෙයුම් කාර්යයන්ට බාධා නොවන, පිණිස ප්‍රතිසංස්කරණ කටයුතු අදියර වශයෙන් කරනු ලැබේ.

**ව්‍යාපෘති ප්‍රගතිය**

- ජය බහළු පර්යන්තයේ 3 වන පර්යන්තය ප්‍රතිසංස්කරණය කිරීම - අදියර 1 - R & S මංතීරු අවසන් කර ඇති අතර 2017 වසරේ මේ දක්වා සිදු කර ඇති ගෙවීම රුපියල් මිලියන 38.04 ක් වේ.
- ජය බහළු පර්යන්තයේ 3 වන පර්යන්තය ප්‍රතිසංස්කරණය කිරීම - අදියර II – M සහ N මංතීරු ප්‍රතිසංස්කරණය කිරීම ප්‍රදානය කර ඇති අතර ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතී.

**විජය කුමාර ජැටිය ගල් අතුරා තාර දැමීම**

විජය කුමාර ජැටියේ සමස්ත අංගණ ප්‍රදේශයම හානියට ලක්වී ඇති අතර මතුපිට නැවත සකස් කිරීම සහ වැසි ජල ජලාපවහන කානු පද්ධතිය වැඩි දියුණු කිරීම අවශ්‍ය වේ. වරාය මෙහෙයුම් සඳහා සිදුවන බලපෑම අවම කිරීම සඳහා අදියර දෙකක් යටතේ සංවර්ධන කටයුතු සැලසුම් කර ඇත.

**ව්‍යාපෘති ප්‍රගතිය**

අදියර **I** හි කොන්ත්‍රාත්තුව 2017 ජනවාරි මස රුපියල් මිලියන 37.6 ක සමස්ත පිරිවැයකට ප්‍රදානය කරන ලද අතර වර්ග මීටර් 4500 ක වැඩ කටයුතු සැලකිය යුතු ප්‍රමාණයකින් අවසන් කර ඇත.

අදියර **II** සඳහා සැලසුම් හා නිර්මාණ කටයුතු සිදු කෙරෙමින් පවතින අතර 2018 වසරේදී අවසන් කිරීමට නියමිතය.

### බහළුගත නැව්බඩු මෙහෙයුම් මධ්‍යස්ථානයේ (CFS– 01) ගුදම ප්‍රතිසංස්කරණය කිරීම

2013 වසරේ මැයි මස ගිනි ගැනීමක් හේතුවෙන් හානියට පත් වූ CFS 01 ගුදම ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු 2016 ජනවාරි මසදී ආරම්භ කරන ලද අතර අදියර දෙකකින් අවසන් කරන ලදී. ගුදමේ මුල් භාගයේ ඉදිකිරීම් 2016.08.01 දින අවසන් කරන ලදී. වර්ග මීටර 600 ක ඉඩ ප්‍රමාණයක් සහිත දෙමහල් කාර්යාල ගොඩනැගිලි සංකීර්ණයක් සහ දෙපසින් මීටර 2.5ක වාහක තීරුවකින් (apron) යුත් වර්ග මීටර 1800ක ඉඩ ප්‍රමාණයක් සහිත ගුදම සහ සේවා සැපයුම් කටයුතු සඳහා විදුලි පරිණාමකයකින් මෙය සමන්විත වේ.

#### ව්‍යාපෘති ප්‍රගතිය

ගුදමේ දෙවන භාගයේ ඉදිකිරීම් 2016 අගෝස්තු මස ආරම්භ කරන ලද අතර, 2017 මැයි මස මුළුමනින්ම අවසන්කර 2017.06.02 වන දින සේවා සැපයුම් කටයුතු ආරම්භ කරන ලදී. මෙය මීටර් 45 X මීටර් 60 (වර්ග මීටර් 2,250ක ඉඩ ප්‍රමාණයක්) සහ අන්තරාදායක නැව්බඩු මෙහෙයුම් සඳහා මීටර් 45 X 22.5 (වර්ග මීටර් 1,012.5ක ඉඩ ප්‍රමාණයක් සහිත) ගුදමකින් මෙය සමන්විත වේ.

### ත්‍රිකුණාමලය වරායේ අෂ්රෆ් ජැටිය ප්‍රතිසංස්කරණය කිරීම

ජැටි බැම්ම ආසන්නයේ අංගණය ගිලා බැසීම හේතුවෙන් පර්යන්තයන්හි මෙහෙයුම් කටයුතු අඩාලව ඇති බැවින් අෂ්රෆ් ජැටිය සංවර්ධනය කිරීම සහ මතුපිට අළුතින් සකස් කිරීම අවශ්‍ය බව හඳුනාගෙන ඇත.

#### ව්‍යාපෘති ප්‍රගතිය

අවශ්‍ය සැලසුම්, ප්‍රමාණ පත්‍ර (BOQs), ටෙන්ඩර් ලේඛන සමඟ පිරිවිතර (Specifications) සකස් කරන ලද අතර, 2017 නොවැම්බර් මසදී ටෙන්ඩරය ප්‍රදානය කරන ලදී. ඉදිකිරීම් 2018 වසරේ ආරම්භ කිරීමට නියමිතය.

### ගාලු වරායේ ක්ලොසන්බර්ග් ජැටිය ප්‍රතිසංස්කරණය කිරීම

අංගණය ගිලා බැසීම හේතුවෙන් පර්යන්තයන්හි මෙහෙයුම් කටයුතු අඩාලව ඇති බැවින් ගාලු වරායේ පවත්නා ජැටිය සංවර්ධනය කිරීම සහ අළුතින් මතුපිට සකස් කිරීම අවශ්‍ය බව හඳුනාගෙන ඇත.

#### ව්‍යාපෘති ප්‍රගතිය

අවශ්‍ය සැලසුම්, ප්‍රමාණ පත්‍ර (BOQ), ටෙන්ඩර් ලේඛන සමඟ පිරිවිතර (Specifications) සකස් කර ප්‍රචාරණය කරන කළමනාකරණ අනුමැතිය අපේක්ෂා කෙරේ. වැඩ කටයුතු 2018 වසර මුලදී ආරම්භ කිරීමට නියමිතය.

**ඔලුවිල් වරායේ වෙරළබඩ සංරක්‍ෂණ කටයුතු**

ඔලුවිල් නිවාඩු නිකේතනය පිහිටා ඇති ප්‍රදේශයේ කඩිනම් වෙරළ සංරක්‍ෂණය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නිවාඩු නිකේතනය පිහිටා ඇති ප්‍රදේශයට නිරිත දිග මෝසම් කාලසීමාවේදී සිදුවන ඛාදනය හේතුවෙන් බරපතල ලෙස බලපෑමක් එල්ලවී ඇති අතර, ජල ටැංකිය, ආධාරක පැති බැමි, අපජල ටැංකි, මැන්හෝල් (manholes) ආදියට හානි පමුණුවමින් නිකේතනය ආසන්නයටම ඛාදනය සිදුවී ඇති බවට නිරීක්‍ෂණය කර ඇත.

හදිසි සංරක්‍ෂණ කටයුතු අදියර දෙකක් යටතේ සිදු කර ඇත.

අදියර I - මීටර් 150ක දිගින් යුත් පැති බැම්ම ඉදිකිරීම (නිවාඩු නිකේතනය පිහිටා ඇති ප්‍රදේශය) 2016 වසරේදී ඉදිකිරීම් අවසන් කරන ලදී.

**ව්‍යාපෘති ප්‍රගතිය**

අදියර II- මීටර් 160ක දිගින් යුත් රැඳවුම් බැම්ම ඉදිකිරීම (නිවාඩු නිකේතනයේ සිට නිලධාරීන්ගේ නිල නිවාස දක්වා).

මීටර 160 ක රැඳවුම් බැම්ම ගලින් ඉදිකිරීම 2016 නොවැම්බර් මස ආරම්භ කරන ලද අතර සියළු ඉදිකිරීම් 2017 වසරේදී අවසන් කරන ලදී.

**ඔලුවිල්හි වෙරළ තීරයේ පාංශු විස්ථාපනය (Littoral Drift) පිළිබඳ පුළුල් අධ්‍යයනය**

මෙවැනි කාර්යයන්හි පූර්වාරම්භයක් ලෙස ඔලුවිල් වෙරළ ප්‍රදේශයේ රොන්මඩ පරිවහනය සහ භූරූපී වෙනස්කම් පිළිබඳව අවබෝධයක් ලබාගැනීමට හා ඒවාට යෙදිය යුතු ප්‍රතිකර්ම තීරණය කිරීම සඳහා පූර්ණ ඉංජිනේරුමට අධ්‍යයනයක් සිදු කිරීමට යෝජනා වී ඇත.

මෙම අධ්‍යයනය සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් ඔලුවිල් වරාය සංවර්ධන ව්‍යාපෘතියේ අරමුදල් සැපයීමේ නියෝජිත ආයතනය වන ඩෙන්මාර්ක් විදේශ කටයුතු අමාත්‍යාංශය (DANIDA) විසින් ආධාර_පදනම මත ලබාදී ඇත. අධ්‍යයන උපදේශක සේවාව සාර්ථක උපදේශක ආයතනය වන සීමාසහිත ඩැනිෂ් හයිඩ්‍රෝලික් ආයතනය වෙත වරාය හා නාවික අමාත්‍යංශ ලේකම් විසින් ප්‍රදානය කරනු ලැබ ඇත.

**ව්‍යාපෘති ප්‍රගතිය**

2017 අප්‍රේල් මසදී සීමාසහිත ඩැනිෂ් හයිඩ්‍රෝලික් ආයතනය විසින් අධ්‍යයනයේ අවසන් දළ කෙටුම්පත් වාර්තාව, ගැටළු විසඳීම සඳහා වන නිර්දේශ සමග ඉදිරිපත් කරන ලදී. පිරිවැය යෝජනා, නිර්දේශ සහිත අවසන් වාර්තාව 2017 ජුනි මස ඉදිරිපත් කරන ලදී. අවසානයේදී අධ්‍යයන කාලය දීර්ඝ කර අඩු පිරිවැය විකල්ප යොදා ගැනීමට තීරණය කරන ලදී.

## ඉංජිනේරු

### විදුලි හා විද්‍යුත් ඉංජිනේරු කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ ඇති සියළුම වරායයන් විදුලිබල සහ සන්නිවේදන ඉංජිනේරු ව්‍යාපෘති සැලසුම් කිරීම, කළමනාකරණය කිරීම සහ විදුලිබල හා ඉංජිනේරු ක්ෂේත්‍රයේ පහසුකම් නඩත්තු කිරීම විදුලි සහ විද්‍යුත් කොට්ඨාශයයේ වගකීම වේ.

ලෝකයේ අනිකුත් ජාත්‍යන්තර කේන්ද්‍රීය වරායයන් හා සමානව වරාය කටයුතු වලට අදාළ සියළු සේවාවන්ගෙන් 95% කට වඩා සම්පූර්ණ කර පවත්වා ගෙනයාම සඳහා විදුලිබලය සහ සන්නිවේදන ක්ෂේත්‍රයන්හි සියළු අත්‍යාවශ්‍ය සේවා පවත්වාගන යාම සඳහා ඉහළ සුදුසුකම් ලත් වෘත්තීය විදුලිබල / සන්නිවේදන ඉංජිනේරු කණ්ඩායමක් පැය 24 පුරාම සේවයේ නියුතුව සිටී.

යෝජිත නැගෙනහිර බහළු පර්යන්තයෙහි සැලසුම් සහ ඉදිකිරීම් සඳහා විදුලි ඉංජිනේරුවරු ස්වකීය අත්දැකීම් තුළින් සහ දැනුමෙන් දායකත්වය ලබා දෙමින් සිටී.

**විදුලිබල ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා පහත සඳහන් කාර්යයන් ඇතුළත් වේ.**

- මෙ.වො.18 ක මුළු ස්ථාපිත ධාරිතාවය වන කි.වො.11 ක් වූ ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලබාගන්නා විදුලිය බෙදාහැරීම;
- කිලෝ වොට් 11 ධාරිතාවයකින් යුතු උපපොලවල් නඩත්තු කිරීම, ස්ථාපිත කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- සියළුම අඩු වෝල්ටීයතාව සහිත බලාගාරයන්හි ආරක්ෂණ පද්ධති හා ස්විච්ගියර (Switchgears) සඳහා වූ විදුලි උපාංග ආරක්ෂා කිරීම, නඩත්තු කිරීම.
- හැරීමේ යාත්‍රාවල, ටග් යාත්‍රාවල සහ අනෙකුත් පාවෙන යාත්‍රාවල සවිකර ඇති විදුලි උපකරණ නඩත්තු කිරීම.
- බහළු මෙහෙයුම් දොඹකර (නෞකාවේ සිට ගොඩබිම දක්වා අංගණ දොඹකර) වල සවිකර ඇති විදුලි උපකරණ නඩත්තු කිරීම.
- තොග නැව්බඩු මෙහෙයුම් දොඹකර නඩත්තු කිරීම.
- බහළු දොඹකර වල විදුලි මෝටර් ( AC සහ DC ) සහ අනිකුත් උපකරණ අළුත්වැඩියා කිරීම.
- සමස්ත ධාරිතාවය මෙ.වො. 15.5ක් වන පොරොත්තු විදුලි උත්පාදන යන්ත්‍ර නඩත්තු කිරීම.
- කි.වො.11ක භූගත විදුලි රැහැන් ජාල ස්ථාපිත කිරීම, නඩත්තු කිරීම සහ ඒවාහි දෝෂ නිවැරදි කිරීම.
- වායු සමීකරණ පද්ධති සැලසුම් කිරීම, සවි කිරීම සහ නඩත්තු කිරීම.

**විද්‍යුත් හා සන්නිවේදන ඉංජිනේරු ක්ෂේත්‍රයට පහත කාර්යයන් ඇතුළත් වේ.**

- VHF ගුවන් විදුලි තරංග ජාලය සැලසුම් කිරීම සහ නඩත්තු කිරීම (නාවික තරංග).
- බහළු පර්යන්තයේ ගිගාහර්ට්ස් 2.4ක් වූ Wi-Fi දත්ත සන්නිවේදන ජාලය සැලසුම් කිරීම හා නඩත්තු කිරීම.
- බහළු පර්යන්තයේ ගුවන් විදුලි තරංග හඳුනා ගැනීමේ (RFID) පද්ධතිය නඩත්තු කිරීම.

- ඔප්ටිකල් ෆයිබර් ජාලය සහ දත්ත ජාල මෙහෙයුම් මධ්‍යස්ථානය සැලසුම් කිරීම සහ නඩත්තු කිරීම.
- දුරකථන මාර්ග 2000ක ධාරිතාවයක් සහිත වරාය දුරකථන PBX පද්ධතිය සැලසුම් කිරීම හා නඩත්තු කිරීම.
- රේඩාර්, ධ්වනි ශබ්ද මානය (ECHO SOUNDER), චන්ද්‍රිකා සන්නිවේදනය, උපකරණ, දිශාන්තර මිහිමත මං සෙවීමේ පද්ධතිය (DGPS) පදනම් කරගත් සමීක්ෂණ පද්ධති ආදිය පදනම් කරගත් නාවික පද්ධතීන් නඩත්තු කිරීම.
- ආරක්ෂක කැමරා (CCTV) පද්ධති සැලසුම් කිරීම හා නඩත්තු කිරීම.
- පවතින ඔප්ටිකල් ෆයිබර් ජාලය පුළුල් කිරීම.
- VHF ඩුප්ලෙක්ස් චැනලය ස්ථානගත කිරීම සඳහා ශබ්ද සන්නිවේදන (Voice Communication) මධ්‍යස්ථානය පුළුල් කිරීම.

## නාවික ඉංජිනේරු කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම පාවෙන යාත්‍රා නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීම සහ නාවික, මෙහෙයුම්, සිවිල් ඉංජිනේරු, නඩත්තු සහ ආරක්ෂක යන කොට්ඨාශයන්හි මෙහෙයුම් කටයුතු සාර්ථකව සිදුකිරීම සඳහා ප්‍රමාණවත් පාවෙන යාත්‍රා සැපයීම නාවික ඉංජිනේරු කොට්ඨාශයේ ප්‍රධාන වගකීම වේ. මෙම කොට්ඨාශය විසින් භාවිතා කරනු ලබන, යාත්‍රා වල පිටතින් සවිකර ඇති යන්ත්‍ර නඩත්තු කිරීම ද මෙම කොට්ඨාශයේ වගකීමකි.

තොග නැව්බඩු මෙහෙයවීම සඳහා මෙහෙයුම් කොට්ඨාශයට මෙහෙයුම් උපකරණ සැපයීම මෙම කොට්ඨාශයේ වගකීමක් වේ. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මුළුතැන්ගෙයි ගෑස් උඳුන්, බත් උඳුන්, ඇලුමිනියම් බඳුන් සහ වෙනත් මුළුතැන්ගෙයි උපකරණ නඩත්තු කිරීම් මෙම කොට්ඨාශයේ කාර්යභාරයක් වේ.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දියත් මං නඩත්තු කිරීමට ද මෙම කොට්ඨාශය මගින් සිදුකරනු ලැබේ. වානේ ව්‍යුහ අළුත්වැඩියා අංශයෙහි පවතින පුහුණු කම්කරු හිඟය හේතුවෙන් නාවික කොට්ඨාශයේ ව්‍යුහාත්මක අළුත්වැඩියා කටයුතු සහ නැව් බඳ අළුත්වැඩියා කටයුතු මෙම කොට්ඨාශය විසින්ම සිදු කරනු ලැබේ.

නාවික ඉංජිනේරු කොට්ඨාශය අංශ දෙකකින් සමන්විත වන අතර වසර තුළ ලබාගත් ඔවුන්ගේ ජයග්‍රහණයන් පහත පරිදි වේ.

**නාවික I අංශය**

**නැවත සැකසීමේ ඉංජිනේරු අංශය (Refit Engineering Section)**

නැවත සැකසීමේ ඉංජිනේරු අංශය, නාවික I අංශය යටතේ ක්‍රියාත්මක වන අතර, ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් සියළුම නැංගුරම් ටග් යාත්‍රා,"මේස" ගිනි නිවීමේ යාත්‍රාව, වරාය භාරන යාත්‍රා සහ යාත්‍රා වල පිටත සවිකර ඇති යන්ත්‍ර (outboard motor) නඩත්තු කිරීම් සහ අළුත්වැඩියා කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම මෙම අංශයේ ප්‍රධාන වගකීම වේ. ලොයිඩ් ලේඛන වර්ගීකරණ සමීක්ෂණ (Lloyds Register Classification Servy) ඇතුළුව මෙම පාවෙන යාත්‍රාවල අළුත්වැඩියාවන් සිදුකරන අතරතුරදීම කොළඹ වරාය සඳහා නැංගුරම් ටග් යාත්‍රා පහක මෙහෙයුම්

අවශ්‍යතා සපුරාලීමටද ත්‍රිකුණාමල වරාය සඳහා එක් නැංගුරම් ටග් යාත්‍රා දෙකක මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීමටද, ගාලු වරාය, කන්සන්තුරේ වරාය සහ හම්බන්තොට වරාය සඳහා එක් නැංගුරම් ටග් යාත්‍රාව බැගින් වූ මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීමටද මෙම අංශය සමත් විය.

ඇතුළු වරාය හැරීමේ කටයුතු සහ ආරක්ෂක කොට්ඨාශයේ අධි වේගී යාත්‍රා වල පිටතින් සවිකරන යන්ත්‍ර අවශ්‍යතාවයන් පිළිබඳ කටයුතු සඳහා නාවික ඉංජිනේරු කොට්ඨාශයෙන් නොමඳ සහායක් ලබා දෙනු ලැබේ.

වර්ගීකරණ කමිටු වල සහාය ඇතිව තටාකාංගන සමීක්ෂණ වෙනුවට ජල සමීක්ෂණ සහ ටග් යාත්‍රා වියළි තටාකාංගන ගතකිරීම ඇතුළු ප්‍රධාන අළුත්වැඩියා කටයුතු සහ ඒවාහි යන්ත්‍ර වලට අවශ්‍ය සියළුම නඩත්තු සහ අළුත්වැඩියා කටයුතු සිදුකරන ලදී. "මේස" ගිනි නිවන පාවෙන යාත්‍රාවේ නඩත්තු කිරීම් ඉතාමත් සාර්ථකව සිදු කරන ලද අතර, වරාය තුළ සහ අවට ඇතිවිය හැකි ඕනෑම ගිනිගැනීමක් මර්ධනය කිරීමට යොදාගැනිම සඳහා පැය 24 පුරාම සූදානම්ව තබා ඇත.

**ඉංජිනේරු වරාය යාත්‍රා අංශය**

නියමු දියත් යාත්‍රා, මුවරින් යාත්‍රා සහ අනෙකුත් පොදු අවශ්‍යතා සඳහා භාවිතා කරන යාත්‍රා ආදිය අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම මෙම අංශයේ ප්‍රධාන වගකීම වන අතර, මේ දක්වා වූ වර්ගීකරණ කමිටු අවශ්‍යතා සපුරාලමින් නාවික කොට්ඨාශයේ මෙහෙයුම් අවශ්‍යතා ඉටු කිරීමට හැකි වී ඇත.

**නාවික II අංශය**

**නැව් තැනීමේ අංශය**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පාවෙන යාත්‍රාවල සියළුම දැව වැඩ සහ ෆයිබර් ග්ලාස් අළුත්වැඩියා කටයුතු සිදු කිරීම නැව් තැනීමේ අංශයේ ප්‍රධාන වගකීම වේ. තවද, දැව වැඩ වල සහ දැව බඳෙහි අළුත්වැඩියාවන්හි වලක්න අළුත්වැඩියා (fender repair) , දියත් යාත්‍රා සහ කිමිදුම් බෝට්ටු වල නඩත්තු මෙම අංශය විසින් සිදුකරන ලදී. තවද GRP බෝට්ටු සහ දැව බඳ සහිත දියත් යාත්‍රාවන්හි අළුත්වැඩියා කටයුතු ද නැව් තැනීමේ අංශය මගින් සිදුකරන ලදී. නාවික කොට්ඨාශය මගින් භාවිතා කරන නැංගුරම් ටග් යාත්‍රාවන්හි දැව භාණ්ඩ, පනේල වැඩ සහ දැව ෆෙන්ඩර් අළුත්වැඩියා කටයුතු ද නැව් තැනීමේ අංශය මගින් සිදුකරන ලදී.

වසර තුළ දී ටොන් 600ක් බර දැරිය හැකි පේටන්ට් දියත් මගෙහි සහ අනෙකුත් දියත් මං වලට යාත්‍රා ඇතුල් කිරීම සහ දියත් මගෙහි ඇති යාත්‍රා නැවත මුහුදට මුදාහැරීමේ මෙහෙයුම් සිදුකරන ලදී. නැංගුරම්ලෑමේ ටග් යාත්‍රා සහ දියත් යාත්‍රාවල ප්‍රධාන අළුත්වැඩියා කටයුතු මෙම අංශය මගින් වසර පුරාවට ම සිදුකරන ලදී.

**නැව්බඩු යාත්‍රා අංශය**

මෙහෙයුම් කොට්ඨාශය විසින් භාවිතා කරනු ලබන ඇදගෙනයාමේ ටග් යාත්‍රා, මෝටර් දියත් යාත්‍රා, වතුර බත්තල්, තට්ටු බත්තල් වල නඩත්තු සහ අළුත්වැඩියා කටයුතු සිදුකිරීම මෙන්ම මෙම යාත්‍රාවල හා වෙනත් වානේ ව්‍යුහවල මලකඩ ගැටිති ඉවත්කර සුද්ද කිරීම (Grit Blasting) හා පින්තාරු වැඩ සිදුකිරීම ද නැව්බඩු යාත්‍රා අංශයේ ප්‍රධාන වගකීම වේ.

වසර තුළ දී, මෙහෙයුම් කොට්ඨාශය, නාවික කොට්ඨාශය, ආරක්ෂක කොට්ඨාශය හා ඉංජිනේරු කොට්ඨාශය, ගාලු වරාය හා ත්‍රිකුණාමලය වරාය මෙන්ම ශ්‍රී ලංකා නාවික හමුදාව සහ කළම්බු ඩොක්යාඩ් ආයතනය වැනි වෙනත් බාහිර ආයතන ගණනාවකට අවශ්‍ය කරනු ලබන විවිධ ප්‍රමාණයෙන් යුත් වානේ රැහැන් කඹ සිලංග (Steel wire rope slings) තිර රෙදි, කැන්වස් ආවරණ වියන් සහ කුඩාරම් රෙදි ආදී අයිතම 125 ක වැඩි ප්‍රමාණයක් මෙම අංශය මගින් නිෂ්පාදනය කර සපයන ලදී.

නාවික ඉංජිනේරු කොට්ඨාශය විසින් එවැනි සේවාවන් අපේක්ෂා කරන්නාවූ වරායයන්ට මෙන්ම අනෙකුත් සියළුම කොට්ඨාශ වලට අවශ්‍ය එවැනි සේවාවන් සාර්ථකව සපයා ඇත. පවතින සීමිත සම්පත් ප්‍රමාණයෙන් හා සියළුම නිලධාරීන්ගේ හා සේවකයින්ගේ උපරිම කැපවීමෙන් වරාය නැව්බඩු මෙහෙයුම්වල නිරත අප පාරිභෝගිකයින් වෙත මෙම කොට්ඨාශය මගින් විශිෂ්ට සේවාවක් සපයනු ලැබේ.

## යන්ත්‍රෝපකරණ ඉංජිනේරු කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නැව්බඩු මෙහෙයුම් උපකරණ නිසි පරිදි නඩත්තු කිරීම සහ ඒ සඳහා සැලසුම් කිරීමට සහ බහළුගත සහ සාම්ප්‍රදායික නැව්බඩු මෙහෙයුම් බාධාවකින් තොරව පවත්වාගෙන යාම පිණිස මෙම උපකරණ ලබා දීම යන්ත්‍රෝපකරණ ඉංජිනේරු කොට්ඨාශයේ ප්‍රධාන වගකීම වේ.

2017 වර්ෂයේ දී මෙම අංශය විසින් මෙම උපකරණ ක්‍රියා විරහිත වන සෑම අවස්ථාවකදීම ඒවා යථා තත්ත්වයට පත්කිරීම සඳහා කඩිනම් ප්‍රතිචාර ක්‍රමෝපායක් සමගින් සැලසුම්ගත නිවාරක නඩත්තු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම තුළින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නැව්බඩු මෙහෙයුම් උපකරණ වල ක්‍රියාකාරීත්වය සාර්ථකව පවත්වා ගන යන ලදී. නෞකාවේ සිට ගොඩබිම දක්වා වූ බහළු දොඹකර (STS), රේල්ලුවක් මත ගමන් කරන ගැන්ට්‍රි දොඹකර (RMG), රබර් ටයර් යෙදූ ගැන්ට්‍රි දොඹකර (RTG), ප්‍රයිම්මුවර් රථ, අංගණ ට්‍රක් රථ, බහළු ට්‍රේලර්, බහළු එසවුම් යන්ත්‍ර (Top lifters) විවිධ වර්ගයේ අඩු එසවුම් ට්‍රක් රථ සහ ජය බහළු/සමගි බහළු පර්යන්තයන්හි සියළුම බහළු මෙහෙයුම් උපකරණ එම බහළු මෙහෙයුම් උපකරණයන්හි ක්‍රියාකාරීත්වය 90% ට වඩා වැඩි ප්‍රවණතාවයකින් ලබාදීම සඳහා නඩත්තු කටයුතු සිදුකල අතර, ඒ තුළින් 2017 වසරේ දී බහළු මෙහෙයුම් වල ඉහළ කාර්යසාධනයක් ඇති කරන ලදී.

මෙහෙයුම් සහ සේවා සැපයුම් කොට්ඨාශයන්හි බහළු එසවුම් යන්ත්‍ර (Top lifters), අඩු එසවුම් ට්‍රක් රථ, ට්‍රේලර් සහ ජංගම දොඹකර ඇතුළු සියළුම උපකරණ සහ සිවිල් ඉංජිනේරු කොට්ඨාශයේ සියළුම ඉදිකිරීමේ යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ ඉංජිනේරු කොට්ඨාශය විසින් සාර්ථකව නඩත්තු කරන ලදී. යන්ත්‍රෝපකරණ කොට්ඨාශයේ වගකීම් අතරට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෝටර් රථ වාහන පද්ධතිය (බස්,ලොරි,වෑන්,ඩබල් කැබ්, මෝටර් රථ, ත්‍රීරෝද රථ සහ යතුරු පැදි) සහ ෂංටින් ලොකොමෝටිව් නඩත්තු කිරීම ද අයත් වේ.

මෙහෙයුම්කරුවන් දෙදෙනෙකු විසින් කල්බදු පදනම මත නඩත්තු කර සහ මෙහෙයුම් කරන "සමහිල් ප්‍රදේශයේ" තෙල් ගබඩා සංකීර්ණය යන්ත්‍රෝපකරණ කොට්ඨාශයයේ අධීක්ෂණය යටතේ සාර්ථකව පවත්වාගෙන යන ලදී.

ගිනි ගැනීම හේතුවෙන් ක්‍රියාවිරහිවී තිබූ ටොන් 90 ක බරක් එසවිය හැකි ජංගම දොඹකරය යන්ත්‍රෝපකරණ ඉංජිනේරු කොට්ඨාශය විසින් නවීකරණය කරන ලද අතර එමගින් රුපියල් මිලියන 20 කට වඩා වැඩි ඉතිරියක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට හිමිවන ලදී.

## යන්ත්‍රෝපකරණ වැඩ ඉංජිනේරු කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම වානේ පිරිසැකසුම් වැඩ වල වගකීම දරණු ලබන්නේ යන්ත්‍රෝපකරණ වැඩ ඉංජිනේරු කොට්ඨාශය විසිනි. ජය බහළු පර්යන්තයට සහ සමගි බහළු පර්යන්තයට අදාළ බහළු මෙහෙයුම් දොඹකර, බහළු ගෙන යන කුඩා ටේලර් වලට අදාළ සියළුම ව්‍යුහාත්මක අළුත්වැඩියා කටයුතු, නැංගුරම්ලෑමේ ටග් යාත්‍රා, නියමු යාත්‍රා, භාරන යාත්‍රා වලට අදාළ සියළුම වානේ අළුත්වැඩියා කටයුතු ඉටුකිරීම ආදී වැදගත් කාර්යභාරයක් මෙම කොට්ඨාශය මගින් ඉටුකෙරේ. නාවික යාත්‍රා සහ නැව්බඩු මෙහෙයුම් උපකරණ සඳහා අවශ්‍ය නව අමතර කොටස් යන්ත්‍රානුසාරයෙන් නිපදවීමේ හා පිරිසැකසුම් කිරීමේ කාර්යයන්හි ද මෙම කොට්ඨාශය නිරතව සිටී. තවද මෙම කොට්ඨාශය දම්වැල් සහ කොකු පරීක්ෂා කිරීම මෙන් ම මෙහෙයුම් අවශ්‍යතා සඳහා ග්‍රැබ් උපකරණ නඩත්තු කිරීම පිළිබඳව ද වගකීම දරණු ලැබේ.

ගොඩැනැගිලිවල නව වානේ ව්‍යුහයන් ගුදම් සහ වෙනත් ව්‍යුහයන්ගේ නව ඉදිකිරීම් සහ පැරණි වානේ ව්‍යුහයන් සහ ගොඩනැගිලි ඉවත් කිරීම මෙම කොට්ඨාශයට පැවරේ.

**පහත සඳහන් කාර්යයන් මෙම කොට්ඨාශය විසින් වර්ෂය තුළ දී සම්පූර්ණ කර ඇත;**

- නැගෙනහිර බහළු පර්යන්තයේ ඇතුළුවීමේ දොරටුවේ වානේ පිරිසැකසුම් වැඩ 90% ක් හා පිටවීමේ දොරටුවේ වැඩ 10% ක් අවසන් කර ඇත.
- නැගෙනහිර බහළු පර්යන්තයේ ඉන්ධන පිරවුම්හල ඉදිකිරීම
- CFS -1 ගුදමේ වානේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීම
- ගාල්ල වරායේ පාලම් තරාදිය (Weigh Bridge) ඉදිකිරීම
- J-9, J-15, J-18 යන ගැන්ට්‍රි දොඹකර වල ට්‍රොලි රේල්ලු අළුත්වැඩියා කිරීම
- J-1, J-2, J-3, J-11, J-16 යන ගැන්ට්‍රි දොඹකර වල අත්වැට අළුත්වැඩියා කිරීම.
- ජනාධිපති ලේකම් කාර්යාලය වටා ආරක්ෂිත වැටක් ඉදිකිරීම
- කොච්චිකඩේ පිහිටි CFS-III ගුදම කඩා ඉවත් කිරීම
- බණ්ඩාරනායක ජැටි ගුදමේ සේවා සැපයුම් (බහළු) මෙහෙයුම් සඳහා රැම්පයක් සහ වේදිකාවක් (Ramp & platform) පිරිසැකසුම් කර සවි කිරීම.
- ත්‍රිකුණාමල වරාය සඳහා ගුදමක් ඉදිකිරීම - කණු සහ සම්බන්ධ කිරීමේ බාල්ක සවිකිරීම අවසන් කර ඇත.
- දේශීය හා ජාත්‍යන්තර නියෝජිත කණ්ඩායම් සඳහා සභාපතිවරයා විසින් සිහිවටන ලෙස පිරිනැමීම සඳහා වරාය ලාංඡන (Coxswain wheels) 35 ක් සෑදීම.

ඉහත කාර්යයනට අමතරව, ශ්‍රී ලංකා නාවික හමුදාවේ නැංගුරම් බැඳ තැබීමේ දම්වැල් පරීක්ෂා කිරීම සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විවිධ කොට්ඨාශ සඳහා මෙම කොට්ඨාශයේ වැඩබිම් 07 ක් මඟින් ගැල්වනයිස් කටයුතු, ප්‍රයිම්මූවර් රථ සඳහා ගෙවී ගිය අමතර කොටස් යන්ත්‍රානුසාරයෙන් සැකසීම, බුෂ් වාත්තු කිරීම, ජල පොම්ප සවිකිරීම සහ අළුත්වැඩියා කිරීම සහ ලියවන පට්ටල් වැඩ සිදු කරන ලදී.

## සිවිල් ඉංජිනේරු කොට්ඨාශය

වරායේ සියළුම වරාය යටිතල පහසුකම් හා කාර්ය මණ්ඩල නිල නිවාස නඩත්තු කිරීම මෙම කොට්ඨාශයේ මූලික වගකීම වේ. 2017 වර්ෂය තුළද මෙම ඉලක්කය සපුරා ගැනීමෙහිලා ප්‍රධාන

වශයෙන් ප්‍රාග්ධන සැපයුම සිවිල් ඉංජිනේරු කොට්ඨාශය මගින් සිදු කරන ලදී. ප්‍රධාන ඉලක්කගත කාර්යයට අමතරව කොට්ඨාශය වෙත පැවරී ඇති ඇතැම් සංවර්ධන කාර්යයන්ද මෙම කාල පරිච්ඡේදය තුළ ආරම්භ කර සාර්ථකව අවසන් කර ඇත.

**වරාය යටිතල පහසුකම් හා කාර්ය මණ්ඩල නිල නිවාස නඩත්තු කිරීම.**

බිත්ති පින්තාරු කිරීම, දෛනික අළුත්වැඩියා, වැඩ පිරිසැකසුම් වල සිදු කරන සුළු සුළු වෙනස්කම්, බුමුතුරුණු මාරු කිරීම ඇතුළු කාර්යාල ගොඩනැගිලි / ව්‍යුහයන් සතුටුදායක අන්දමින් නඩත්තු කිරීම මෙම කොට්ඨාශයේ නඩත්තු අංශය මගින් සිදු කරන ලදී. ඉහත සඳහන් කාර්යනට අමතරව, ගොඩනැගිලි සහ නිල නිවාස නිසි පරිදි පවත්වාගැනීම සඳහා අවශ්‍ය දැව වැඩ එම අංශය මගින් සිදු කරන ලදී. 2017 වර්ෂයේදී මෙම අංශය මගින් කොළඹ වරාය සහ අනෙකුත් වරායන්හි නාවික ව්‍යුහයන් සහ සියළුම ප්‍රදීපාගාර මෙම අංශය මගින් නඩත්තු කරන ලද අතර හැරීමේ අංශය මගින් වරායේ ගැඹුර නඩත්තු කරන ලදී. සෑම මට්ටමකට අයත් කාර්ය මණ්ඩල නිල නිවාස සහ වරාය පරිශ්‍රයෙන් පිට වෙනත් ස්ථානවල පිහිටා ඇති නිවාඩු නිකේතන වල නඩත්තු කටයුතු නිවාස අංශය මගින් සිදු කරන ලදී. දරුණු කාලගුණික තත්ත්වයන් / අනෙකුත් ස්වභාවික පාරසරික වෙනස් වීම් හේතුවෙන් ඇති වූ නොයෙකුත් බාධා නොසලකා පිළිගත හැකි මට්ටමින් මාර්ග නඩත්තු කිරීමට මහාමාර්ග හා දුම්රිය මාර්ග අංශය විසින් උපරිම උත්සාහය දරණ ලදී. ජය බහළු පර්යන්තයේ නඩත්තු ඒකකය විසින් බහළු පර්යන්තයේ නඩත්තු කටයුතු සාධාරණ මට්ටමින් සිදු කරන ලදී. අනෙකුත් පොදු පිරිසිදු කිරීමේ කටයුතු සමඟ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය මහජන සෞඛ්‍ය පරීක්ෂක අංශය මගින් සතුටුදායක අයුරින් සිදු කරන ලද අතර වෙන් කල අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ වැඩසටහන, ක්‍රියාත්මක කිරීමේ ප්‍රධනා කාර්යභාරය ඔවුන් විසින් ඉටු කරන ලදී. ගුදම් නඩත්තු කිරීම හා අනෙකුත් හදිසි අවශ්‍යතාවයන් CIW අංශය මගින් මෙහෙයවන ලදී. විශේෂයෙන්ම එක් එක් අංශය විසින් මෙහෙයවන සුවිශේෂී කාර්යයන් හැරුනුකොට නඩත්තු කටයුතු සහ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම අවස්ථා දෙකෙහිදීම සියළුම අංශයන් එකිනෙකාට සහාය දක්වන ලදී.

**සංවර්ධන වැඩ**

නව සංවර්ධන කාර්යයන් සාමාන්‍යයෙන් සංවර්ධන අංශය මගින් මෙහෙයවනු ලැබුවද පහත කාර්යයන් ඉටුකිරීමට සියළුම අංශ සාමූහිකව සහයෝගය දක්වන ලදී.

- CFS -I ගුදම සම්පූර්ණයෙන්ම නැවත ඉදිකිරීම (සිවිල් වැඩ) සහ නැගෙනහිර බහළු පර්යන්තයේ ගොඩනැගිලි / ව්‍යුහයන් ඉදිකිරීම.
- කනකසන්තුර හා ත්‍රිකුණාමල වරායයන්හි විවිධ ඉදිකිරීම්.
- බාහිර ව්‍යාපෘති සඳහා අවශ්‍ය ප්‍රතිස්ථානගත කිරීමේ වැඩ.

## මානව සම්පත් සංවර්ධනය

### මානව සම්පත් කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආයතනික අරමුණු ඉටු කිරීම පිණිස එහි සියළුම කොට්ඨාශ වලට අවශ්‍ය සේවක පිරිස් බඳවාගැනීම මඟින් මානව සම්පත් කොට්ඨාශය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. කළමනාකාරීත්වය සහ සේවකයින් තෘප්තියට පත්වන ආකාරයෙන් කාලෝචිත බඳවා ගැනීම් තුළින් මෙම අරමුණ ඉටුකිරීම කඩිනම්වී ඇත.

2017 වසර ආරම්භයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමස්ත සේවක සංඛ්‍යාව 9,651 ක්වූ අතර මෙයට ඇතුළත් ස්ථිර, කොන්ත්‍රාත් පදනම හා වෙනත් සේවක කාණ්ඩ පහත පරිදි වේ.

| | |
|---|---|
| විධායක | 591 |
| විධායක නොවන | 5,379 |
| තාක්ෂණික | 1,824 |
| තාක්ෂණික නොවන | 1,857 |
| **එකතුව** | **9,651** |

කෙසේ වුවද, 2017 වසර ආරම්භයේදී 9651 ක් වූ සේවක සංඛ්‍යාව  වසර අවසානයේදී 9,377 ක් වූ අතර වරායයන් අනුව සේවක සංඛ්‍යාව පහත පරිදි වේ.

| | |
|---|---|
| කොළඹ වරාය | 8,625 |
| ගාල්ල වරාය | 351 |
| ත්‍රිකුණාමල වරාය | 401 |
| **එකතුව** | **9,377** |

**2017 වසර තුළ අභ්‍යන්තර උසස්වීම්**

මානව සම්පත් සැලැස්මට අනුව බඳවාගැනීමේ ක්‍රියාපටිපාටිය ප්‍රකාරව යෝග්‍යතාවය සහ සුදුසුකම් සහිත අපේක්ෂකයන්ගෙන්  අභ්‍යන්තර පුරප්පාඩු පුරවන ලද අතර පුරප්පාඩු වන තනතුරු සඳහා අභ්‍යන්තර අයදුම්කරුවන් නොමැති අවස්ථාවන්හිදී බාහිර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවන ලදී.

**2017 වසර සඳහා බාහිරින් බඳවාගත් සේවකයින් පිළිබඳ තොරතුරු**

2017 වසර තුළ ස්ථිර සහ කොන්ත්‍රාත් පදනම මත සේවකයන් 125 දෙනෙකු බාහිරව බඳවාගන්නා ලදී. පහත වගුව මගින් වාර්තාව සවිස්තරාත්මකව දැක්වේ.

| සේවක කාණ්ඩය | ස්ථිර | කොන්ත්‍රාත් | එකතුව |
|---|---|---|---|
| විධායක | 19 | 4 | 23 |
| විධායක නොවන | 50 | 7 | 57 |
| තාක්ෂණික නොවන | 40 | 1 | 41 |
| තාක්ෂණික | 04 | 0 | 4 |
| එකතුව | **113** | **12** | **125** |

**සේවයෙන් ඉවත්වූ සේවකයින් පිළිබඳ තොරතුරු**

2017 වසර තුළ සේවකයින් 399 දෙනෙකු සේවයෙන් ඉවත්වූ අතර, අදාළ විස්තර පහත දක්වා ඇත.

| සේවයෙන් ඉවත්වීමට හේතුව | ඉවත්වූ සේවක සංඛ්‍යාව |
|---|---|
| විශ්‍රාම ගැනීම් | 332 |
| මරණයට පත්වීම | 24 |
| සේවයෙන් පහකිරීම් | 07 |
| සේවයෙන් ඉල්ලා අස්වීම් | 20 |
| සේවය අත්හැර යෑම් | 08 |
| වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම | 02 |
| සේවය අවසන් කිරීම් | 06 |
| එකතුව | **399** |

**අනතුරු සහ වන්දි ගෙවීම්**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයන් 69 දෙනෙකු හා බාහිර පුද්ගලයන් 09 දෙනෙකු ඇතුළුව සමාලෝචිත වර්ෂය තුළ සිදුවූ මුළු හදිසි අනතුරු සංඛ්‍යාව 78කි. බාහිර පුද්ගලයින් දෙදෙනෙකු මිය ගොස් ඇති අතර එක් පුද්ගලයෙකු සඳහා පමණක් වන්දි ගෙවීමට නියමිතව ඇත.

**පාරිතෝෂික ගෙවීම්**

ස්වභාවික හේතූන් මත මරණයට පත්වූ සේවකයන්ගේ යැපෙන්නන් හට ගෙවීම් ලෙස රු.529,000 /= ක මුදලක් ගෙවන ලද අතර, 2017 වසර සඳහා තවත් රු60,000/= ක් ගෙවීමට නියමිත ය.

**දැනුවත් කිරීමේ සහ අභිප්‍රේරණය කිරීමේ වැඩසටහන්**

දැනුවත් කිරීමේ සහ අභිප්‍රේරණය කිරීමේ වැඩසටහන් 04ක් මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනයේ දී පවත්වන ලදී. මෙම වැඩසටහන් වල මූලික අරමුණ වූයේ ආයතනික අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සේවකයන් අභිප්‍රේරණය කිරීම සහ ඵලදායීතාවය ඉහළ නැංවීම ය.

**රන් කාසි ප්‍රදානය**

| බර | කාසි ගණන |
|---|---|
| පවුම් 01 | 24 |
| පවුම් 01 ¼ | 43 |
| පවුම් 01 ½ | 09 |

**සේවා ස්ථාන මාරු සහ සහන කමිටුව**

2017 වසර තුළ සේවක ස්ථාන මාරු සහ සහන කමිටුව සය (06) වතාවක් රැස්වූ අතර, සේවකයින් ඉදිරිපත් කරන කරුණු මත ස්ථාන මාරුවීම් ලබාදීමට සහ දුක්ගැනවිලි නිරාකරණය කිරීමට පියවර ගන්නා ලදී.

**විනය කටයුතු**

විනයගරුක සේවක පිරිසක් සේවයෙහි යොදවා ගැනීම පිණිස 2017 වසරේ දී විනය පරීක්ෂණ 194 ක් මානව සම්පත් කොට්ඨාශය විසින් පවත්වන ලදී.

## සුභසාධක හා කාර්මික සම්බන්ධතා කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයන් හට වඩා හොඳ ජීවන තත්ත්වයක් ලබාදීමට ඉවහල් වන්නාවූ පහසුකම් හා අවස්ථාවන් ලබාදීම පිණිස කාර්මික සම්බන්ධතා කොට්ඨාශය ක්‍රියාත්මක වේ.

**කොට්ඨාශයේ පරිපාලනය**

සුභසාධක හා කාර්මික සම්බන්ධතා කොට්ඨාශය අංශ දෙකකින් යුක්තව ක්‍රියාත්මක වේ.

- කොට්ඨාශයේ ප්‍රධාන කාර්යාලය
- මධ්‍යම මුළුතැන්ගෙවල් අංශය

සුභසාධක හා කාර්මික සම්බන්ධතා කොට්ඨාශය ක්‍රියාත්මක කරන සුභසාධක වැඩසටහන් පහත පරිදි වේ.

**කාර්යය මණ්ඩලය සඳහා නොමිලේ ආහාර සැපයීම**

වරාය අධිකාරියේ පොරොත්තු සේවයේ යොදවා ඇති සේවකයින් හට දිවා/රාත්‍රී ආහාර මෙන්ම තේ සහ කැවිලි සපයන අතර කාර්යාල ගණයේ සේවකයින්ට දිවා ආහාරය සපයනු ලැබේ. 2017 වර්ෂය තුළ දිවා/රාත්‍රී ආහාර හා තේ/රසකැවිලි සැපයීම සඳහා වැය කර ඇති මුදල රු 657,343,932/= කි. ආහාර ලබා නොගන්නා සේවකයින් හට ඒ වෙනුවෙන් එක් ආහාර වේලක් සඳහා රු.100/= ක මුදලක් ගෙවනු ලැබේ.

**සේවක සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය**

රක්ෂණ වර්ෂය සෑම වසරකම සැප්තැම්බර් 01 දිනෙන් ආරම්භවී ඊළඟ වර්ෂයේ අගෝස්තු මස 31 දිනෙන් අවසන් වේ. ඒ අනුව 2016/2017 ට අදාළ රක්ෂණ වර්ෂය 2017 අගෝස්තු 31 දිනෙන් අවසන් විය. එය MBSL රක්ෂණ ආයතනය මගින් ක්‍රියාත්මක වූ අතර 2017/2018 රක්ෂණ වර්ෂය ජාතික රක්ෂණ භාර අරමුදල (National Insurance Trust Fund) හරහා ක්‍රියාත්මක වේ. ඒ අනුව, 2017/2018 රක්ෂණ වර්ෂය ජාතික රක්ෂණ භාර අරමුදල හරහා ක්‍රියාත්මක කිරීමේ දී පහත සඳහන් වෙනස්කිරීම් සිදු කර ඇත.

01. රෝහල් ගාස්තු ආවරණය කිරීම රු.100,000/= සිට රු. 200,000/= දක්වා වැඩි කර ඇත.

02. රෝහල් ගතවීමකදී එක් අවස්ථාවක් සඳහා ගෙවන උපරිම රක්ෂණ මුදල රු.75,000/= සිට රු.150,000/= දක්වා වැඩි කර ඇත.

**ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක මහත්ම / මහත්මීන්ගේ දරුවන් වන අ.පො.ස (උ/පෙළ) හදාරන සිසුන් හා විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන සිසුන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ වැඩ පිළිවෙළ අදියර දෙකක් යටතේ ක්‍රියාත්මක වේ. අ.පො.ස. (උ/පෙළ) හදාරන සිසුන් සඳහා මාසිකව රු. 750/= බැගින් මාස 24ක කාලසීමාවක් තුළ ප්‍රදානය කෙරේ. මෙම මුදල වසරකට රු. 9,000/= බැගින් වසර දෙකක් දක්වා ගෙවනු ලැබේ. ඒ අනුව, 2014 සහ 2015 යන වර්ෂවල දෙසැම්බර් මාසයේදී පවත්වන ලද අ.පො.ස. (සා/පෙළ) විභාගයේ ප්‍රතිඵල පදනම්ව ශිෂ්‍යත්වලාභීන් 514 දෙනෙකු වෙනුවෙන් රු. 4,626,000/= ක මුදලක් ගෙවා ඇත.

සේවක මහත්ම/මහත්මීන්ගේ විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබන දූ දරුවන් සඳහා මහපොළ ශිෂ්‍යාධාරය හෝ විශ්වවිද්‍යාල ශිෂ්‍යාධාර ලබා නොගැනීමේ පදනම මත ශිෂ්‍යත්ව ලබා දීම සිදු කරනු ලැබේ. මෙම ශිෂ්‍යත්ව වසරකට මාස 10 ක් වන සේ වසර 03 සිට 05 දක්වා වූ කාල සීමාවක් සඳහා පිරිනමන අතර එය පාඨමාලාවේ කාලසීමාව මත රඳා පවතී. වසර 03 ක පාඨමාලා සඳහා වසරකට රු.25,000/= බැගින්ද ඒ ආකාරයටම වසර 04 සහ 05 පූර්ණකාලීන උපාධි පාඨමාලා සඳහා වසරකට රු.25,000/= බැගින් වාර්ෂිකව ගෙවනු ලබයි. ඒ අනුව වසර 03 ක සාමාන්‍ය උපාධිය හදාරන ශිෂ්‍ය/ශිෂ්‍යාවන් සඳහා රු. 75,000/= ක්ද, වසර 4 මූලික උපාධි පාඨමාලාව හදාරන ශිෂ්‍ය/ශිෂ්‍යාවන් සඳහා රු.100,000/= ක් ද, වසර 05 වෛද්‍ය උපාධිය හදාරන ශිෂ්‍ය/ශිෂ්‍යාවන් සඳහා රු.125,000/= ක් ද වශයෙන් එක් ශිෂ්‍යත්වලාභියෙකු වෙනුවෙන් වාර්ෂිකව රු.25,000/= බැගින් ගෙවනු ලැබේ.

ඒ අනුව, 2011/2012, 2012/2013, 2013/2014 හා 2014/2015 යන අධ්‍යයන වර්ෂ තුළ ශිෂ්‍ය/ශිෂ්‍යාවන් 334 දෙනෙකු සඳහා ශිෂ්‍යාධාර මුදල් ලෙස රු. 8,350,000/= ක මුදලක් ගෙවා ඇත. 2015/2016 අධ්‍යයන වර්ෂයට අදාළව අයදුම්පත් කැඳවන ලද අතර, ශිෂ්‍යාධාර පිරිනැමීම සඳහා සුදුසුකම් ලැබ සිටි ඇති ශිෂ්‍ය සංඛ්‍යාව 60 දෙනෙකුගෙන් අයදුම්පත් ලැබිණ.

**ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය**

වරාය අධිකාරියේ සේවක මහත්ම මහත්මීන් සඳහා 2016 ජනවාරි 08 වැනි දින ආරම්භ කරන ලද ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය සාර්ථකව ක්‍රියාත්මකව පවතී. මේ වන විට ලියාපදිංචි වී ප්‍රතිකාර ගෙන ඇති රෝගීන් සංඛ්‍යාව 1,885කි. 2017 වර්ෂයේ ප්‍රතිකාර ලබාගත් රෝගීන් සංඛ්‍යාව 8,614 ක් විය. ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර වලට අමතරව මෙහි චීන කටු චිකිත්සක ප්‍රතිකාර ද කරනු ලැබේ. ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය සඳහා 2017 වසර සඳහා ප්‍රාග්ධන වියදම් වශයෙන් රු. 400,000/= ක මුදලක්ද, පුනරාවර්තන වියදම් වශයෙන් 2,000,000/= ක මුදලක් ද වෙන් කර ඇත.

**සුභසාධක නිවාස ණය යෝජනා ක්‍රමය**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ස්ථිර සේවකයින්ට නිවසක් ඉදිකර ගැනීමට, නිවසකට අළුතින් කොටසක් එකතු කිරීමට, හෝ නිවසක් ඉදිකිරීම සඳහා ඉඩමක් මිල දී ගැනීමට රුපියල් 500,000/= ක උපරිමයකට යටත්ව ණය මුදලක් ලබා දීමේ යෝජනාක්‍රමයක් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව හරහා ක්‍රියාත්මක වේ. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වර්ෂයකට රු මිලියන 50ක මුදලක් වෙන් කරනු ලැබේ. එම ණය මුදල ලබා දීමේදී 6%ක සහනදායී පොලී අනුපාතයක් අය

කරනු ලැබේ. 2017 වසරේ දී අයදුම්පත් 05ක් ලැබී ඇති අතර රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව වෙත මෙම වැඩ පිළිවෙළ යටතේ මුදාහැර ඇති මුදල රු 1,500,000/= කි.

**සුභසාධක කටයුතු සඳහා බස් රථ ලබා දීම**

අධිකාරියේ සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ අවමංගල්‍ය කටයුතු, වන්දනා ගමන් හා විනෝද චාරිකා සඳහා බස් රථ 05ක් යොදවා ඇත. අභ්‍යන්තර ප්‍රවාහන කටයුතු සඳහා බස් රථ 03 ක් වෙන් කර ඇත. 2017 වසර තුළ සිදු කරන ලද මුළු ගමන් සංඛ්‍යාව 791 ක් විය.

**දිවා සුරැකුම් මධ්‍යස්ථානය සහ පෙර පාසල**

අවු: 2 ½ සිට අවුරුදු 05 දක්වා වයස් වල දූ දරුවන් සඳහා මෙම පහසුකම් සලසනු ලැබේ. ළමුන් ඇතුළත් කර ගැනීම ජනවාරි මස සිට සැප්තැම්බර් 30 දින දක්වා සිදු කරන අතර එක් දරුවෙකු වෙනුවෙන් රු 1,300/= ක මාසික ගාස්තුවක් අය කෙරේ.
2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මාසික ගාස්තු වශයෙන් ලැබී ඇති මුදල රු.679,000/=කි.

**පුස්තකාල පහසුකම්**

වරාය අධිකාරියේ සේවකයින්ගේ කියවීමේ රුචිය වැඩි කිරීම සහ ඒ තුළින් නව දැනුම එකතු කර ගැනීම හා කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් සේවකයින් විසින් පවත්වාගෙන යනු ලබන පුස්තකාල සඳහා මූල්‍ය ප්‍රතිපාදන සපයනු ලැබේ. 2017 වසරේ මේ සඳහා රු 200,000/=ක මුදලක් අනුමත වූ අතර එය ක්‍රියාත්මක තත්ත්වයේ පවතින පුස්තකාල 20 ක් සඳහා සාමාජික සංඛ්‍යාව අනුව බෙදාදෙන ලදී. එක් පුස්තකාලයක් සඳහා උපරිම මුදල රු. 10,900/= කි.

**විශේෂ නිවාඩු හිමිකම් දීමනා ගෙවීම**

කිසියම් සේවකයෙකු රෝගීවීමෙන් හෝ අනතුරකට ලක්වීමෙන් සිය සම්පූර්ණ නිවාඩු හිමිකම් අවසන්වී ඇති අවස්ථාවක එම සේවකයා වෛද්‍ය නිර්දේශ මත සේවයට යෝග්‍යතාවය ලබන තෙක් උපරිම දින 180 ක් සඳහා වැටුප් සහිත නිවාඩු ලබාදෙනු ලැබේ. සහනදායී පියවරක් ලෙස වැටුප් සහිත නිවාඩු හෝ වැටුප් රහිත නිවාඩු අනුමත් කරනු ලබන්නේ ප්‍රධාන වෛද්‍ය නිලධාරීන්ගේ අනුමැතියට යටත්වය. 2017 ජනවාරි සිට දෙසැම්බඑර් මාසය දක්වා අයදුම්පත් 92 ක් ලැබී ඇති අතර, ඉන් වැටුප් රහිත නිවාඩු දින 181 ක් සඳහාද වැටුප් සහිත අනුමත නිවාඩු දින 3,845 ක් සඳහාද වැටුප් රහිත නිවාඩු දින 07 ක් සඳහාද අනුමැතිය ලබාදී ඇත.

**සමුද්‍රීය කෞතුකාගාරය**

සමුද්‍රීය කෞතුකාගාරය සතියේ දිනවල ඉරිදා දිනවල සහ පෝයදිනවල පෙ.ව. 08.00 සිට ප.ව. 05.00 දක්වා විවෘතව ඇත. 2017 වර්ෂයේ කෞතුකාගාරය නැරඹූ මුළු සංඛ්‍යාව 52,318 කි.

වරායේ ඓතිහාසික විකාශනය විදහා දැක්වෙන අනුරූ, ඵලක භාණ්ඩ සහ පැරණි වරාය පරිශ්‍රය තුළ නාවික ගමනාගමනයට භාවිතා කළ භාණ්ඩ මෙහි ප්‍රදර්ශනයට තබා ඇත. පාසැල් සිසුන් හට ඉහළ අධ්‍යාපනික වටිනාකමක් ඇති මෙය නැරඹීමට පාසැල් ශිෂ්‍යයන් වැඩි වශයෙන් පැමිණෙති. කොළඹින් බැහැරව අධ්‍යාපනික චාරිකා පැමිණෙන පාසල් සිසුන්ගෙන් බහුතරයක් මෙම සමුද්‍රීය කෞතුකාගාරය නැරඹීමට පැමිණේ. ඊට අමතරව වැඩිහිටි නිවාස හා පෙර පාසැල් වලින් ද පැමිණේ.

**සේවකයින් සඳහා තිළිණ ප්‍රදානය**

වසර 30ක සේවා කාලයක් සම්පූර්ණ කල ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළු සේවකයින් සඳහා වටිනා තිළිණ ප්‍රදානය කරනු ලැබේ. 2014 වර්ෂයේ සිට තිළිණ ප්‍රදානය කරනු ලබන පිළිවෙතහි සම්පූර්ණ වෙනසක් සිදු කරන ලදී. ඒ අනුව වසර 30 ක සේවා කාලයක් සම්පූර්ණ කරන සේවකයින් සඳහා තිළිණ ලබා දීම මානව සම්පත් කොට්ඨාශයේ දැනුම් දීම මත සුභසාධක හා කාර්මික සම්බන්ධතා කොට්ඨාශය මඟින් සිදු කරනු ලැබේ. ඒ අනුව, 2017 වසරේ දී තිළිණ ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබූ සේවක සංඛ්‍යාව 342 ක් විය.

**සුභසාධක ආපනශාලා**

වරාය අධිකාරියේ සේවකයින්ගේ සහ පිටස්තර වරාය භාවිතාකරන්නන්ගේ අවශ්‍යතා සඳහා වරාය පරිශ්‍රය තුළ ආපනශාලා 13ක් පවත්වාගෙන යනු ලැබේ. වාර්ෂික මිල ගණන් කැඳවා සුදුසු බදුකරුවන් තෝරාගෙන එම අය මඟින් ආපනශාලා පවත්වාගෙන යනු ලැබේ. 2017 වර්ෂය තුළ දී ආපනශාලා මඟින් බදු කුලිය ලෙස ලැබුණු මුළු ආදායම රු 5,498,418/= කි.

**කතරගම අංක II නිවාඩු නිකේතනය**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපතිගේ අංක 29/2017 හා 2017.10.06 දරණ චක්‍රලේඛය මඟින් කතරගම අංක II නිවාඩු නිකේතනය සුභසාධක හා කාර්මික සම්බන්ධතා කොට්ඨාශය වෙත පවරන ලදී. 2017.10.06 දින සිට 2017.12.31 දින දක්වා මෙම පහසුකම් ලබාගත් සේවක මහත්ම/ මහත්මීන් සංඛ්‍යාව 321 කි.

## වෛද්‍ය කොට්ඨාශය

වෛද්‍ය කොට්ඨාශය සතියේ දින 7 තුළ පැය 24 පුරා ක්‍රියාත්මකව පවතී.

බාහිර ප්‍රතිකාර අංශයක්, දන්ත ශල්‍යාගාරයක්, එක්ස් කිරණ සහ ඊ.සී.ජී පහසුකම්, රසායනාගාරයක්, දවසේ පැය 24 පුරා විවෘතව ඇති ඖෂධ ශාලාවක්, බෙහෙත් ශාලාවක් සහ ගිලන්රථ සේවාවක් සහිත වෛද්‍ය කොට්ඨාශයෙහි වෛද්‍යවරු 06 දෙනෙකු, දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු සහ පරිපූරක වෛද්‍ය කාර්ය මණ්ඩලයක් සේවයේ යෙදී සිටී. අනතුරු හා හදිසි ප්‍රතිකාර සේවා අප්‍රමාදව සැපයේ.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කොට්ඨාශ මට්ටමේ ඩෙංගු මර්දන කමිටු සාමාජිකයෙකුගේ සහ කොට්ඨාශ ප්‍රධානීගේ අධීක්ෂණය යටතේ එක් එක් කොට්ඨාශයට සම්බන්ධ ඩෙංගු මර්ධන කණ්ඩායම් විසින් සතිපතා වරාය පරිශ්‍රය තුළ ඩෙංගු මදුරුවන් බෝවන ප්‍රදේශ පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ. එක් එක් කොට්ඨාශය මඟින් මාසික වාර්තාවක් වරාය හා නාවික අමාත්‍යාංශයේ ලේකම් වෙත ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති මඟින් යවන ලදී.

ඩෙංගු රෝගය සම්බන්ධයෙන් මතුවන ගැටළු සාකච්ඡා කිරීමට සහ ඒ සඳහා ප්‍රතිකාර්මික පියවර ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඩෙංගු මර්දන කමිටුව විසින් රැස්වීම් මාසිකව පවත්වන ලදී.

විශේෂයෙන් ජීවන රටාව හේතුකොට ගෙන වැළඳෙන දියවැඩියාව වැනි රෝග වැලැක්වීම සඳහා අපගේ වෛද්‍යවරුන් විසින් අධ්‍යාපනික වැඩසටහන් පවත්වන ලදී.

වෛද්‍ය කොට්ඨාශයයේ සම්පත් පරිභෝජනය ඉතාමත් ප්‍රශස්ත මට්ටමින් සිදුකරන ලදී.

## මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය (MPMA)

මහපොළ වරාය සහ සමුද්‍රීය විද්‍යායතනය (MPMA) වරාය සේවකයින්, වරාය භාවිතා කරන්නන් සහ සමුද්‍රීය ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයින් පුහුණු කිරීමේ ප්‍රධාන අරමුණ පෙරදැරිව කටයුතු කරන ආයතනයකි. වාර්ෂික පුහුණු දින දර්ශනයට අනුව ඉලක්ක ගත කණ්ඩායම්වල දැනුම, නිපුණතා හා ආකල්ප වර්ධනය අරභයා සකසන ලද දේශන, සම්මන්ත්‍රණ, වැඩ මුළු මාලාවන් සහ ප්‍රායෝගික පුහුණු වැඩ සටහන් කෙරෙහි අවධානය යොමු කරන ලදී. වරාය සේවකයින්ගේ ඵලදායිතා වර්ධනය, කණ්ඩායම් හැඟීම් වර්ධනය, තාක්‍ෂණික නිපුණතා සංවර්ධනය, පාරිභෝගික සේවා සහ තත්ත්ව අභිවෘද්ධිය අරමුණු කරගත් වැඩ මුළු ගණනාවක් 2017 වසරේ දී පවත්වන ලදී.

පාරිභෝගික අරමුණු ඉලක්කගතව සැකසුනු පාඨමාලා තුළින් වරාය සේවකයන් හට ඔවුන්ගේ ප්‍රවීනතා මට්ටම ඉහළ නංවාගැනීමට සහ වරාය මෙහෙයුම් පිළිබඳ ඔවුන්ගේ නිපුණතා දියුණු කර ගැනීමට මහපොළ වරාය සහ සමුද්‍රීය විද්‍යායතනය අවස්ථා සලසා දී ඇත.

2017 වර්ෂයේදී මිනිස් පැය 342,756 ආවරණය කරමින් (සේවාස්ථ පුහුණුව රහිතව) අපේක්‍ෂකයන් 3,305 පමණ මහපොළ වරාය සහ සමුද්‍රීය විද්‍යායතනය මගින් පුහුණු කර ඇත. මීට අමතරව කාර්මික විද්‍යාල සහ අනෙකුත් වෘත්තීය පුහුණු ආයතනවල සිසුන් සහ විශ්වවිද්‍යාල උපාධි අපේක්‍ෂකයන් 158 දෙනෙකු සඳහා මහපොළ වරාය සහ සමුද්‍රීය විද්‍යායතනය මගින් සේවාස්ථ පුහුණුව ලබා දී ඇත.

**2017 වර්ෂයේ සමස්ත පුහුණු කිරීම් ප්‍රමාණය**

| **විෂය ධාරාව** | **පුහුණු කරන ලද අපේක්‍ෂකයින් සංඛ්‍යාව** | **මුළු මිනිස් පැය ගණන** |
|---|---:|---:|
| උපකරණ ක්‍රියාකරවීම | 1,252 | 18,953 |
| නැව්බඩු මෙහෙයවීම | 36 | 864 |
| කළමනාකරණය | 1839 | 236,322 |
| තොරතුරු පද්ධති | 463 | 48,093 |
| තාක්‍ෂණික ( විදුලි/යාන්ත්‍රික වැඩපල) | 575 | 34,652 |
| ගිනි නිවීම්, නිරාපද සහ වෘත්තීය සෞඛ්‍ය | 993 | 16,651 |
| සමුද්‍රීය සහ නාවික සේවක | 685 | 18,880 |
| ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරියේ ආධුනිකයන් වෘත්තීය පුහුණු ආයතන සහ කාර්මික විද්‍යාල සිසුන් | 101 | 171,080 |
| විශ්වවිද්‍යාල උපාධි අපේක්‍ෂකයින් | 57 | 95,760 |
| **එකතුව (සේවාස්ථ පුහුණුව රහිතව)** | **3,305** | **196,596** |
| **එකතුව (සේවාස්ථ පුහුණුව සහිතව)** | **4,349** | **342,756** |

**නව උසස්වීම් පරිපාටිය යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයන්හට උසස්වීම් සඳහා යෝග්‍යතා සුදුසුකම් ලබාදීම**

අදාළ අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් නොමැතිවීම හේතුවෙන් බොහෝ වරාය සේවකයන් උසස්වීම් ලබා ගැනීමට නොහැකිව එකම තනතුරේ රැඳී සිටින බව නිරීක්ෂණය වී ඇත. මෙම තත්ත්වය මගහරවා ගැනීමට සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියට සුදුසු පරිදි මෙම සුදුසුකම් සපුරාලීමට මහපොළ වරාය සහ සමුද්‍රීය විද්‍යායතනය ව්‍යුහාත්මක පුහුණු වැඩ සටහන් සැලසුම් කර ඇත.

තුවද, විධායක ශ්‍රේණියේ නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා 2017 වර්ෂය තුළදී වරාය මෙහෙයුම් කළමනාකරණය, වරාය ආරක්ෂක කළමනාකරණය, ගිණුම්කරණය, විගණනය සහ මානව සම්පත් කළමනාකරණය යන විෂයයන් පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන් පවත්වන ලදී. නැව් ශිල්පී කිමිදුම්කරුවන්ගේ සහ කාන්තා ගැන්ට්‍රි දොඹකර ක්‍රියාකරවන්නියන්ගේ නිපුණතා වැඩි දියුණු කිරීම සඳහා නව වැඩසටහන් දෙකක් පවත්වන ලදී.

**සමස්ත වරාය ඵලදායීතාවය වැඩි දියුණු කිරීම**

වරායේ සමස්ත ඵලදායීතාවය වැඩි දියුණු කිරීම සඳහා වරාය කටයුතු පිළිබඳ විවිධ විෂයයන් සඳහා මහපොළ වරාය සහ සමුද්‍රීය විද්‍යායතනය විවිධ කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ.

- වරාය මූල්‍ය / ගිණුම්
- විගණනය
- ප්‍රසම්පාදනය හා ගබඩා පාලනය
- ලිපිකරු කුසලතා සංවර්ධනය හා පරිපාලනය
- මානව සම්පත් කළමනාකරණය
- ධනාත්මක චින්තනය
- සෞඛ්‍ය සහ ආරක්ෂාව
- වරාය කළමනාකරණය
- කාර්මික ශිල්පීන් සහ අධීක්ෂකවරුන් සඳහා ඉංජිනේරු සැලසුම් ඇඳීම
- මෝටර් පාලක පරිපථ
- විදුලි කාර්මිකයින් සඳහා ඉලෙක්ට්‍රොනික විද්‍යාව
- වැද්දුම් පාඨමාලාව
- පරිගණක පුහුණුව
- උපකරණ පුහුණුව

2017වසරේ දී පාඨමාලා වලට සහභාගීවූවන් 4,349 දෙනෙකු සඳහා මෙවැනි වැඩ සටහන් එකසිය හතලිස් පහක් (145) පවත්වන ලදී. බහළු පර්යන්තයන්හි මිනිස් ජීවිත සහ උපකරණවල ආරක්ෂාව වැඩිදියුණු කිරීම සඳහා පෞද්ගලික ලොරි රථ රියැදුරන් 933ක් සඳහා ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. මෙම වැඩසටහන් වල ප්‍රතිඵලයක් වශයෙන් ලොරි රථ ආපසු හරවා පැමිණීමේ කාලය අඩුවීම සහ පර්යන්ත කටයුතුවල ආරක්ෂාවේ වර්ධනයක් ඇති විය.

**දේශීය සහ විදේශීය සමුද්‍රීය කර්මාන්තයට සහයෝගය දැක්වීම**

සමුද්‍රීය කර්මාන්තයට අදාළ පුහුණු වැඩසටහන් පැවැත්වීමෙන් මහපොළ වරාය සහ සමුද්‍රීය විද්‍යායතනය ගෝලීය සමුද්‍රීය ක්ෂේත්‍රයට විශාල දායකත්වයක් ලබා දේ. මෙම වැඩසටහන් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව රැකියා විරහිත හා වරප්‍රසාද නොලත් දහස් ගණන් ශ්‍රී ලාංකීය තරුණ තරුණියන් ජාත්‍යන්තර නෞකා සේවාවන්හි රැකියා සොයා ගනිති. 2017 වසරේදී අපේක්ෂකයින් 685 සඳහා වැඩසටහන් 33 පවත්වන ලදී.

**ISO 9001 :2008 සහතිකය**

මහපොළ වරාය සහ සමුද්‍රීය විද්‍යායතනය, නැවියන් සඳහා නාවික ක්ෂේත්‍රයේ රැකියා ලබාගැනීමට අනිවාර්යය අවශ්‍යතාවයක් වන IMO/ATCW පුහුණු වැඩ සටහන් පැවැත්වීම සඳහා තිබිය යුතු තත්ත්ව කළමනාකරණ පද්ධතිය සඳහා ISO 9001 : 2008 තත්ත්ව සහතිකය ලබා ඇති ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ අධ්‍යාපනික ආයතනයකි. 2017 වර්ෂයේදී විද්‍යායතනය විසින් කළමනාකරණ සමාලෝචන 03ක් අභ්‍යන්තර තත්ත්ව විගණන 04 ක් වෙළඳ නැව් ලේකම් කාර්යාල විගණන 01 ක් සහ ඉංදියාවේ ලියාපදිංචි තත්ත්ව ප්‍රමිති (IRQS) විගණන 01 ක් පවත්වා ඇත.

**නවීන තාක්ෂණය භාවිතා කිරීම**

ආයතනයේ කටයුතු වලට නවීන තාක්ෂණය හඳුන්වාදීම තුළින් වරාය මහපොළ සමුද්‍රීය විද්‍යායතනය පුහුණු වැඩසටහන් වල තත්ත්වය වැඩි දියුණු කර ඇත. අභ්‍යාසලාභීන් 33 දෙනෙකු පුහුණු කරන, මෙහි ස්ථාපනය කර ඇති මෙකාට්‍රොනික පර්යේෂණාගාර බහළු සිමියුලේටර් (Mechatronic Laboratory Container Simulator) ගැන්ට්‍රි දොඹකර ක්‍රියාකරවන්නන් හා හුවමාරු (Transfer) දොඹකර ක්‍රියාකරවන්නන් 53ක් පුහුණු කරනු ලබමින් පවතී. තෝරාගත් කාන්තා අභ්‍යාසලාභීන් 12 දෙනෙකු ග්‍රැන්ට් දොඹකර මත පුහුණු කරනු ලැබ ඇත.

**විභව්‍ය ශ්‍රම බලකාය**

අනාගත අවශ්‍යතා සපුරාලීම සහ අළුතින් සංවර්ධනය කරන ලද වරායයන්වල වැඩකටයුතු සඳහා පුහුණු සේවක සංචිතයක් පවත්වා ගෙන යෑමේ කටයුතු මහපොළ වරාය සහ සමුද්‍රීය විද්‍යායතනය විසින් ක්‍රියාත්මක කරමින් සිටී. මෙය අරමුණු කර ගෙන 2017 වසරේදී වරාය උපකරණ ක්‍රියාකරුවන් 262ක් පුහුණු කරන ලදී.

**භාෂා සහ තොරතුරු තාක්ෂණ කුසලතා වැඩිදියුණු කිරීම**

ගෝලීය ව්‍යාපාරයකදී පාරිභෝගික තෘප්තිය අත්‍යාවශ්‍ය සාධකයක් වන බැවින්, පාරිභෝගිකයන් වඩාත් තෘප්තියට පත්කිරීම සඳහා සේවකයන්ගේ භාෂා කුසලතා වර්ධනය කිරීම සහ ඔවුනට තොරතුරු තාක්ෂණ කුසලතා හා දැනුම ලබාදීම පිළිබඳව ශ්‍රී ලංකා වරාය අධිකාරිය සැලකිලිමත් වී ඇත. මෙය යථාර්තයක් බවට පත් කිරීමේ වගකීම මහපොළ වරාය සහ සමුද්‍රීය විද්‍යායතනය භාර ගෙන ඇති අතර සේවකයින්ගේ සහජ හැකියාවන් වර්ධනය කිරීම සඳහා 2017 වසරේදී විවිධ තොරතුරු තාක්ෂණ පාඨමාලා පවත්වා සේවකයන් 463 පුහුණු කර ඇත. තවද, තෝරා ගත් අයදුම්කරුවන් 192 සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි ඇතුළු විවිධ භාෂා පාඨමාලා පවත්වා ඇත.

**කාර්මික සහාය සැපයීම**

රජයේ විශ්වවිද්‍යාල, කාර්මික විද්‍යාල සහ වෘත්තීය පුහුණු ආයතනයන්හි සිසුන්හට ඔවුන්ගේ පාඨමාලා සම්පූර්ණ කර ගැනීම සඳහා කාර්මික පුහුණුව ලබාදීම සඳහා සහයෝගය දැක්වීමේ ක්‍රියාවලියක ශ්‍රී ලංකා වරාය අධිකාරිය නිරතව ඇත. 2017 වසරේ දී විවිධ විශ්වවිද්‍යාලවල උපාධි අපේක්ෂකයන් 57 දෙනෙකු හා වෙනත් ශිෂ්‍යයන් 101 ක් දෙනෙකු සඳහා පුහුණුව නිම කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් අවස්ථාව ලබා දෙන ලදී.

**මහපොළ වරාය සහ සමුද්‍රීය විද්‍යායතනය මගින් සේවා සපයනු ලබන සමුද්‍රීය ආයතන**

මහපොළ වරාය සහ සමුද්‍රීය විද්‍යායතනය විසින් පහත සඳහන් ආයතන වෙත සේවාවන් සපයනු ලැබේ.

- ශ්‍රී ලංකා නාවික හමුදාව.
- Lanka Academy of Technical Studies (Private) Ltd.
- CINEC ආයතනය.
- Mercantile Seamen Training Institute Ltd.
- UNK Global Maritime Institute.
- වෙළෙඳ නැව් ලේකම් කාර්යාලය (Merchant Shipping Secretarait)
- සාගර විශ්වවිද්‍යාලය (Ocean University)

**උපයන ලද ආදායම**

2017 වසරේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාල සීමාව තුළදී බාහිර පාර්ශ්වයන් සඳහා මුදල් අයකරන පාඨමාලා මගින් රුපියල් 25,693,560/= ක මුළු මුදලක් මහපොළ වරාය සහ සමුද්‍රීය විද්‍යායතනය විසින් වරාය අධිකාරිය වෙත උපදෙස් දී ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විවිධ කොට්ඨාශ මගින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෙහෙයුම්වල කාර්යක්ෂමතාවය වැඩි කිරීම සඳහා තම සේවකයන්හට ලබා දුන් පුහුණු වැඩසටහන් මගින් ඉපැයූ ආදායම රුපියල් 22,529,440/= විය. ඒ අනුව, 2017 වසරේදී මහපොළ වරාය සහ සමුද්‍රීය විද්‍යායතනය මගින් උපයන ලද මුළු ආදායම රුපියල් 48,223,000/= ක් විය.

2017 වසරේ දී මහපොළ වරාය සහ සමුද්‍රීය විද්‍යායතනය විසින් පවත්වන ලද පාඨමාලා සඳහා මුළු වියදම රුපියල් 11,807,856/= විය.

**විදේශ පුහුණු සහ ශිෂ්‍යත්ව**

සමාලෝචිත වර්ෂය තුළ අධිකාරියේ ජ්‍යෙෂ්ඨ සහ මධ්‍ය කළමනාකරණ මට්ටමේ තනතුරු දරන නිලධාරින් 102 දෙනෙකු සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කර ඔවුන්ට පුහුණු පාඨමාලාවන් හැදෑරීමට සහ ශ්‍රී ලංකාවෙන් පිටත අන්තර්ජාතික සංවිධාන මගින් විදේශයන්හි පවත්වල සම්මන්ත්‍රණ සහ දේශන වලට සහභාගී වීමට අවස්ථාව ලබා දී ඇත.

මීට අමතරව, ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ක්‍රීඩා තරඟවලට සහභාගීවීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයන් 50 දෙනෙකු විදේශ රට වල සංචාරය කරන ලදී.

## උපයෝගී සේවා

### තොරතුරු පද්ධති කොට්ඨාශය

තොරතුරු පද්ධති කොට්ඨාශය සමුද්‍රීය කර්මාන්තයේ නියැළී සිටින ආයතනයක දියුණුව සඳහා වන ප්‍රධානතම ශක්තියක් සහ උත්ප්‍රේරකයක් වේ. එබැවින්, වරාය මෙහෙයුම් වැඩිදියුණු කිරීම සඳහා සුදුසු තොරතුරු පද්ධති භාවිතා කිරීම ශ්‍රී ලංකාවේ උපාය මාර්ගික භූගෝලීය පිහිටීම සමඟ සම්බන්ධවීම තුළින් කොළඹ වරාය,කළාපයේ අනෙකුත් ප්‍රතිවාද වරායයන්ට වඩා ඉදිරියෙන් සිට කටයුතු කිරීමට හැකියාව ලැබෙනු ඇත.

තොරතුරු පද්ධති කොට්ඨාශය සිය ශක්තීන් සහ තරඟකාරී මායිම් නවෝත්පාදක විද්‍යුත් ක්‍රමවේද සහ උපාය මාර්ගික තොරතුරු පද්ධති යෙදවීම තුළින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා සහ සේවාදායකයින් වෙත අඛණ්ඩව සේවා සැපයීම සඳහා යොදවා ඇත.

තොරතුරු පද්ධති කොට්ඨාශය විසින් 2017 වසරේ ආරම්භ කරන ලද ප්‍රධාන ව්‍යාපෘති අදාළ වන පරිදි පවතින යෙදවුම් පද්ධති වල ශීර්ෂ යටතේ සාරාංශගත කොට ඇත.

#### නැව්බඩු කළමනාකරණ පද්ධතිය

නැව්බඩු කළමනාකරණ පද්ධතිය මගින් ප්‍රධාන වශයෙන් ආනයනකරුවන් සහ අපනයනකරුවන් හට සේවා ඇණවුම් සකස් කිරීම, නැව්බඩු ලේඛන පද්ධති ගතකිරීම, විද්‍යුත් මාර්ගයෙන් ගෙවීම් සිදුකිරීම සඳහා සේවා සැපයීම මගින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවාදායකයින් හට කාර්යක්ෂම සේවාවන් සැපයීම සිදුකෙරේ. සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) සහ කලම්බු ඉනටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් (CICT) පූර්ණ බහළු (FCL) ආනයනකරුවන් හට සේවා ඇණවුම් සකස් කිරිමට සහාය වීමේ සහ විද්‍යුත් මාර්ගයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට ගෙවීම් කිරිමේ පහසුකම මෙම පද්ධතිය මගින් ලබා දෙනු ඇත.

මීට අමතරව, වරාය ගුදම් වෙත අර්ධ පූර්ණ බහළු භාරදීමේ සේවාවන් නැව් බඩු කළමනාකරණ පද්ධතිය මගින් පුළුල් කිරීමට අපේක්ෂිතය. තීරු සංකේත සහ අතේ ගෙන යා හැකි දුරස්ථ පාලක භාවිතයෙන් නවීන ගුදම් කළමනාකරණ පද්ධතියක් සමඟ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම ගුදම් සේවා ස්වයංක්‍රීය කිරීමට සැලසුම් සකස්කර ඇත. මෙමගින් සේවාදාකයින් හට අන්තර්ජාලය මඟින් ගෙවීම් කිරීම, අන්තර්ජාලය ඔස්සේ නැව්බඩු නිෂ්කාශනය, අනුමැතිය සහ අවසරය ලබා ගැනීම සහ වෙනත් බොහෝ දියුණු අන්තර්ජාල පහසුකම් භාවිතා කිරීමට ඉඩ සැලසේ.

ඉහත සඳහන් කටයුතු පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය මේ වන විට අවසන් කර ඇති අතර, මෙම වැඩි දියුණු කිරීම් වලින් වැඩි කොටසක් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අවශ්‍යතාවනයට අනුව 2017 වර්ෂයේදී සම්පූර්ණ කරන ලද අතර, මෙම පද්ධතිය 2018 වර්ෂයේදී ක්‍රියාවට නැංවීමට සැලසුම් කර ඇත.

#### කාර්යය පිරිවැය ගණනය කිරීමේ පද්ධතිය

ප්‍රධාන වශයෙන් ඉංජිනේරු වැඩපොළවල් වල සිදුකරන සෑම කාර්යයක් සඳහාම වැය කරන මුදල් ප්‍රමාණය වෙන් වශයෙන් හඳුනාගැනීම, අධීක්ෂණය කිරීම සහ පවත්වාගෙන යාම සඳහා මෙම පද්ධතිය සැලසුම් කරන ලදී.

මෙම පද්ධතිය 2017 වර්ෂයේදී විදුලි ඉංජිනේරු V අංශයේදී නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරන ලද අතර මෙම පද්ධතිය සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී. අතර සිවිල් ඉංජිනේරු සහ යාන්ත්‍රික ඉංජිනේරු කොට්ඨාශ වල සහයෝගය ඇතිව මෙම පද්ධතිය ප්‍රචලිත කිරීමේ ආරම්භක සාකච්ඡා පවත්වන ලදී.

**මූළුතැන්ගෙයි තොග පාලන සහ කළමනාකරණ පද්ධතිය**

මධ්‍යම මුළුතැන්ගෙය සඳහා තොග පාලන සහ කළමනාකරණ පද්ධතිය සැලසුම් කරන ලද්දේ එහි දෛනික තොග ශේෂය අධීක්ෂණය කිරීම, තොග භාණ්ඩ යළි ඇණවුම් කිරීමේ මට්ටම අධීක්ෂණය කිරීම සහ මුළුතැන්ගෙයි කටයුතු වලට අදාළ සියළුම තොරතුරු අධීක්ෂණය කිරීම සඳහා ය.

මෙම පද්ධතිය 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද අතර මේ වන විට සාර්ථකව ක්‍රියාත්මකව පවතී. පාරිභෝජ්‍ය අවශ්‍යතාවයන් පදනම්ව භාණ්ඩ සැපයීම් ගණනාවක් ආරම්භ කරන ලදී. මිළදී ගැනුම් මොඩියුල ඒකාබද්ධ කිරීම සඳහා ව්‍යාපෘතිය වැඩි දියුණු කිරීමට කටයුතු කරනු ලැබේ.

**"ඔරකල්" E – අන්තර්ජාල ව්‍යාපාර පරිගණක පද්ධතිය**

මෙම පද්ධතිය මූලික වශයෙන් ආරම්භ කර ඇත්තේ කොළඹ වරායේ මූල්‍ය සහ වට්ටෝරුගත භාණ්ඩ පාලන කළමනාකරණ පද්ධතිය සඳහා වන අතර එය මේ වන විට ගාල්ල සහ ත්‍රිකුණාමල වරායයන් දක්වාද ව්‍යාප්ත කර ඇත.

අන්තර්ජාල ව්‍යාපාර පද්ධතියේ ඔරකල් මූල්‍ය සහ ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතිය වැඩි දියුණු කිරීම 2016 වසරේ දී ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ආරම්භ කරන ලද තවත් වැදගත් ව්‍යාපෘතියකි.

මෙම පද්ධතිය දෝෂයකින් තොරව සතුටුදායක ලෙස ක්‍රියාත්මකව පැවති අතර, ඉන් උපරිම ප්‍රතිලාභ ලබාගැනීම සඳහා නවීන දෘඩාංග සහිත නව පද්ධතියකට පවත්නා පද්ධතිය මාරු කිරිමට අවශ්‍ය විය. එබැවින් ඒ සඳහා ටෙන්ඩර් ලිපි ලේඛන (පද්ධති අවශ්‍යතා පිරිවිතර) පිළියෙළ කර, ටෙන්ඩර් ක්‍රියාවලිය සඳහා 2017 දෙසැම්බර් මාසයේදී සැපයුම් කොට්ඨාශය වෙත ඉදිරිපත් කරන ලදී.

**ආරක්ෂක පාලන සහ අන්තර්ජාලය මගින් බලපත්‍ර නිකුත් කිරීමේ පද්ධතිය**

දැනට භාවිතා වන ආරක්ෂක පාලන සහ බලපත්‍ර නිකුත් කිරීමේ පද්ධතිය වසර 16කට පෙර ක්‍රියාත්මක කරන ලද්දක් වන අතර, ගුවන්විදුලි සංඛ්‍යාත හඳුනාගැනීමේ තාක්ෂණය (RFID) වැනි අති නවීන තාක්ෂණය යොදා පද්ධතිය වැඩි දියුණු කිරීමට තොරතුරු පද්ධති කොට්ඨාශය විසින් තීරණය කරන ලදී. සවිස්තරාත්මක පද්ධති අධ්‍යයනයකින් පසු, පවත්නා පද්ධතියේ සීමාවන් සහ නව ගුවන්විදුලි සංඛ්‍යාත හඳුනාගැනීමේ තාක්ෂණය (RFID) මත පදනම් වූ පද්ධතියට සහාය දැක්වීම සඳහා වැඩි දියුණු කළයුතු අංග හඳුනාගන්නා ලදී. ගුවන්විදුලි සංඛ්‍යාත හඳුනාගැනීමේ තාක්ෂණයට අමතරව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවාදායකයින් හට තවදුරටත් පහසුකම් ලබාදීම සඳහා අන්තර්ජාලය හා සම්බන්ධ විය හැකි මෘදුකාංගයක අවශ්‍යතාවය හඳුනාගන්නා ලදී. 2017 වසරේ දී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව වැඩි දියුණු කිරීම ආරම්භ විය. විද්‍යුත් මාර්ග ගත ඉල්ලීම් හා සම්බන්ධ ඉදිරිපත් කිරීම් සම්පූර්ණ කර ඇත. 2018 වර්ෂයේදී පද්ධතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරනු ලැබේ.

**පර්යන්ත කළමනාකරණ පද්ධතිය සහ ආපදා ප්‍රතිසාධන අඩවිය (Disaster Recovery Site) වැඩිදියුණු කිරීම**

මෙම පද්ධතිය මගින් පර්යන්ත කළමනාකරණ පද්ධතිය සහ ආපදා ප්‍රතිසාධන අඩවිය (Disaster Recovery Site) අති නවීන තාක්‍ෂණය යොදා එහි ඵලදායීතාවය වැඩි දියුණු කිරීම, බහළු මෙහෙයුම් වඩා කාර්යක්‍ෂම කිරීම, වරාය භාවිතා කරන්නන් සඳහා දවසේ පැය 24 පුරාම සේවා සැලසීම, වරාය භාවිතා කරන්නන් සඳහා අන්තර්ජාලය පාදක කරගත් සංචල භාවිතය, ද්වාර ස්වයංක්‍රීයකරණය, අංගණ ස්වයංක්‍රීයකරණය, විශේෂඥ සැරසුම්, ප්‍රධාන ගමන් මාර්ග, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමස්ත බහළු කළමනාකරණ මෙහෙයුම් වලින් උපරිම ප්‍රථිපල ලබා ගැනීම සඳහා නිර්මාණිත බුද්ධි අංශ තොරතුරු පාදක කරගත් විශ්ලේෂිත උපකරණ හා ස්වයංක්‍රීයකරණය වාහන පද්ධති කළමනාකරණ විකල්ප, ද්‍රව්‍ය තවදුරටත් ජාලගත කිරීම (IOT), මුද්‍රිත අකුරු හඳුනාගැනීමේ උපකරණ (OCR), රේඩියෝ තරංග හඳුනාගැනීමේ උපකරණ (RFID), ස්ථාන අනාවරණය කිරීමේ පද්ධතිය (PDS) සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ව්‍යාපාරික විශිෂ්ඨතාවය ඉහළ නැංවීම සඳහා ගෝලීය ස්ථානගත කිරීම් පද්ධති (GPS) පාදක කරගත් යෙදවුම් හඳුන්වාදීම ද සිදු කරනු ඇත. මෙම යෝජිත වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය සමඟ වරාය භාවිතාකරන්නන්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ වඩා පහසු ලෙස කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුවට සහ වෙනත් පර්යන්තයන් සඳහා උසස් පරිගණක විද්‍යුත් මාර්ග ගත පහසුකම් සැලසීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට හැකියාව ලැබෙනු ඇත.

පවතින බහළු අංගන කළමනකාරණ පද්ධතිය වැඩි දියුණු කිරීම පිණිස ඉහත සඳහන් කාර්යයට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

**වර්චුවල් සර්වර් දෘඩාංග ක්‍රියාත්මක කිරීම**

විනාශ විය හැකි පරිගණක දත්ත ප්‍රතිසම්පාදනය (Disaster Recovery) සහ පරිගණක දත්ත තොරතුරු අමතර පිටපත් නැවත ලබාගැනීමේ සේවා (Backup services) සමඟ නිරන්තර භාවිතයෙහි යෙදවීම පිණිස පරිගණක තාක්‍ෂණික නිර්මාණ සේවා උපකරණ දෘඩාංග පද්ධති පරිසරයක් (Virtual Server Hardware Environment) තොරතුරු තාක්‍ෂණ කොට්ඨාශය විසින් ක්‍රියාත්මක කරන ලදී.

මෙම ව්‍යාපෘතිය සමඟ

- ඉහළ ධාරිතාවයකින් යුතු සර්වර් උපකරණ දෙකක් සහ වෙනම ගබඩාවක් සමඟ සර්වර් උපකරණ විස්සක් හෝ ඊට වැඩි ගණනකින් යුතු දෘඩාංග පරිසරයක් ක්‍රියාත්මක කෙරේ.
- වෙන් වෙන් වශයෙන් ගබඩා සහිත ඉහළ ධාරිතාවක් සහිත Disaster Recovery ස්වයංක්‍රීයකරණය ක්‍රියාත්මක කෙරේ.
- සෑම පද්ධතියක් සඳහාම තුන්වැනි පාර්ශ්ව දත්ත ගබඩාවක් (Backup & Recovery) සහ විසඳුම් සවි කර ඇත.

සැලසුම් කල පරිදි මෙම ව්‍යාපෘතිය 2017 වසරේ දෙවන භාගයේදී අවසන් කරන ලදී.

**ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වෙබ් අඩවිය සහ ඇන්ඩ්‍රොයිඩ් ජංගම යෙදවුම් (Android Mobile Applications)**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නිල වෙබ් අඩවියට (www.slpa.lk) අමතරව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ව්‍යාපාර පිළිබඳ වැදගත් තොරතුරු වඩාත් ආරක්ෂාකාරී අයුරින් ලබා දීම සඳහා නව ඇන්ඩ්‍රොයිඩ් ජංගම යෙදවුම් ක්‍රියාත්මක කරන ලදී.

විවිධ වැදගත් කටයුතු ආරම්භ කිරීමත් සමඟ iPhone, iPad, iPd touch හෝ Mac යන්ත්‍ර සඳහා iCloud සහාය ලඟදීම හඳුන්වා දෙනු ඇත.

සමාජ මාධ්‍ය ජාල ඒකාබද්ධ කරමින් සහ ජංගම දුරකථන සඳහා උචිත අයුරින් මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය සඳහා නව වෙබ් අඩවියක් ආරම්භ කරන ලදී. දත්ත සෙවුම් ක්‍රම ලේඛයක් (Search Engine) භාවිතයේදී ප්‍රතිඵල වල ඉහළින්ම මෙම වෙබ් අඩවිය පෙන්නුම් කරන බව සහතික වීම මගින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වෙබ් අඩවිය භාවිතා කරන පුද්ගලයන් සංඛ්‍යාව ඉහළ දැමීම සඳහා අවශ්‍ය දත්ත සෙවුම් ප්‍රශස්තකරණ යාන්ත්‍රණයක් (Search Engine Optimzsation) මෙයට ඇතුළත් වේ.

**CCTV පද්ධතිය (වරාය අවේක්ෂණ සහ නිරීක්ෂණ කැමරා පද්ධතිය)**

වරාය ආරක්ෂක කටයුතු වැඩිදියුණු කිරීම සහ එය කාර්යක්ෂමව සහ නිරවද්‍ය ලෙස නිරීක්ෂණය කිරීම සඳහා ආරක්ෂිත කැමරා (CCTV) පද්ධතියක් 2017 වසරේ දී ස්ථාපිත කරන ලදී. සියළුම වරාය මෙහෙයුම් කටයුතු වල ආරක්ෂාව තහවුරු කරනු වස් සියළුම වරාය කටයුතු වඩා පුළුල්ව ආවරණය වන පරිදි නිරීක්ෂණය කිරීම සඳහා CCTV අවේක්ෂණ සහ නිරීක්ෂණ කැමරා පද්ධතියක් සවිකිරීමට ද සැලසුම් කර ඇත.

මේ පිළිබඳව වරාය තුළ මූලික අධ්‍යයනයක් සිදුකළ අතර, එහි මුල් පියවර වශයෙන් කොළඹ වරාය තුළ සියළුම ගේට්ටු ආවරණය වන පරිදි නිරීක්ෂණය කිරීමට තීරණය කරන ලදී. පද්ධති අවශ්‍යතාවයන් සඳහා පිරිවිතර පිළියෙල කිරීම් සම්පූර්ණ කර ඇති අතර, ටෙන්ඩර් ලේඛන සකස්කිරීම අවසන් කර ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

**විද්‍යුත් ලේඛන (විද්‍යුත් ලේඛන කළමනාකරණ පද්ධතිය)**

කාර්යක්ෂම හා නිරවද්‍ය ලෙස ලේඛන භාවිතා කිරීමේ සහ කළමනාකරණය කිරීමේ පරමාර්ථයෙන් ලේඛන කළමනාකරණ පද්ධතිය ආරම්භ කරන ලදී. තවද, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සඳහා විද්‍යුත් ලේඛන කළමනාකරණ පද්ධතියක් සහ වැඩ කළමනාකරණ පද්ධතියක් ආරම්භ කිරීමට ද සැලසුම් කර ඇත.සමස්ත වරාය සඳහාම Optical Charactor Recognition (OCR) පහසුකම සහිත විද්‍යුත් ලේඛන කළමනාකරණ පද්ධතියක් භාවිතයේ පැවතීම ලේඛනවල රහස්‍යභාවය, සුරක්ෂිතභාවය හා පරිහරණය කිරීම (Share) උසස් මට්ටමකින් පවත්වාගෙන යාමට ඉවහල් වන අතරම, වරාය අධිකාරිය ප්‍රබුද්ධ ආයතනයක් ලෙස ගොඩනැගීමට ද ඉවහල් වනු ඇත.

පෙර වර්ෂ වලදී කොට්ඨාශ කිහිපයක් සමඟ මූලික අධ්‍යයනයක් සිදු කල අතර වෙළෙඳපොළ පවත්නා ලේඛන කළමනාකරණ පද්ධතීන් අධ්‍යයනය කිරීමෙන් අනතුරුව ටෙන්ඩර් ලේඛන සකස් කර 2017 දෙසැම්බර් මස ටෙන්ඩර් ක්‍රියාවලිය සඳහා සැපයුම් කොට්ඨාශය වෙත ඉදිරිපත් කරන ලදී.

**වෙබ් අඩවි භාවිතයෙන් පිළියෙල කරන නව වැටුප් පත්‍රිකා හා මානව සම්පත් කළමනාකරණ පද්ධතිය**

වැටුප් පත්‍රිකා සහ මානව සම්පත් ක්‍රියාවලීන් ඒකාබද්ධ කිරීම සඳහා මානව සම්පත් කොට්ඨාශයේ හා මුදල් කොට්ඨාශයේ සහාය සහිතව නව මානව සම්පත් කළමනාකරණ පද්ධතිය සංවර්ධනය කිරීම ආරම්භ කරන ලදී. කඩිනමින් තොරතුරු ලබා ගැනීම, භාවිතයට ඉතා පහසු අන්තර් මුහුණත් (user friendly interfaces), ආරක්ෂාව හා පාලනය වැඩි දියුණු කිරීම, ප්‍රසාද දීමනා සහ දිරි දීමනා ගණනය කිරීම, වැටුප් පත්‍රිකා සැකසීමේ කටයුතු ස්වයංක්‍රීය කිරීම, විද්‍යුත් මාධ්‍යයෙන් සේවකයන්ගේ පැමිණීම සහ පිටවීම යෑම සටහන් කර ගැනීමට මෙම ජාලගත පද්ධතිය උපකාරී වේ.

**පවත්නා පද්ධතීන් නඩත්තු කිරීම**

යෙදවුම් පද්ධති ක්‍රියාත්මක කිරීමෙන් පසු එහි මෘදුකාංග සහ සහායක දෘඩාංග නඩත්තු කිරීම තොරතුරු පද්ධති කොට්ඨාශයේ ප්‍රධාන වගකීම වේ. කිසියම් තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීමේ සම්පූර්ණ ප්‍රයත්නයෙන් 60%ක් මුළුමනින්ම පද්ධති නඩත්තු කිරීම සඳහා වන අතර මෙය පද්ධති සංවර්ධන ජීව චක්‍රයේ දීර්ඝතම ක්‍රියාත්මක වීමේ අදියර වශයෙන් සැළකේ. පද්ධති ආරම්භ කිරීමේ සහ පවත්වාගන යාම තොරතුරු පද්ධති කොට්ඨාශයේ වගකීම වන බැවින් තොරතුරු පද්ධති කොට්ඨාශයට පැවරෙන නඩත්තු කටයුතු වල ප්‍රමාණය විශේෂ අවධානයට යොමුවිය යුතු කරුණකි.

මෘදුකාංග සහ දෘඩාංග නිරතුරුව නඩත්තු කිරීම සඳහා තොරතුරු පද්ධති කොට්ඨාශය විසින් ගනු ලබන ක්ෂණික ක්‍රියාමාර්ග තොරතුරු තාක්ෂණ පද්ධති බාධාවකින් තොරව ක්‍රියාත්මක කරගෙන යාම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියට උපකාරී වේ.

සර්වර් දෘඩාංග ඇතුළු සියළුම පවත්නා පද්ධතිවල නඩත්තු කටයුතු සමාලෝචිත වර්ෂය තුළ තොරතුරු පද්ධති කොට්ඨාශය විසින් සිදු කරන ලදී.

## නීති කොට්ඨාශය

නීති කොට්ඨාශය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළු කොට්ඨාශ අතර ප්‍රමුඛ කොට්ඨාශයක් ලෙස සලකනු ලබන අතර, එය ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම පිණිස හා සියළු කටයුතු පවතින නීති හා රෙගුලාසි වලට අනකූලව සිදුවන්නේද යන්න සොයා බැලීමේ අරමුණ ඇතිව අනෙකුත් කොට්ඨාශ සමඟ එක්ව කටයුතු කරන විශේෂ අංශයක් ලෙස ක්‍රියාත්මක වෙමින් පවතී. වෙනත් කොට්ඨාශ විසින් සම්පාදනය කරනු ලබන නීති, කොන්ත්‍රාත් හා ගිවිසුම් ආදිය සමාලෝචනය කිරීම හා ඒවා සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම සිදු කරනු ලබන්නේ නීති කොට්ඨාශය විසිනි. කොන්ත්‍රාත්තු, ගිවිසුම්, බැඳුම්කර, ඔප්පු (පැවරුම්, බඳුදීම් හා ප්‍රකාශ හා උකස් කිරීම්) ආදිය කෙටුම්පත් කිරීම, බලාත්මක කිරීම හා ඒ පිළිබඳ වෙනත් කටයුතු වල යෙදීම ද නීති කොට්ඨාශය මඟින් සිදු කරනු ලැබේ.

නීතිපති දෙපාර්තමේන්තුවේ හා නීතිඥ සමාගම් වල නීතිඥයින්ගේ සහාය ඇතිව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නඩුවල අධියාචනා කටයුතු වලට අතිරේකව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂවරුනට, කොට්ඨාශ ප්‍රධානීන් හට හා වෙනත් අංශ වලට අවශ්‍ය අවස්ථාවන්හිදී නෛතික මත ප්‍රකාශ කරනු ලබන්නේද නීති කොට්ඨාශය විසිනි. වෙනත් කොට්ඨාශ සමඟ සම්බන්ධීකරණය ඇතිව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්ය මණ්ඩලය වෙත නීතිය පිළිබඳ දැනුවත් කිරීම හා නීතිය

අනුව කටයුතු කිරීමට හැඩගැස්වීමේ කටයුතු කිරීමට දායකත්වය ලබදීමද නීති කොට්ඨාශය මඟින් සිදු කරනු ලැබේ.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතේ අදාළ ප්‍රතිපාදන යටතේ නිකුත් කිරීමට ඇති නියෝග හා රෙගුලාසි පිළියෙල කිරීමෙන් හා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කටයුතු වලට අවශ්‍ය කරනු ලබන ඉඩම් පවරා ගැනීම ආදී කටයුතු වලදී නීති කොට්ඨාශය විසින් අවශ්‍ය සහාය දක්වනු ලැබේ. රාජ්‍ය ඉඩම් (අයිතිය අත්පත් කිරීමේ) පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම හා රජයේ නිලනිවාස (අයිතිය අත්පත් කිරීමේ) පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම ද නීති කොට්ඨාශය විසින් සිදු කරනු ලැබේ. ව්‍යාපෘති හා සම්බන්ධ කටයුතු වලට සහ කළමනාකාරීත්වය හා රේඛීය අමාත්‍යංශය විසින් විවිධ කමිටු වල සාමාජිකයන් වශයෙන් පත් කරනු ලබන කොට්ඨාශයට අනුයුක්ත නිලධාරීන් පිළිබඳව අවශ්‍ය කටයුතු සම්බන්ධයෙන් නීති කොට්ඨාශයේ දායකත්වය ලබා දෙනු ලැබේ.

නීති කොට්ඨාශය විසින් වසරකට ඒ ඒ කොට්ඨාශයන් හා අංශ වෙත නීති උපදෙස් 300 කට අධික ප්‍රමාණයක් ලබාදෙනු ලැබේ. අවශ්‍ය අවස්ථාවන්හිදී නීතිපති දෙපාර්තමේන්තුව හා පෞද්ගලික නීති සමාගම් වල නීතිඥයින්ගේ උපදෙස් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

2017.12.31 දින වන විට ශ්‍රේෂ්ඨාධිකරණ නඩු 17 ක් අභියාචනාධිකරණ නඩු 15 ක් මහාධිකරණ නඩු 08 ක් දිස්ත්‍රික් උසාවි නඩු 05 ක් හා කම්කරු විනිශ්චය අයදුම් 05 ක් මානව හිමිකම් ආයදුම් 164 ක්, සමත අයදුම් (කම්කරු දෙපාර්තමේන්තු) 98 ක් හා කාර්මික ආරවුල් 04 ක් වාණිජ ආරවුල් 02 ක් කම්කරු වන්දි අයදුම් 01 ක් මහේස්ත්‍රාත් උසාවි නඩු 13 ක් හා රේගු පරීක්ෂණ 02 ක් ඒ ඒ අදාළ අධිකරණ හා ආයතන හමුවේ විභාග වෙමින් පවතී.

## සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ කොට්ඨාශය

ශ්‍රී ලංකාවේ සියළුම වාණිජ වරායයන්හි මෙහෙයුම් සහ නඩත්තු කටයුතු සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍ය කරනු ලබන ඉන්ධන ගබඩා කිරීම සහ නිකුත් කිරීම, යන්ත්‍ර සහ උපකරණ, අමතර කොටස් සහ අනෙකුත් අයිතම මිලදී ගැනීම (දේශිය සහ විදේශීය) මෙම කොට්ඨාශයේ කාර්යභාරයට ඇතුලත් වේ.

සමාලෝචිත වර්ෂය තුළ අනුමත කල ටෙන්ඩර් සංඛ්‍යාව

| **විස්තරය** | **ටෙන්ඩර් මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව** | **ටෙන්ඩර් මණ්ඩල අනුමැතීන් සංඛ්‍යාව** |
|---|---|---|
| දෙපාර්තුමේන්තු ප්‍රසම්පාදන කමිටුව (රුපියල් මිලියන 20 -100 දක්වා) | 13 | 106 |
| ප්‍රසම්පාදන කමිටුව - **A** (රුපියල් 250,000/- මිලියන 20 දක්වා ) | 49 | 2,240 |
| ප්‍රසම්පාදන කමිටුව - **B** (අනුමත සීමාව රු. 250,000/=ට අඩු) | 51 | 4,337 |

**විදේශීය මිළදී ගැනීම් (පිරිවැය හා නැව් ගාස්තු වටිනාකම)සඳහා 2017 වර්ෂය තුළ දැරූ සමස්ත වියදම**

| | |
|---|---|
| ප්‍රාග්ධන නොවන අයිතම | Rs. 291,533,098.26 |
| ප්‍රාග්ධන අයිතම | Rs. 52,627,120.33 |

| | |
|---|---|
| විවෘත කළ ණයවර ලිපි (D/A සහ D/P ඇතුළුව) | 86 |
| විවෘත කළ ටෙලිග්‍රැෆික් හුවමාරු සංඛ්‍යාව | 46 |

**2017 වර්ෂය තුළ වාප්පු අංශය මගින් නිෂ්කාශනය කරන ලද නැව් භාණ්ඩවල විස්තරය**

| | |
|---|---|
| නැව් භාණ්ඩ | 72 |
| ගුවන් භාණ්ඩ | 61 |
| තැපැල් පාර්සල් | 05 |

**2017.12.31 දිනට තොග වටිනාකම රු.2,443,641,800.00**

**ප්‍රධාන ගබඩාව සහ තොග පාලනය**

| | |
|---|---|
| 2017 වර්ෂය තුළ ගබඩා වලට ලැබුණු භාණ්ඩ වල වටිනාකම (ප්‍රාග්ධන නොවන) | රු. 1,829,712,236.50 |
| 2017 වර්ෂය තුළ ගබඩා වලට ලැබුණු භාණ්ඩ වල වටිනාකම (ප්‍රාග්ධන) | රු. 381,504,676.00 |
| භාවිතා කරනු ලබන අංශ වෙත නිකුත් කළ භාණ්ඩ වල වටිනාකම (ප්‍රාග්ධන නොවන) | රු. 1,864,907,514.76 |

## ආරක්ෂක කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ පාලනය වන සියළුම වරායන් සතු දේපල හා මානව සම්පත් ආරක්ෂා කිරීම, වරාය භාවිතා කරන්නන්, මෙහෙයවනු ලබන නැව්භාණ්ඩ සහ සේවාලාභී යාත්‍රාවන් වෙත ආරක්ෂාව ලබාදීම ආරක්ෂක කොට්ඨාශයේ ප්‍රමුඛ වගකීම වේ. මෙම වගකීම ඉටු කිරීම සඳහා දවසේ පැය 24 මුළුල්ලේ අඛණ්ඩව ආරක්ෂක සේවාවක් කාර්යක්ෂම හා පූර්ණ ලෙස ආරක්ෂක කොට්ඨාශය විසින් පවත්වාගෙන යනු ලැබේ.

දෛනික ආරක්ෂක කටයුතු කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යමින්, අනෙකුත් කොට්ඨාශ සමඟ සම්බන්ධීකරණයෙන් වරාය අධිකාරියේ ඉදිරි සංවර්ධන කටයුතු සාර්ථක කරලීම උදෙසා, සේවක සුභසාධනය සහ මානව සම්පත් සංවර්ධන කටයුතු සාර්ථක කරලීම උදෙසා, සේවක සුභසාධනය සහ මානව සම්පත් සංවර්ධනය මඟින් ඇති කල සේවක අභිප්‍රේරණය තුළින්, ආරක්ෂක කොට්ඨාශය 2017 වසරේ දැක්වූ ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

**වරාය පිවිසුම් බලපත්‍ර නිකුත් කිරීම**

වරාය භාවිතා කරන්නන් වෙත බලපත්‍ර නිකුත් කිරීමෙන් ඉපැයූ ආදායම. (සියළු ආදායම් බදු ඇතුලත්ව)

| | |
|---|---|
| පුද්ගල සහ වාහන බලපත්‍ර නිකුත් කිරීමෙන් උපයන ලද සම්පූර්ණ ආදායම | 391,334,340.11 |
| අස්ථාන ගත ප්‍රවේශ බලපත් වෙනුවට අළුතින් බලපත්‍ර නිකුත් කිරීමේදී දඩ මුදල් වශයෙන් උපයන ලද ආදායම | 102,091.89 |
| පෙර ගෙවුම් මත නිකුත් කල බලපත්‍ර ආදායම (SAGT/CICT/CDL) | 33,750,953.37 |
| වාර්ෂික බලපත්‍ර සමග පවුච සහ උරපටි නිකුත් කිරීමෙන් උපයන ලද ආදායම | 48,400.00 |
| වරාය තුළ මසුන් ඇල්ලීම (Angling) සඳහා පුද්ගල හා වාහන බලපත්‍ර නිකුත් කිරීමෙන් උපයන ලද ආදායම | 84,489.84 |
| 2016 වර්ෂයට පෙර, වරාය භාවිතා කරන්නන් සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර (RPU permits) වවුචර්පත් මගින් ගෙවීමෙන් ලද ආදායම | 1,196,340.00 |
| අළුත් වාහන සහ ආදේශක වාහන සඳහා අමාත්‍යාංශ අනුමැතිය ඇතිව නිකුත් කරන ලද බලපත්‍ර මත උපයන ලද ආදායම | 107,625,000.00 |
| **බලපත්‍ර නිකුත් කිරීම මගින් ලබා ඇති මුළු ආදායම** | **534,141,615.21** |

බලපත්‍ර නිකුත් කිරීම මගින් ඉපැයූ ආදායමට අමතරව සේවකයන් වශයෙන් 2016 වසර තුළ නිකුත් කරන ලද පුද්ගල හා වාහන නිදහස් බලපත්‍ර සංඛ්‍යාව පිළිවෙලින් 19,639ක් සහ 4,538ක් විය.

**ආ. බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක කල නව වැඩසටහන්.**

- වසර 05කට බලපැවැත්වෙන පරිදි වාර්ෂිකව අළුත් කිරීමේ පදනම මත මෙතෙක් නිකුත් කරන ලද වාර්ෂික පුද්ගල බලපත්‍ර (RPU) වෙනුවට ඉහළ කළමනාකාරීත්වයේ අනුමැතිය ඇතිව, 2018 වසරේ ක්‍රියාත්මක වන පරිදි එක් වර්ෂයකට පමණක් වලංගු වන පරිදි නිකුත් කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව බලපත්‍ර අළුත් නොකරන පුද්ගල බලපත්‍රධාරීන්හට (RPU) වරාය පරිශ්‍රය වෙත ඇතුල් වීමට අවසර දෙනු නොලැබේ.

- නිදහස් බලපත්‍ර නිකුත් කිරීමට මේ අනුමැතිය ලද ආයතන 24 වෙත 2017 වර්ෂයේ සිට “Bio Metric” කාඩ් පතෙහි මුද්‍රිත බලපත්‍රය වෙනුවට “Media Tag” කාඩ් පතෙහි මුද්‍රිත බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව නිදහස් බලපත්‍ර නිකුත් කිරීමේ පිරිවැය අවම කර ගැනීමට හැකි වී ඇත.

වරායට ඇතුළුවීමේ පුද්ගල බලපත්‍ර 128 හා වාහන බලපත්‍ර 53 ක් මේ වසරේදී තහනම් කර ඇති අතර පෙර වර්ෂ වල ඒවාද ඇතුළුව තහනම් කරන ලද බලපත්‍ර ගණන පිළිවෙලින් 152 හා 51 ක් විය.

**රථ වාහන පාලනය**

- ♦ වරාය පරිශ්‍රය තුළ සිදු කරන සංවර්ධන කටයුතු අනුව, වඩාත් කාර්යක්ෂම රථ වාහන හැසිරවීමේ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම මගින් වරාය මාර්ග වල රථ වාහන තදබදය අඩු කිරීමට හැකි විය.

- ♦ 2017 වර්ෂයේ රථවාහන පාලන අංශය වෙත රිය අනතුරු 69 වාර්තා වූ අතර, එමගින් වරාය අධිකාරියට සිදුවූ හානි වෙනුවෙන් දඩ මුදල් පැනවීම මගින් උපයන ලද ආදායම රු. 3,028,779.40 විය.

- ♦ තවද, රථවාහන නීති උල්ලංගණය කිරීම හේතුවෙන් ගරු අධිකරණයේ නඩු 114 ක් පවරණ ලද අතර, දඩ මුදල් පැනවීම මගින් උපයන ලද ආදායම රු. 234,000.00 විය

- ♦ වරාය පරිශ්‍රය තුළ රිය අනතුරු 181 වාර්තා වී ඇත අතර ඉන් 79 වරාය සේවකයින් විසින්ද 102 පිටස්තර පුද්ගලයින් විසින්ද සිදු කර ඇත.

**නව තාක්ෂණය හඳුන්වා දීම**

ආරක්ෂක කැමරා (CCTV), ස්කැනර් උපකරණ (SCANNERS), ඩ්‍රෝන කැමරා (DRONE) සමඟ රේඩියෝ සංඛ්‍යාත තදාත්මීකරණය (Radio Frequency Identification) හඳුන්වාදීම තුළින් වරාය ආරක්ෂක කටයුතු නිරීක්ෂණය කිරීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කිරීමේ මූලික කටයුතු 2017 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර, එය ඒ ඒ අදාළ කොට්ඨාශ සමඟ එක්ව 2018 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත.

**විමර්ශන කටයුතු**

විවිධ කොට්ඨාශවලට අනුයුක්ත සේවකයින් විසින් හා පිටස්තර පුද්ගලයින් විසින් සිදු කරන ලද විෂමාචාර සම්බන්ධයෙන් ආරක්ෂක විමර්ශනය විසින් කල .... පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| වංචනික ක්‍රියා | - | 15 |
| මත්පැන් පානය කර සිටීම | - | 29 |
| අල්ලස් දීමේ සිද්ධීන් | - | 02 |
| බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය කිරීම් | - | 06 |
| වෙනත් විෂමාචාර | - | 76 |
| **එකතුව** | **-** | **128** |

**පුහුණු කිරීම් හා සංවර්ධන කටයුතු**

ආරක්ෂක නිලයින්ගේ කාර්යක්ෂමතාවය හා සේවයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා මෙන්ම ඔවුන්ගේ ඉදිරි උසස්වීම සඳහා අවශ්‍ය දැනුම ලබාදීමට සැකසූ පුහුණු වැඩමුළු 09 ක් සැසිවාර 27 ක් ඔස්සේ ආරක්ෂක පුහුණු පාසල මගින් පවත්වා ඇත. එමගින් ආරක්ෂක නිලයින් 946 ක් වෙත පුහුණුව ලබාදී ඇත.

සියළුම වරායන් නියෝජනය වන පරිදි ආරක්‍ෂක නිලයින් පුහුණු අභ්‍යාස කටයුතු වල යොදවා, පුහුණුව හා සංවර්ධනය ප්‍රශස්ත මට්ටමින් සිදු කිරීමට ආරක්‍ෂක කොට්ඨාශය සමත්වී ඇත.

සියළුම ආරක්‍ෂක නිලයන්ගේ සුභසාධනය ඉහළ නංවාලමින් උසස් මට්ටමේ ආරක්‍ෂක සේවාවක් පවත්වාගෙන යාමට 2017 වර්ෂයේදී මෙම කොට්ඨාශය සමත්වී ඇත.

## සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය (CPRD)

සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය 2004 වසරේ දී ස්ථාපිත කරන ලද්දේ කළමනාකාරීත්වය සහ සේවකයින් අතර මෙන්ම දේශීය සහ අන්තර්ජාතික බාහිර සංවිධාන සමඟ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රතිරූපය ඉහළ නැංවීම සඳහා වඩාහොඳ සන්නිවේදනයක් ඇති කිරීමේ අපේක්‍ෂාව ඇතිවය. ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට නියමිත වරාය ව්‍යාපෘතීන් සඳහා දේශීය වශයෙන් සහ අන්තර්ජාතික වශයෙන් පුළුල් ප්‍රචාරයක් ලබාදීම වෙනුවෙන් ගත හැකි සෑම පියවරක්ම මෙම කොට්ඨාශය විසින් ගෙන ඇත.

කළමනාකාරීත්වය සහ සේවකයන් අතර සන්නිවේදනය වැඩිදියුණු කිරීමේ ප්‍රධාන අරමුණ ඉටුකිරීම සඳහා සන්නිවේදන සහ මහජන සම්බන්ධතා කොට්ඨාශය විසින් මාසික 'තීර්ථ' පුවත්පත ප්‍රකාශයට පත්කොට එය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයන් අතර නොමිළේ බෙදාහැරීම සාර්ථකව සිදුකර ඇත. ක්‍රීඩා, සෞන්දර්යය විෂයයන් සහ මතවාදයන් ප්‍රකාශ කිරීම ආදී සමාජ වැදගත්කමක් සහිත විවිධ විෂයධාරාවන්හි නිපුණතා සහිත සේවකයන් හඳුනාගැනීමට ද මෙමගින් හැකියාව ලැබේ. කාර්යක්‍ෂමතාවය සහ ඵලදායීතාවය වර්ධනය කිරිම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නීති හා රෙගුලාසි සහ කාලීන ක්‍රියාමාර්ග පිළිබඳව සේවකයන් දැනුවත් කිරීම සඳහා වේදිකාවක් ද මෙමගින් නිර්මාණය වේ.

ආයතනයේ පරිශීලන අවශ්‍යතා සඳහා සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය විසින් මුද්‍රිත හා විද්‍යුත් දත්ත වාර්තා සහිත ලේඛනාගාර සහ පුස්තකාල පහසුකම් පවත්වාගෙන යනු ලබයි. ශ්‍රී ලංකා වරාය අධිකාරියට අදාළව දේශීය පුවත්පත් සහ වෙනත් විවිධ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි සඟරාවන්හි පළකරනු ලබන සියළුම දෑ පිළිබඳ පරිගණකගත දත්ත සහ මුද්‍රිත පිටපත් මෙම කොට්ඨාශය විසින් එක්රැස්කර ආරක්‍ෂිතව තබා ඇත. ඉදිරි කාලීන අවශ්‍යතා සපුරාලමින් කලින් කලට ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍යවන්නා වූ වීඩියෝ වාර්තා චිත්‍රපට සැකසීම සඳහා වරාය අධිකාරියේ අතීත හා වර්තමාන වැදගත් අවස්ථාවන් නවීන විද්‍යුත් මැදිරියක් තුළ සුරක්‍ෂිතව ගබඩාකර ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විවිධ අවස්ථා ආවරණය කල ඡායාරූප අත්පොතක් හා පරිගණක ගතකොට ඇති ඡායාරූප පුස්තකාලයක් ද මෙම කොට්ඨාශයෙහි ස්ථාපිත කර ඇත.

2017 වර්ෂයේදී "අනුබද්ධ වරායන් පිළිබඳ ජාත්‍යන්තර ජාලය" (INAP) තුළින් "සමුද්‍රීය සහයෝගීතාවය හා ආර්ථික සමෘද්ධිය" යන තේමාව යටතේ සමුද්‍රීය කලාපයේ රටවල් 08 ක සහභාගිත්වයෙන් 2017 නොවැම්බර් මස 07 වන දින සිට 08 වන දින දක්වා කොළඹ කිංස්බරි හෝටලයේදී පවත්වන ලද අනුබද්ධ වරායන් පිළිබඳ ජාත්‍යන්තර ජාලයෙහි 19 වන සමුළුවෙහි සත්කාරක ආයතනය ලෙස ක්‍රියා කරන ලද්දේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසිනි. මෙම සමුළුව පැවැත්වෙන කාලය තුළදී සමුළුවේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා සාමූහික ප්‍රයත්නයකින් යුතුව සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය අතිශය වැදගත් කාර්යභාරයක් ඉටුකරන ලදී. ඒ අනුව, උත්සවයේ ආරම්භක අවස්ථාවේ සජීවී ආවරණය, උපරිම ප්‍රචාරය සඳහා පුවත්පත් හා විද්‍යුත් මාධ්‍ය ආයතනයන් සම්බන්ධීකරණය කිරීම සිදු කල අතර, සහ සියළු ඡායාරූප ගත කිරීම් වීඩියෝ ගත කිරීම් ආදී කටයුතු මෙම කොට්ඨාශය මඟින් ආවරණය කරන ලදී.

කළමනාකාරීත්වයේ උපදෙස් මත, 2017 සැප්තැම්බර් මස 15 වෙනි දින සිට 17 දින දක්වා ශ්‍රී ලංකා ප්‍රදර්ශණ හා සම්මන්ත්‍රණ මධ්‍යස්ථානයේදී පවත්වන ලද ශ්‍රී ලංකා ජාත්‍යන්තර ගුවන්, නාවික හා සේවා සැපයුම් දෙවන ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරය සහභාගී වූයේ සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය මගිනි. ශ්‍රී ලංකා වරාය අධිකාරිය සඳහා සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය විසින් වෙන්කර ගන්නා ලද ප්‍රදර්ශන කුටියෙහි ඡායාරූප රචනා පෙළක්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් නිර්මාණය කරන ලද සමුද්‍රීය සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ වීඩියෝ වාර්තා චිත්‍රපට සහ ප්‍රදර්ශනය නැරඹීමට පැමිණෙන අය අතර බෙදා දීම සඳහා විස්තර පත්‍රිකා ඇතුළත් විය.

2017 අගෝස්තු 11 දින සිට 13 දින දක්වා කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පවත්වන ලද තේ, පොල්, රබර්, වෙළඳ ප්‍රදර්ශනය ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙනුවෙන් කළමනාකාරීත්වයේ උපදෙස් අනුව, සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය විසින් නියෝජනය කරන ලදී. මෙම ප්‍රදර්ශනයේ ප්‍රදර්ශන කුටිය ශ්‍රී ලංකා වරාය අධිකාරිය සඳහා සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය විසින් ඉදි කරන ලදුව ප්‍රදර්ශනය පැවති සමස්ත කාලය තුළ පවත්වාගෙන ගිය ප්‍රදර්ශන කුටිය මඟින් ශ්‍රී ලංකාව කලාපයේ සංවර්ධනය තුළින් ඉදිරියට ගමන් කරන ප්‍රධාන සමුද්‍රීය කේන්ද්‍රස්ථානය බව පෙන්නුම් කරන ලද අතර, ප්‍රදර්ශනය නැරඹීමට පැමිණි පාසැල් සිසුන්, උසස් අධ්‍යාපනය හදාරන සිසුන් සහ සමුද්‍රීය විෂය පිළිබඳ උනන්දුවක් දක්වන අය අතර ප්‍රචලිත කිරීම සඳහා වීඩියෝ කෙටි චිත්‍රපට ප්‍රදර්ශණය කල අතර බෙදා දීම සඳහා විස්තර පත්‍රිකා ආදියද සපයා තිබිණ.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ උත්සව අවස්ථා සම්බන්ධීකරණය කිරීමෙහිලා සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය සුවිශේෂී කාර්ය භාරයක් ඉටුකර ඇත. විවිධ අවස්ථා සැමරීම සඳහා පල කරනු ලබන පුවත්පත් අතිරේක සැලසුම් කිරීම කරනු ලබන්නේ මෙම කොට්ඨාශය මගිනි.

සමාලෝචිත වර්ෂය තුළදී පවත්වන ලද සියළු වැදගත් උත්සව වල ප්‍රචාරක කටයුතු විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කිරීමට කටයුතු කරන ලද අතර, ශ්‍රී ලංකා වරාය අධිකාරියට අහිතකර අන්දමින් මුද්‍රිත මාධ්‍ය හා විද්‍යුත් මාධ්‍ය ඔස්සේ විටින් විට පලවන වාර්තා වලට ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීමද මෙම කොට්ඨාශය විසින් සිදු කරනු ලැබේ. විවිධ පුවත්පත් සාකච්ඡා වලදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රතිරූපය ඔප්නැංවීමට හා එහි ඵලදායීතාවය ඉහළ නැංවීමට ඉවහල් වන අන්දමේ ප්‍රවෘත්ති නිවේදනය කිරීමේ හා අදහස් ප්‍රකාශ කිරීමේ සහ ප්‍රචාරය කිරීම සඳහා වෙනත් සෑම මාධ්‍ය ආයතන වෙත වීඩියෝ සහ මුද්‍රිත තොරතුරු ලබා දීමේ සහ ප්‍රවෘත්ති නිවේදන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලත් අංශය සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය බව සඳහන් කල යුතුය.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලබන වැඩ සටහන් සාර්ථක කර ගැනීම පිණිස සන්නිවේදන හා මහජන සම්බන්ධතා කටයුතු වලට පහසුකම් සැලසීමට පැවරී ඇති කාර්යයන්ට සමගාමීව, හම්බන්තොට වරාය පිළිබඳව හා ශ්‍රී ලංකාවේ අනාගත සමාජ ආර්ථික සංවර්ධනයට එහි ප්‍රතිලාභ කුමන අන්දමින් උපකාර වන්නේද යන බව මහජනතාව අතර ප්‍රචලිත කිරීම සඳහා විවිධ විශේෂාංග, වාර්තා චිත්‍රපට හා සම්මුඛ සාකච්ඡා විකාශය කිරීමට, ප්‍රචාරය කිරීමට හා පළ කිරීමට ද මෙරට ජාතික හා වෙනත් පිළිගත් රූපවාහිනී, ගුවන්විදුලි හා පුවත්පත් ආයතන ගණනාවක් සමග සම්බන්ධීකරණය කිරීම ආරම්භ කර ඇත. මෙම මහා පරිමාණ ව්‍යාපෘතිය පිළිබඳව ප්‍රාදේශීය පුවත්පත් කලාවේදීන් අතර වඩා පුළුල් අවබෝධයක් ඇති කරලීම පිණිස මෙම කොට්ඨාශය විසින් විවිධ වැඩ මුළු රාශියක් පැවැත්වීම සඳහා සම්බන්ධීකරණ කටයුතු ආරම්භ කල අතර එමඟින් මෙම ව්‍යාපෘතිය මඟින් අප මාතෘ භූමියට අනාගතයේදී උදාවන සෞභාග්‍ය පිළිබඳව විශාල ප්‍රචාරයක් ද ලැබී ඇත.

## පරිශ්‍ර අංශය

ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් සියළු නිශ්චල දේපළ කළමනාකරණය කිරීම පරිශ්‍ර අංශයේ ප්‍රධාන වගකීම වේ. සමීක්ෂණ සැලසුම් කැඳවීම, තක්සේරු වාර්තා ලබා ගැනීම, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම, කල්බදු ගිවිසුම් අත්සන් කිරීම, බදු කුලී අයකිරීම හා වරාය අධිකාරිය සතු ඉඩම් හා පරිශ්‍ර වලට අදාළ වෙනත් සියළු කටයුතු සිදු කිරීම මඟින් මෙම වගකීම් ඉටුකිරීමට පරිශ්‍ර අංශය විසින් සිදු කරනු ලැබේ.

පහත සඳහන් සටහනෙහි දැක්වෙන පරිදි දිවයින පුරා ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් ඉඩම් අක්කර 10,047 කට ආසන්න ප්‍රමාණයක් ඇත.

| වරාය | ඉඩම් (අක්කර) |
|---|---|
| කොළඹ වරාය | 966 |
| ගාල්ල වරාය | 94 |
| ත්‍රිකුණාමල වරාය | 5,571 |
| ඔලුවිල් වරාය | 168 |
| හම්බන්තොට වරාය | 2,935 |
| කන්කසන්තුරේ වරාය | 300 |
| වෙනත් | 13 |
| **එකතුව** | **10,047** |

අක්කර 10,047 ක් වූ මුළු ඉඩම් ප්‍රමාණයෙන් කොළඹ වරාය හා ඒ අවට පරිශ්‍ර 77 ක්ද, ගාලු වරාය හා ඒ අවට පරිශ්‍ර 04 ක්ද, ත්‍රිකුණාමල වරාය හා ඒ අවට පරිශ්‍ර 04 ක්ද, ඔලුවිල් වරාය හා ඒ අවට පරිශ්‍ර 03 ක්ද බාහිර පර්ශ්ව/ආයතන වෙත බදු දී ඇත.

2017 වර්ෂය තුළදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය බදු කුලී මුදල් වශයෙන් රුපියල් බිලියන 1.5 කට ආසන්න මුදලක් උපයා, එමගින් අධිකාරියේ අදායම පුළුල් කිරීම සඳහා දායක වීමට සමත්වී ඇත.

පරිශ්‍ර අංශය විසින් 2017 වර්ෂය තුළදී නව කල්බදු ගිවිසුම් 04 ක් අත්සන් කර ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් පරිශ්‍ර වෙනුවෙන් රුපියල් මිලියන 47 ක මුදලක් කොළඹ මහ නගර සභාව වෙත හා වෙනත් පලාත් පාලන ආයතන වෙත පරිශ්‍ර අංශය විසින් 2017 වර්ෂය තුළ වරිපනම් බදු වශයෙන් ගෙවා ඇත.

2017.09.20 දින නිකුත් කරන ලද අංක 26/2017 දරණ නව නිවාස චක්‍රලේඛයට අනුකූලව හිස්ව පවතින නිල නිවාස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින් සඳහා වෙන්කර දීමට අවශ්‍ය කටයුතු සිදුවෙමින් පවතී.

## අභ්‍යන්තර විගණන කොට්ඨාශය සහ මුදල් කොට්ඨාශය

**පාලනය (වරාය විගණන)**

විගණන කමිටු රැස්වීමේ දී නිර්දේශ කර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන වාර්ෂික විගණන වැඩසටහන මගින් අභ්‍යන්තර විගණන කොට්ඨාශයේ කටයුතු හසුරවනු ලැබේ. විගණන කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට සිය විශ්වසනීය වගකීම් ඉටුකිරීම සඳහා සහාය ලබාදේ. විගණන කමිටුව හරහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය තුළ ඵලදායී සහ සවිස්තරාත්මක කරුණු අඩංගු වූ පුළුල් අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක කිරිම අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වී ඇත. වැදගත් මූලික අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ලෙස, අභ්‍යන්තර සැලැස්ම සහ පවතින විගණන වැඩසටහන සමාලෝචනය කරමින් කමිටුව විසින් තවත් වැදගත් කටයුතු කිහිපයක්, අධිකාරියේ පාලනය පවතින තත්ත්වයට වඩා ඉහළ මට්ටමකින් පවත්වාගෙන යෑමේ අරමුණින් ක්‍රියාත්මක කොට ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආදායම්/වියදම් පිළිබඳව අභ්‍යන්තර පිරික්සුම් සහ සාමාන්‍ය අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරන ලදී.

**අභ්‍යන්තර පරීක්ෂණ**

**පැමිණීම**

කම්කරු හා කම්කරු නොවන සේවකයින් සේවා ස්ථානයේ රැඳී සිටී දැයි පරීක්ෂා කිරීම සඳහා හදිසි පරීක්ෂණ කටයුතු, හදිසි වැටලීමේ කණ්ඩායම විසින් දිවා රාත්‍රී මුර සේවා තුළදී නිතිපතා සිදු කරනු ලැබී ය. අනවසරයෙන් සේවා ස්ථානයෙන් බැහැරව සිටි සේවකයින් සඳහා විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම පිණිස වාර්තා කර ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සේවකයින් සිය සේවා ස්ථාන වල රැඳී සිටීම යහපත් අතට පත් විය.

**මුදල්**

මුදල් හා සුළු මුදල් අග්‍රිමය වරින් වර හදිසි පරීක්ෂා කිරීම් වලට භාජනය කරනු ලැබූ අතර ඌණතාවයන් පිළිබඳව වාර්තා කරන ලදී.

**ආදායම් විගණනය**

විශේෂ කාර්යයක් ලෙස වරායෙහි ආදායම් ලැබීම් පිළිබඳව විගණන කටයුතු, විගණන වැඩසටහන් අනුව සිදුකරන ලද අතර, එමගින් වරාය ගාස්තු අඩුවෙන් අයකිරීම පිළිබඳ සිද්ධීන් අනාවරණය විය. ණයගැති ගිණුම්, විවාදිත බිල්පත් සහ අගරු චෙක්පත් පරීක්ෂණයට භාජනය කළ අතර ඒවායේ අඩුලුහුඩුකම් වාර්තා කරනු ලැබී ය. ගොඩබෑමේ සහ භාරදීමේ ඒකක සම්බන්ධයෙන් අඛණ්ඩ පරීක්ෂණ සිදුකරන ලදී.

**වියදම් විගණනය**

ප්‍රාග්ධන සහ පුනරාවර්ථන වියදම් සහ ගබඩා ගෙවීම් වවුචර් සම්බන්ධයෙන් පරීක්ෂණ සිදු කරන ලද අතර අතිරික්ත ගෙවීම් සහ වෙනත් අක්‍රමිකතා අනාවරණය කරගන්නා ලදී. වාහන ධාවන සටහන්

පත් සහ වාහන අවසර පත් පරීක්‍ෂාවට ලක් කළ අතර ඌණතාවයන් පෙන්වා දෙනු ලැබිණ. වැටුප් හා වේතන සකස් කිරීම් සම්බන්ධයෙන් නිතිපතා පරීක්‍ෂා කරගෙන යනු ලැබූ අතර අනාවරණය කර ගනු ලැබූ අක්‍රමිකතා පිළිබඳ වාර්තා කෙරිණ.

**ගබඩා භාණ්ඩ පිළිබඳ භෞතික සමීක්‍ෂණය**

කොළඹ වරායේ ගබඩා භාණ්ඩ පිළිබඳ භෞතික සමීක්‍ෂණ කටයුතු අඛණ්ඩව කර ගෙන යනු ලැබූ අතර සෙසු වරායයන්හි වාර්ෂික තොග පරීක්‍ෂා කිරීම සඳහා ද සහාය දක්වනු ලැබිණ.

ප්‍රධාන ගබඩාවේ අඛණ්ඩ සමීක්‍ෂණ කටයුතු වලදී භාවිතා නොවන තොග අයිතම හඳුනාගත් අතර සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා සැපයුම් කොට්ඨාශය වෙත වාර්තා කරන ලදී.

**විමර්ශන කටයුතු**

සභාපති වරායගේ ඉල්ලීම පරිදි වසර තුළ දී විශේෂ විමර්ශන සිදු කරන ලදී.

**අවසාන ගිණුම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කරන්නේදැයි සහතික කරනු පිණිස අධිකාරියේ අවසාන ගිණුම් පරීක්‍ෂා කිරීම ද මෙම කොට්ඨාශයේ වගකීම වේ.

**පූර්ව විගණන**

සමාලෝචිත වර්ෂය තුළ තැන්පතු ආපසු ගෙවීම් සහ වරාය ගාස්තු අයකිරීම් අතහැර දැමීම පිළිබඳව පූර්ව විගණනයන් කරනු ලැබී ය.

**ගාල්ල වරාය, ත්‍රිකුණාමලය වරාය සහ හම්බන්තොට වරාය**

ගාල්ල, ත්‍රිකුණාමලය සහ හම්බන්තොට වරායයන්හි ආදායම් හා වියදම් පිළිබඳ ගිණුම් විගණන කටයුතු සිදු කර අදාළ වාර්තා සකසන ලදී.

**විගණන කමිටුව**

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අධ්‍යක්‍ෂවරයෙකු වන මහා භාණ්ඩාගාරයේ නියෝජිතවරයාගෙන් සහ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ තවත් අධ්‍යක්‍ෂවරු දෙදෙනෙකුගෙන් විගණන කමිටුව සමන්විත වේ. විගණන කමිටු නිතිපතා පැවැත්වීම තහවුරු කරනු වස්, විගණන කමිටුවේ සභාපති ලෙස මහා භාණ්ඩාගාරයේ නියෝජිතවරයා පත් කිරීමට අධ්‍යක්‍ෂ මණ්ඩලය තීරණය කරන ලදී.

අභ්‍යන්තර ප්‍රතිපත්ති හා ක්‍රියාපිළිවෙත් සමාලෝචනය කිරීම, එම ප්‍රතිපත්ති සහ ක්‍රියාපිළිවෙත්හි කාර්යක්‍ෂමතාවය සොයා බැලීම, අභ්‍යන්තර විගණන අංශයේ වාර්තා හා රජයේ විගණන අංශයේ ලිපි සමාලෝචනය කර ඒවාහි නිර්දේශ සම්බන්ධයෙන් අධ්‍යක්‍ෂ මණ්ඩලය මගින් ක්‍රියාමාර්ග ගන් ලබන්නේ ද යන්න සහ ඒවාට කොට්ඨාශ ප්‍රධානීන්ගේ එකඟතාවය ලැබෙන්නේද යන්න විගණන කමිටුවේ විමර්ෂණයට ලක්වේ.

මෙමඟින්, අධ්‍යක්ෂ මණ්ඩලයේ මග පෙන්වීම මත මූල්‍ය හා මෙහෙයුම් අවදානම හඳුනා ගැනීමට අවශ්‍ය සැකසුම් හා යාන්ත්‍රණ අධිකාරිය සතු වන බව හා මෙවැනි අවදානම් මනාව සැලසුම් කල ක්‍රියාකාරී සැලස්මක් හරහා කළමනාකරණය කර විසඳිය හැකි බවට තහවුරු කරනු ලැබේ.

අධිකාරියේ සේවකයින් හා වෙනත් පරදු භාරකරුවන්ගේ යහපත උදෙසා සම්පත් වල ඵලදායීතාවය ඉහළ නැංවීමට හා කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම සඳහා මූල්‍ය සහ මෙහෙයුම් කටයුතු හා අදාළ වර්තමාන පද්ධතීන් හා ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම විගණන කමිටුව වගකියනු ලැබේ.

## වෙනත් වරායයන්

### ත්‍රිකුණාමල වරාය

**නාවික මෙහෙයුම්**

**නෞකාවෙන් නෞකාවට (ship to ship) මෙහෙයුම්**

ත්‍රිකුණාමල වරායේ නෞකාවෙන් නෞකාවට (ship to ship) මෙහෙයුම් 2015 අප්‍රේල් මස සිට ක්‍රියාත්මක කරන ලදී.

**යාත්‍රා**

ත්‍රිකුණාමලය වරාය සතු තිබෙන යාත්‍රා පහත පරිදි වේ.

ටග් යාත්‍රා - 02 - මෙහෙයුම්හි නිරතව TTA ජැටියේ නැංගුරම්ලා ඇත
දියත් යාත්‍රා - 04 - මෙහෙයුම්හි නිරතව - 02, මෙහෙයුම්හි නිරත නොවන - 02
ටැනැක් ටග් යාත්‍රා- 01 - මෙහෙයුම්හි නිරතව TTA ජැටියේ නැංගුරම්ලා ඇත

### ගාලු වරාය

| නෞකා වර්ගය | සංඛ්‍යාව |
|---|---|
| ක්ලින්කර් | 76 |
| ජිප්සම් | 04 |
| යබොර(Slag) | 01 |
| මගී නෞකා (වරාය තුළ නැංගුරම්ලා ඇති) | 04 |
| මගී නෞකා (වරායෙන් පිටත නැංගුරම්ලා ඇති) | 02 |
| වෙනත් | 65 |
| නැංගුරම් ලා ඇති | 76 |
| වරාය සීමාවෙන් පිටත නෞකා | 8,062 |
| රුවල් යාත්‍රා | 68 |



# මූල්‍ය සමාලෝචනය

# වාර්ෂික වාර්තාව 2017

ආදායම (සියළු වරායයන්)

ආදායම

(වරාය කටයුතු සාරාංශය) (රු. මිලියන)

| විස්තරය | 2017 | 2016 | විස්තරය | 2017 | 2016 |
|---|---|---|---|---|---|
| වරාය කටයුතු වලින් ආදායම | 36,914 | 36,799 | නාවික | 8,503 | 7,963 |
| වෙනත් ආදායම් | 8,694 | 7,281 | නැව්භාණ්ඩ | 17,487 | 18,520 |
| | | | වාප්පු මෙහෙයුම් | 5,419 | 5,066 |
| | | | වරාය පහසුකම් | 4,235 | 4,021 |
| | | | වෙනත් සේවා මෙහෙයුම් | 1,270 | 1,230 |
| **මුළු ආදායම** | **45,609** | **44,080** | **උප එකතුව** | **36,914** | **36,799** |

මෙහෙයුම් සහ වෙනත් වියදම් (සියළු වරායයන්)

රු. මිලියන

| විස්තරය | 2017 වියදම | 2016 වියදම | වැඩිවීම/ (අඩුවීම) | % |
|---|---|---|---|---|
| වත්කම් නඩත්තුව | 1,325 | 1,424 | 99 | 7 |
| ඉන්ධන, විදුලිය සහ ජලය | 2,149 | 2,076 | (73) | (3) |
| විදේශ ණය මත පොලිය | 2,082 | 4,302 | 2,220 | 52 |
| අතිකාල | 3,807 | 3,772 | (35) | (1) |
| ක්ෂයවීම (ක්‍රමක්ෂය ඇතුලුව) | 5,572 | 5,995 | 423 | 7 |
| වේතන, වැටුප් හා දීමනා | 12,582 | 11,952 | (629) | (5) |
| වෙනත් | 2,664 | 3,483 | 818 | 23 |
| **වියදම** | **30,181** | **33,006** | **2,825** | **9** |
| විදේශ විනිමය (පාඩු)/ ලාභ | 2,206 | 10,038 | 7,833 | 78 |
| **විදේශ විනිමය පාඩු ඇතුළුව මුළු වියදම** | **32,387** | **43,044** | **10,657** | **25** |

## වරායයන් අනුව කාර්යසාධනය

## කොළඹ වරාය

2017 වර්ෂයේ දී කොළඹ වරාය රුපියල් මිලියන 14,136ක පූර්ව බදු_ලාභයක් වාර්තා කරන ලදී. 2016 වර්ෂයේ ලාභය වූ රුපියල් මිලියන 39,913 හා සසඳා බැලීමේදී 2017 වර්ෂයේ උපයන ලද දළ ආදායම රුපියල් මිලියන 41,325 ක් වූ අතර එය රුපියල් මිලියන 1,412ක වැඩිවීමකි. 2017 වර්ෂයේ දී බදු ගෙවීමට පෙර මුළු වියදම රුපියල් මිලියන 27,189ක් (විදේශ විනිමය පාඩු රුපියල් මිලියන 2,161 ඇතුළුව) වූ අතර 2016 වසරේ දී එය රුපියල් මිලියන 28,666ක් (විදේශ විනිමය පාඩු රුපියල් මිලියන 3,533 ඇතුළුව) වූ අතර එය 5%ක අඩුවීමකි.




## ගාල්ල වරාය

2017 වර්ෂයේ දී ගාල්ල වරාය රුපියල් මිලියන 628ක පූර්ව බදු ලාභයක් වාර්තා කරන ලදී. 2016 වර්ෂයේ දී ලැබූ ආදායම වන රුපියල් මිලියන 1,239 හා සසඳා බැලීමේදී 2017 වර්ෂයේ දී උපයන ලද දළ ආදායම වූ රුපියල් මිලියන 1,388 රුපියල් මිලියන 149ක වැඩිවීමකි. 2017 වර්ෂයේ දී බදු ගෙවීමට පෙර මුළු වියදම රුපියල් මිලියන 760ක් (විදේශ විනිමය පාඩු රුපියල් මිලියන 32 ඇතුළුව) වූ අතර එය 2016 වර්ෂයේ දී රුපියල් මිලියන 742ක් (විදේශ විනිමය පාඩු රුපියල් මිලියන 44 ඇතුළුව) විය. මෙය 2%ක වැඩිවීමකි



## ත්‍රිකුණාමල වරාය

2017 වර්ෂයේ දී ත්‍රිකුණාමලය වරාය රුපියල් මිලියන 355ක පූර්ව බදු ලාභයක් වාර්තා කරන ලදී. 2016 වර්ෂයේ ලැබූ ආදායම වූ රුපියල් මිලියන 886 හා සසඳා බැලීමේ දී 2017 වර්ෂයේ දී වාර්තා කරන ලද මුළු ආදායම රුපියල් මිලියන 1,120ක් වූ අතර එය රුපියල් මිලියන 234ක වැඩිවීමකි. 2017 වර්ෂයේ දී බදු අය කිරීමට පෙර මුළු වියදම රුපියල් මිලියන 764ක් වූ අතර එය 2016 වසරේ දී රුපියල් මිලියන 734ක් විය. මෙය 4%ක වැඩිවීමකි.




## හම්බන්තොට වරාය

2017 වර්ෂයේ දී හම්බන්තොට වරාය රුපියල් මිලියන 1,898 ක පූර්ව බදු අලාභයක් වාර්තා කරන ලදී. 2016 වර්ෂයේ ආදායම වූ රුපියල් මිලියන 2,042 හා සසඳා බැලීමේදී 2017 වර්ෂයේ දළ ආදායම රුපියල් මිලියන 1,776ක් වූ අතර එය රුපියල් මිලියන 266ක අඩුවීමකි. 2017 වර්ෂයේ බදු ගෙවීමට පෙර මුළු වියදම රුපියල් මිලියන 3,674 (විදේශ විනිමය පාඩු රුපියල් මිලියන 12 ඇතුළුව)ක් වූ අතර 2016 වසරේ දී එය රුපියල් මිලියන 12,901ක් (විදේශ විනිමය පාඩු රුපියල් මිලියන 6,462 ඇතුළුව) වූ අතර එය 72%ක අඩුවීමකි.



මානව ප්‍රාග්ධනය ආයතනයේ ප්‍රධානතම මෙන්ම ප්‍රබලතම ශක්තිය බව ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් හඳුනාගනු ලැබ ඇති අතර එයින් උපරිම ප්‍රතිලාභ අත්කර ගැනීම සඳහා මානව සම්පත ආයතනයේ තරඟකාරී වත්කමක් ලෙස සලකා එය තවදුරටත් සංවර්ධනය කල හැකි ක්‍රම සහ විධි ඇතුලත් ''මානව සම්පත් ප්‍රතිපත්තිය'' හඳුන්වා දීමට කටයුතු කර ඇත.

මානව සම්පත පුහුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ ප්‍රධානතම ආයතනය වන්නේ මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනයයි. මෙම ආයතනය මගින් ඩිප්ලොමා පාඨමාලා ඇතුළු වෙනත් වැඩ මුළු, සම්මන්ත්‍රණ සහ ප්‍රායෝගික සැසි ඇතුලත් විවිධ පුහුණු වැඩ සටහන් පවත්වනු ලැබේ. තවද, පුහුණු ශ්‍රේණිගත සේවකයින් හට ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතිකය ලබා ගැනීමට හැකිවනු පිණිස ප්‍රායෝගික විභාග පැවැත්වීමට ද මෙම ආයතනය කටයුතු යොදා ඇත.

2012 වර්ෂයේදී හඳුන්වාදෙන ලද බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය තුළින් සියළුම කාණ්ඩවල සේවකයින් හට සිය තනතුරු වල උසසවීම් ලබාගැනීමේ අවස්ථා හිමි වන බැවින් සියළුම කාණ්ඩ වලට අයත් සේවකයින් දිරිමත්ව ඇත. ඒ අනුව, මෑත වර්ෂයන්හි මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය මඟින් පවත්වනු ලබන පුහුණු වැඩ සටහන් සඳහා වාර්තාගත ඉල්ලුමක් පවතින බව පෙනෙන්නට ඇත.

හඳුන්වාදීමට අපේක්ෂිත ''මානව සම්පත් ප්‍රතිපත්තිය'' තුළින් ඒ ඒ කොට්ඨාශයන්හි ආයතනික අරමුණු ඉටුකර ගැනීම සඳහා සේවකයින් හට ඔවුන්ගේ කාර්යයන් නිදහස් පරිසරයක සිට ඉටුකිරීමට හැකිවනු පිණිස විවිධ කොට්ඨාශයන්හි පරිපාලන කාර්ය පටිපාටි සංග්‍රහය, විනය පටිපාටිය, බඳවා ගැනීමේ පිළිවෙත, විවිධ කොට්ඨාශයන්හි මානව සම්පත් අවශ්‍යතාවයන් පිළිබඳ විස්තර සපයා ගැනීමට හැකිවනු ඇත. තවද, මෙම මානව සම්පත් ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් විශේෂයෙන්ම සේවක උසස් වීම් වලදී ස්ත්‍රී පුරුෂ බේදයකින් තොරව හා වෙනත් කිසියම් මානව සම්පත් හා සම්බන්ධ සියළු කරුණු වලදි කිසිදු අගතියක් ඇති නොවන සේ කටයුතු පවත්වාගෙන යාමට හැකිවන අතර, සියළුම සේවක කොට්ඨාශයන් සඳහා සමාන අවස්ථා ලබාදීමේ වගකීම ඉටුකිරීමට ද හැකිවනු ඇත.

**සමාලෝචිත වර්ෂය තුළදී, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සිය ආයතනික සමාජ වගකීම් අඛණ්ඩව සිදු කරන ලදී. එනම්;**

- වරාය සේවකයින්ගේ අ.පො.ස (සා/පෙළ) සහ අ.පො.ස. (උ/පෙළ) විභාග විශිෂ්ට ලෙස සමත් වූ දූ දරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව පිරි නැමීම.

- වරාය සේවකයින්ගේ කුඩා දරුවන්ගේ සුභසාධනය වෙනුවෙන් අංග සම්පූර්ණ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් පවත්වාගෙන යාම.

- වරාය ගිනි නිවීමේ ඒකකය ගිණි නිවීම් කටයුතු වලදී කොළඹ මහ නගර සභාවට සහායවී ඇති අතර හදිසි අවස්ථාවලදී කොළඹ සහ තදාසන්න ප්‍රදේශයන්හි ගිණි නිවීම් කටයුතු කිරීම.

- මුල්ලේරියාව මානසික රෝහලේ වාට්ටුවක් නඩත්තු කිරීම.

ආයතනික පාලනය යනුවෙන් අදහස් කෙරෙනුයේ ආයතනයට සම්බන්ධ සියළුම පාර්ශ්වයන්ගේ උපරිම යහපත උදෙසා එහි සම්පත් ඵලදායී ලෙස භාවිතා කරමින් අදාළ ආයතනය සම්බන්ධ නිසි මාර්ගෝපදේශකත්වයකින් යුතුව පාලනය පවත්වා ගන යාම සඳහා එම ආයතනය විසින් පිහිටුවනු ලබන සමස්ත යාන්ත්‍රණය වේ. යහපාලනයක් පවත්වා ගන යාම සම්බන්ධයෙන් මූලික වගකීම පැවරී ඇත්තේ වරාය අධිකාරියේ සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙතය. ආයතනයේ මූලික අරමුණු ළඟා කරගනු පිණිස, එහි කාර්ය පද්ධති හා හැසිරවීම් නියමිත ආකාරයෙන් ක්‍රියාත්මක වන බවට ඔවුනට සහතික වීමට සිදු වන අතර ඒ සඳහා වෘත්තීමය නිළධාරීන් ඔවුන්ට අදාළ ක්‍රියාකාරී ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වගකීම දැරීම තුළින් පහසුකම් සැලසිය යුතුය. මෙම කර්තව්‍යය තුළ අභ්‍යන්තර විගණක නිලධාරීන් හට ආයතනයේ කාර්ය සාධනය පිළිබඳ පරීක්ෂා කිරීමට හා අනුමත ක්‍රියා පිළිවෙත්හි විචල්‍යතාවයන් තිබේදැයි යන්න වාර්තා කිරීම මගින් වැදගත් කාර්යභාරයක් ඉටුකල යුතුව ඇත. එහි විචල්‍යතාවයන් විශේෂයෙන් මෙහෙයුම් හා මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් අපේක්ෂිත කාර්ය සාධනය ළඟාකර ගන්නේ කෙසේද යන්න පිළිබඳව නිර්දේශ කරනු ලබන්නේ නම් එමඟින් යහපාලනය කෙරෙහි දායකත්වයක් සැපයෙනු ඇත.

මූල්‍යමය හා වෙනත් මෙහෙයුම් වාර්තා කිරීම් උසස් මට්ටම හා සංඛ්‍යාතය, අධ්‍යක්ෂ මණ්ඩලය සිය භාරකාරීත්ව යුතුකම් ඉටුකරන වපසරිය, අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ කළමනාකාරීත්වය විසින් හුවමාරු කරගන්නා තොරතුරු වල තත්ත්වය සහ වටිනාකම ඉහළ කරවන ආකාරයේ විනිවිදභාවයෙන් යුතු ආයතනයක් පවත්වාගෙන යාමට දක්වන ඔවුන්ගේ කැපවීම ඉතා වැදගත් කොට සලකනු ලැබේ. එනයින් බලන කල ශ්‍රී ලංකා වරාය අධිකාරිය ආයතනික යහපාලනයේ උසස් ගුණාංග පවත්වාගෙන යාමට කැපවී ඇත.

අධිකාරියේ පාලනය පවත්වාගෙන යාමේ වගකීම දරන්නේද අධ්‍යක්‍ෂ මණ්ඩලය විසිනි. මනා ක්‍රමවේදයක් ක්‍රියාත්මක වන බවට සහතික වීම සඳහා නීතිරීති හා රෙගුලාසි, ව්‍යුහයන් හා ක්‍රියාමාර්ග වර්ධනය කිරීම සම්බන්ධයෙන් සැලකිය යුතු අවධානයක් යොමු කිරීම අධිකාරිය විසින් අඛණ්ඩව සිදු කර ගෙන යනු ලැබේ. අධිකාරිය විසින් එහි ආයතනික පාලන ව්‍යුහයන් උසස් මට්ටමින් ප්‍රසාදනය කර ඇත.

මුදල් වර්ෂය තුළ අධිකාරිය විසින් අනුගමනය කර ඇති ආයතනික යහපාලන ප්‍රතිපත්තිමය අංග පහත සඳහන් ශීර්ෂ යටතේ දක්වා ඇත:

- අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු
- අභ්‍යන්තර පාලන
- අභ්‍යන්තර විගණන
- විනය නීති
- මහා භාණ්ඩාගාරය, වරාය හා නාවික අමාත්‍යාංශය සමඟ පවතින සම්බන්ධතාවය
- ව්‍යවස්ථාපිත හා නෛතික අවශ්‍යතාව සමඟ පවතින අනුකූලතාවය.
- යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ

මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද යහ පාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ මාලාවේ නිශ්චිතව හඳුනාගත් වගන්ති වලින් බැහැරව කටයුතු කිරීම සඳහා වරාය සහ නාවික අමාත්‍යවරයා හා මුදල් හා සැලසුම් අමාත්‍යවරයා විසින් ඒකාබද්ධව ඉදිරිපත් කරන ලද නිර්දේශයන් සඳහා අනුමැතිය ලබාදීමට අමාත්‍ය මණ්ඩලය ගත් තීරණය අනුගමනය කරමින් ක්ෂේත්‍රය තුළ උසස් මට්ටමකින් තරඟකාරී සහ ප්‍රායෝගික රාජ්‍ය

ආයතනයක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය කරන නම්‍යශීලිත්වය සහ ස්වාධීනත්වය තහවුරු කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් "පාලන විධි සංග්‍රහය" කෙටුම්පත් කර ඇත.

**අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු**

අධ්‍යක්ෂ මණ්ඩලය සභාපති, උපසභාපති හා අධ්‍යක්ෂවරුන් 07දෙනෙකුගෙන් සමන්විත වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්, ඉහළම වෘත්තීය සහ පෞද්ගලික සාරධර්ම සහ වටිනාකම් හා අධිකාරිය ක්‍රියාත්මක වන ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ඇති අයවලුන් විය යුතුවේ.

වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරනු ලබන්නේ පහත සඳහන් ආකාරයටය;

- ♦ වරාය සංවර්ධනයෙහි හෝ වරාය මෙහෙයුම් කාර්යයන්හි හෝ නෛතික හෝ මූල්‍ය කටයුතු හෝ නාවික කටයුතු,වාණිජ හෝ ඉංජිනේරු කටයුතුවල හෝ පරිපාලනයෙහි හෝ කම්කරු සබඳතා පිළිබඳ පළපුරුද්දක් සහිත සහ එම කටයුතුවල හැකියාව ඇති බවට අමාත්‍යවරයාට පෙනී යන්නේ නම් ඔවුන් අතරින් සභාපතිවරයා සහ තවත් අධ්‍යක්ෂවරුන් 04 දෙනෙකු අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබේ.

- ♦ පනතේ 13:1 වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් කළමනාකාර අධ්‍යක්ෂ පත්කරනු ලැබේ.

- ♦ මූල්‍ය විෂය සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු නම් කරනු ලැබේ.

- ♦ රේගු අධ්‍යක්ෂ ජනරාල් සහ ධීවර කටයුතු විෂය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා භාරයේ පවතින අමාත්‍යාංශයේ නියෝජිතයෙකු එම ඇමතිවරයා විසින් නම් කරනු ලැබේ.

සභාපතිවරයා හැර, (1)(අ) උපවගන්තිය හෝ (1)(ඈ) උප වගන්තිය යටතේ පත්කරන ලද අධ්‍යක්ෂවරුන්ගෙන් එක් අයෙකු වරාය අධිකාරියේ උප සභාපතිවරයා වශයෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැක.

සභාපතිවරයා, උප සභාපතිවරයා සහ කළමනාකාර අධ්‍යක්ෂවරයා සතු කාර්යභාරය පැහැදිලි ලෙස වෙන් කොට, අර්ථ නිරූපනය කර ඇත. විධායක නොවන සියළු අධ්‍යක්ෂවරු ඔවුන් සතු ගැඹුරු හසළ දැනුම හා පළපුරුද්ද මත අධිකාරියට සේවය සලසයි.මෙම වාර්තාවේ සඳහන් දිනය වන විට ධූරයන් දරමින් සිටි අධිකාරියේ අධ්‍යක්ෂවරුන්ගේ නම් සහ ඔවුන් පිළිබඳ විස්තර අංක 16 සිට 20 දක්වා පිටුවල සඳහන් වේ.

**අධ්‍යක්ෂ මණ්ඩලය සතු මූලික කටයුතු සහ වගකීම් පහත දැක්වේ;**

- ♦ ක්‍රමෝපායික අරමුණු, ප්‍රතිපත්ති, අභිලාෂ හා ඉලක්ක තුළින් කාර්යයන් මෙහෙයවීම.

- ♦ ඉලක්ක හා අරමුණු ඉටුකර ගැනීම උදෙසා වූ කාර්යසාධනය අධීක්ෂණය කිරීම.

- ප්‍රමාණවත් අභ්‍යන්තරික පාලනයක් සහ ඉහළම ආචාරධර්ම ප්‍රමිතීන් පවත්වා ගන්නා බවට සහතික වීම.

- නිර්ණායකයන් සම්පාදනය කිරීම සහ අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහිලා ඒවායේ සාර්ථකත්වය පිළිබඳව සහතික වීම.

- සියළු ව්‍යාපාරික අවදානම් සහගත තත්ත්වයක් හඳුනාගෙන යෝග්‍ය හා ප්‍රමාණවත් පාලනයක් ඇති කිරීම හා අවදානම් තත්ත්වයන් සම්බන්ධයෙන් කාලීනව අවශ්‍ය පියවර ගැනීම සඳහා එම තත්ත්වය වාර්තා කිරීමේ අධීක්ෂණ යාන්ත්‍රණය යථා පරිදි ක්‍රියාත්මක වන බවට සහතික වීම.

අධ්‍යක්ෂ මණ්ඩලය නිතිපතා රැස්වන අතර සමාලෝචිත වර්ෂය තුළ 15 වතාවක් රැස්වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයට සිය කටයුතු සිදුකර ගෙන යාමට අවශ්‍ය තොරතුරු අවස්ථානුකූලව ලබා ගැනීමේ හැකියාව ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් සභාපතිගේ උපදෙස් මත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ න්‍යාය පත්‍රය සකස් කරනු ලබන අතර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට පෙර තොරතුරු පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් සියළුම අධ්‍යක්ෂවරුන් වෙත සපයනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සාකච්ඡා කරනු ලබන කරුණු අතර මෙහෙයුම් හා මූල්‍ය කාර්යසාධන දර්ශකයන් සමාලෝචනය කිරීම, ප්‍රධාන ප්‍රාග්ධන වියදම් ව්‍යාපෘති හා යෝජනා සිය සීමාවන් තුළ අනුමත කිරීමද ඇතුළත් වේ.

සියළුම නිර්දේශයන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අවසන් අනුමැතියට යටත්ව, අධ්‍යක්‍ෂ මණ්ඩලයේ ඇතැම් වගකීම් ප්‍රධාන වශයෙන් කළමනාකරණ කමිටුව, විගණන කමිටුව ඇතුළු අනුකමිටු කිහිපයක් වෙත අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් පවරනු ලැබ ඇත.

**කළමනාකරණ කමිටුව**

සභාපති, උප සභාපති, කළමනාකාර අධ්‍යක්ෂ සහ විධායක අධ්‍යක්ෂ ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් හතර දෙනෙකු (04) සහ අනෙකුත් පූර්ණ කාලීන අධ්‍යක්ෂවරු හත් දෙනෙකු (07) සහ හාබර් මාස්ටර්වරයා කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්ලෙස කටයුතු කරන ලදී.

සාර්ථක වාණිජමය ආයතනයක් වශයෙන් මෙන්ම සමාජ වගකීමක් සහිත සංස්ථාපිත රාජ්‍ය ආයතනයක් ලෙස වරාය භාවිතා කරන්නන්හට වඩාත් දියුණු සේවයක් සලසමින් මානව සම්පත් ඵලදායිතාව වැඩි දියුණු කිරීම මෙන්ම අනෙකුත් හවුල්කරුවන්ගේ යහපත සඳහා සම්පත් උපරිම අන්දමින් ප්‍රයෝජනයට ගෙන එදිනෙදා පරිපාලන, කළමනාකරණ සහ මෙහෙයුම් කටයුතු පිළිබඳ තීරණවලට එළඹීමේදී කළමනාකරණ කමිටුව ඉහත විස්තර කරන ලද විවිධ පැතිකඩ සම්බන්ධව කටයුතු ඉටුකරන ලදී.

කළමනාකරණ කමිටුව එහි රැස්වීම් වලදී සියළුම ප්‍රතිපත්තිමය කරුණු මෙන්ම තීරණ ක්‍රියාත්මක කිරීමට ප්‍රථම ඒවා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහ එකඟත්වය සඳහා ඉදිරිපත් කිරීමට පෙරාතුව ද මනා පරිශීලනයට භාජනය කරන ලදී. මෙම ක්‍රියාවලිය පවත්වා ගන යාමට සහ ප්‍රමාදයන් වලකාලීමට හැකිවනු පිණිස සඳහා කළමනාකරණ කමිටුව මසකට දෙවරක් රැස්වී තීරණ ගන්නා ලදී. මෙම වර්ෂය තුළ කළමනාකරණ කමිටු රැස්වීම් අටක් (08ක්) පවත්වා ඇත.

**විගණන කමිටුව**

විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු වන මහා භාණ්ඩාගාරයේ නියෝජිතයා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ තවත් සාමාජිකයින් දෙදෙනෙකුගෙන් සමන්විත වේ. විගණන කමිටුව 2017 දෙසැම්බර් මස නැවත පත් කරන ලදී.

විගණන කමිටුව විසින් අභ්‍යන්තර පාලන ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සමාලෝචනය කිරීම, එම ප්‍රතිපත්ති හා පටිපාටිවල කාර්යක්ෂමතාව සොයා බැලීම සහ අභ්‍යන්තර විගණක වාර්තාව හා රජයේ විගණන සමාලෝචනය කිරීම සහ ඒවා සම්බන්ධ නිර්දේශ කොට්ඨාශ ප්‍රධානීන් විසින් පිළිපදිනු ලබන්නේදැයි අධ්‍යක්ෂ මණ්ඩලය හරහා පසු විපරම් කිරීම සිදු කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ මඟ පෙන්වීම යටතේ, මූල්‍යමය සහ මෙහෙයුම් සම්බන්ධ අවදානම් හඳුනා ගැනීමටත් මනා ලෙස නිර්වචනය කරන ලද ක්‍රියාකාරී සැලැස්මක් තුළින් එවැනි අවදානම් කළමනාකරණය කර ගැනීමට හැකිවනු පිණිස ක්‍රියාමාර්ග සහ යාන්ත්‍රණයන් අධිකාරිය සතුව පවතින බවට විගණන කමිටුව විසින් තහවුරු කරනු ලැබේ .

සේවකයින්ගේ සහ වරාය කටයුතු හා සම්බන්ධ අයගේ යහපත වෙනුවෙන් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමට සහ සම්පත්වල ඵලදායීතාවය ඉහළ නැංවීම පිණිස මූල්‍යමය සහ මෙහෙයුම් සම්බන්ධ පවත්නා ක්‍රමවේදයන් සහ පිළිවෙත් සවිමත් කිරීම උදෙසා නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම කමිටුවේ වගකීම වේ.

**අභ්‍යන්තර පාලනය**

ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් තිබීම ආයතනයක කාර්යක්ෂම කළමනාකරණය සඳහා අත්‍යාවශ්‍ය අංගයකි. අධිකාරියේ අභ්‍යන්තර පාලන පද්ධතිය හා මෙම පාලන ක්‍රියාදාමයේ ක්‍රියාශීලිත්වය සමාලෝචනය කිරීම සම්බන්ධව සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයවෙත පැවරේ. අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති සහ පිළිවෙත් සම්බන්ධයෙන් විස්තරාත්මක රීති මාලාවක් අධිකාරිය විසින් සකස් කර ඇති අතර ඒවා නිරන්තරයෙන් සමාලෝචනය කර යාවත්කාලීන කරයි. ව්‍යාපාරික අරමුණු ළඟා කර ගැනීමේදී බාධා පමුණුවන අවදානම් තත්ත්වයන් කළමනාකරණය කිරීම සඳහා මෙම ක්‍රමවේදය සැලසුම් කර ඇත. වත්කම් අනවසරයෙන් භාවිතා කිරීම හෝ ඒවා ආරක්ෂා කිරීම සඳහා මෙන්ම විධිමත් වාර්තා පවත්වා ගන යාම, උත්පාදනය වන්නා වූ තොරතුරු වල විශ්වසනීයත්වය සම්බන්ධයෙන් ප්‍රමාණවත් සහතිකවීමක් මෙම කමිටුව මගින් සැලසේ.

අධිකාරියේ ස්ථාපිත ප්‍රතිපත්ති සහ නිර්ණායක තුළින් එහි ප්‍රවීණතාවය, අවංකභාවය, සදාචාරාත්මක වටිනාකම සහ මනා පාරිසරික සන්නිවේදන වටපිටාවක් පවත්වා ගෙන යාම කෙරෙහි අධිකාරියේ ඇපකැපවීම තුළින් අභ්‍යන්තර පාලන පද්ධතියට සහාය දැක්වේ.

**අභ්‍යන්තර විගණකවරු**

සුදුසුකම් ලත් වරලත් ගණකාධිකාරිවරයෙකු විසින් අභ්‍යන්තර විගණන කොට්ඨාසයේ ප්‍රධානත්වය දරනු ලැබේ. මෙය ස්වාධීනව කටයුතු කරන කොට්ඨාශයක් වන අතර ඍජුවම වගකියනු ලබන්නේ සභාපතිට හා විගණන කමිටුවට පමණි.

විගණන කමිටුවේ විෂය පථය සකස් කරනු ලබන්නේ සභාපති සහ විගණන කමිටුවේ උපදෙස් ප්‍රකාරව වන අතර විෂය පථය අවශ්‍ය වන්නේ නම් අදාළ සංශෝධන සඳහා එය අඛණ්ඩව

සමාලෝචනය කෙරේ. විගණන කමිටුවේ සහාය ඇතිව මූලික වශයෙන් සමස්ත අභ්‍යන්තර පාලන පද්ධතිය අධීක්ෂණය කරනුයේ අභ්‍යන්තර විගණන කොට්ඨාසය මඟිනි. අභ්‍යන්තර විගණනය අභ්‍යන්තර පාලන ක්‍රියා පිළිවෙත්හි කාර්යක්ෂමතාවය හා ඵලදායීත්වය පිළිබඳ විෂය නිශ්‍රිත මතයක් සපයන අතර අභ්‍යන්තර පාලන ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම.

**විනය නීති**

සතුටුදායක හැසිරීම් රටාවක් පවත්වාගෙන යාම සඳහා මග පෙන්වනු පිණිස විනය නීති පනවා ඇත. සියළුම අධ්‍යක්ෂවරුන්,කොට්ඨාස ප්‍රධානීන් හා සේවකයින් විසින් සිය දෛනික රාජකාරි කටයුතු ඉටු කිරීමේදීත්, ස්වකීය ක්‍රියාකාරකම් අධිකාරියේ කිර්තිනාමයට හා ප්‍රතිරූපයට හානි විය හැකි අවස්ථාවලදීත්, ඉහළම මට්ටමේ සදාචාරාත්මක හා අවංකභාවයෙන් යුතුව කටයුතු කරනු ලැබීම අධිකාරියේ අපේක්ෂාව වේ.

**විනය නීතිවල මූලිකාංග**

- සියළුම කටයුතු වලදී සාධාරණත්වය, අවංකභාවය හා අපක්ෂපාතීත්වය දැක්වීම.
- නීතිය දැන සිටීම හා එයට අවනත වීම.
- ඉටු කරනු ලබන සියළු කටයුතු වල රහස්‍යභාවය ආරක්ෂා කිරීම.
- අධිකාරියට අගතියක් සිදුවිය හැකි ආකාරයේ හැසිරීමෙන් වැළකීම.

**අනුකූලතා කාර්යය රාමුව හා ව්‍යවස්ථාපිත සහ නෛතික අවශ්‍යතාවයන්ට අවනත වීම**

සියළුම නෛතික සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කිරීමේ වැදගත්කම අධිකාරිය පිළිගෙන ඇත. මෙම අවශ්‍යතාවයේදී අධිකාරියේ සියළුම ව්‍යවස්ථාපිත සහ නෛතික අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කරන බවට සහතික වීම සඳහා මුදල් කොට්ඨාශය හා අභ්‍යන්තර විගණන කොට්ඨාශය සමගාමීව සෑම පරිශ්‍රමයක්ම දරමින් කටයුතු කරමින් සිටී. ඊට අමතරව අධිකාරියේ ව්‍යාපාරික කටයුතු සහ වෙනත් කාර්යයන් නීති සහ රීති වලට අනුකූලව සිදුවන බවට නීති කොට්ඨාසය සහතික වේ.

**වරාය හා නාවික අමාත්‍යංශය, මුදල් අමාත්‍යංශය සහ මුදල් අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරය සමඟ පවතින සම්බන්ධතාවය**

පැහැදිලි විධානයන් මගින් ක්‍රමෝපායික අරමුණු ඉටු කර ගනු පිණිස සැලසුම් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට මග පෙන්වන ගරු වරාය හා නාවික අමාත්‍යවරයා සහ එහි ලේකම්වරයා සහ උපාය මාර්ගික ව්‍යවසායකත්ව කළමනාකරණ ආයතනය (SEMA) සමඟ අධිකාරිය අඛණ්ඩ සම්බන්ධතාවයක් පවත්වා ගෙන යනු ලැබේ. ඊට අමතරව මුදල් අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරයට අවශ්‍ය වන පරිදි වසර 03ක් සඳහා ව්‍යාපාරික සැලසුමක් සහ මූල්‍යමය වාර්තා සහ අනෙකුත් මෙහෙයුම් කාර්යසාධන වාර්තා ඇතුළු පරිපූර්ණ වාර්තා අධිකාරිය විසින්ත්‍රෛයිමාසික පදනමක් මත ඉදිරිපත් කරන ලදී.

**අදාළ පාර්ශ්ව සම්බන්ධ අනාවරණය කිරීම්**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ ගණුදෙනු පවත්වා ගෙන යන ලබන කිසිදු පාර්ශ්වයක් සමඟ පෞද්ගලික හිතවත්කමක් හෝ සම්බන්ධතාවයක් නොපවත්වන බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කර සනාථ කර සිටී.

**වගකීම**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන මගින් වරාය අධිකාරියේ කාර්යයන්හි ගති ස්වභාවය සත්‍ය හා සාධාරණ ලෙස පිළිබිඹු වන බවත්, එම වාර්තා පිළිගත් අවශ්‍යතාවයන්ට අනුකූලව පිළියෙළ කර ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

**අනාගතය**

ආයතනික පාලනයක සැබෑ වටිනාකම රැඳී පවතින්නේ වඩා යහපත් ක්‍රම පද්ධති, ප්‍රතිපත්ති සහ මූලධර්ම මාලාවක් අන්ධානුකරණයෙන් අනුගමනය කිරීම තුළ නොවන බවත්, සියළුම පරදුකරුවන්ගේ විශ්වාසය දිනා ගනිමින් බවත් අධිකාරිය විශ්වාස කරන අතර එමගින් සිය ව්‍යාපාරික කටයුතු විනිවිදභාවයෙන් යුක්තව ඉහළම විශ්වාසය හා සාධාරණත්වයෙන් ඉටු කිරීමෙන් ඔවුන් ද අපගේ ක්‍රමෝපායන්ට සහාය වනු ඇත.



# වරාය සංඛ්‍යාලේඛන

# වාර්ෂික වාර්තාව 2017

## කොළඹ වරාය

### වරාය පරිමාණය

### වරාය ප්‍රදේශය

| | |
|---|---|
| වරාය ද්‍රෝණි ප්‍රදේශය | හෙක්ටයාර් 184.6 |
| වයඹ දිග දියකඩනයේ දිග ප්‍රමාණය | මීටර් 810 |
| ඊශාන දිග දියකඩනයේ දිග ප්‍රමාණය | මීටර් 330 |
| බටහිර පිවිසුම | මීටර් 230 Xමීටර් 16 |
| උතුරු පිවිසුම | මීටර් 190 X මීටර් 13 |

**වැඩ කරන වේලාවන්**

කොළඹ වරාය වසරේ සෑම දිනකම දවසේ පැය 24 පුරා සේවා සැපයීමේ පදනම මත ක්‍රියාත්මකව පවතී.

| 2017 වර්ෂයේදී මෙහෙයුම් කළ වර්ග අනුව නැව්බඩු මෙහෙයුම් ධාරිතාවය | |
|---|---|
| බහළුගත | 89.7% |
| තොග කඩන | 0.9% |
| වියළි තොග | 2.8% |
| දියර තොග | 6.6% |

## කොළඹ නව දකුණු වරාය

### වරාය ප්‍රදේශය

| | |
|---|---|
| වරාය ද්‍රෝණි ප්‍රදේශය | හෙක්ටයාර් 192.0 |
| නිරිත දිග දියකඩනයේ දිග ප්‍රමාණය | මීටර් 5,140 |
| වයඹ දිග දියකඩනයේ දිග ප්‍රමාණය | මීටර් 1,550 |
| ප්‍රධාන පිවිසුම | මීටර් 570 Xමීටර් 18 |

**වැඩ කරන වේලාවන්**

ලෝක කම්කරු දිනය හැර එහෙත් එදින දිවා නාවික කටයුතු පමණක් සහිතව වසරේ සෑම දිනකම දවසේ පැය 24 සේවා සැපයීමේ පදනම මත ක්‍රියාත්මකව පවතී.

## ගාල්ල වරාය

### වරාය පරිමාණය

| | |
|---|---|
| ජල ප්‍රදේශය | හෙක්ටයාර් 15.3718 |
| ප්‍රවේශ ඇළ මාර්ගය | මීටර් 140 |
| ගොඩබිම් ප්‍රදේශය | හෙක්ටයාර් 16.4015 |
| සමස්ත සීමිත දිග ප්‍රමාණය | මීටර් 130 |
| සීමිත ගැඹුර | මීටර් 7.3 |

**අපගමන වේලාව**

නැඟෙනහිර - බටහිර ප්‍රධාන මාර්ගයෙන් නැත.

**නැංගුරම් පහසුකම්**

අද්දර නැංගුරම්පල සංඛ්‍යාව 05

| නැංගුරම්පළ | මුළු දිග (මීටර්) | අද්දර ගැඹුර (මීටර්) |
|---|---|---|
| ක්ලොසන්බර්ග් ජැටිය | 420 | 8.9 |
| නව පාලම | 162 | 8.9 |
| නව පාලම/හරස් | 84 | 8.9 |

**ගුදම් පහසුකම්**

| නම | සාමාන්‍ය උස (අඩි) | ප්‍රදේශය (වර්ග අඩි) | ධාරිතාවය (ඝන අඩි) | බහළු තැන්පත් කිරීමේ උස (අඩි) |
|---|---|---|---|---|
| අංක 01 | 23 | 13,333 | 306,667 | 10 උස |
| අංක 02 | 23 | 40,000 | 920,000 | 10 උස |

## ත්‍රිකුණාමලය වරාය

**වරාය පරිමාණය**

| | |
|---|---|
| ජල ප්‍රදේශය | හෙක්ටයාර් 1,536 |
| ප්‍රවේශ ඇළ මාර්ගය (අවම පළල) | මීටර් 500 |
| ගොඩබිම් ප්‍රදේශය | හෙක්ටයාර් 2,254 |

**වැඩ කරන වේලාවන්**

ලෝක කම්කරු දිනය හැර එහෙත් එදින දිවා නාවික කටයුතු පමණක් සහිතව ත්‍රිකුණාමලය වරාය වසරේ සෑම දිනකම පැය 24 රේ සේවා සැපයීම් පදනම මත ක්‍රියාත්මකව පවතී.

**නැංගුරම්ලෑමේ පහසුකම්**

**ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නැංගුරම්පලවල්**

| නැංගුරම්පල | මුළු දිග (මීටර්) | අද්දර ගැඹුර (මීටර්) |
|---|---|---|
| අෂ්රෆ් ජැටිය | 250 | 12.5 |
| පැති නැංගුරම්පළ (අෂ්රෆ් ජැටිය) | 90 X 2 | 8.5 |
| මඩ්කොව් ප්‍රදේශයේ පිහිටි ජැටිය | 45 | 3.5 |
| ටීටීජ් හි පිහිටි ජැටිය | 190 | 2.0 - 4.0 |
| සිලෝන් ජැටිය | 50 | 2.5 |

| | | |
|---|---|---|
| නගර ජැටිය | 50 | 2.5 |
| මුතුර් ජැටිය | 60 | 3.0 |
| වීඑස්ඕ ජැටිය | 25 | 1.5 |
| පැරණි නගර ජැටිය | 60 | 2.0 |
| තෙල් ජැටිය | 130 | 9.75 |

**වෙනත් නැංගුරම්පළවල්**

| නැංගුරම්පල | මුළු දිග (මීටර්) | අද්දර ගැඹුර (මීටර්) |
|---|---|---|
| ප්‍රීමා ජැටිය (ඇතුල්) | 122 | 5.9 |
| ප්‍රීමා ජැටිය (පිටත) | 227 | 14.3 |
| ප්‍රීමා ජැටිය (බහුකාර්ය) | 170 | 10.3 |
| ටෝකියෝ සිමෙන්ති ජැටිය | 160 | 9.5 |

**ගුදම් පිළිබඳ විස්තර - ටීටීඒ**

| ගුදම | පරිමාණය (අඩි) | සාමාන්‍ය උස (අඩි) | ප්‍රදේශය (ව.අ.) | බහළු තැන්පත් කිරීමේ උස (අඩි) | ධාරිතාවය (ඝණ අඩි) |
|---|---|---|---|---|---|
| අංක 01 | 75 X 34 | - | 2,550 | 12 | 30,600 |
| අංක 02 සහ 03 | 90 X 70 | 15 | 6,300 | 12 | 75,600 |
| අංක 04 | 190 X 95 | 19 | 18,050 | 14 | 252,700 |
| අංක 05 ඒ | 150 X 110 | 25 | 16,500 | 15 | 247,500 |
| අංක 05 බී | 150 X 80 | 15 | 12,000 | 12 | 144,000 |
| අංක 06 | 300 X 110 | 20 | 33,000 | 15 | 495,000 |
| අංක 07 | 96 X 36 | - | 3,456 | 12 | 41,472 |

**මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය - දැනට**

**වරාය පරිමාණය**

**වරාය ප්‍රදේශය**

| | |
|---|---|
| ජල ප්‍රදේශය | හෙක්ටයාර් 75 |
| බටහිර දිකඩනයේ දිග | මීටර් 988 |
| නැගෙනහිර දියකඩනයේ දිග | මීටර් 311 |
| ප්‍රවේශ ඇළ මාර්ගය | මීටර් 210 * මීටර් 16 |
| හැරවුම් වට රවුම | මීටර් 600 |

**පාලම් වල දිග**

| | |
|---|---|
| සාමාන්‍ය නැව් බඩු පාලම | මීටර් 600 |
| සේවා පාලම | මීටර් 105 |
| තෙල් පාලම 1 | මීටර් 310 |
| තෙල් පාලම 2 | මීටර් 300 |
| ද්‍රෝණියේ ගැඹුර | මීටර් 17 |
| නෞකා නිර්මාණය | ද.බ.ටො. 100,000 |

## මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය - දෙවන අදියර අවසන් කිරීමෙන් පසු

**වරාය පරිමාණය**

**වරාය ප්‍රදේශය**

| | |
|---|---|
| සම්පූර්ණ කිරීමෙන් පසු මුළු ජල ප්‍රදේශය | හෙක්ටයාර් 152<br>(අදියර 1 හි ජල ප්‍රදේශය ඇතුළුව) |
| ප්‍රවේශ ඇළ මාර්ගය | මීටර් 210 * මීටර් 17 |
| හැරවුම් චක්‍රය | මීටර් 600 |

**පාලම් වල දිග**

| | |
|---|---|
| ප්‍රධාන බහළු නැංගුරම්පල | මීටර් 835.5 |
| පෝෂක බහළු පර්යන්තය | මීටර් 460 |
| බහුකාර්ය නැංගුරම්පල | මීටර් 838.5 |
| හුවමාරු නැංගුරම්පල | මීටර් 208 |
| ද්‍රෝණියේ ගැඹුර | මීටර් 17 |
| නෞකා නිර්මාණය | ද.බ.ටො. 100,000 |



# මූල්‍ය ප්‍රකාශනයන්

# වාර්ෂික වාර්තාව 2017

2017.12.31 දිනට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් පරිදි විය.

**ආචාර්ය පරාක්‍රම දිසානායක මහතා**
**සභාපති**

**පී ජී දසනායක මහතා**
**උප සභාපති**

**එච් ඩී ඒ එස් ප්‍රේමචන්ද්‍ර මහතා**
**කළමනාකාර අධ්‍යක්ෂ**

**එච් ඒ විමලසූරිය මහතා**
**විධායක අධ්‍යක්ෂ**

**පී එස් එම් චාර්ල්ස් මහත්මිය**
**අධ්‍යක්ෂ**

**එච් ජී සුමනසිංහ මහතා**
**අධ්‍යක්ෂ**

**ජගත් පී විජේවීර මහතා**
**අධ්‍යක්ෂ**

**නිලාන් වික්‍රමසිංහ මහතා**
**අධ්‍යක්ෂ**

**සුරංග පී හිඳැල්ලාරච්චි මහතා**
**අධ්‍යක්ෂ**

සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 15ක් පවත්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටුවක් ලෙස ක්‍රියාත්මක වන කළමනාකරණ කමිටුවේ රැස්වීම් අටක් (08) 2017 වර්ෂය තුළ දී පැවැත්විණි. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනෙක් අනු කමිටුව වන විගණන කමිටුව 2017 වර්ෂය තුළදී රැස්වීම් හතරක් (04) පවත්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ පහත සඳහන් අධ්‍යක්ෂවරුන් විගණන කමිටුවේ සාමාජිකයින් ලෙස කටයුතු කරන ලදී.

**එච් ජී සුමනසිංහ මහතා**
**සභාපති**

**පී එස් එම් චාර්ල්ස් මහත්මිය**
**සාමාජික**

**නිලාන් වික්‍රමසිංහ මහතා**
**සාමාජික**

කොළඹ වරාය විසින් මෙතෙක් මෙහෙයවන ලද ඉහළම බහළු මෙහෙයුම් ප්‍රමාණය වූ විස්සේ සම ඒකක 6,209,068 ක් සහ සාමාන්‍ය නැව්බඩු ටොන් මිලියන 89.03 ක් 2017 වර්ෂයේ දී වාර්තා විය. මෙහෙයවන ලද සමස්ත බහළු ප්‍රමාණය සහ නැව්බඩු ටොන් ප්‍රමාණය පිළිවෙලින් 8.3% කින් සහ 8.7% කින් වර්ධනය වී ඇත.

2016 වර්ෂය හා සසඳා බැලීමේදී, වැඩි ධාරිතාවයකින් යුත් නෞකා පැමිණීම/ නව සන්ධාන ගොඩනැගීම්/ ඒකාබද්ධ කිරීම් ආදියෙහි ප්‍රතිඵලයක් වශයෙන් කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් (CICT) වෙත සේවාවන් මාරුවීම සහ පෞද්ගලික පර්යන්ත මෙහෙයුම්කරුවන් විසින් තරඟකාරී මිල ගණන් යටතේ සේවා සැපයීම සහ සහන පිරිනැමීම හේතුකොට ගෙන ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත වල මෙහෙයුම් කිරීමට හැකිවී ඇත්තේ බහළු විස්සේ සම ඒකක 2,010,702 කි. එය බහළු විස්සේ සම ඒකක 89,415 (-4.3%) ක අඩුවීමකි. සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) සහ කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් (CICT) යන සමාගම් දෙක පිළිවෙලින් 10.9% හා 19.3% ක ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කර ඇත.

- 2016 වර්ෂයට කොළඹ වරායේ බහළු මෙහෙයුම් ධාරිතාවය 2016 වර්ෂයේදී විස්සේ සම ඒකක 5,734,923 සිට 2017 වර්ෂයේ දී විස්සේ සම ඒකක 6,209,068 ක් දක්වා ඉහළ යන ලදී. (මෙය විස්සේ සම ඒකක 474,145 හෝ 8.3% ක වැඩිවීමකි.)

- 2016 වර්ෂය හා සැසඳීමේදී 2017 වර්ෂයේ කොළඹ වරායේ දේශීය බහළු මෙහෙයුම් ධාරිතාවය 6.4%කින් ඉහළ යන ලදී. ( විස්සේ සම ඒකක 83,701)

- 2016 වර්ෂය හා සැසඳීමේදී කොළඹ වරායේ ප්‍රතිඅපනයන බහළු මෙහෙයුම් ධාරිතාවය 8.9% කින් ඉහළ යන ලදී. (මෙය විස්සේ සම ඒකක 386,321).

- කොළඹ වරායේ මෙහෙයවන ලද සමස්ත නැව්බඩු ටොන් ප්‍රමාණය 8.7%කින් වැඩි විය. (මෙය 2016 වර්ෂයේ මෙහෙයවන ලද ටොන් මිලියන 81,879 සිට 2017 වර්ෂයේ මෙහෙයවන ලද ටොන් ප්‍රමාණය මිලියන 89,035 දක්වා ඉහළ යාමකි)

- 2016 වර්ෂයේදී ආනයනය කරන ලද මුළු දේශිය රථ වාහන ධාරිතාවය ( කොළඹ සහ හම්බන්තොට වරාය) 2017 වර්ෂයේදී ඒකක 63,407 සිට 63,030 දක්වා ආන්තික වශයෙන් අඩු වී ඇත.

- 2016 වර්ෂයේ දී මෙහෙයවන ලද සමස්ත මෝටර් රථ ප්‍රතිඅපනයන (කොළඹ සහ හම්බන්තොට වරායේ) ධාරිතාවය වූ ඒකක 150,921 සිට 2017 වර්ෂයේදී ඒකක 83,787 දක්වා 44.5% කින් අඩු විය.

2017 වර්ෂයේ කොළඹ වරායට පැමිණි නෞකා සංඛ්‍යාව පසුගිය වසර හා සසඳා බැලීමේදී, 4,405 සිට 4,329 දක්වා එනම් 1.7% කින් අඩුවී ඇත. 2016 වර්ෂයේ බහළු නෞකා 3,804 ක් පැමිණ තිබූ අතර, 2017 වර්ෂයේදී එම සංඛ්‍යාව 3,683 දක්වා 3.2% කින් අඩුවී ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත වෙත වැඩි බහළු ප්‍රමාණයක් ආකර්ෂණය කරගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාරීත්වය විසින් අළෙවි හා ව්‍යාපාර සංවර්ධන ක්‍රමෝපායයන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ ගණුදෙනු ඉදිරියට පවත්වාගෙන

යාම සඳහා සහ සම්බන්ධකම් පවත්වාගෙන යෑම සඳහා වරාය ප්‍රධාන නැව් සේවාවන් සමඟ පර්යන්ත සේවා ගිවිසුම් හතරක්(04) අත්සන් කරන ලදී. 2017 වර්ෂය තුළ ප්‍රධාන නැව් සේවා හතරක් සහ පෝෂක නැව් සේවා තුනක් (03) ආකර්ෂණය කරගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමත් වි ඇති අතර අහඹු ලෙස පැමිණෙන නෞකා අපගේ පර්යන්ත වල මෙහෙයවා එමගින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත වෙත අන්තර් මෙහෙයුම් ලබාගැනීමට සමත් විය.

කළමනාකාරීත්වය විසින් හඳුන්වාදෙන ලද උපාය මාර්ග, ජය බහළු පර්යන්තයේ සමස්ත මෙහෙයුම් ධාරිතාවය පහල යාමේ ගැටළුව විසඳීමටද දායක වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ජය බහළු පර්යන්තයේ 4 වන කාර්තුවේ දී මෙහෙයුම්, පසුගිය වසරේ මෙම කාලසීමාව හා සසඳා බැලීමේදී 9.2 % වර්ධනයක් වාර්තා කර ඇත. මෙම නැඹුරුව අඛණ්ඩව පවතී.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉතිහාසයෙහි ප්‍රථම වතාවට කොළඹ වරාය මගින් බහළු විස්සේ සම ඒකක මිලියන 6.2 මෙහෙයවන ලදී. ඇල්ෆාලයිනර් පර්යේෂණ වාර්තාවට අනුව, ලෝකයේ බහළු මෙහෙයවන වරාය ශ්‍රේණිගත කිරීම් දර්ශකයේ කොළඹ වරාය 23 වන ස්ථානයේ සිට 22 වන ස්ථානයට පත්වී ඇත.

අතිවිශාල නෞකා මෙහෙයවීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් කොළඹ දකුණු වරායේ ගැඹුරු වරාය පහසුකම් (Deep water facilities) ඉදිකරන ලදී. මෙම පහසුකම් උපයෝගී කර ගනිමින් පුරා වසර හතරකට පසු සී/ස කොළඹ ජාත්‍යන්තර බහළු පර්යන්ත (පෞද්.) සමාගම (CICT) 2017 වර්ෂයේ දී විස්සේ සම ඒකක මිලියන 2.3ක් මෙහෙයුම් කරන ලද අතර (19.3% ක වර්ධනයක්) අතිවිශාල නෞකා සඳහා පහසුකම් සැපයිය හැකි පර්යන්ත සමඟ සිව් වසරක් තුළ උපරිම ධාරිතාවය ළඟා කරගෙන ඇත . මෙම නව පහසුකම් යටතේ කොළඹ වරායට 2017 වර්ෂයේදී 8.3% ක වර්ධනයක් අත්කර ගැනීමට හැකි විය.

පසුගිය වසර හා සාපේක්ෂව, ප්‍රතිශතයක් වශයෙන් 3.5% වැඩිවීමක් වන රුපියල් මිලියන 45,609 ක ආදායමක් 2017 වර්ෂයේ දී ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් උපයන ලදී. 2016 වර්ෂයේ රුපියල් මිලියන 15,376 ක මෙහෙයුම් ලාභය (විදේශ ණය පොලිය සහ විදේශ විනිමය පාඩු/ලැබීම් වලට පෙර) 2017 වර්ෂයේ දී රුපියල් මිලියන 17,510 දක්වා 13.9%කින් වැඩි විය.

# මූල්‍ය කටයුතු වාර්තා කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළු කාර්යයන් පිළිබඳ ගිණුම් පොත් නිසියාකාරව පවත්වාගෙන යනු ලබන බවටත්, පවතින තත්ත්වය හා වර්ෂයේ ලාභ/පාඩු පිළිබඳ සත්‍ය හා සාධාරණ මතයක් ලබා දෙන අයුරින් එහි මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලබන බවටත්, සහතික වීමේ වගකීම 1971 අංක 38 දරණ මුදල් පනතේ (12) හා (13.6) වගන්ති යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත.

ඒ අනුව, ගිණුම් පොත් නිසි ලෙස පවත්වාගෙන යන ලෙස වරාය අධිකාරියට අධ්‍යක්ෂ මණ්ඩලය නියෝග කර ඇති අතර, නිතිපතා පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වල සහ විගණන කමිටුව හරහා මූල්‍ය වාර්තාකරණ පිළිවෙත පිළිබඳව සමාලෝචනය කරන ලදි.

නිවැරදි ගිණුම්කරණ ප්‍රතිපත්ති නොවෙනස් වන පදනමක් මත සාධාරණ හා විචක්ෂණ විනිශ්චයන් හා ඇස්තමේන්තු පහදමින් මෙම වාර්තාවෙහි පෙන්වා ඇති මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇති බව අධ්‍යක්ෂවරුන් නිගමනය කර ඇත.

අධිකාරියේ වත්කම් ආරක්ෂා කරගැනීම සඳහාත් වංචා, දූෂණ හා වෙනත් අක්‍රමිකතා වැලැක්වීම හා අනාවරණය කර ගැනීම සඳහා ගත හැකි සෑම පියවරක්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබ ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ව්‍යාපාර කටයුතු විධිමත් ක්‍රමවේදයකට ගෙනයාමට සහ අපගේ ලේඛනයන්හී නිරවද්‍යතාවය හා විශ්වාසනීයත්වය උපරිම ලෙසට ප්‍රායෝගික වන පරිදි ආරක්ෂ කිරීම සඳහා, අභ්‍යන්තර පරීක්ෂා කිරීම්, අභ්‍යන්තර විගණන සහ මූල්‍ය හා අනෙකුත් පාලනයන් ඇතුළත් ඵලදායී සහ පරිපූර්ණ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි



**එස් ඒ එස් කේ ජයසේකර මිය**
**අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්**

ආයතනයේ මූල්‍ය කළමනාකරණය අනුව වගකීම් ඉටුකිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීම විගණන කමිටුවේ වගකීම වේ. මෙය ඉටුකිරීමේදී කමිටුවේ ප්‍රධාන වගකීම් පහත දැක්වෙන පරිදි වේ.

- ♦ ඵලදායී අභ්‍යන්තර පාලන සහ අභ්‍යන්තර විගණන කටයුතු කාර්යක්‍ෂමව සිදුවන බවට සහතික වීම.
- ♦ මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය වාර්තාකරණය සහ විගණන ක්‍රියාවලීන්හි නිරවද්‍යතාවය සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම.
- ♦ ව්‍යවස්ථාපිත සහ නියාමන අවශ්‍යතා සමඟ අනුකූල වන බවට සහතිකවීම.
- ♦ මෙහෙයුම් කාර්යක්ෂමතා සහ පාලන පද්ධති සමාලෝචනය කිරීම.

මහා භාණ්ඩාගාර නියෝජිත/ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ විසින් විගණන කමිටුවේ ප්‍රධානත්වය දරනු ලබන අතර අධිකාරියට සිය පාලනය උසස් මට්ටමිකින් ගෙනයාම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී වැදගත් ක්‍රියාකාරකම් කිහිපයක් සිදු කරනු ලැබීය.

වැදගත් මූලික අභ්‍යන්තර ක්‍රමවේදයක් ලෙස, 2017 වසර සඳහා අභ්‍යන්තර සැලැස්ම සහ විගණන වැඩසටහන ක්‍රියාත්මක කළ අතර මාසික වාර්තා ලබා ගැනීම තුළින් එය ක්‍රියාත්මක කිරීමේ සඵලතාව පිළිබඳ නිතිපතා සමාලෝචන කරන ලදී. විගණකාධිපතිවරයා විසින් 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වරාය අධිකාරියේ ගිණුම් පිළිබඳ කෙටුම්පත් වාර්තාව කළමනාකාරීත්වයේ ප්‍රතිචාර සමඟ සමාලෝචනය කරන ලදී. කමිටු රැස්වීම්වලදී මතු කරන ලද ඇතැම් විශේෂ කරුණු විගණන කමිටුවේ නිර්දේශ සහිතව අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කරන ලදී. අධිකාරියේ ත්‍රෛමාසික මූල්‍ය වාර්තා සහ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණන සමාලෝචනය සමඟ අඛණ්ඩව සමාලෝචනය කරන ලද අතර, අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අනුදැනුම මත ඉදිරියට කළයුතු පියවර ගන්නා ලදී. කමිටු රැස්වීම්හි දී පෙන්වූ වැදගත් කරුණු විගණන කමිටුවේ නිර්දේශ සමඟ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අවධානය සඳහා යොමුකරන ලදී.

අධිකාරියේ වත්කම් ආරක්ෂාකාරීව පවතින බවට සහ විගණනය කරන ලද ගිණුම් වල ප්‍රතිඵල හා මූල්‍ය තත්ත්වය වැරදි ලෙස සඳහන් වීම් වලින් තොර බවට සහතික වීම සඳහා අවශ්‍ය "පිරික්සුම් සහ තුල්‍යතාවයන්" පවතින බව විගණන කමිටුවේ අදහස වේ. වසර තුළ දී, අධිකාරියේ පාලනය වැඩි දියුණු කිරීම සහ විනිවිදභාවයකින් යුතුව කටයුතු සිදු කිරීම සඳහා විගණන කමිටුව සුවිශේෂී දායකත්වයක් සපයන ලදී.



**එච් ජී සුමණසිංහ**
**සභාපති - විගණන කමිටුව**

ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් අනුකූලතාවය දැක්වීමේ තත්ත්වය සවිස්තරාත්මකව පහත දැක්වේ.

**සේවක අර්ථ සාධක අරමුදල - අධිකාරියේ සහ සේවක දායකත්වය**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම ස්ථිර සේවකයින් වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දායකත්වය වශයෙන් 15% ක් සේවක දායකත්වය වෙනුවෙන් 10% ක් වශයෙන් එළඹෙන මාසයෙහි අවසාන දිනට ප්‍රථම කම්කරු දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතු වේ.

සේවකයින්ගෙන් අඩු කරනු ලබන සියළුම දායක මුදල් සහ අධිකාරියේ අදාළ දායක මුදල නියමිත දිනට හෝ ඊට ප්‍රථමයෙන් ප්‍රේෂණය කරනු ලැබ ඇත.

**සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල**

අධිකාරියේ 3% දායක මුදල සෑම මසකම නියමිත දිනට හෝ ඊට ප්‍රථමයෙන් ප්‍රේෂණය කරනු ලැබ ඇත.

**උපයන විට ගෙවීම**

උපයන විට ගෙවීමේ බද්ද දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත නියමිත දිනට ප්‍රේෂණය කරනු ලැබ ඇත.

**ආදායම් බදු**

2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ 113 වගන්තිය ප්‍රකාරව උපයනු ලබන ආදායමට අදාළ ආදායම් බදු ගෙවීම, බදු ගෙවිය යුතු ආදායමක් උපයා ඇති සෑම අවස්ථාවකදීම නියමිත දිනවලදී ත්‍රෛමාසිකව ගෙවනු ලැබ ඇත.

**වාර්ෂික ආදායම**

අධිකාරියේ ආදායම් බදු සම්බන්ධ වාර්ෂික වාර්තාව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙත වාර්ෂිකව ගොණුකර ඇත. මෙම වාර්තා සෑම වර්ෂයකම නියමිත දිනය වන නොවැම්බර් 30 දිනට ප්‍රථම සම්පූර්ණකොට භාරදෙනු ලැබ ඇත.

**වාර්ෂික වාර්තාකරණය**

වාර්ෂික අයවැය, ගිණුම් සහ වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ අමාත්‍යංශය වෙත ඉදිරිපත් කර ඇත.

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | | | | ශ්‍රී.ලං.ව.අ. | |
|---|---|---|---|---|---|---|
| | කොළඹ | ත්‍රිකුණාමලය | ගාල්ල | හම්බන්තොට | 2017 | 2016 |
| **පැමිණි නැව් සංඛ්‍යාව** | | | | | | |
| නැව්බඩු නෞකා | 4,239 | 225 | 81 | 225 | 4,770 | 4,868 |
| වෙනත් නෞකා | 153 | 8 | 6 | 5 | 172 | 155 |
| වෙනත් යාත්‍රා | 717 | 38 | 63 | 21 | 839 | 759 |
| | **5,109** | **271** | **150** | **251** | **5,781** | **5,782** |
| **මෙහෙයුම් ධාරිතාවය** | | | | | | |
| **බහළු විස්සේ සම ඒකක ප්‍රමාණය (ශ්‍රී.ල.ව.අ.)** | | | | | | |
| ප්‍රතිනැව්ගත කිරීම් | 1,609,114 | - | - | | 1,609,114 | 1,607,792 |
| දේශීය | 388,282 | - | - | | 388,282 | 483,109 |
| නැවත ගබඩා කිරීම් | 13,306 | - | - | | 13,306 | 9,216 |
| **මුළු විස්සේ සම ඒකක ප්‍රමාණය** | **2,010,702** | **-** | **-** | | **2,010,702** | **2,100,117** |
| **බහළු විස්සේ සම ඒකක ප්‍රමාණය (එස්.ඒ.ජී.ටී)** | | | | | | |
| ප්‍රතිනැව්ගත කිරීම් | 1,406,265 | - | - | - | 1,406,265 | 1,294,631 |
| දේශීය | 375,944 | - | - | - | 375,944 | 317,707 |
| නැවත ගබඩා කිරීම් | 27,626 | - | - | - | 27,626 | 19,869 |
| **මුළු විස්සේ සම ඒකක ප්‍රමාණය** | **1,809,835** | **-** | **-** | **-** | **1,809,835** | **1,632,207** |
| **බහළු විස්සේ සම ඒකක ප්‍රමාණය (සී.අයි.සී.ටී)** | | | | | | |
| ප්‍රතිනැව්ගත කිරීම් | 1,726,203 | - | - | - | 1,726,203 | 1,452,838 |
| දේශීය | 619,325 | - | - | - | 619,325 | 499,034 |
| නැවත ගබඩා කිරීම් | 43,003 | - | - | - | 43,003 | 50,727 |
| **මුළු විස්සේ සම ඒකක ප්‍රමාණය** | **2,388,531** | **-** | **-** | | **2,388,531** | **2,002,599** |
| **බහළු විස්සේ සම ඒකක ප්‍රමාණය (කොළඹ වරාය)** | | | | | | |
| ප්‍රතිනැව්ගත කිරීම් | 4,741,582 | - | - | - | 4,741,582 | 4,355,261 |
| දේශීය | 1,383,551 | - | - | - | 1,383,551 | 1,299,850 |
| නැවත ගබඩා කිරීම් | 83,935 | - | - | - | 83,935 | 79,812 |
| **මුළු විස්සේ සම ඒකක ප්‍රමාණය** | **6,209,068** | **-** | **-** | **-** | **6,209,068** | **5,734,923** |
| සාම්ප්‍රදායික මෙ.ටො. | 3,367,233 | 3,443,596 | 711,511 | 213,167 | 7,735,507 | 7,810,827 |
| ද්‍රව මෙ.ටො. | 5,865,240 | 453,714 | - | - | 6,318,954 | 5,052,774 |
| | **9,232,473** | **3,897,310** | **711,511** | **213,167** | **14,054,461** | **12,863,601** |
| **සම ඒකක ( මෙ.ටො.) - ශ්‍රී ලංකා වරාය අධිකාරිය** | | | | | | |
| බහළුගත නැව් බඩු | 25,791,290 | - | - | - | 25,791,290 | 26,975,029 |
| සාම්ප්‍රදායික නැව් බඩු | 3,367,233 | 3,443,596 | 711,511 | 213,167 | 7,735,507 | 7,810,827 |
| ද්‍රව | 5,865,240 | 453,714 | - | - | 6,318,954 | 5,052,774 |
| **මුළු සම ඒකක (මෙ.ටො.)** | **35,023,763** | **3,897,310** | **711,511** | **213,167** | **39,845,751** | **39,838,630** |
| **සම ඒකක ( මෙ.ටො.) - (එස්.ඒ.ජී.ටී)** | | | | | | |
| බහළුගත නැව් බඩු | 23,622,195 | - | - | - | 23,622,195 | 21,195,940 |
| **මුළු සම ඒකක (මෙ.ටො.)** | **23,622,195** | **-** | **-** | **-** | **23,622,195** | **21,195,940** |
| **සම ඒකක ( මෙ.ටො.) - (සී.අයි.සී.ටී.)** | | | | | | |
| බහළුගත නැව් බඩු | 30,411,243 | - | - | - | 30,411,243 | 25,511,052 |
| | **30,411,243** | **-** | **-** | **-** | **30,411,243** | **25,511,052** |
| **සම ඒකක ( මෙ.ටො.) - (කොළඹ වරාය)** | | | | | | |
| බහළුගත නැව් බඩු | 79,824,728 | - | - | - | 79,824,728 | 73,682,031 |
| සාම්ප්‍රදායික නැව් බඩු | 3,367,233 | 3,443,596 | 711,511 | 213,167 | 7,735,507 | 7,810,827 |
| ද්‍රව | 5,865,240 | 453,714 | - | - | 6,318,954 | 5,052,774 |
| **මුළු සම ඒකක (මෙ.ටො.)** | **89,057,201** | **3,897,310** | **711,511** | **213,167** | **93,879,189** | **86,545,632** |
| **මෙහෙයුම් කළ දළ ටොන් ප්‍රමාණය (ශ්‍රී.ල.ව.අ.)** | | | | | | |
| බහළුගත නැව් බඩු | 54,109,284 | - | - | - | 54,109,284 | 59,333,004 |
| සාම්ප්‍රදායික නැව් බඩු | 10,120,094 | 3,793,629 | 559,058 | 11,659,487 | 26,132,268 | 26,918,253 |
| වෙනත් | 4,591,126 | 126,146 | 43,702 | 199,820 | 4,960,794 | 3,703,064 |
| **මුළු ටොන් ප්‍රමාණය** | **68,820,504** | **3,919,775** | **602,760** | **11,859,307** | **85,202,346** | **89,954,321** |
| **මෙහෙයුම් කළ දළ ටොන් ප්‍රමාණය (එස්.ඒ.ජී.ටී)** | | | | | | |
| බහළුගත නැව් බඩු | 42,569,709 | - | - | - | 42,569,709 | 39,513,906 |
| **මුළු ටොන් ප්‍රමාණය** | **42,569,709** | **-** | **-** | **-** | **42,569,709** | **39,513,906** |
| **මෙහෙයුම් කළ දළ ටොන් ප්‍රමාණය (සී.අයි.සී.ටී)** | | | | | | |
| බහළුගත නැව් බඩු | 93,110,002 | - | - | - | 93,110,002 | 81,742,402 |
| **මුළු ටොන් ප්‍රමාණය** | **93,110,002** | **-** | **-** | **-** | **93,110,002** | **81,742,402** |
| **මෙහෙයුම් කළ දළ ටොන් ප්‍රමාණය (කොළඹ වරාය)** | | | | | | |
| බහළුගත නැව් බඩු | 189,788,995 | - | - | - | 189,788,995 | 180,589,312 |
| සාම්ප්‍රදායික නැව් බඩු | 10,120,094 | 3,793,629 | 559,058 | 11,659,487 | 26,132,268 | 26,918,253 |
| වෙනත් | 4,591,126 | 126,146 | 43,702 | 199,820 | 4,960,794 | 3,703,064 |
| **මුළු ටොන් ප්‍රමාණය** | **204,500,215** | **3,919,775** | **602,760** | **11,859,307** | **220,882,057** | **211,210,629** |
| **පිරිස්** | | | | | | |
| සේවක සංඛ්‍යාව | **8,588** | **401** | **351** | **37** | **9,377** | **9,651** |

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත

| දෙසැම්බර් 31 අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | සටහන | සමූහය 2017 | සමූහය 2016 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය 2017 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය 2016 |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපළ පිරියත සහ උපකරණ | 3 | 149,469,781,120 | 306,125,425,551 | 149,426,989,444 | 306,083,716,729 |
| අස්පෘශ්‍ය වත්කම් | 4 | 57,579,403 | 70,316,518 | 57,039,427 | 69,547,232 |
| ආයෝජනය කරන ලද දේපළ | 5 | 173,647,489,750 | 4,064,444,037 | 173,647,489,750 | 4,064,444,037 |
| පරිපාලිත සමාගම්වල ආයෝජනය | 6 | - | - | 76,000,000 | 76,000,000 |
| ආශ්‍රිත සමාගම්වල ආයෝජනය | 7 | 39,215,920,136 | 64,942,056 | 39,196,120,030 | 40,030 |
| විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් (AFS) | 9 | 21,974,163,908 | 3,611,120,617 | 21,974,163,908 | 3,611,120,617 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙන් අයවිය යුතු මුදල | 12.2 | 123,179,741 | 147,411,904 | 123,179,741 | 147,411,904 |
| මහා භාණ්ඩාගාර ලැබීම් - මහජන බැංකුවේ ණය | 41 | 3,950,858,870 | | 3,950,858,870 | |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **388,438,972,926** | **314,083,660,683** | **388,451,841,169** | **314,052,280,548** |
| **ජංගම වත්කම්** | | | | | |
| වට්ටෝරුගත භාණ්ඩ | 11 | 2,971,202,423 | 2,947,698,209 | 2,484,790,666 | 2,461,286,452 |
| වෙළඳ සහ වෙනත් ලැබීම් | 12 | 114,635,412,269 | 10,516,400,758 | 114,562,457,908 | 10,443,166,849 |
| තැන්පතු සහ අත්තිකාරම් | 13 | 295,557,929 | 201,127,216 | 295,557,929 | 201,127,216 |
| පෙර ගෙවුම් වියදම් | | 108,008,573 | 56,481,917 | 105,069,819 | 51,999,609 |
| සේවක ණය | 14 | 4,296,739,607 | 4,305,199,594 | 4,270,311,803 | 4,278,923,434 |
| වෙනත් මූල්‍ය වත්කම් | 15 | 22,345,520,484 | 17,743,408,267 | 22,345,520,484 | 17,743,408,267 |
| මුදල් සහ මුදල් සමක | 16 | 1,762,527,731 | 1,330,100,814 | 914,764,144 | 582,143,737 |
| **මුළු ජංගම වත්කම්** | | **146,414,969,015** | **37,100,416,774** | **144,978,472,752** | **35,762,055,563** |
| **මුළු වත්කම්** | | **534,853,941,942** | **351,184,077,452** | **533,430,313,920** | **349,814,336,110** |
| **ස්කන්ධ සහ වගකීම්** | | | | | |
| **ස්කන්ධ** | | | | | |
| යොදු වූ ප්‍රාග්ධනය | 17 | 7,591,379,785 | 7,591,379,785 | 7,591,379,785 | 7,591,379,785 |
| සංචිත ප්‍රාග්ධන | 18 | 14,533,969,106 | 712,038,233 | 14,533,969,106 | 712,038,233 |
| වෙනත් සංචිත | 40 | 173,118,815,356 | 3,072,587,812 | 173,118,815,356 | 3,072,587,812 |
| ණය බේරුම් කිරීමේ සංචිත | 19 | 4,613,549,887 | 4,613,549,887 | 4,613,549,887 | 4,613,549,887 |
| ප්‍රත්‍යාගණන සංචිත | 20 | 75,893,542,157 | 74,048,089,533 | 75,893,542,157 | 74,048,089,533 |
| විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් සංචිතය | | 174,592,752 | 152,949,462 | 174,592,753 | 152,949,462 |
| රඳවාගත් ඉපැයීම් | | 32,882,966,740 | (13,662,508,210) | 34,320,307,692 | (12,170,982,560) |
| **මුළු ස්කන්ධ එකතුව** | | **308,808,815,783** | **76,528,086,502** | **310,246,156,735** | **78,019,612,152** |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| ණය ගැනීම් - ශ්‍රී ලංකා රජය | 21.1 | 54,924,342,666 | 214,555,128,086 | 54,924,342,666 | 214,555,128,086 |
| ණය ගැනීම් - මූල්‍ය ආයතන | 22.1 | 14,296,509,447 | 13,529,318,308 | 11,360,327,710 | 10,593,136,571 |
| රාජ්‍ය දීමනා | 23 | 28,764,321,596 | 2,112,806,647 | 28,764,321,596 | 2,112,806,647 |
| විලම්භිත බදු වගකීම් | 24 | 4,191,116,180 | 12,114,566,119 | 4,191,116,180 | 12,114,566,119 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදීම | 25 | 4,743,019,850 | 4,361,535,839 | 4,731,949,905 | 4,350,188,554 |
| **ජංගම නොවන මුළු වගකීම්** | | **106,919,309,739** | **246,673,354,999** | **103,972,058,057** | **243,725,825,975** |
| **ජංගම වගකීම්** | | | | | |
| වෙළඳ සහ වෙනත් ණයහිමියන් | 26 | 105,806,896,751 | 1,306,998,191 | 105,914,892,043 | 1,429,776,503 |
| ණය ගැනීම් - ශ්‍රී ලංකා රජය | 21.2 | 5,198,526,722 | 10,285,274,220 | 5,198,526,722 | 10,285,274,220 |
| ණය ගැනීම් - මූල්‍ය ආයතන | 22.2 | 1,555,871,084 | 1,913,783,798 | 1,555,871,084 | 1,912,413,794 |
| තැන්පතු සහ ලැබූ අත්තිකාරම් | 27 | 2,215,795,483 | 4,256,906,103 | 2,215,795,483 | 4,256,906,103 |
| ගෙවිය යුතු ජංගම බදු | 28 | 294,334,230 | 286,271,593 | 276,768,597 | 271,397,419 |
| ප්‍රතිපාදන සහ උපචිත වියදම් | 29 | 4,054,392,146 | 9,933,402,042 | 4,050,245,199 | 9,913,129,942 |
| **මුළු ජංගම වගකීම්** | | **119,125,816,415** | **27,982,635,948** | **119,212,099,127** | **28,068,897,982** |
| **මුළු ස්කන්ධ හා වගකීම් එකතුව** | | **534,853,941,942** | **351,184,077,452** | **533,430,313,920** | **349,814,336,110** |

**පිටු අංක 109 සිට 123 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 124 සිට 146 දක්වා පිටුවල මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අත්‍යවශ්‍ය අංගයන් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන 2017.12.31 දිනට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ අදහසක් ඉදිරිපත් කරයි.**

**ශිරාණි වන්නිආරච්චි**
**අධ්‍යක්ෂ (මුදල්)**

**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය වාර්තා සැකසීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.**

| | |
|---|---|
| **ආචාර්ය පරාක්‍රම දිසානායක** | **පී.ජී. දසනායක** |
| **සභාපති** | **උප සභාපති** |

**දිනය : 2018 නොවැම්බර් 5**

වරහන් තුළ ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත

| දෙසැම්බර් 31 අවසන් වූ වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය | සටහන් | සමූහය 2017 | සමූහය 2016 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය 2017 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය 2016 |
|---|---|---|---|---|---|
| ආදායම | 30 | 36,914,350,371 | 36,822,240,450 | 36,914,350,371 | 36,799,110,383 |
| සෘජු වියදම් | 31 | (20,129,228,457) | (20,922,237,967) | (20,019,597,180) | (20,201,445,201) |
| **දළ ලාභය** | | **16,785,121,914** | **15,900,002,483** | **16,894,753,191** | **16,597,665,182** |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 32 | 7,044,597,306 | 6,196,619,861 | 7,044,376,955 | 6,194,911,829 |
| පරිපාලන වියදම් | 33 | (7,844,470,229) | (8,071,153,006) | (8,029,995,485) | (8,458,510,089) |
| **මෙහෙයුම් ලාභය** | | **15,985,248,990** | **14,025,469,338** | **15,909,134,660** | **14,334,066,922** |
| ශුද්ධ මූල්‍ය පිරිවැය | 34 | (440,111,202) | (3,326,160,842) | (481,061,680) | (3,260,038,732) |
| විදේශ විනිමය ලැබීම් /(පාඩු) | 43 | (2,205,937,060) | (10,108,178,558) | (2,205,937,060) | (10,038,302,300) |
| ආශ්‍රිත සමාගම් වල ලාභයේ කොටස් | 7.1 | (45,101,920) | 3,848,613 | - | - |
| **බදු පෙර ලාභය** | | **13,294,098,808** | **594,978,551** | **13,222,135,920** | **1,035,725,890** |
| ආදායම් බදු වියදම් | 35 | (12,328,717) | (12,447,110) | - | - |
| විලම්බිත බදු වියදම් | 24 | 102,008,604 | - | 102,008,604 | - |
| වසරේ ලාභය | | **13,383,778,696** | **582,531,441** | **13,324,144,525** | **1,035,725,890** |
| **මව් සමාගමේ ව්‍යාපාරික ස්කන්ධ හිමියන් සඳහා වන වෙන් කිරීම** | | **13,383,778,696** | **582,531,441** | **13,324,144,525** | **1,035,725,890** |
| **වෙනත් සවිස්තරාත්මක ආදායම්** | | | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් නැවත ගණනය කිරීම | | (176,382,793) | (525,922,090) | (177,735,321) | (526,172,368) |
| විකිණීම සඳහා ඇති (AFS) මූල්‍ය වත්කම් හි වටිනාකම් වෙනස | 9.1 | 21,643,291 | (156,312,657) | 21,643,291 | (156,312,657) |
| වසරේ වෙනත් විස්තීරණ මුළු ආදායම | | (154,739,502) | (682,234,747) | (156,092,030) | (682,485,025) |
| වසරේ මුළු විස්තීරණ ආදායම | | **13,229,039,193** | **(99,703,305)** | **13,168,052,495** | **353,240,866** |
| **මව් සමාගමේ ස්කන්ධ හිමියන් සඳහා වන වෙන් කිරීම** | | **13,229,039,193** | **(99,703,305)** | **13,168,052,495** | **353,240,866** |
| වරහන් තුළ ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි | | | | | |

පිටු අංක 109 සිට 123 හි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 124 සිට 146 දක්වා පිටුවල මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය අංගයක් වේ.

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත

| සමූහය | යෙදවූ ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිතය | වෙනත් සංචිත | ණය මුදාහැරීම් සංචිත | ප්‍රත්‍යාගණණ සංචිත - | විකිණීම සඳහා ඇති සංචිත | දඩ අරමුදල | රඳවාගත් ඉපයීම් (ණය සඳහා ) | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| **2016 ජනවාරි 01 දිනට ශේෂය** | | | | | | | | | |
| වසරේ ලාභය | **7,591,379,785** | **712,038,233** | **1,673,780,305** | **4,613,549,887** | **74,093,898,320** | **309,262,118** | | **(15,191,429,585)** | **73,802,479,064** |
| | - | - | - | - | - | - | | 582,531,441 | 582,531,441 |
| වෙනත් විස්තීරණ ආදායම් | - | - | - | - | - | (156,312,657) | | - | (156,312,657) |
| මුළු විස්තීරණ ආදායම | | | | | | | | 582,531,441 | 426,218,785 |
| | - | - | - | - | (45,808,787) | - | | 45,808,787 | 0.00 |
| ප්‍රත්‍යාගණන අතිරික්ත මත ගැලපුම | | | | | | | | (3,683,000) | (3,683,000) |
| ගෙවූ ලාභාංශ | - | - | - | - | - | - | | 152,406,471 | 152,406,471 |
| ඉවත් කිරීම් මත ගැලපුම | - | - | - | - | - | - | | 1,277,779,765 | 1,277,779,765 |
| පෙර වර්ෂය හා ගැලපුම (43 සටහන ) | - | - | (103,534,286) | - | - | - | | - | (103,534,286) |
| CICT මඟින් පෙර ගෙවන ලද මුදල් මත ගැලපුම | | | | - | | | | - | - |
| ණය නිදහස් කිරීම මත ගැලපුම | | | - | | | | | (525,922,090) | (525,922,090) |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් නැවත ගණනය කිරීම | | | 1,503,000,000 | | | | | | 1,503,000,000 |
| CICT මගින් එකවර ගෙවන ලද මුදල | | | (658,207) | | | | | | (658,207) |
| ලාෆ් ටර්මිනල්ස් සමාගම විසින් එක්වරකට පමණක් ගෙවනු ලැබූ වාරිකය මත ක්‍රමක්ෂය | | | | | | | | | - |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **7,591,379,785** | **712,038,233** | **3,072,587,812** | **4,613,549,887** | **74,048,089,533** | **152,949,462** | | **(13,662,508,210)** | **76,528,086,502** |
| වසරේ ලාභය | - | - | - | - | - | - | | 13,383,778,696 | 13,383,778,696 |
| වෙනත් සවිස්තරාත්මක ආදායම් | - | - | - | - | - | 21,643,291 | | - | 21,643,291 |
| **සවිස්තරාත්මක ආදායම් එකතුව** | | | | | | | | **13,383,778,696** | **13,405,421,986** |
| ප්‍රත්‍යාගණන අතිරික්ත මත ගැලපුම | - | - | - | - | 2,157,158,929 | - | | | 2,157,158,929 |
| ගෙවන ලද ලාභාංශ | | | | | | | | (6,802,000) | (6,802,000) |
| ඉවත් කිරීම් මත ගැලපුම | - | - | - | - | (311,706,305) | - | | 311,706,305 | - |
| HIPS සමාගම්හී ආයෝජන මත ප්‍රාග්ධන ලැබීම්/පාඩු | | *13,821,930,873* | | | | | | | 13,821,930,873 |
| පෙර වර්ෂය හා ගැලපුම (43 සටහන ) | - | - | - | - | - | - | | 33,033,174,743 | 33,033,174,743 |
| CICT මඟින් පෙර ගෙවන ලද මුදල් මත ක්‍රමක්ෂය | - | - | (103,534,286) | - | - | - | | | (103,534,286) |
| ගෙවිය යුතු විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම් නැවත ගණනය කිරීම | | | | | | | | (176,382,793) | (176,382,793) |
| ණය මුදා හැරීම මත ගැලපුම | - | - | - | - | - | - | | - | - |
| ලාෆ් පුද්ගලික සමාගම එක් වරකට පමණක් ගෙවන වාරිකය මත ක්‍රමක්ෂය | | | (658,207) | | | | | | (658,207) |
| ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් සමාගම එක් වරකට පමණක් ගෙවන වාරිකය මත ක්‍රමක්ෂය | | | (6,829,041) | | | | | | (6,829,041) |
| සීමාසහිත ටෝකියෝ සිමෙන්ති සමාගම (ලංකා)එක් වරකට පමණක් ගෙවන වාරිකය මත ක්‍රමක්ෂය | | | (596,774) | | | | | | (596,774) |
| ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් සමාගම විසින් එකවර ගෙවන ලද වාරිකය | | | 309,000,000 | | | | | | 309,000,000 |
| සීමාසහිත ටෝකියෝ සිමෙන්ති (ලංකා) සමාගමෙන් ලැබුණු එක්වර ගෙවන ලද වාරිකය | | | 370,000,000 | | | | | | 370,000,000 |
| HIPS සමාගම අත්පත් කර ගැනීම මගින් හිමි වූ කල්බදු අයිතීන් | | | 72,388,674,280 | | | | | | 72,388,674,280 |
| HIPG සමාගම අත්පත් කර ගැනීම මගින් හිමි වූ කල්බදු අයිතීන් | | | 97,198,113,903 | | | | | | 97,198,113,903 |
| HIPS සමාගමේ කල්බදු අයිතීන් මත ක්‍රමක්ෂය | | | (46,075,536) | | | | | | (46,075,536) |
| HIPG සමාගමේ කල්බදු අයිතීන් මත ක්‍රමක්ෂය | | | (61,866,795) | | | | | | (61,866,795) |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **7,591,379,785** | **14,533,969,106** | **173,118,815,356** | **4,613,549,887** | **75,893,542,157** | **174,592,752** | - | **32,882,966,740** | **308,808,815,783** |
| **ශ්‍රී ලංකා වරාය අධිකාරිය** | | | | | | | | | |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **7,591,379,785** | **712,038,233** | **3,072,587,812** | **4,613,549,887** | **74,048,089,533** | **152,949,462** | - | **(12,170,982,560)** | **78,019,612,153** |
| වසරේ ලාභය | - | - | - | - | - | - | - | 13,324,144,525 | 13,324,144,525 |
| වෙනත් සවිස්තරාත්මක ආදායම් | - | - | - | - | - | *21,643,291* | | - | 21,643,291 |
| **සවිස්තරාත්මක ආදායම් එකතුව** | | | | | | | | | **13,345,787,816** |
| ප්‍රත්‍යාගණන අතිරික්ත මත ගැලපුම | - | - | - | - | 2,157,158,929 | - | | | 2,157,158,929 |
| ඉවත් කිරීම් මත ගැලපුම | - | - | - | - | (311,706,305) | - | | 311,706,305 | - |
| HIPS,HIPG සමාගම්හී ආයෝජන මත ප්‍රාග්ධන ලැබීම්/පාඩු | | 13,821,930,873 | | | | | | | 13,821,930,873 |
| පෙර වර්ෂය හා ගැලපුම (43 සටහන ) | | | | | | | | 33,033,174,743 | 33,033,174,743 |
| CICT මඟින් පෙර ගෙවන ලද මුදල් මත ක්‍රමක්ෂය | - | - | *(103,534,286)* | - | - | - | | - | (103,534,286) |
| ගෙවිය යුතු විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම් නැවත ගණනය කිරීම | | | | | | | | (177,735,321) | (177,735,321) |
| ණය මුදා හැරීම මත ගැලපුම | - | - | - | - | - | - | | - | - |
| ලාෆ් පුද්ගලික සමාගම එක් වරකට පමණක් ගෙවන වාරිකය මත ක්‍රමක්ෂය | | | *(658,207)* | | | | | | (658,207) |
| ඩිස්ටිලරීස් සමාගම එක් වරකට පමණක් ගෙවන වාරිකය මත ක්‍රමක්ෂය | | | *(6,829,041)* | | | | | | (6,829,041) |
| සීමාසහිත ටෝකියෝ සිමෙන්ති (ලංකා) සමාගමෙන් ලැබුණු එක්වර ගෙවන ලද වාරිකය මත ක්‍රමක්ෂය | | | *(596,774)* | | | | | | (596,774) |
| | ලාභාංශ ලැබීම් | 839,681,509 | 851,416,512 | 839,681,509 | 851,539,616 |
| | ගොඩබෑම් සහ බෙදාහැරීමේ බිල්/ස්ටෙවඩෝරු බිල් මත දඩ සහ අධිභාර | 22,009,771 | 59,402,586 | 22,009,771 | 59,402,586 |
| | කල් ඉක්මවාත් නොගෙවන ලද බිල් මත අධිභාර | 6,279,873 | 8,214,100 | 6,279,873 | 8,214,100 |
| | වත්කම් විකුණුම් මත උත්පාදන | 18,139,866 | 23,939,047 | 18,139,866 | 23,939,047 |
| | අය නොකරන ලද භාණ්ඩ සහ ගබඩා අතිරික්ත | - | 120,187 | - | 120,187 |
| | ටෙන්ඩර් විකිණීමෙන් ලද ආදයම | 33,549,379 | 221,761 | 33,549,379 | 221,761 |
| | සේවකයින් මත අධිභාර | 61,914 | 4,585 | 61,914 | 4,585 |
| | අගරු කළ බන්ධිත අයිතමයන් සහ ණය ගැති ශේෂ මත අයකිරීම් | 1,526,622 | 2,231,928 | 1,526,622 | 2,231,928 |
| | දඩ සහ රක්ෂණ කොමිස් මුදල් | 19,662 | 22,484 | 19,662 | 22,484 |
| | | **921,268,595** | **945,573,190** | **921,268,595** | **945,696,294** |
| | **මධ්‍යම කොට්ඨාශය** | | | | |
| | වරාය ප්‍රවේශ ගාස්තු | 19,000,660 | 25,035,774 | 19,000,660 | 25,035,774 |
| | තාවකාලික වරාය බලපත්‍ර ගාස්තු | 378,437,987 | 469,550,122 | 378,437,987 | 469,550,122 |
| | වාර්ෂික වාහන බලපත්‍ර සහ තාවකාලික වාහන බලපත්‍ර | 94,474,783 | 9,793,350 | 94,474,783 | 9,793,350 |
| | භාණ්ඩ සැපයුම්කරුවන්ගේ බලපත්‍ර සහ සමීක්ෂණ ගාස්තු මත අයකිරීම් | 29,216,507 | 26,897,331 | 29,216,507 | 26,897,331 |
| | වරායයන් තුනක වාෂ්පු නිශ්කාෂණ නියෝජිතායතන වලට බලපත්‍ර නිකු | 29,047,508 | 22,291,582 | 29,047,508 | 22,291,582 |
| | වරාය යාත්‍රාවන් වෙත බලපත්‍ර නිකුත් කිරීම | 931,324 | 441,744 | 931,324 | 441,744 |
| | සුභසාධක බස් ලබාදීම මගින් උපයාගැනීම් | 3,158,038 | 2,183,177 | 3,158,038 | 2,183,177 |
| | ආපන ශාලා මගින් ලැබෙන ආදායම | 6,000 | 30,200 | 6,000 | 30,200 |
| | විවිධ | 79,042,400 | 68,171,263 | 78,822,049 | 68,171,263 |
| | පොත් සහ ප්‍රකාශන අලෙවිය | 456,704 | 409,711 | 456,704 | 409,711 |
| | වන්දි ලැබීම් | 8,075,260 | 15,693,918 | 8,075,260 | 15,693,918 |
| | ගාලු මුවදොර හරිත එකතුව | - | 618,505 | - | 618,505 |
| | ප්‍රදානයන් ලැබීම් | 61,171,076 | 48,042,872 | 61,171,076 | 48,042,872 |
| | පරිපාලන සහ යටිතල පහසුකම් ගාස්තු | 548,963,712 | 453,176,111 | 548,963,712 | 453,176,111 |
| | CICT මගින් පෙර කළ ගෙවීම් | 103,534,286 | 103,534,286 | 103,534,286 | 103,534,286 |
| | ශ්‍රී ල ව අ දිවා ළමා සුරකුම් මධ්‍යස්ථානය සඳහා ඇතුළුවීමේ /මාසික / | 679,900 | 805,476 | 679,900 | 805,476 |
| | ජල ගුණවිද්‍යා සමීක්ෂණ කාර්යාලය - රළ පිළිබඳ දත්ත (CPCDP) | 10,030 | 72,712 | 10,030 | 72,712 |
| | සීමාසහිත ලාෆ් ටර්මිනල් සමාගම - එකවර ගෙවන ලද වාරිකය | 658,207 | 658,207 | 658,207 | 658,207 |
| | ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් සමාගම - එකවර ගෙවන ලද වාරිකය | 6,829,041 | - | 6,829,041 | - |
| | තොරතුරු පිටපත් කිරීමේ ගාස්තු | 5,280 | - | 5,280 | - |
| | සීමාසහිත ටෝකියෝ සිමෙන්ති ලංකා සමාගම - එකවර ගෙවන ලද වාරි | 596,774 | - | 596,774 | - |
| | කල්බදු අයිතීන් ක්‍රමක්ෂය | 107,942,331 | - | 107,942,331 | - |
| | | **1,472,237,808** | **1,247,406,343** | **1,472,017,457** | **1,247,406,343** |
| | | **7,044,597,306** | **6,196,619,861** | **7,044,376,955** | **6,194,911,829** |

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත

| | | සමූහය | | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | |
|---|---|---|---|---|---|
| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2017 | 2016 | 2017 | 2016 |
| 33 | **පරිපාලන වියදම්** | | | | |
| | වැටුප්, වේතන හා දීමනා | 4,401,992,789 | 4,362,788,349 | 4,380,550,801 | 4,023,439,589 |
| | අතිකාල | 908,173,301 | 831,504,584 | 908,173,301 | 831,504,584 |
| | ගමන් යැපීම් සහ ඉන්ධන දීමනා | 801,601 | 59,074,996 | 801,601 | 777,113 |
| | ඉන්ධන/විදුලිය සහ වෙනත් වියදම් | 186,533,594 | 241,778,183 | 184,015,632 | 200,330,024 |
| | ජලය සඳහා වියදම | 136,692,462 | 136,452,830 | 136,300,551 | 135,176,677 |
| | බාහිර කුලී ගාස්තු/ කොන්ත්‍රාත් | 43,480,139 | 26,803,104 | 41,835,613 | 24,147,360 |
| | අළුත්වැඩියා සහ නඩත්තු සඳහා කොන්ත්‍රාත් වැඩ | 292,766,477 | 239,172,642 | 292,341,917 | 241,147,766 |
| | සන්නිවේදන වියදම් | 43,793,472 | 40,776,856 | 43,396,417 | 38,878,766 |
| | පරිශ්‍රයන්හි කුලී/ගාස්තු සහ බදු | 49,178,342 | 43,146,361 | 48,732,842 | 40,614,788 |
| | රක්‍ෂණ සහ බලපත්‍ර ගාස්තු/නීති ගාස්තු | 30,201,332 | 35,706,978 | 27,050,313 | 25,506,185 |
| | කාර්යාල අවශ්‍යතා/ආරක්‍ෂක ගාස්තු | 65,137,126 | 113,114,463 | 48,326,880 | 40,263,955 |
| | පුහුණු කිරීමේ වියදම් | 38,909,987 | 37,177,130 | 37,183,463 | 34,620,077 |
| | සුභසාධක වියදම් | 226,830,083 | 220,244,879 | 219,454,770 | 212,464,879 |
| | ප්‍රචාරණ සහ මහජන සම්බන්ධතා | 20,134,300 | 12,685,743 | 20,134,300 | 12,685,743 |
| | විවිධ වියදම් | 214,517,816 | 927,294,933 | 216,042,499 | 910,846,930 |
| | ක්‍ෂය කිරීම් | 213,804,996 | 286,663,136 | 209,859,049 | 276,814,175 |
| | අස්පෘශ්‍ය වත්කම් වල ක්‍රමක්‍ෂය | 23,924,336 | 56,420,801 | 23,695,026 | 55,744,966 |
| | ව්‍යාපාර ප්‍රවර්ධනය/වෙනත් අයකිරීම් ගාස්තු | 404,100 | 11,760,116 | - | 11,532,160 |
| | ලියා ඉවත්කළ විවිධ ශේෂ ගිණුම් | - | 3,306,873 | - | 18,079 |
| | බොල් හා අඩමාන ණය | 22,377,355 | 5,216,176 | 22,376,508 | 5,028,409 |
| | එකතුකළ අගය මත බදු වියදම් | 67,200,566 | 55,293,926 | 67,200,566 | 55,293,926 |
| | මුද්දර ගාස්තු | 683,525 | 702,200 | 683,275 | 702,450 |
| | ජාතිය ගොඩනැගීමේ බදු ගෙවීම | 224,903,153 | 202,515,090 | 224,903,153 | 202,515,090 |
| | විගණන ගාස්තු | 2,981,587 | 4,135,002 | 2,731,785 | 3,667,022 |
| | අන්තර්ග්‍රහණය නොකළ මූළුතැන්ගෙයි වියදම් | - | 66,014,018 | - | 66,014,018 |
| | ජයබහළු පර්යන්තය වෙත ගෙවන ලද පරිපාලන සහ යටිතල පහසුකම් ග | 5,041,504 | 4,161,803 | 252,075,174 | 208,090,153 |
| | MPMC සමාගම වෙත ගෙවන ලද කළමනාකරණ ගාස්තු | 616,162,893 | 14,836,099 | 616,162,893 | 800,586,926 |
| | ඉන්වොයිසි මුදල් වෙනස් වීම | 1 | (0.1) | 0.8 | (0) |
| | අධ්‍යක්ෂ ගාස්තු | 1,776,988 | 4,941,301 | - | - |
| | රෝ-රෝ වියදම් | - | 21,733,618 | - | - |
| | පරිගණක අළුත් වැඩියාව සහ නඩත්තුව | - | 434,252 | - | - |
| | ශුද්ධ පොත් අගය - විශ්‍රාම ගැනීම | 5,967,159 | 98,279 | 5,967,159 | 98,279 |
| | ලේකම් ගාස්තු | - | 646,000 | - | - |
| | විශ්‍රාම ප්‍රතිලාභ | - | 2,233,282 | - | - |
| | නැව්බඩු මෙහෙයුම් ගාස්තු | - | 2,188,553 | - | - |
| | බැංකු ගාස්තු | 99,249 | 130,450 | - | - |
| | | **7,844,470,229** | **8,071,153,006** | **8,029,995,485** | **8,458,510,089** |
| 34 | **ශුද්ධ මූල්‍ය පිරිවැය** | | | | |
| | **පොලී ලැබීම්** | | | | |
| | භාණ්ඩාගාර බිල් සහ ඇරයුම් තැන්පතු මත පොලිය | 1,453,007,179 | 878,177,387 | 1,453,007,179 | 878,177,387 |
| | ආරක්ෂිත තැන්පතු සහ ආයෝජන මත පොලිය | 40,043,674 | 50,964,229 | 1,407,620 | 813,000 |
| | බාහිර පාර්ශ්වයන්ට ලබාදුන් ණය මුදල් මත පොලිය | 83,331 | 4,971,939 | 83,331 | 4,971,939 |
| | සේවක ණය මත පොලිය | 198,548,592 | 205,768,542 | 195,582,799 | 202,201,398 |
| | | **1,691,682,775** | **1,139,882,098** | **1,650,080,928** | **1,086,163,725** |
| | **පොලී වියදම්** | | | | |
| | ණය මත පොලිය | (2,082,669,764) | (4,421,690,527) | (2,082,018,395) | (4,301,850,044) |
| | වෙනත් මූල්‍ය අයකිරීම් | (49,124,213) | (44,352,413) | (49,124,213) | (44,352,413) |
| | | **(2,131,793,977)** | **(4,466,042,940)** | **(2,131,142,608)** | **(4,346,202,457)** |
| | | **(440,111,202)** | **(3,326,160,842)** | **(481,061,680)** | **(3,260,038,732)** |
| 35 | **ආදායම් බදු වියදම්** | | | | |

2006 වර්ෂයේ අංක 10 දරණ ආදායම් බදු පනතේ 13 ( YYYY) සහ 13 (YYYY) වගන්ති වලට අනුව, අධිකාරියේ සහ එහි උපසමාගම්හී මෙහෙයුම් මගින් ලබාගන්නා මෙහෙයුම් ලාභය අය බද්දෙන් නිදහස් කරන ලද ආදායමක් ලෙස තක්සේරුගත 2011/2012 වසරේ සිට සැලකේ. ඒ අනුව 28%ක් වන පවතින බදු අගය භාවිතා කරමින් අනෙකුත් ආදායම් මාර්ග සඳහා ප්‍රතිපාදන සකස් කර ඇත.

| ආදායම් බදු වල ප්‍රධාන සංරචකයන් පහත පරිදි වේ | | සමූහය | | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | |
|---|---|---|---|---|---|
| | | 2017 | 2016 | 2017 | 2016 |
| වර්තමාන බදු වියදම් | (සටහන 35.1) | 12,328,717 | 12,447,110 | - | - |
| බෙදාහැරිය හැකි ලාභය මත බදු | | - | - | - | - |
| ලාභාංශ බදු | | - | - | - | - |
| පසුගිය වර්ෂය තුළ ප්‍රතිපාදන මත ආදායම් බදු | | - | - | - | |
| විලම්භිත බදු ගාස්තු | **(සටහන 24.1)** | - | - | | - |
| | | **12,328,717** | **12,447,110** | **-** | - |

| 2017දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත 2017 | 2016 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය 2017 | 2016 |
|---|---|---|---|---|
| **35.1 ජංගම බදු වියදම් සහ ගණකාධිකරණ ලාභ නිමවුම අතර සැසඳුම .** | | | | |
| බදුකරණයට පෙර ගිණුම්කරණ ලාභය - වගකීමෙන් නිදහස් | 13,236,966,666 | 594,978,551 | 13,119,901,858 | 1,035,725,890 |
| බදු සඳහා බැදුණු වෙනත් ආදායම් - පොලී ආදායම | 1,691,682,775 | 1,139,882,098 | 1,650,080,928 | 1,086,163,725 |
| පරිපාලිතයන්හි බදු පැනවිය හැකි ලාභ | (117,716,177) | (424,510,654) | - | - |
| **ව්‍යවස්ථාපිත ආදායම** | **1,573,966,598** | **715,371,444** | **1,650,080,928** | **1,086,163,725** |
| භාවිතා කළ බදු පාඩු | (577,528,325) | (156,919,405) | (577,528,325) | (380,157,304) |
| **තක්සේරු කළ හැකි ආදායම / බදු පැනවීමේ ලාභ** | **996,438,273** | **558,452,038** | **1,072,552,603** | **706,006,421** |
| අඩු කිරීමට අවකාශ ලැබෙන ගෙවීම් | (1,072,552,603) | (706,006,421) | (1,072,552,603) | (706,006,421) |
| **ආදායමට බදු අය කිරීම** | | | - | - |
| 28%ක ව්‍යවස්ථාපිත බදු අනුපාතය මත අයකළ බද්ද | 12,328,717 | 12,447,110 | - | |
| **වර්ෂය සඳහා සාමාන්‍ය ක්‍රියාකාරකම් මත වර්තමාන බද්ද** | **12,328,717** | **12,447,110** | - | - |
| බදු පාඩු | | | | |
| **ඉදිරියට ගෙන එන ලද පාඩුව** | **5,318,112,435** | **5,475,031,840** | **5,312,973,117** | **5,693,130,421** |
| සිදු වූ අලාභය | - | - | - | - |
| භාවිතා කළ අලාභය | (577,528,325) | (156,919,405) | (577,528,325) | (380,157,304) |
| **ඉදිරියට ගෙන එන ලද අලාභය** | **4,740,584,110** | **5,318,112,435** | **4,735,444,793** | **5,312,973,117** |

2007/2008, 2008/2009, 2009/2010 සහ 2010/2011 යන තක්සේරු වර්ෂයන් සඳහා 2006 වසරේ අංක 10 දරන දේශිය ආදායම් බදු පනතේ 25 (ඊ) වගන්තිය වෙනුවට එම පනතේම 32 වගන්තිය යටතේ දක්වා ඇති විදේශ ණය පොළිය අඩු කර ගැනීම ප්‍රතික්ෂේප කරමින් දේශිය ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු සිදුකර ඇති අතර දේශිය ආදායම් බදු පනතේ 25 (1) වගන්තිය යටතේ විදේශ ණය හා අදාල විනිමය පාඩු මත අඩු කිරීම් සිදු කිරීම ප්‍රතික්ෂේප කර ඇත.

දේශිය ආදායම් බදු කොමසාරිස්වරයාගේ තීරණයට එරෙහිව ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් බදු අභියාචනා කොමිසම වෙත අභියාචනා ඉදිරිපත් කර ඇත. 2008/2009 සහ 2010/2011 යන තක්සේරු වර්ෂයන් සඳහා බදු අභියාචනා කොමිසමේ නඩු විභාගය තවමත් සිදු කෙරෙමින් පවතින අතර 2007/2008 තක්සේරු වර්ෂයන් සඳහා බදු අය කර යුතු ආදායම ගණනය කිරීමේදී විදේශ විනිමය පාඩු ගණනය කිරීම ප්‍රතික්ෂේප කිරීම කල බව තහවුරු කරමින් බදු අභියාචනා කොමිසම ඔවුන්ගේ තීරණය ලබා දී ඇත. බදු අභියාචනා කොමිසම ලබා දුන් තීරණය හා ශ්‍රී ලංකා වරාය අධිකාරිය එකඟ නොවූ බැවින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මෙම නඩුව අභියාචනාධිකරණය වෙත යොමු කරන ලදී. 2009/2010 වර්ෂයේ දී බදු අභියාචනා කොමිසම විසින් නඩු තීරණය ශ්‍රී ලංකා වරාය අධිකාරියට පක්ෂපාතී ලෙස ලබාදෙන ලදී. (උදා. අත්සන් කර නොතිබූ බැවින් ඇගයීම වලංගු නොවේ .) ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් බදු අභියාචනා කොමිසමේ තීරණයට එරෙහිව අභියාචනාධිකරණයේ නඩුවක් පවරන ලදී.

**36 ප්‍රාග්ධන සහ වෙනත් වගකීම්**

වාර්තා කරන කාල සීමාව අවසානයේදී අනුග්‍රාහාත්මක ගිවිසුම ප්‍රකාරව මූල්‍ය වගකීම් අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කර ඇත

**37 සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිකිරීමේ පිරිවැය**

හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියෙහි (අදියර 1) පිටස්තර නියෝග අංක 6 යටතේ හම්බන්තොට සූරියවැව අන්තර්ජාතික ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිකිරීම සඳහා 2017 දෙසැම්බර් 13 දින නිකුත් කරන ලද 1.සීමාසහිත චයිනා හාබර් ඉංජිනියරින් සමාගම 2.සිනෝහයිඩ්‍රෝ සමාගම ශ්‍රී ලංකා වරාය අධිකාරියට එරෙහිව ( අංක 21959/CYK/PTA) ICC බේරුම්කාර නඩුව සමතයකට පත් කිරීමේදී අධ්‍යක්‍ෂ මණ්ඩල තීරණය (PA/HD/33) ප්‍රකාරව පහත තීරණයන් දැනුම් දී ඇත.

* 2017.12.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මහජක බැංකුවෙන් සෘජුවම ණය මුදල වන රු.3,950,858,869.57ලබා ගැනීම පහසුකරවමින් ණය ගිවිසුමට එළඹීමට

* නිරවුල් කිරීමේ ගිවිසුම අතිරේක ගිවිසුමක් මගින් සංශෝධනය කිරීමට සහ එය ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් ක්‍රියාත්මක කිරීමට

ප්‍රධාන නීති නිළධාරියා විසින් දැනුම් දුන් පරිදි 2016 දී සිදු කරන ලද ප්‍රතිපාදන වන රු. 5,838,489,259.62 ක මුදල 2017 වසරේදී ප්‍රතිවර්තනය කරන ලදි

* බදු ගෙවීමේදී ප්‍රමාදයක් සිදු වුවහොත් දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල් විසින් යම්කිසි දඩයක් නියම කළහොත් එය සඳහා රුපියල් මිලියන 72 ක මුදලක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් රඳවා තබා ඇත. (විවිධ තැන්පතු ගිණුම)

**38 අංක CA(PHC)APN45/2006-MV “JAAMI” දරණ අභියාචනාධිකරණ නඩුව සමතයකට පත් කිරීම**

2017.02.23 දිනැති අංක PAM/61/2017 දරණ අධ්‍යක්‍ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව ඉහත නඩුව සමතයකට පත් කිරීම සඳහා ඉතිරි ශේෂය බෙදා ගැනීමට අධ්‍යක්‍ෂ මණ්ඩල තීරණය කළ අතර (අවම 50% වන කොටසක් ) 2017.03.29 දින ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නැව් සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්‍ෂවරයා වෙත නීති කොට්ඨාශය ලිපියක් යොමු කරන ලදි. ශ්‍රී ලංකා නැව් සංස්ථාව මෙම යෝජනාවට එකඟ වූ අතර මෙම කරුණ 2017.06.29 දින අභියාචනාධිකරණයේදී සඳහන් කරන ලදි. පාර්ශවයන් දෙකෙහිම නීති නිදේශකවරුන් සමතයකට පත් කිරීමේ මෝසම ගොණු කිරීමට එකඟ වන ලදි. ඒ අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඉහත මෝසම නීති උපදේශක වෙත යවා ඇති අතර සමතයකට පත් කිරීමේ කොන්දේසි අභියාචනාධිකරණයේ ඇතුලත් කර නොමැති අතර මෙම කරුණ 2018.02.01 දින සඳහන් කිරීමට නියමිතය .

**39 වාර්තා කරක කාල සීමාවන් පසු සිදු වූ අවස්ථාවන්**

2008/2009 යන තක්සේරු වසර සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද අභියාචනාව බදු අභියාචනා කොමිසම විසින් ප්‍රතික්ෂේප කර ඇති අතර මෙම තීරණයට එරෙහිව අභියාචනාධිකණයේ අභියාචනාවක් ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය තීරණය කර ඇත.

**40 බදු අභියාචනා කොමිසම සහ අභියාචනාධිකරණය හමුවේ පවතින නඩු**

2006 දේශීය ආදායම් බදු පනත අංක 10 හි 25(ඊ) වන පරිච්ඡේදය වෙනුවට එම පනතේ ම 32 වන වගන්තිය යටතේ විදේශ ණය පොලී අඩුකිරීම සඳහා කර ඇති ඉල්ලීම නොසලකා හරිමින් ද, දේශීය ආදායම් බදු පනතේ 25(1) වගන්තිය යටතේ විදේශ ණය හා සම්බන්ධ විදේශ විනිමය පාඩු අඩුකිරීම සඳහා කරන ලද ඉල්ලීම නොසලකා හරිමින් ද, 2007/2008, 2008/2009, 2009/2010 සහ 2010/2011 යන තක්සේරු වර්ෂ සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් තක්සේරු සිදු කර ඇත.
ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයාගේ අභිමතයට එරෙහිව බදු අභියාචනා කොමිසම වෙත අභියාචනා ඉදිරිපත් කරන ලදී. 2008/2009 සහ 2010/2011 යන ඇගයීම් වර්ෂයන් සඳහා බදු අභියාචනා කොමිසමේ නඩුව විභාග වෙමින් පවතින අතර, 2007/2008 තක්සේරු වර්ෂය සඳහා බදු අය කල හැකි ලාභ ගණනය කිරීමේදී විදේශ විනිමය පාඩු නොසලකා හරින ලද බවට තහවුරු කරමින් බදු අභියාචනා කොමිසම ඔවුන්ගේ තීරණය ලබා දී ඇත.
බදු අභියාචනා කොමිසමේ තීරණයට විරුද්ධව නෛතික ගැටලු මත ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් එය අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කර ඇත. 2009/2010 වර්ෂයේදී බදු අභියාචනා කොමිසමේ විසින් නඩු තීරණය ශ්‍රී ලංකා වරාය අධිකාරියට පක්ෂපාති ලෙස ලබාදෙන ලදී. (උදා. අත්සන් කර නොතිබූ බැවින් ඇගයීම වලංගු නොවේ ). ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් බදු අභියාචනා කොමිසමේ තීරණයට එරෙහිව අභියාචනාධිකරණයේ නඩුවක් පවරන ලදී. නඩුවල සාරාංශය පහත පරිදි වේ.

| තක්සේරු වර්ෂය | නඩුවල වර්තමාන තත්ත්වය | බැංකු ඇපය (අගය. රුපියල්) | ඇප ලෙස පොරොන්දු වූ ස්ථාවර තැන්පතු අගය |
|---|---|---|---|
| 2007/2008 | බදු අභියාචනා කොමිසම විසින් ලබාදුන් තීරණය හා ශ්‍රී ලංකා වරාය අධිකාරිය එකඟ වී නොමැති අතර මෙම කරුණ අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කර ඇත. | - | - |
| 2008/2009 | 2008/2009 වසර සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද අභියාචනාව බදු අභියාචනා කොමිසම විසින් ප්‍රතික්ෂේප කර ඇති අතර ශ්‍රී ලංකා වරාය අධිකාරිය තීරණයට එරෙහිව අභියාචනාධිකරණයේ අභියාචනාවක් ඉදිරිපත් කිරීමට තීරණය කර ඇත. | 310,869,170 | රුපියල් මිලියන.315 |
| 2009/2010 | බදු අභියාචනා කොමිසම ශ්‍රී ලංකා වරාය අධිකාරියට වාසි සහගත ලෙස තීරණය ලබා දී ඇත. කෙසේ නමුත් බදු අභියාචනා කොමිසමේ තීරණයට එරෙහිව දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් අභියාචනාධිකරණයේ නඩුවක් පවරා ඇත. | | - |
| 2010/2011 | මෙම නඩුව බදු අභියාචනා කොමිසමේ තවමත් විභාග වෙමින් පවතී. | 749,708,930 | රුපියල් මිලියන 812.10 |

**41 අසම්භාව්‍ය වගකීම්**

සාමාන්‍ය ව්‍යාපාර කටයුතු කිරීමේදී පැන නගින නීතිමය හිමිකම් සඳහා අධිකාරියට අසම්භාව්‍ය වගකීම් සතු වේ. ප්‍රතිපාදන (සටහන 29) ලෙස හඳුනා නොගන්නේ නම් කළමනාකරණය විසින් මෙම හිමිකම් සාධාරණ නොවන බවට සලකන අතර ඒවා සමතයකට පත්කිරීම සඳහා සම්පත් පිටතට ගලායෑමේ ඇති හැකියාව අවම වන බවට සලකනු ලැබේ. මෙම ගණනය කිරීම අධිකාරියේ නීති අංශයේ නීති උපදෙස් සමඟ සමායෝජනය වේ. ඒ අනුව පහත නඩු සඳහා වන නීතිමය හිමිකම් සඳහා ප්‍රතිපාදන වෙන්කර නොමැත .

**42 සමූහයේ මූල්‍ය අගයන් සැසඳීම යළි ලේඛණ ගත කිරීම**

උප සමාගම් සහ ආශ්‍රිත සමාගමෙහි විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ ලැබීමත් සමඟ 2016 වසර සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශණ පහත සඳහන් ලෙස යළි ලේඛණ ගත කරන ලදි.

| | | සමූහය | |
|---|---|---|---|
| **2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශණය මත බලපෑම** | සටහන | 2016 වසර සඳහා විගණනය කරන ලද ගිණුම | 2016 වසර සඳහා විගණනය නොකරන ලද ගිණුම |
| උප සමාගම්හී ආයෝජනයන් | 7 | 64,942,056 | 61,093,443 |
| වෙළඳ සහ වෙනත් ලැබීම් | 12 | 10,516,400,758 | 10,542,478,553 |
| රඳවාගත් ඉපැයීම් (ණයගැති) | | (13,662,508,210) | (13,662,500,097) |
| ණය ගැණුම් - මූල්‍ය ආයතන (ජංගම නොවන වගකීම්) | 22.1 | 13,529,318,308 | 10,597,931,565 |
| වෙළඳ සහ වෙනත් ණය හිමියන් | 26 | 1,306,998,191 | 1,328,533,167 |
| ණය ගැණුම් - මූල්‍ය ආයතන (ජංගම වගකීම්) | 22.2 | 1,913,783,798 | 4,845,170,541 |
| ගෙවිය යුතු බදු මුදල් | 28 | 286,271,593 | 286,957,687 |
| **2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශණය මත බලපෑම** | | | |
| ආශ්‍රිත සමාගම්හී ලාභ | 7.1 | 3,848,613 | - |
| සෘජු වියදම් | 31 | 20,922,237,967 | 20,934,955,843 |
| පරිපාලන වියදම් | 33 | 8,071,153,006 | 8,054,578,405 |

**43 පෙර වර්ෂයෙහි ගැලපුම්**

| විස්තරය | මුදල රු. | මුදල රු. |
|---|---|---|
| 2016 වසර සඳහා ගාලු මුවාදොර පිටිය පාලනය සඳහා ශ්‍රී ලංකා වරාය කළමනාකරණ උපදේශක සමාගමෙන් (SLPMCS) හිමිවිය යුතු ලාභය 2017 නොවැම්බර් 30 වැනි දින ලැබෙන ලදි. මෙම ආදායම 2016 වසරට අදාල හෙයින් පෙර වර්ෂයෙහි ගිණුම හරහා ගිණුම්කරණය සිදුකරන ලදි. | | 5,672,374.89 |
| දිනය, ස්ථානය, සේවාවේ වෙනස්වීම්, පෙර වර්ෂයන් හා සැසැදීමේදී අමතරව අයකර ගත් ක්ෂයවීම් පහත පරිදි ගැළපුම් කරන ලදි. | | 14,208,124.56 |
| පිරියත හා උපකරණ | 13,757,845.98 | |
| පිරියත හා උපකරණ | 211,599.31 | |
| විදුලි හා විද්‍යුත් උපකරණ | 148,103.26 | |
| ලී බඩු සහ කාර්යාල උපකරණ | 30,802.50 | |
| වෙනත් වත්කම් | 59,773.50 | |
| දිනය, ස්ථානය, සේවාවේ වෙනස්වීම්, පෙර වර්ෂයන් හා සැසැදීමේදී අමතරව අයකර ගත් ක්ෂයවීම් පහත පරිදි ගැළපුම් කරන ලදි.<br>මෙහෙයුම් උපකරණ -1,389,294.88 විදුලි හා විද්‍යුත් උපකරණ -1,701.96<br>රථ වාහන -13,179,157.70 | | 14,570,154.54 |
| දිනය, ස්ථානය, සේවාවේ වෙනස්වීම්, පෙර වර්ෂයන් හා සැසැදීමේදී අමතරව අයකර ගත් ක්ෂයවීම් පහත පරිදි ගැළපුම් කරන ලදි.<br>මෙහෙයුම් ගොඩනැගිල්ල සහ ව්‍යුහයන් -59,826,226.50 | | 59,826,226.50 |
| 2009 වසරේදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ගුවන් විදුලි ජාල උපකරණ සඳහා ආනයනය කරන ලද වලංගු රේගු ප්‍රකාශණය නොමැති වීම හේතුවෙන් අගය එකතු කරන ලද බද්ද (VAT) ගෙවීම පැහැර හැර ඇත. 2017 නොවැම්බර් 07 දිනැති දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය PA/HD/28 ප්‍රකාරව මෙම ගෙවීම සිදු කරන ලදි. | | 72,876,120.00 |
| හම්බන්තොට වරාය පරිශ්‍රය බදුගත් සීමාසහිත හේලිස් ඇඩ්වාන්ස් සමාගම කාර්යාල භූමිය භාවිතා නොකළ හෙයින් ස්ථාවර වාර්ෂික පරිභෝජනය වූ කිලෝ වොට් 3970 න් 20% පමණක් අයකර ගැනීමට සහ 2014 අගෝස්තු සිට 2016 දෙසැම්බර් දක්වා රු. 2383,191 අයකර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දෙන ලදි. එම නිසා අමතරව ගිණුම්කරණය කරනු ලැබූ මුදල වූ රු. 1906,552 පෙර වර්ෂයෙහි ගිණුම හරහා ගැලපුම් කරන ලදි. | | 1,906,552.00 |
| 2016 වසරේ කාරක කාර්යසාධන ගිණුමට අයකරන ලද අළුත්වැඩියා පිරිවැය වෙනත් ගිණුමකට මාරු කිරීම පෙර වසරේ වියදමක් ලෙස සලකන ලදි. (ගාල්ල වරාය) | | 4,050,363.37 |
| අයකර ගත් විදේශ විනිමය පාඩු/ ලාභ දැනට වෙනත් ගිණුමකට මාරු කර ඇති අතර හම්බන්තොට වරාය පිළිබඳව දැනට කිසිදු නොපියවූ ශේෂයන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පොත් වල නොමැත. | | 27,458,931,208 |
| හම්බන්තොට ඉන්ටර් නැෂනල් පෝට් ගෲප් සමාගමේ කල්බදු අයිතීන්, චංචල දේපළ සහ වට්ටෝරුගත භාණ්ඩයන් හම්බන්තොට ඉන්ටර් නැෂනල් පෝට් සර්විසස් සමාගමෙහි ආයෝජනයන් ලෙස ගිණුම්ගත කිරීම. | | 59,951,400 |
| 2010 වසරේ ලබාදුන් විලම්බිත බදු ප්‍රතිපාදන වෙනත් ගිණුමකට මාරු කිරීම | | 5,664,282,405.12 |
| JE/FD/RND/2017/201නිවැරදි කිරීම ලෙස බදු කුලී සහ විදුලිය වෙනුවෙන් බොල් සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදන ලබාදීම. | | 29,242,247.70 |
| කුරුළුදූව පාළම ඉදිකිරීම සඳහා ඉතිරි මුදල ගෙවීම | | 17,467,351.85 |
| **එකතුව** | | **33,033,174,742.55** |

**44 විදේශ විණිමය ලාභ/පාඩු**

විදේශ විණිමය ලාභ/පාඩු ගැලපුම් කරණ LKAS 1 අමතර අයිතම ප්‍රකාරව සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශයට එකතු කර ඇත. මෙම ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ එහි මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ අදහසක් ලබා ගැනීමට අදාළ වන බැවින් මෙය වසර අවසානයේ ආයතනයේ ශුද්ධ ලාභයට විශාල බලපෑමක් එල්ල කරයි.

**ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත**

**45** ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 2017

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ උප සමාගමක් වන ජය බහළු පර්යන්තය සහ හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සමාගම 2017 වසර සඳහා විගණනය නොකරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.
උප සමාගම වන සීමාසහිත මාගම්පුර වරාය කළමනාකරණ සමාගම (MPMC) සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආශ්‍රිත සමාගම් වන සීමාසහිත ශ්‍රී ලංකා වරාය කළමනාකරණ සහ උපදේශක සේවා සමාගම (SLPMCS) ඔවුන්ගේ මූල්‍ය ප්‍රකාශන තවමත් ඉදිරිපත් කර නැත. එමනිසා ජය බහළු පර්යන්තයේ සහ හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සමාගමේ දළ මූල්‍ය ප්‍රකාශන භාවිතා කරමින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.
සීමාසහිත මාගම්පුර වරාය කළමනාකරණ සමාගමේ සහ ශ්‍රී ලංකා වරාය කළමනාකරණ සහ උපදේශක සේවා සමාගමේ ලාභය සලකා බලා නැත.

**46 CICT භූමියේ අගය ප්‍රාග්ධනිතකරණය කිරීම (Capitalization)**

CICT ඉඩම් පවරාදීම ක්‍රමානුකූලව සිදු කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණයන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය අපේක්ෂාවෙන් සිටින අතර මෙම ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කිරීමට බලාපොරොත්තු වේ. මෙම තීරණය ලැබෙන තෙක් ඉහත ඉඩම් ප්‍රාග්ධනීකරණය කිරීමට හැකි තත්ත්වයක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට නොමැත.

**47 ඔලුවිල් වරාය ප්‍රාග්ධනීකරණය කිරීම (Capitalization)**

ඔලුවිල් වරාය පිළිබඳ 2017.12.31 දිනට කාරක කාර්යසාධන ගිණුමේ පිරිවැය ප්‍රාග්ධනිතකරණය කර ඇත.

**48 හැටන් නැෂනල් බැංකුවේ ණයවර ලිපි පහසුකම සඳහා ලබා දෙන සංස්ථාපිත ඇපය**

සීමාසහිත මාගම්පුර වරාය කළමනාකරණ සමාගම ලබාගත් ණයවර ලිපි පහසුකම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් හැටන් නැෂනල් බැංකුව වෙත සංස්ථාපිත ඇපයක් ලබා දී ඇත. කෙසේ නමුත්, ලබාදුන් සංස්ථාපිත ඇපය සීමාසහිත මාගම්පුර වරාය කළමනාකරණ සමාගම සහ හැටන් නැෂනල් බැංකුව අතර එකඟවීමේ ලිපිය හා එකඟ නොවේ. එම නිසා, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වගකීම ප්‍රශ්නාර්ථයකි. තවද, මෙම පහසුකම පියවීමේ වගකීම සීමාසහිත මාගම්පුර වරාය කළමනාකරණ සමාගමට නොමැති අතර මේ සඳහා අමාත්‍ය මණ්ඩල එකඟත්වය 2016.11.22 දින ලබා දෙන ලදි. තවද, වරාය නාවික අමාත්‍යාංශයේ ලේකම් මහා භාණ්ඩාගාරයේ ලේකම් විසින් නම් කරන ලද නියෝජ්‍ය ලේකම් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ (නීති) ඇතුලත් සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් අධ්‍යයනයක් සිදු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් පත් කරන ලදි.

**49 හම්බන්තොට වරාය පිළිබඳ සිදු වූ අති විශේෂ ගණුදෙණුව**

1.සහන ගිවිසුම ක්‍රියාත්මක වීමත් සමඟ පහත සඳහන් ගණුදෙණු අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබාදුන් පරිදි සිදු කෙරෙන ලදි

හම්බන්තොට වරායේ ණය ආපසු ගෙවීම පිළිබඳ වගකීම 2017.07.25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් මහා භාණ්ඩාගාරය විසින් භාර ගන්නා ලදි.
ඒ අනුව 2017 ජූලි මස සිට දෙසැම්බර් දක්වා සිදු කරන ලද නැවත ගෙවීම සහන ගිවිසුමේ 33.2 වගන්තිය ප්‍රකාරව සහ 2017.10.03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් ගෲප් සමාගම /හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සර්විසස් සමාගම් අතර අත්සන් කරන ලද කල්බදු ගිවිසුම සඳහා වැය වූ මුද්දර ගාස්තු සමඟ මහා භාණ්ඩාගාර ලැබීම් ලෙස දක්වා ඇත.

ii. සහන ගිවිසුම ප්‍රකාරව හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් ගෲප් සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙන් 85% ක් වයිනා මර්චන්ට් පෝට් සමාගම මගින් මිළදී ගත් අතර රු. 104,960,332,400 ක් 2017.12.31 දිනට ලැබිය යුතු වේ.

iii. සහන ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව, හම්බන්තොට වරායට අදාළ නිශ්චල දේපල වල කල්බදු අයිතීන් හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් ගෲප් සමාගම /හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සර්විසස් සමාගම් වලට ලබා දෙන ලදි.

2. 2017 දෙසැම්බර් 12 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක PA/HD/28 ප්‍රකාරව, පහත සඳහන් කරුණු සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත.
i. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වට්ටෝරු භාණ්ඩ හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සර්විසස් සමාගමට පවරා දීමට
ii. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් වෙනත් කොන්ත්‍රාත්තු යටතේ සංවර්ධනය කරන ලද නමුත් බදු ප්‍රදේශය තුළ ස්ථානගතව ඇති නිශ්චල දේපළ පවරා දීමට
iii. තක්සේරු දෙපාර්තමේන්තුව විසින් යෝජනා කරන ලද කල්බදු කුලිය භාවිතයෙන් ලබාගත් අගය මත රජයේ ඉඩම්වල කල්බදු අයිතීන් හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් ගෲප් සමාගම /හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සර්විසස් සමාගම් වලට පවරා දීමට

**50 කුරුළුදූව පාලම ඉදිකිරීම සඳහා ඉතිරි ගෙවීම**

අමාත්‍ය මණ්ඩල තීරණ අංක PED/INFR/PTSP/CM/939 සහ 2016.09.29 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගත් තීරණය ප්‍රකාරව (අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක PAM/148/2016) (2016.09.28 දින) මාතර කුරුළුදූව පාලම ඉදිකිරීම සඳහා වූ ඉතිරි මුදල වන රු.17,467,351.85 ක මුදල රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ගෙවීමට තීරණය කර ඇත.

**51 උපචිත තොග ගිණුමෙහි**

පද්ධතියේ ඇති වූ දෝෂයන් හේතුවෙන් විදේශ ගිණුම් අංක 321010 සැසඳීම හා නිවැරදි කිරීම අවශ්‍ය වේ.

**52 වත්කම්හි ප්‍රයෝජනවත් ආයුකාලය සමාලෝචනය කිරීම**

පාවෙන සහ මෙහෙයුම් උපකරණ, මෙහෙයුම් ගොඩනැගිලි සහ ව්‍යුහයන්ගේ ප්‍රයෝජනවත් ආයු කාලය වසර තුළ සමාලෝචනය කරන ලද අතර පොත්වල ශුද්ධ වටිනාකම ඒ අනුව ගැලපුම් කරන ලදි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වත්කම් සමාලෝචනය කිරීම අඛණ්ඩ ක්‍රියාවලියක් ලෙස සිදු කෙරෙනු ඇත.

**53 හම්බන්තොට වරායේ ගණුදෙණු නැවැත්වීමේ දිනය**

සහන ගිවිසුමේ බලාත්මක දිනය (2017.12.09) දක්වා සිදු වූ ගණුදෙණු සලකා බලා හම්බන්තොට වරායේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

**54 හම්බන්තොට වරායේ ආයෝජන දේපලයන්හී ආයු කාලය**

හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් ගෲප් සමාගම /හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සර්විසස් සමාගම් වලට වසර 99 ක කාලසීමාවක් සඳහා බදු දුන් දේපල වල ඇස්තමේන්තු ගත ආයු කාලය වසර 100 ක් ලෙස සලකනු ලැබුයේ කල්බදු අයිතීන්ගෙන් උපයාගත් ආදායම එම කාල සීමාව තුලම ක්‍රමක්ෂය වන බැවිනි.

**55 හම්බන්තොට වරාය ව්‍යාපෘති ප්‍රදේශය තුළ පිහිටා නොමැති ඉඩමක් සඳහා වන්දි ගෙවීම**

හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් ගෲප් සමාගම වෙත භාරදුන් හම්බන්තොට වරාය ව්‍යාපෘති ප්‍රදේශය තුළ පිහිටා නොමැති ඉඩමක් සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය වන්දි ගෙවා ඇත. මේ වන විට මෙම ඉඩම අයෝජන මණ්ඩලය සතුව පවතින හෙයින් මෙය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පොත් වල ප්‍රාග්ධනීකරණය කර නොමැත.

**56 ගාලු වරාය සංවර්ධන ව්‍යාපෘතිය (SLP - 85 ණය)**

යෙන් මිලියන 14,495 ක JICA ණය මුදලින් යෙන් මිලියන 458 ක් ගෙවා ඇති අතර එය ගාලු වරාය සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම සඳහා යොදවා ඇත. මෙය තවමත් ප්‍රාග්ධනීකරණය කර නොමැත.

**57 ආයෝජන දේපළ වල සාධාරණ අගය තීරණය නොකිරීමට හේතුව**

ආයෝජන දේපළ යනු ප්‍රධාන වශයෙන්ම සමුද්‍රීය සංවර්ධන කටයුතු සහ ව්‍යුහයන් ඇතුලත් වරාය යටිතල පහසුකම් වේ. මේ ආකාරයේ වරාය සංවර්ධන ව්‍යාපෘතීන් සිදු නොකරන හෝ අවම ලෙස සිදු කෙරෙන අතර හම්බන්තොට වරාය හරිත සංකල්පය යටතේ සංවර්ධනය කරන ලද විශේෂ අංගයන්ගෙන් සමන්විත වේ. තවද වරාය වාණිජ්‍යකරණය ඒ වන විට සම්පූර්ණයෙන්ම සිදු වී නොතිබුණි. මෙම පසුබිමේදී වෙළඳපොළ අගයේ සාධාරණ තක්සේරුවක් ලබා ගැනීම සඳහා කිසිදු පදනමක් නොතිබූ අතර මිළ මත පදනම් වූ තක්සේරුවක් සිදු කිරීම සඳහා අවශ්‍ය දත්ත මූලාශ්‍ර ලබා ගැනීමට හැකියාව තිබුණි.

**2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**58 සම්බන්ධිත පාර්ශ්ව අනාවරණය කිරීම**

ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරය , රජයට සම්බන්ධිත ආයතන, උප සමාගම් , ආශ්‍රිත සමාගම් සහ මූලික කළමනාකරණ පුද්ගලයින් අධිකාරියේ සම්බන්ධිත පාර්ශ්වයන්ට . ඇතුලත්ය

**58.1 මූලික කළමනාකරණ පුද්ගලයින් සමඟ කරන ගණුදෙනු**

(ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත(LKAS) 24ට අනුකූලව "අදාළ පාර්ශ්ව අනාවරණය කිරීම", සැළසුම් කිරීම, අධීක්ෂණය සහ යම් දෙයක ක්‍රියාකාරකම් සෘජුව හෝ වක්‍රාකාරව පාලනය කිරීම සඳහා මූලික කළමනාකරණ පුද්ගලයින් වගකීම් දරනු ලබයි. ඒ අනුව විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය මූලික කළමනාකරණ පුද්ගලයින් ලෙස වර්ගීකරණය කර ඇත.

| මූලික කළමනාකරණ පුද්ගලයින් සමඟ කළ ගණුදෙනු පහත දැක්වේ | 2017 | 2016 |
|---|---|---|
| වේතන සහ වෙනත් කෙටිකාලීන සේවක ප්‍රතිලාභ | 32,138,677 | 28,575,950 |
| ගෙවීමට ඇති ශේෂයන් - ණය සහ අත්තිකාරම් | 499,900 | 699,940 |

**58.2 සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ගණුදෙනු**

අධිකාරිය විසින් කරනු ලබන විශේෂිත වූ සම්බන්ධිත පාර්ශ්වවල ගණුදෙනු පිළිබඳ විස්තර පහත සඳහන් වේ.

| ආයතනයේ නම | සම්බන්ධතාවය | අධ්‍යක්ෂවරුන් /නියෝජිතයින්ගේ නම් | ගණුදෙනුවේ ස්වභාවය | ගණුදෙනුවේ අගය | ගෙවිය යුතු යුතු | ලැබීම් |
|---|---|---|---|---|---|---|
| මහා භාණ්ඩාගාරය | ප්‍රධාන දායකත්වය | | ප්‍රදානය කළ ණය | - | | |
| | | | නැවත ගෙවූ ණය | 4,840,274,812 | | |
| | | | ගෙවූ පොලිය | 1,271,415,919 | | |
| **<u>රජයට සම්බන්ධිත ආයතන</u>** | | | | | | |
| ශ්‍රී ලංකා රේගුව | සම්බන්ධිත ආයතන | | ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ නියෝජිත ආයතනයන්ගේ මෙහෙයුම් | 14,717.00 | - | 1,242,838.40 |
| ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | සම්බන්ධිත ආයතන | | - | - | - | - |
| සී/ස නාවික හා ගුවන්සේවා තොරතුරු පර්යේෂණ ආයතනය | සම්බන්ධිත ආයතන | | - | - | - | - |
| **රජයට සම්බන්ධිත වෙනත් ආයතන** | සම්බන්ධිත ආයතන | | සපයන ලද සේවා | | | |
| | | | සපයන ලද සේවා සඳහා මුදල් පියවීම | | | - |
| | | | වරාය හා නාවික අමාත්‍යාංශය සඳහා ඉන්ධන සැපයීම | 1,287,708 | | 274,211.44 |
| වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂක ජෙනරාල් | | | වෙළඳ ලේකම් කාර්යාලය වෙත ඉන්ධන සැපයීම | 103,796 | | 20,975.22 |
| | | | නැව් තෙල් සැපයීමේ යාත්‍රා 02 ක් සඳහා ලියාපදිංචි ගාස්තු | 1,248,310 | | |
| | | | වාර්ෂික ටොන් ප්‍රමාණය සඳහා ගෙවිය යුතු ගාස්තු | 494,455 | | |
| ලංකා ඛණිජ තෙල් සංස්ථාව | | | ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ නියෝජිත ආයතනයන්ගේ මෙහෙයුම් | 17,049,330 | | 4,443,963.65 |
| සීමාසහිත ලාංකා පොහොර සමාගම | | | ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ නියෝජිත ආයතනයන්ගේ මෙහෙයුම් | 11,205,565 | | 98,313.87 |
| ලංකා නැව් සංස්ථාව | | | ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ නියෝජිත ආයතනයන්ගේ මෙහෙයුම් | 35,091,712 | | 36,236,899.32 |
| ශ්‍රී ලංකා වරාය කළමනාකරණ සහ උපදේශන සේවා පුද්ගලික සමාගම | ආශ්‍රිත සමාගම | | සනීපාරක්ෂක සේවා සඳහා ගෙවීම | 39,071,160 | 11,101,170 | - |
| | | | වැටුප් ගෙවීම | 119,483,988 | | 21,550,064.05 |
| | | | ලැබූ සේවා සඳහා ගෙවීම | 85,375,498 | 9,780,090 | - |
| | | | ලැබූ ලාභාංශ | | | |
| ජය බහළු පර්යන්ත සමාගම | උප සමාගම | | ගෙවන ලද පරිපාලන සහ යටිතල පහසුකම් ගාස්තු | 252,075,174 | 24,913,388 | - |
| | | | ලැබිය යුතු ලාභාංශ | 6,121,800 | - | - |
| | | | ඉන්ධන සැපයීම | 1,076,596 | | 172,179.01 |
| | | | ඖෂධ නිකුත් කිරීම | 57,948 | 104,475.26 | - |
| | | | දුරකතන බිල්පත් | | 523,900 | |
| සීමාසහිත සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් සමාගම | ආශ්‍රිත සමාගම | | ලැබූ කුලී මුදල් | 450,278,531 | - | 33,725,732 |
| | | | ලැබූ රාජ්‍ය භාගය | 944,288,027 | - | 89,648,157 |
| | | | ලැබූ ලාභාංශ | 833,559,709 | - | - |
| ලංකා කෝල් (පුද්.) සමාගම | සම්බන්ධිත සමාගම | | වසර තුළ කිසිදු ගණුදෙනුවක් සිදුකර නැත | | - | |
| | | | | | - | |
| | | | | | - | |
| කොළඹ ජාත්‍යයන්තර බහළු පර්යන්ත සමාගම | සම්බන්ධිත සමාගම | ආචාර්ය පරාක්‍රම දිසානායක | ලැබූ කල්බදු කුලිය | 1,237,230,334 | - | |
| | | පී. ජී. දසනායක මහතා | ලැබූ ලාභාංශ | 1,544,995,138 | - | 86,544,609 |
| | | ශිරාණි වන්නිආරච්චි මිය | ලැබූ විලම්භිත පොළිය | 33,368,539 | - | |
| | | | CICTමගින් පළමු වරට ගෙවන මුදල | 103,534,286 | - | - |
| | | | | | - | - |
| මාගම්පුර වරාය කළමනාකරණ සමාගම | උප සමාගම | නිලාන් ජේ . එස්. වික්‍රමසිංහ මහතා | ගෙවිය යුතු පරිපාලන ගාස්තු | 616,162,893 | 71,819,156 | 1,804,652 |
| | | ශිරාණි වන්නිආරච්චි මිය | පහත වියදම් අඩු කිරීමෙන් පසු ඉහත ගාස්තු ගෙවා ඇත | | | |
| | | | වැටුප් | 9,367,089.52 | | |
| | | | වතුර | 718.06 | | |
| | | | විදුලිය | 42.50 | | |
| | | | වෙනත් | | | |
| සීමාසහිත කලම්බු ඩොක්යාඩ් සමාගම | කොටස් ආයෝජනය | | ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ නියෝජිත ආයතනයන්ගේ මෙහෙයුම් | 9,481,712.15 | | 72.11 |
| | | | ලැබූ ලාභාංශ | | | |
| හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සර්විසස් සමාගම | | ආචාර්ය පරාක්‍රම දිසානායක | | | | |
| | | නිලාන් ජේ. එස්. වික්‍රමසිංහ මහතා | | | | |
| හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් ගෲප් සමාගම | | ආචාර්ය පරාක්‍රම දිසානායක | | | | |
| | | නිලාන් ජේ. එස්. වික්‍රමසිංහ මහතා | | | | |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් පෙන්නුම් කරයි.

**මූල්‍ය අවදානම් කළමනාකරණය**

මූල්‍ය ප්‍රකාශන භාවිතය හේතුවෙන් පහත සඳහන් අවදානම් වලට මුහුණදීමට අධිකාරියට සිදුවනු ඇත.

1. ණය අවදානම
2. ද්‍රවශීලතා අවදානම
3. වෙළඳපොළ අවදානම (මුදල් අවදානම සහ පොලී අනුපාත අවදානම)

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන සමන්විත වන්නේ හිමිකම් ආයෝජන (ලේඛනගත සහ ලේඛනගත නොවූ), ණයකර සඳහා ආයෝජන, කාලීන තැන්පතු, මූල්‍ය වෙළඳපොළ ආයෝජන සහ මුදල් වලිනි. කාලීන තැන්පතු හා මූල්‍ය වෙළඳපොළේ ආයෝජනයෙහි ප්‍රධාන අරමුණ වන්නේ, මෙහෙයුම් සඳහා ද්‍රවශීලතාවය ඉහළ නැංවීම සහ පවත්වාගෙන යාමයි. හිමිකම්හි ආයෝජනය සහ ණයකර ආරක්ෂණයන් හි ආයෝජනය ක්‍රමෝපායික ආයෝජනයන් වන අතර, වෙළඳ සහ වෙනත් ලැබීම් වැනි අනෙකුත් මූල්‍යමය ලියවිලි සහ ඒවායේ ව්‍යාපාරික කටයුතු වලින් ඍජුවම පැනනඟින වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ පිළිබඳව ශ්‍රී ලංකා වරාය අධිකාරිය කටයුතු කළයුතුව ඇත. තවද, වරාය පුළුල් කිරීම සහ සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් ශ්‍රී ලංකා රජයෙන් සහ මූල්‍ය ආයතන වලින් ලබාගත් ණය වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය පොලිය ගෙවිය යුතු වේ.

**1. ණය අවදානම**

ණය අවදානම යනු ගණුදෙනුකරුවෙකු ගිවිසුම් ප්‍රකාර බැඳීම් හමුවේ ගෙවීම් කිරීමට අපොහොසත් වන්නේ නම්, අධිකාරියට සිදුවිය හැකි මූල්‍ය පාඩු පිළිබඳ අවදානම වන අතර, මෙය ප්‍රධාන වශයෙන් පැනනඟිනු ලබන්නේ ශ්‍රී ලංකා හමුදාවන්, වෙනත් රාජ්‍ය ආයතන සහ ආයෝජන සුරැකුම් ඇතුළුව ගණුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු ලැබීම් වලිනි.

**වෙළඳ ලැබීම්**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය නැව් නියෝජිතයින් සහ රාජ්‍ය ආයතන සමඟ ප්‍රධාන වශයෙන් වෙළඳ කටයුතු වල නිරත වේ. අතීත පළපුරුද්ද සහ නැව් නියෝජිතයින්ගේ මූල්‍යමය සහතිකවීම් වැනි වෙනත් සාධක පදනම් කරගනිමින් නැව් නියෝජිතයින්ගේ ණය තත්ත්වය පිළිබඳව කළමනාකාරීත්වය තක්සේරු කරනු ලබයි. ඊට අමතරව කළමනාකරණ කමිටුවේ දී සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පවත්නා පදනම මත ගෙවීමට ඇති ශේෂයන් අධීක්ෂණය කරනු ලබයි.

වෙළඳ ලැබීම් සම්බන්ධයෙන් සිදුවන පාඩු, ඇස්තමේන්තු මගින් පෙන්වන හානිකිරීම් සඳහා (මූල්‍ය ප්‍රකාශනයේ 2.7 සටහන බලන්න) ප්‍රතිපාදන සඳහා අධිකාරිය විසින් ප්‍රතිපත්ති ස්ථාපිත කර ඇත. විශේෂිත වූ ගණුදෙනුකරුවන් පුද්ගලික වශයෙන් තක්සේරු කිරීමට සම්බන්ධ තනි වශයෙන් වන හානි කිරීම් පාඩු සහ විශේෂිත නොවූ ගණුදෙනුකරුවන් සඳහා සාමූහික හානිකිරීම්, ප්‍රතිපාදන වල ප්‍රධාන ලක්ෂණයන් වේ. ගෙවීම් සිදුකිරීමේ ඓතිහාසික දත්ත පදනම් කරගෙන සාමූහික හානිකිරීමේ පාඩු තීරණය කෙරිණ. පිහිටුවන ලද හානිකිරීමේ ප්‍රතිපත්ති වලට අනුකූලව හානිකිරීම් පාඩු මැන බැලීම පිණිස ශ්‍රී ලංකා හමුදාවන්, වෙනත් රජයේ ආයතන, නීතිමය තත්ත්වයන්ට යටත් නැව් නියෝජිතයින් සහ විශේෂිත නැව් නියෝජිතයින් පෞද්ගලිකවම සමාලෝචනය කෙරිණ. අනෙත් ඒවා සාමූහිකව සමාලෝචනය කෙරිණ. වෙළඳ ලැබිය යුතු දේ සහ හානිකිරීමේ පාඩු වෙනුවෙන් වූ ප්‍රතිපාදන වල විස්තර සඳහා කරුණාකර මූල්‍ය ප්‍රකාශන සඳහා වන 12 සටහන බලන්න.

**වෙනත් මූල්‍ය වත්කම්**

අධිකාරියේ වෙනත් මූල්‍යමය වත්කම්වලින් පැන නගින ණය අවදානම සමන්විත වන්නේ කාලීන තැන්පතු, මුදල් සහ මුදල් හා සමාන ණයකර වල ආයෝජන වලිනි. මෙම මූල්‍යමය ලියකියවිලි වල ඉදිරියට ගෙන එන ලද මුදලට සමාන උපරිම අනාවරණයක් සහිතව, ගිවිසුම් ප්‍රකාර පාර්ශ්වයන්ගේ ගිවිසුම් ප්‍රකාර වගකීම් හමුවේ වූ පැහැර හැරීම් වලින් පැනනගින මූල්‍ය අවදානම හේතුවෙන් අධිකාරිය මූල්‍ය අවදානමට මුහුණ දේ. ප්‍රධාන වශයෙන් රාජ්‍ය මූල්‍ය ආයතනවල සහ වෙනත් රාජ්‍ය ආයතනයන්හි අරමුදල් යෙදවීම මගින් මෙම මූල්‍යමය ලියකියවිලි සම්බන්ධයෙන් ඇති ණය අවදානම අධිකාරිය විසින් පාලනය කරනු ලැබේ.

## 2. ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු අධිකාරිය විසින් තම මූල්‍ය වගකීම්, ඒවා කල්ගතවීම හේතුවෙන් ඉටු කිරීමට නොහැකි වීම වේ. ද්‍රවශීලතාවය පාලනය කිරීමේදී අධිකාරියේ තත්ත්වය වන්නේ, සාමාන්‍ය සහ බලාපොරොත්තු නොවූ අවස්ථාවන් යටතේ, පිළිගත නොහැකි පාඩුවීම් රහිතව හෝ අධිකාරියේ කීර්තිනාමයට හානිවීම පිළිබඳ අවදානමකින් තොරව වගකීම් ගෙවීමට ඇති අවස්ථාවන්හි දී, ගෙවීම් සිදුකිරීම සඳහා ප්‍රමාණවත් මුදල් අධිකාරිය සතුව තිබීම හැකිතාක් දුරට සහතික කිරීමයි.

මෙහෙයුම් මූල්‍ය ප්‍රවාහයන් (පුනරාවර්තන අයවැය) සහ ප්‍රාග්ධන අයවැයවල පුරෝකථනයන් වාර්ෂිකව පිළියෙල කෙරේ. මෙහෙයුම් අවශ්‍යතාවයන්ට මුහුණදීම සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් ඇති බවට අධිකාරියට සහතික වනු වස් පුනරාවර්තන සහ ප්‍රාග්ධන යන අයවැය ද්විත්වය සහ ද්‍රවශීලතා අවශ්‍යතාවයන් මුදල් කොට්ඨාශය විසින් අධීක්ෂණය කරනු ලැබේ. වාර්තා සැකසීමේ කාලපරිච්ඡේදය අවසානයේ දී රු.23,260,284,628.21/- (2016 : රු.18,325,552,004/-) මුදලකට අධිකාරිය විසින් කාලීන තැන්පතු, කෙටි කාලීන රජයේ සුරැකුම්පත් සහ වෙනත් ද්‍රවශීල වත්කම් පවත්වාගෙන යනු ලැබිණ.

වාර්තාකරනු ලබන කාලසීමාවේ අවසන් දින වනවිට, ගිවිසුම් ප්‍රකාරව කල් පිරෙන දිනය දක්වා ඇති ඉතිරි කාලසීමාව මත පදනම්ව අධිකාරියේ මූල්‍ය වගකීම් වල කල්පිරීමේ විශ්ලේෂණයන් පහත වගුවෙන් නිරූපනය කෙරේ. වට්ටම් නොලැබූ ගිවිසුම් ප්‍රකාර මුදල් ප්‍රවාහයන් වගුවේ අගයන්ගෙන් පෙන්නුම් කෙරේ.

**ශ්‍රී ලංකා රුපියල් වලින් සඳහන් කර ඇත**

| මූල්‍ය වගකීම් | 2017 දෙසැම්බර් 31 | | | 2016 දෙසැම්බර් 31 | | |
|---|---|---|---|---|---|---|
| | වසරකට වඩා අඩු | වසරකට වඩා වැඩි | එකතුව | වසරකට වඩා අඩු | වසරකට වඩා වැඩි | එකතුව |
| ණය ගැණුම් / රජය | 5,198,526,722 | 54,924,342,666 | 60,122,869,388 | 10,285,274,220 | 214,555,128,086 | 224,840,402,306 |
| ණය ගැණුම්/ මූල්‍ය ආයතන | 1,555,871,084 | 11,360,327,710 | 12,,916,198,794 | 1,912,413,794 | 10,593,136,572 | 12,505,550,366 |
| වෙළඳ සහ වෙනත් ණය හිමියන් | 105,914,892,043 | - | 105,914,892,043 | 1,429,776,503 | - | 1,429,776,503 |
| එකතුව | 112,664,920,006 | 62,333,811,506 | 174,998,731,513 | 13,627,464,517 | 225,148,264,658 | 238,775,729,175 |

## 3. වෙළඳපොළ අවදානම

අධිකාරියේ ආදායමට හෝ මූල්‍ය ලියකියවිලි වල ඉදිරියට ගෙන ආ රඳවාගත් අගයට බලපෑමක් ඇතිකරනු ලබන, විදේශ විනිමය අනුපාත සහ පොලී අනුපාතයන් වැනි වෙළඳපොළ මිළ වෙනස්වීමේ අවදානමක් සහිත දෑ වෙළඳපොළ අවදානම ලෙස සැලකේ.

### 3.1 මූල්‍ය අවදානම

වාර්තාකරනු ලබන කාලසීමාව තුළ ශ්‍රී ලංකා මහ බැංකුව ඇ.එ.ජ.ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල පාවීමට ඉඩහැරීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව ඇ.එ.ජ.ඩොලරයේ වටිනාකමේ උච්චාවචනයෙන් අධිකාරියේ මූල්‍ය අවදානම පැනනගියි. බොහෝ මුදල් ගණුදෙනු සිදුවන්නේ ශ්‍රී ලංකා රුපියල් මගින් වන අතර, මෙය සමාගමේ භාවිතා වන මුදල් ඒකකය වේ. කෙසේ නමුත්, වරායයන් පුළුල් කිරීම, සංවර්ධන ව්‍යාපෘතීන් හා නිශ්චිත බැංකු ශේෂයන් සහ නාවික නියෝජිත ලැබීම් (APL ලංකා පුද්ගලික සමාගම) වලට අදාළ පොළී සහිත ණය ගැණුම් විදේශ මුදල් ඒකක මගින් පෙන්නුම් කෙරේ. (ජපන් යෙන් සහ ඇ.එ.ජ. ඩොලර්)

ඇ.එ.ජ.ඩොලරය පාවීමේ ප්‍රතිඵලයක් ලෙස ණය ගැණුම් නැවත ගෙවීම් සහ නැව් නියෝජිතයින්ට (APL ලංකා පුද්ගලික සමාගම ආදිය) සැපයූ සේවාවන් ඉන්වොයිස්ගත කිරීම මගින් පැන නැගුණු රු.2,205,937,060/=ක මුළු මුදල, ඇ.එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල ක්ෂය වීමෙන් 2017 වර්ෂයේ වාර්තා කරන ලද කාල සීමාව සඳහා මෙහෙයුම් ප්‍රතිඵල මත බලපෑමක් එල්ල කරන ලදී. කෙසේ නමුත්, එකම මුදල් ඒකකයක් මගින් පවත්වාගෙන යන මුදල් තැන්පතු හරහා යළි ගෙවීම් සහ ලබාගත් ණය නැවත ගෙවීම සිදුකිරීමට හා මුදල් සංචලනයේ බලපෑම අවම කිරීමට අධිකාරිය විසින් එකම මුදල් ඒකකයක් භාවිතා කරනු ලැබේ.

පොලී සහිත ණය හා විදේශ විනිමය මගින් නිරූපණයකොට ඇති ණය ගැනීම් පිළිබඳ තොරතුරු සඳහා කරුණාකර මූල්‍ය ප්‍රකාශනයේ සටහන් අංක 21 හා 22 බලන්න.

**පොලී අවදානම**

රාජ්‍ය සුරැකුම්පත්, බැංකු තැන්පතු සහ ස්ථාවර හා සංචරණ පොලී සහිත ණය ගැනීම් හා සම්බන්ධ වෙළඳපොළ පොලී අනුපාතයේ වෙනස්කම් අධිකාරියේ පොලී අවදානමට හේතු වේ.

රු.54,209,363,742.81 (2016 : රු. 54,103,443,683.80/=) වන අධිකාරියේ පොලී සහිත ණය සහ ලබාගැනීම් වල පොලී වල අනුපාතයට අනුව ගණනය කෙරෙන අතර අනෙකුත් මුදල වන රු.18,829,704,438.21 (2016: රු.183,242,508,989.33/=)හි අඩංගු පොලිය ස්ථාවර අනුපාතයට අනුව ගණනය කරනු ලැබේ.

රාජ්‍ය බැංකු සහ රජය සමග ඇති තැන්පතු ඇතුළුව මුදල් හා බැංකු ශේෂයන් අධිකාරිය සතුව ඇත. අධිකාරිය විසින් ක්‍රියාකාරි ලෙස පොලී අනුපාත චලනයන් අධීක්ෂණය තුළින් පොලී අනුපාත අවදානම අධීක්ෂණය කරනු ලබයි.

| ණය | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|
| **චල විණිමය අනුපාතය** | | |
| කොළඹ වරාය පුළුල් කිරීම (දකුණු වරාය) | 41,293,164,949 | 41,567,362,731 |
| පර්යන්ත ට්‍රක් රථ (මලයාසියාවේ එක්සිම් බැංකුව) | | 30,530,586 |
| ලංකා බැංකුව | 8,960,970,082 | 12,505,550,365 |
| මහජන බැංකුව | 3,955,228,712 | |
| **ස්ථාවර විනිමය අනුපාතය** | | |
| කොළඹ වරාය සංවර්ධන ව්‍යාපෘතිය | 18,829,704,439 | 21,286,883,069 |
| හම්බන්තොට වරාය සංවර්ධනය (අදියර 1) | - | 34,920,772,393 |
| හම්බන්තොට වරාය සංවර්ධනය (අදියර 11 ඇ.එ.ජ.ඩො.මිලියන 600) | - | 90,614,160,000 |
| හම්බන්තොට වරාය සංවර්ධනය (අදියර 11 යුවාන් බිලියන 1) | - | 5,317,703,819 |
| හම්බන්තොට තෙල් ටැංකි ව්‍යාපෘතිය | - | 9,872,233,068 |
| අනුයාත කටයුතු සහ උපකරණ සැපයීම - අදියර 1 හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය | - | 21,230,756,640 |

**2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| ණය | | ණය ලබාදුන් ආයතනය | මුදල් ඒකකය | පොළී අනුපාතය | ණය මුදල (ණය ලබාදුන් මුදල් ඒකකයෙන් | 2017.12.31 දිනට නොපියවූ ශේෂය | ණය ගැණුම් පිරිවැය |
|---|---|---|---|---|---|---|---|
| JBIC | SLP-23 | JAICA | JPY | 2.50% | 5,703,407,055 | 964,282,792 | |
| | SLP-27 | | JPY | 2.50% | 10,432,338,189 | 2,469,347,541 | |
| | SLP-30 | | JPY | 2.60% | 19,962,268,331 | 6,075,143,798 | |
| | SLP-33 | | JPY | 2.60% | 6,828,220,432 | 2,770,709,309 | |
| | SLP-41 | | JPY | 2.60% | 4,878,185,478 | 2,309,334,798 | |
| | SLP-46 | | JPY | 2.60% | 2,644,187,565 | 2,235,258,060 | |
| | SLP-67 i | | JPY | 1.80% | 1,354,512,318 | 1,265,894,112 | |
| | SLP-67 ii | | JPY | 0.75% | 217,445,997 | - | |
| | SLP-85 | | JPY | 0.30% | 14,495,000,000 | 589,600,324 | |
| ආසියානු සංවර්ධන බැංකුව (ADB)- 2316 | | ආසියානු සංවර්ධන බැංකුව | US $ | Libor+0.6% | 300,000,000 | 41,145,993,958 | |
| වරණීය ගැණුම්කරුගේ ණය | | චීනයේ එක්සිම් බැංකුව | US $ | 2.00% | 600,000,000 | | 931,530,666 |
| රජයේ සහන ණය (අදියර 11) | | චීනයේ එක්සිම් බැංකුව | RMB | 2.00% | 1,000,000,000 | | 56,295,274 |
| සූරියවැව ක්‍රීඩාංගනය ඉදිකිරීම | | මහජන බැංකුව | LKR | AWPR+2.5% | 3,950,858,870 | 3,950,858,870 | |
| නැගෙනහිර බහළු පර්යන්තය | | ලංකා බැංකුව | US $ | 6 Months Libor+4.25% | 80,000,000 | 8,960,970,082 | |
| | | | | **එකතුව** | | **72,737,393,644** | **987,825,940** |
| | | | උපචිත පොළිය | | | 301,674,537 | |
| | | | | | | **73,039,068,181** | |
| | | | සටහන 21 | ණය ගැණුම් - ශ්‍රී ලංකා රජය | | 60,122,869,388 | |
| | | | සටහන 22 | ණය ගැණුම් - මූල්‍ය ආයතන | | 12,916,198,794 | |
| | | | | | | **73,039,068,182** | |

හම්බන්තොට වරාය සංවර්ධනය සඳහා ලබාගත් ණය සහ හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා ලබාගත් ණය ආපසු ගෙවීම් මහා භාණ්ඩාගාරය විසින් 2017.07.25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව භාරගෙන ඇත.එම නිසා, මෙය පිළිබඳව ශ්‍රී ලංකා වරාය අධිකාරියට කිසිදු වගකීමක් නොමැත .

දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා







මෙහෙයුම් සහ වෙනත් වියදම්
රු. මිලියන
50,000
40,000
30,000
20,000
10,000
0
-10,000
-20,000
2017 වසර සඳහා වියදම රු. මිලියන
2016 වසර සඳහා වියදම රු. මිලියන
වැඩි වීම/ (අඩුවීම)
%
අතිකාල
ක්ෂය වීම
වියදම්

සියලු වරායයන්


නැව් බඩු ධාරිතාවය විශ්ලේෂණය [මෙ.ටොන්] කොළඹ වරාය(ශ්‍රී.ල.ව.අ.+ එස්.ඒ.ජී.ටී+ සී.අයි.සී.ටී)
තොගකඩන, තොග සහ ද්‍රව 15%
දේශීය බහළු 15%
ප්‍රතිනැව්ගත බහළු 70%
ප්‍රතිනැව්ගත බහළු
දේශීය බහළු
තොගකඩන, තොග සහ ද්‍රව


මෙහෙයුම් ආදායම විශ්ලේෂණය
සියළු වරායයන්
ප්‍රතිනැව්ගත බහළු 19%
වෙනත් 45%
තොග කඩන, තොග සහ ද්‍රව 10%
දේශීය බහළු 26%
ප්‍රතිනැව්ගත බහළු
දේශීය බහළු
තොගකඩන, තොග සහ ද්‍රව
වෙනත්

පීඕඑස්/ඒ/එස්එල්පීඒ/1/2017/03 2018 නොවැම්බර් 14 දින

**සභාපති**
**ශ්‍රී ලංකා වරාය අධිකාරිය**

**ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සහ එහි පරිපාලිත සමාගම්හි 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2 )(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ එහි පරිපාලිත සමාගම්හි 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1979 අංක 51 දරණ ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ 33 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

### 1.4 මතය ව්‍යාවනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකි විය.

### 1.5 පරිපාලිත හා ආශ්‍රිත සමාගම්

සීමාසහිත ජය බහලුම් පර්යන්ත සමාගම හා සීමාසහිත මාගම්පුර වරාය කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම යන පරිපාලිත සමාගම් දෙක හා ආශ්‍රිත සමාගමක් වන සීමාසහිත වරාය

කළමනාකරණ හා උපදේශක සේවා සමාගම ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතුව පැවතුණි. පරිපාලිත සමාගම්හි හිමිකම සියයට 100 ක් හා ආශ්‍රිත සමාගමෙහි හිමිකම සියයට 39.97 ක් වූ අතර 2017 දෙසැම්බර් 09 දින සිට මාගම්පුර වරායේ මෙහෙයුම් කටයුතු වෙනත් සමාගම් දෙකක් වෙත පවරා තිබූ බැවින් එම සමාගමේ අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිත බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

#### 2.1.1 මතය ව්‍යාචනය - සමූහය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

#### 2.1.2 මතය ව්‍යාචනය - අධිකාරිය

මෙම වාර්තාවේ 2.2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - සමූහය

වරාය අධිකාරියේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී එක් පරිපාලිත සමාගමක කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන ඒකාබද්ධ ගිණුම් පිළියෙල කර තිබුණු අතර අධිකාරිය සතු අනෙක් පරිපාලිත සමාගමේ ගිණුම් 2018 මැයි මාසය අවසන් වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. මේ නිසා සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී පරිපාලිත සමාගම් දෙකෙහි විගණිත මූල්‍ය ප්‍රකාශන යොදාගෙන නොතිබුණි.

#### 2.2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - අධිකාරිය

##### 2.2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා ලබාගෙන තිබූ විදේශ ණයවලින් 2017 නොවැම්බර් 30 දිනට අධිකාරියේ ගිණුම්වල ඉතිරිව පැවති රු. මිලියන 147,746 ක ණය ශේෂය මහා භාණ්ඩාගාරයේ එකඟතාවකින් හෝ කැබිනට් මණ්ඩල තීරණයකින් තොරව අධිකාරිය විසින් මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර තිබූ අතර ඒ හේතුවෙන් රජයේ කිසිදු ගිණුමක එම ණය මුදල් ඇතුළත්ව නොතිබුණි. කෙසේ වුවද මෙම ණය මුදල් කුමන ගිණුමක ඇතුළත් විය යුතුදැයි නිශ්චිතතාවයක් නොවුණි. තවද මෙම ණය ගිණුම්වලින් ඉවත් කිරීම නිසා අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවලට ද පහත සඳහන් බලපෑම් සිදු වී තිබුණි.

(i) විදේශ ණය ශේෂය රු. මිලියන 147,746 කින් අඩුවෙන් දක්වා තිබීම.

(ii) ණය වටිනාකම දේශීය මුදලට පරිවර්තනය කිරීමේදී 2016 දෙසැම්බර් 31 දින දක්වා හඳුනාගන්නා ලද රු. මිලියන 27,458.93 ක විදේශ විනිමය පරිවර්තන අලාභය 2017 වර්ෂයේ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයෙහි ආරම්භක රඳවාගත් ඉපයුම් ශේෂයට ගැලපීම හේතුවෙන්

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පවතින රඳවාගත් ඉපයුම් ශේෂය එම වටිනාකමින් අධිගණනය වී තිබීම.

(iii) 2017 ජනවාරි 01 සිට 2017 නොවැම්බර් 30 දින දක්වා හඳුනාගන්නා ණය මුදලට අදාළ විදේශ විනිමය පරිවර්තන අලාභය වූ රු. මිලියන 4,086 ක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට ඇතුළත් නොකිරීම හේතුවෙන් ඉහත වටිනාකමින් සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභ අධිගණනය වී තිබීම.

(iv) 2017 දෙසැම්බර් 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා ණය මුදලේ විදේශ විනිමය පරිවර්තන ලාභය රු. මිලියන 339 ක් වූ අතර, එම ප්‍රමාණය සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සකස් කිරීමේදී සැලකිල්ලට ගෙන නොතිබීම.

**2.2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්**

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව, නැව් නියෝජිත ආයතනයකින් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂය රු. මිලියන 986.08 ක් වූ අතර, නැව් නියෝජිත ආයතනය ලබා දුන් ශේෂ සනාථ කිරීමේ ලිපිය අනුව එම ශේෂය රු. මිලියන 728.14 ක් වූයෙන් රු. මිලියන 257.94 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනසට හේතු දක්වමින් සැසඳුම් ප්‍රකාශනයක් පිළියෙල කර නොතිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වරාය අධිකාරියේ මූල්‍ය කාර්ය පරිපාටි සංග්‍රහයේ 9.1.3 වගන්තිය අනුව, අධිකාරියට ලැබිය යුතු මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් ඍජුව හෝ අනියම් ලෙස වගකිවයුතු නිලධාරීන් ඒවා හිඟ මුදල් බවට පත්වීමට ඉඩනොහරින බවට වගබලා ගැනීම සඳහා සෑම සැලකිල්ලක්ම දැක්විය යුතු වේ. එසේ වුවද, 2017 දෙසැම්බර් 31 දිනට අධිකාරියට අයවිය යුතු රු. මිලියන 2,788 ක මුළු වෙළඳ ණයගැති ශේෂයෙන් කොළඹ වරායේ වෙළඳ නැව් නියෝජිත ණයගැති ශේෂ එකතුව රු. මිලියන 516 ක් හා වෙළඳ නොවන ණයගැති ශේෂ එකතුව රු. මිලියන 63 ක් වසරකට වැඩි කාලයක් තිස්සේ අය නොවී පැවතුණි.

(ආ) ණය පදනම මත සේවා සපයා තිබීම හේතුවෙන් කොළඹ, ත්‍රිකුණාමලය හා ගාල්ල යන වරායන්හි සේවාවන් ලබාගත් රාජ්‍ය ආයතන සහ නැව් නියෝජිත ණයගැතියන් වෙතින් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු එකතුව රු. මිලියන 423.14 ක් වෙනුවෙන් සම්පූර්ණයෙන්ම බොල් හා අඩමාණ ණය සඳහා ප්‍රතිපාදනය කර තිබුණි.

(ඇ) ලැබිය යුතු ගිණුම් ශේෂ තුළ අන්තර්ගත කොළඹ හා ත්‍රිකුණාමලය වරායන්හි වෙළඳ නොවන ණයගැතියන් යටතේ දැක්වෙන දේපළ, සුභසාධන හා ආපනශාලා පවත්වාගෙන යාම වෙනුවෙන් ලබාදුන් පරිශ්‍රවල, පරිශ්‍ර කුලිය හා විදුලි පරිභෝජනය වෙනුවෙන් අධිකාරිය දරන ලද විදුලි වියදම් නිසි පරිදි අයකර නොගැනීම හේතුවෙන් වර්ෂය ඉක්මවා තිබූ එම ශේෂවල වටිනාකම රු. මිලියන 65 ක් වූ අතර රු. මිලියන 63.68 ක් සඳහා බොල් හා අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන සලසා තිබුණි.

(ඈ) 2017 දෙසැම්බර් 31 දිනට ගැටළු සහගත/ආරවුල් සහිත ණයගැති ශේෂ (Dispute debtors) රු. මිලියන 46.83 ක් හා නැවත විසඳීම සඳහා යොමු කල නිරවුල් නොවූ ණයගැති ශේෂය රු. මිලියන 14.70 ක් විය. ඉහත ශේෂයන් තුළ අන්තර්ගත වසරක් ඉක්ම වූ නිරවුල් නොවූ ණයගැතියන් රු. මිලියන 3.18 ක් හා නැවත විසඳීම සඳහා යොමුකල නිරවුල් නොවූ ණයගැතියන් (Re-dispute) රු. මිලියන 4.78 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද අවසන් නිගමන වලට එළඹ නොතිබුණි.

(ඉ) නැව් නියෝජිත ආයතනයකින් මෙතෙක් අයනොවී පැවති දින 30 ඉක්ම වූ ගුදම් ගාස්තු හා නැව් එහා මෙහා කිරීම සඳහා වූ රු. මිලියන 113.19 ක බිල්පත් වෙනුවෙන් ගාස්තු සහනයක් ලබා දීමට (ගාස්තු කපා හැරීමට) අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇති නමුත් මහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. කෙසේ වුවද 2018 මැයි 16 දින රු. මිලියන 112.86 ක් බොල් ණය ලෙස කපා හැර තිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1979 අංක 51 දරණ ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ පනතේ 6 (ඌ) වගන්තිය | පනතේ විධිවිධාන ප්‍රකාරව පොදු සංචිතයක් ස්ථාපිත කිරීමට 2017 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 1971 අංක 38 දරණ මුදල් පනත | |
| | (i) 11 වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | 2017 වර්ෂයේදී අධිකාරිය විසින් ස්ථාවර තැන්පතුවල සහ කෙටි කාලීන තැන්පතුවල ආයෝජනය කරන ලද රු. මිලියන 12,674 ක් සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන නොතිබුණි. |
| | (ii) 10 (5) වගන්තිය | රාජ්‍ය සංස්ථාවක යම් වර්ෂයක අතිරික්තයක් තිබේ නම් පනතේ දක්වා ඇති අඩු කිරීම් කළ පසු ඉතිරිය ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය. එසේ වුවද 2016 හා 2017 වර්ෂයන්හිදී අධිකාරිය පිළිවෙලින් රු. මිලියන 1,035.73 ක් හා රු. මිලියන 13,324.14 ක ශුද්ධ ලාභයක් ලබා තිබුණද එම ලාභ ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. තවද ඉහත ලාභය තුළ කොළඹ වරාය පර්යන්ත 2 හි මෙහෙයුම් කටයුතු වල නිරතව සිටින පෞද්ගලික සමාගම් දෙකෙන් අධිකාරිය විසින් වාර්ෂික බදු කුලිය ලෙස අයකරගත් රු. මිලියන 1,993.47 ක් ද රාජ්‍ය භාගය ලෙස අයකරගත් රු. මිලියන 2,489.28 ද ඇතුලත් වී තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 387 හා 156 | චෙක්පත් මගින් කෙරෙන සියළුම ගෙවීම් සඳහා තම බැංකු ශේෂය ප්‍රමාණවත්දැයි ගෙවන නිලධාරියා විසින් නිතරම සොයා බැලිය යුතු වුවත් අධිකාරිය විසින් වැටුප් ගෙවීමේ දී රු. මිලියන 484.171 ක බැංකු අයිරාවක් ඇතිවීම හේතුවෙන් රු. මිලියන 0.286 ක් වූ බැංකු අයිරා පොළී ගෙවීමට සිදුවී තිබුණි. |

| | | |
|---|---|---|
| (ඈ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ පොදු ව්‍යාපාර චක්‍රලේඛය | |
| | (i) 4.2.3 වගන්තිය | පරිපාලිත සමාගම්හි කාර්ය සාධනයන් පිළිබඳව අදාළ කාලානුරූපී වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කළ යුතු වුවත් අධිකාරියට අයත් එක් පරිපාලිත සමාගමක කාර්යසාධන වාර්තා සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කර නොතිබුණි. |
| | (ii) 5.1.2 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ දී අධිකාරියේ කොට්ඨාශ 23 ට අදාළව ප්‍රධාන කාර්යසාධන දර්ශකයන් (Key Performance Indicators) හඳුන්වා දී තිබූ නමුත් අපේක්ෂිත පරිදි තථ්‍ය කාර්යසාධනය ළඟා කර ගත් බවට දර්ශකයන් පදනම් කරගෙන කාර්යසාධනය ඇගයීමට කටයුතුකර නොතිබුණි. |
| | (iii) 9.3.1.(iv) වගන්තිය | නව තනතුරක් නිර්මාණය කිරීමට හෝ සේවක සංඛ්‍යාව වැඩි කිරීමකට පෙර නියමාකාරයෙන් රැකියා ඇගයීමක් හා අධ්‍යයනයක් කළ යුතු ලෙස දක්වා තිබුණද එපරිදි කටයුතු කිරීමකින් තොරව අධිකාරියේ කොට්ඨාශ 6 ක කාර්යභාරයට සාපේක්ෂව අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා බඳවා ගැනීම් සිදුකර තිබුණි. |
| | (iv) (iv) 9.3.1 හි (vi) හා (vii) වගන්ති | චක්‍රලේඛ නියමයන්ට අනුකූල නොවන ලෙස අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ දී නිළධාරීන් 35 දෙනෙකු මාස 03 කට අධික කාලයක් සඳහා වැඩ බැලීමේ පදනම මත පත්කර තිබුණි. |
| (ඉ) | 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.3 හා 3.1 වගන්ති | (i) චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව මාසික ඉන්ධන දීමනාව සඳහා හිමිකම් නොමැති නිළධාරීන් 86 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේ ජනවාරි මාසයේදී ඉන්ධන ලීටර් 8370 ක් ලබාදී තිබුණි. |
| | | (ii) චක්‍රෙල්ඛ විධිවිධානවලට පටහැනිව, අධිකාරියේ නිළධාරීන් 35 දෙනෙකු සඳහා මාසික ඉන්ධන සීමා තීරණය කර තිබූ අතර නියැදි විගණන පරීක්ෂාවට අනුව, 2017 ජනවාරි මාසයේදී පමණක් ඉන්ධන ලීටර් 1,459 ක් වැඩිපුර ලබාදී තිබුණි. |
| (ඊ) | 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ XIV වගන්තිය හා 2016 අප්‍රේල් 29 දිනැති අංක පීඊඩී/ 03/2016 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | උපයන විට ගෙවීම් බදු, පුද්ගලික වැටුපෙන් අඩුකර ගෙවිය යුතු වුවද අධිකාරියේ නිලධාරීන් සඳහා වූ එම මුදල් අධිකාරියේ අරමුදල් වලින් ගෙවා තිබුණි. 2017 වර්ෂය සඳහා එසේ ගෙවන ලද රු. මිලියන 479.94 ක් ද ඇතුලුව 2011/2012 තක්සේරු වර්ෂයේ |

| | | |
|---|---|---|
| | | සිට 2017 දෙසැම්බර් මාසය දක්වා එකතුව රු. මිලියන 2,361.62 ක උපයන විට ගෙවීමේ බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත අධිකාරියේ අරමුදලින් ගෙවා තිබුණි. |
| (උ) | 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතෙහි උපයන ගෙවීම් බදු වගු අංක 03 හි 2 වගන්තිය සහ 2011 මාර්තු 07 දිනැති අංක අයිආර්ඩී/පීඒවයිර්/ආර්ජී/01 දරණ දේශීය ආදායම් පාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ලිපිය | රාජ්‍ය ආයතනවල සේවකයන්ට ගෙවන පාරිතෝෂික මුදල්වලින් උපයන විට ගෙවීම් බදු අඩු කල යුතු බව දක්වා තිබූ නමුත් අධිකාරිය විසින් පාරිතෝෂික ගෙවීමේදී අයකල යුතු සියයට 10 ක් වූ එම බදු රඳවාගැනීමකින් තොරව පාරිතෝෂික ගෙවීම්කර තිබුණි. |
| (ඌ) | 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනත සහ 2011 මාර්තු 07 වන දිනැති දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති 2015 ජූලි 06 දිනැති අංක එස්ඊසී/2015/05 දරණ චක්‍රලේඛය | රාජ්‍ය ආයතනවල සේවා නියුක්තිකයන් වෙත ප්‍රසාද මුදල් ගෙවීමේදී ඒ මත උපයන විට බදු අඩු කළ යුතු නමුත් එම බදු නිළධාරීන්ගෙන් අයකිරීමකින් තොරව අධිකාරියේ අරමුදලින් දරා තිබුණි. |
| (එ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/2 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය | අධිකාරිය සතු රු. මිලියන 369.15 ක් වූ පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර ලේඛණයක් පවත්වා නොතිබුණි.<br>එසේම ඉහත පරිගණක ලේඛණය නඩත්තු කිරීමේ කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අංශය අධීක්ෂණය කළ යුතු වුවද එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. |

## 3 මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමූහයේ ලාභය රු. මිලියන 13,384 ක් හා අධිකාරියේ ලාභය රු. මිලියන 13,324 ක් විය. ඉකුත් වර්ෂයේ සමූහයේ සහ අධිකාරියේ ලාභ පිළිවෙලින් රු. මිලියන 583 ක් සහ රු. මිලියන 1,036 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමූහයේ සහ අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙළින් රු. මිලියන 12,801 කින් සහ රු. මිලියන 12,288 කින් වර්ධනය වී තිබුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව හම්බන්තොට වරාය සඳහා ලබා ගන්නා ලද ණය මුදල් පොත්වලින් ඉවත් කිරීමත් සමග ඉවත් කරන ලද විදේශ විනිමය පරිවර්තන අලාභය රු. මිලියන 4,086 ක් ද ඇතුළුව අධිකාරියේ ශුද්ධ විදේශ විනිමය ගැලපුම් අලාභ රු. මිලියන 7,832 කින් අඩුවීම, ණය පොළී වියදම රු. මිලියන 2,219 කින් අඩුවීම, රාජ්‍ය භාග ආදායම රු. මිලියන 505 කින් ඉහළයාම, තැන්පතු මත පොළී ආදායම රු. මිලියන 575 කින් ඉහළ යාම ඉහත මූල්‍ය ප්‍රතිඵල වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2015 වර්ෂයේදී හැර අනෙකුත් වර්ෂවලදී ලාභ ලබා තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ක්ෂයවීම් නැවත ගැලපීමේදී අධිකාරියේ දායකත්වය අඛණ්ඩව ධන අගයක් ගෙන තිබූ අතර 2013 වර්ෂයේදී රු. මිලියන 24,052 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 37,839 ක් දක්වා වැඩිවී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ හතරක් සඳහා වූ ප්‍රමාණාත්මක ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| | | 2017 | 2016 | 2015 | 2014 | 2013 |
|---|---|---|---|---|---|---|
| (i) | දළ ලාභ අනුපාතය සියයට | 46 | 45 | 35 | 39 | 33.39 |
| (ii) | මුළු ආදායමට මෙහෙයුම් ලාභය/(අලාභය) සියයට | 36.19 | 33.34 | 22.86 | 27.93 | 13 |
| (iii) | ශුද්ධ ලාභ/(අලාභ) අනුපාතය සියයට | 29 | 2.35 | (35) | 23.73 | 4.52 |
| (iv) | ස්කන්ධ ප්‍රාග්ධන දීර්ඝ කාලීන ණය | 1:0.20 | 1:2.89 | 1:2.92 | 1:2.30 | 1:2.27 |
| (v) | ජංගම අනුපාතය | 1.22:1 | 1.27:1 | 1.52:1 | 2.16:1 | 2.51:1 |
| (vi) | ක්ෂණික අනුපාතය | 1.19:1 | 1.19:1 | 1.41:1 | 1.05:1 | 2.42:1 |
| (vii) | ඒක සේවක පිරිවැය රු. මිලියන | 1.78 | 1.66 | 1.73 | 1.42 | 1.38 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා ලබාගත් ණය පොත්වලින් ඉවත් කිරීම හේතුවෙන් 2013 වර්ෂයේ 1:2.27 ක්ව පැවති අධිකාරියේ ස්කන්ධ ප්‍රාග්ධනයට දීර්ඝ කාලීන ණය අනුපාතය 2017 වර්ෂය වන විට 1:0.20 අඩුවී තිබුණි.

(ආ) මුළු ආදායමට සාපේක්ෂව 2013 වර්ෂයේ සියයට 13 ක් වූ මෙහෙයුම් ලාභ අනුපාතය 2017 වර්ෂය වන විට සියයට 36.19 දක්වා වැඩි වී තිබූ අතර 2013 වසරේ දී සියයට 4.52 ක්ව පැවති බදු පසු ශුද්ධ ලාභ අනුපාතය 2017 වර්ෂයේ දී සියයට 29 ක් දක්වා වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ විදේශීය විනිමය පරිවර්තන අලාභය පසුගිය වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 7832 කින් අඩු වීම හා ණය පොලී වියදම රු. මිලියන 2219 කින් අඩු වීම මෙහෙයුම් ලාභ හා ශුද්ධ ලාභ අනුපාතය ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ඇ) 2013 වර්ෂයේ ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය පිළිවෙලින් 2.51:1 ක් හා 2.42:1 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට එය පිළිවෙලින් 1.22:1 ක් හා 1.19:1 ක් දක්වා ක්‍රමයෙන් පිරිහී තිබුණි. උපචිත වියදම් සඳහා වෙන්කිරීම් ඉහළ යාම මේ සඳහා හේතුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1979 අංක 51 දරණ ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනත අනුව, කාර්යක්ෂම හා අඛණ්ඩ වරාය මෙහෙයුම් සැපයීම හා ආරක්ෂක සේවා සැපයීම, ප්‍රවේශ මාර්ගවල යාත්‍රාකරණය විධිමත් කිරීම හා පාලනය කිරීම, වරායවල දියුණුව හා සංවර්ධනය, වරාය කටයුතු සම්බන්ධීකරණය කිරීම හා විධිමත් කිරීම අධිකාරියේ ප්‍රධාන අරමුණු විය. මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා සැලසුම් සකස් කිරීම හා කාර්යසාධනය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

#### 4.1.1 සැලසුම් කිරීම

##### 4.1.1.1 සංයුක්ත සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් 2013 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර තිබූ අතර එම සැලැස්ම අනුව, 2020 වර්ෂය වන විට විශිෂ්ඨ සමුද්‍රීය සේවා සැපයුම් මධ්‍යස්ථානය බවට පත්වීම, ටොන් මිලියන 200 ක නැව් භාණ්ඩ මෙහෙයවීම, ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් බිලියන එකක ආදායමක් ඉපයීම, ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් බිලියන 10 ක ආයෝජන අත්කර ගැනීම (වරායන් අතර), ජාතික ආර්ථිකයට දායකත්වය ලබා දෙන ප්‍රමුඛයා බවට පත්වීම සහ පරිසර හිතකාමී හරිත වරාය මෙහෙයුම්කරුවකු බවට පත්වීම යන ප්‍රධාන ඉලක්ක සපුරා ගැනීමට ඉලක්ක කර තිබුණි. කෙසේ වුවද, එම ඉලක්ක කොතෙක් දුරට ළඟා කරගෙන තිබුනේ ද යන්න වාර්ෂිකව සමාලෝචනයට භාජනය කර නොතිබූ අතර ප්‍රධාන ඉලක්ක ළඟා කර ගන්නා ආකාරය දැක්වෙන වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සංයුක්ත සැලැස්ම තුළ ඇතුළත් කර නොතිබුණි.

(ආ) සංයුක්ත සැලැස්ම සකස් කිරීමේදී ආයතනයේ ස්ථාපිත අරමුණු ඉටු කර ගැනීම සඳහා ව්‍යාපාරය තුළ ශක්තීන් (Strategies) මෙන්ම දුර්වලතා (Weakness) හා ව්‍යාපාර පරිසරයේ ඇති අවස්ථාවන් (Opportunities) හා බාධක (Threats) පිළිබඳ ඇගයීමකට ලක්කර නොතිබුණි.

(ඇ) අධිකාරියේ සංයුක්ත සැලැස්ම අනුව, දිග මීටර් 1200 ක් වූ නැගෙනහිර බහලුම් පර්යන්තයේ ඉදිකිරීම් නිම කර ඉන් වාර්ෂික බහළුම් මිලියන 2.4 ක් මෙහෙයවීමට ඉලක්ක කර තිබුණි. 2016 වර්ෂයේදී පර්යන්තයේ දිග මීටර් 600 ක ඉදිකිරීම් නිමකර තිබුණ ද එහි බහාළුම් මෙහෙයුම් කටයුතු ආරම්භ නොකිරීම හේතුවෙන් අපේක්ෂිත පරිදි ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වී තිබුණි.

### 4.1.2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

#### 4.1.2.1 ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කාර්යයන්හි ප්‍රගතිය

2017 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම හා කළ වැඩ වාර්තාව අනුව, ඇස්තමේන්තු වටිනාකම් රු. මිලියන 3079.1 ක් වූ ප්‍රධාන වැඩ සටහන් හා ව්‍යාපෘති 39 ක් (මුළු ක්‍රියාකාරකම් 131) ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනාගෙන තිබුණි. නමුත් කළ වැඩ වාර්තා අනුව, සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 1195 ක් වූ ව්‍යාපෘති 09 ක් පමණක් (ක්‍රියාකාරකම් 34 ක්) සම්පූර්ණයෙන් අවසන් කර තිබූ අතර, එය මුළු ව්‍යාපෘතිවලින් සියයට 23 ක් විය. 2017 වර්ෂයේදී ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 1884.1 ක් වූ ව්‍යාපෘති 30 ක් අවසන් කර නොතිබූ අතර ඒ පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඇස්තමේන්තු පිරිවැය රු. මිලියන 250 ක් වූ වරාය සහ නාවික ව්‍යාපාර මධ්‍යස්ථානයේ (Port and Shipping Business Center) ඉදිකිරීම්වලින් සියයට 40 ක් සමාලෝචිත වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂා කර තිබූ නමුත් සියයට 15 ක් පමණක් නිමකර තිබුණි.

(ආ) ත්‍රිකුණාමලය වරාය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ වරායෙහි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු. මිලියන 100 ක් වැයකර සැලැස්මක් සකස් කර එය 2017 මාර්තු මස අවසානයට නිම කිරීමට අපේක්ෂා කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද නිමකර තිබුණේ සියයට 40 ක් පමණක් විය.

(ඇ) 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත කර තිබූ 2015 හා 2016 වර්ෂවලදී අවසන් කළයුතු රු. මිලියන 795 ක වටිනාකමින් යුත් ව්‍යාපෘති 09 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ද නිම කර නොතිබුණ.

(ඇ) ඉඩම් භාවිතා කිරීමේ ප්‍රධාන සැලැස්මක් (Land use master plan) 2017 ජුනි මාසය වන විට සකස් කර අවසන් කිරීමට අපේක්ෂා කළ ද එම කාර්යය සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද නිම කර නොතිබුණි.

(ඉ) ජාතික වරාය ප්‍රධාන සැලැස්මක් (National Port master Plan) සකස් කිරීම සඳහා රු. මිලියන 15 ක් වෙන් කර තිබූ අතර එම සැලැස්මට අදාළ National Port Policy Direction, Hinterland Connectivity Project, Port Access Elevated Highway Phase යනාදී ක්‍රියාකාරකම් 2017 වර්ෂය නිම වීමට පෙර අවසන් කිරීම අපේක්ෂා කළ ද අපේක්ෂිත පරිදි අදාල කාර්යයන් නිමකර නොතිබුණි.

### 4.1.2.2 කොළඹ වරායේ හා අධිකාරියේ බහළුම් මෙහෙයුම් (Container Handling) කටයුතු

සමාලෝචිත වර්ෂය අවසන් වන විට කොළඹ වරාය තුළ බහලුම් හැසිරවීම ඇතුළු මෙහෙයුම් කටයුතු සිදු කරන පර්යන්ත 04 ක් පැවති අතර එයින් ජය බහළුම් පර්යන්තය හා සමගි බහළුම් පර්යන්තය පූර්ණ වශයෙන් වරාය අධිකාරිය සතුවිය. අනෙකුත් පර්යන්ත දෙක වන කොළඹ ජාත්‍යන්තර බහලුම් පර්යන්තය (CICT) හා දකුනු ආසියානු පිවිසුම් පර්යන්තය (SAGT)) පුද්ගලික ආයතන දෙකක් වෙත සියයට 85 ක අයිතිය මත අවුරුදු 35 කට ඉදිකිරීම, මෙහෙයවීම සහ පැවරීම (Built, Operation & Transfer) යන පදනම යටතේ බදු දී තිබුණි.

2016 හා 2017 වර්ෂවල අධිකාරියේ අනෙකුත් පර්යන්තවල බහලුම් මෙහෙයුම් (Container Handling) කටයුතු පහත පරිදි වේ.

| | ශ්‍රීල.ව.අ (SLPA). ඒකක | | දු.ආ.පි.ප. (SAGT) ඒකක | | කො.ජ.බ.ප. (CICT) ඒකක | | එකතුව ඒකක | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 |
| ප්‍රතිනැව්ගතකිරීම් (Transshipments) | 1,607,792 | 1,609,114 | 1,294,631 | 1,406,265 | 1,452,838 | 1,726,203 | 4,355,261 | 4,741,582 |
| දේශීය (Domestic) | 483,109 | 388,282 | 317,707 | 375,944 | 499,034 | 619,325 | 1,299,850 | 1,383,551 |
| නැවත පැටවීම (Re-Stowing) | 9,216 | 13,306 | 19,869 | 27,626 | 50,727 | 43,003 | 79,812 | 83,935 |
| | **2,100,117** | **2,010,702** | **1,632,207** | **1,809,835** | **2,002,599** | **2,388,531** | **5,734,923** | **6,209,068** |

මේ පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේග

(අ) සමස්තයක් වශයෙන් 2016 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී කොළඹ වරායේ බහාළුම් හැසිරවීම සියයට 8 කින් වර්ධනය වී තිබුණද, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ බහාළුම් මෙහෙයුම් කටයුතු සියයට 4 කින් අඩුවී තිබුණි. 2017 වර්ෂය තුළදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ නැව් නියෝජිත ආයතන සමග ඇති කර ගෙන තිබූ පර්යන්ත සේවා ගිවිසුම් (Terminal Service Agreements) අනුව අධිකාරියට අයත් පර්යන්ත වෙත පැමිණිය යුතු නැව් කිහිපයක් පුද්ගලික පර්යන්ත දෙක වෙත යොමු වීම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ආ) වර්තමානයේ භාණ්ඩ ප්‍රවාහනයේදී නැව් නියෝජිත ආයතන මහා පිරිමැසුම් ලබා ගැනීමේ අරමුණින් (Economic of Scale) ප්‍රමාණයෙන් විශාල නැව් භාවිතා කිරීමට වැඩි පෙළඹීමක් දක්වනු ලැබේ. එමෙන්ම බහාළුම් නැව් සමාගම් ඒකාබද්ධකරණය සහ සංකේන්ද්‍රණය වීම නිසා ආසියානු යුරෝපීය වෙළඳ මාර්ගය තුළ බහාළුම් ධාරිතා පරිමාවෙන් සියයට 95 ක් පමණ සන්ධාන ගත වූ නැව් සමාගම් කිහිපයක් විසින් පාලනය කෙරේ. මෙය වරාය සේවාවන් ලබා ගැනීමේදී විශාල තරඟයක් ඇති කිරීමට හේතු වී තිබුණි. මෙවැනි තත්ත්වයක් යටතේ අධිකාරිය තම වෙළඳපල කොටස රැක ගැනීම හා වැඩිකර ගැනීම සඳහා සුදුසු තරඟකාරී ක්‍රියාමාර්ග ඇතුළත් අලෙවිකරණ සැලැස්මක් සකස් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් එවැනි සැලැස්මක් හා අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) කොළඹ වරායේ දැනට බහාළුම් හැසිරවීම් සඳහා ක්‍රියාත්මක පර්යන්ත අතුරින් ගැඹුර (Draft) මීටර් 14.25 ට වඩා වැඩි නැව් පැමිණිය හැකි එකම පර්යන්තය වන්නේ කොළඹ ජාත්‍යන්තර

බහාළුම් පර්යන්තය (CICT) පමණක් වන අතර එහි ධාරිතාවය වසරකට විසිසම ඒකක මිලියන 2.4 ක් වේ. 2017 වර්ෂයේදී එම පර්යන්තය වෙත ගැඹුර මීටර් 14.25 ට වැඩි නැව් 294 ක් පැමිණ තිබූ අතර බහාළුම් ඒකක මිලියන 2 කට වැඩි සංඛ්‍යාවක් මෙහෙයවා තිබුණි. ඒ අනුව 2016 වර්ෂයට සාපේක්ෂව එම පර්යන්තයේ බහාළුම් හැසිරවීම සියයට 16 ක වර්ධනයක් වූ අතර එම වර්ධනය 2018 වර්ෂයේදී ද ඒ ආකාරයෙන් පැවතියහොත් එහි මෙහෙයුම් ධාරිතාවය උපරිමයට ළඟා වන බව නිරීක්ෂණය විය. එහෙත් ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු පර්යන්ත වල උපරිම ගැඹුර (Draft) සහ ගැන්ට්‍රි දොඹකරවල පළල හා උස (Air Draft) පිළිවෙලින් මීටර් 14.25 ක් හා මීටර් 18 ක් වූයෙන් ගැඹුර (Draft) මීටර් 14.25 ට වැඩි නැව් මෙහෙයවිය හැකි පර්යන්තයක් හා මෙහෙයුම් උපකරණවල අවශ්‍යතාවයක් පවත්නා බව නිරීක්ෂණය විය. කෙසේ වුවද වරායේ පර්යන්ත වෙත පැමිණිය හැකි Nemo, CLG, Fax සහ Wax යන සමාගම්වලට අයත් නැව් සමාලෝචිත වර්ෂයේදී දකුණු ආසියානු පිවිසුම් පර්යන්තය (SAGT) වෙත ගොස් තිබූ අතර, එය වලක්වා ගැනීම සඳහා තරඟකාරී අළෙවිකරණ උපක්‍රම අධිකාරිය විසින් සකස් කර නොතිබුණි.

(ඇ) කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියට අදාළව ශ්‍රී ලංකා රජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර එළැඹි ණය ගිවිසුමේ අවශ්‍යතාව හා 2011 අගෝස්තු මාසයේ සී/ස යූ.ආර්.එස්. ස්කොට් විල්සන් සමාගම විසින් සම්පාදනය කරනු ලැබූ සංවර්ධන විකල්ප ක්‍රමෝපාය සමාලෝචනය අනුව, 2015 වර්ෂයේදී නැගෙනහිර බහලුම් පර්යන්තයේ පළමු අදියරේ මෙහෙයුම් කටයුතු ඇරඹීමට නියමිතව තිබුණි. බහාළුම් ඒකක 1,200,000 ක වාර්ෂික ධාරිතාවයක් සහිත ඉදිකිරීම් පිරිවැය රු. මිලියන 11,168 ක් වූ මීටර් 18 ක ගැඹුරති හා මීටර් 600 ක් දිගැති නැගෙනහිර බහලුම් පර්යන්තයේ ඉදිකිරීම් කටයුතු 2016 අප්‍රේල් මාසයේ අවසන් බවට සහතිකය (Final Completion Certificate) නිකුත් කර තිබුණද නැව් බඩු මෙහෙයවීම සඳහා අවශ්‍ය ගැන්ට්‍රි දොඹකර ඇතුළු උපකරණ සපයා මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට 2018 සැප්තැම්බර් 31 දින දක්වාද කටයුතු කර නොතිබුණි.

(ඉ) අධිකාරියට අයත් ජය බහාළුම් පර්යන්තයේ සහ සමගි බහාළුම් පර්යන්තය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

- ඉහත පර්යන්තවල උපකරණ ප්‍රතිස්ථාපන සැලැස්මක් 2017 වර්ෂයේදී සකස් කර තිබූ අතර එම සැලැස්මට අනුව, පවතින උපකරණ වසර 19 සිට වසර 31 ක් දක්වා පැරණි වී තිබීම හේතුවෙන් ඒවායේ කාර්යක්ෂමතාව අඩු වී තිබුණි. ඒ අනුව, 2017 වර්ෂය තුළදී ගැන්ට්‍රි දොඹකර 8 ක් ඉවත් කිරීමට ද අංගන දොඹකර 6 ක් ඉවත් කිරීමට ද අලුතින් විශාල දොඹකර (Post Panama වර්ගයේ ) 3 ක් මිලදී ගැනීමට ද තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ ලබාදී තිබුණි. ඒ අනුව ජය බහළුම් පර්යන්තයේ ධාරිතාවය වැඩි දියුණු කිරීම සඳහා නැව් තොට සිවිල් කටයුතු වෙනුවෙන් ඇමරිකානු ඩොලර් මිලියන 25 ක් වන දොඹකර 3 ක් හා ඇ.ඩො. මිලියන 30 ක් වූ බහළුම් මෙහෙයුම් උපකරණ මිලදී ගෙන නවීකරණ කටයුතු ආරම්භ කිරීමට, ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2017 ජුලි 18 දින ලැබී තිබුණි. එම අනුමැතිය මගින් මෙම කාර්යයන් කඩිනම් අවශ්‍යතාවයක් ලෙස දක්වා තිබුණද 2018 මැයි මාසය අවසානය වන විට යෝජනා කැඳවීම පමණක් සිදු කර තිබුණි.

- ජය බහාළුම් පර්යන්තයේ ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා වර්ෂ 21 ට වඩා පැරණි ටර්මිනල් ට්‍රැක්ටර් 34 ක් වෙනුවට නව ටර්මිනල් ට්‍රැක්ටර් 14 ක් 2017 වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන මගින් මිලදී ගැනීම සඳහා 2017 ජුලි 13 දිනැති අංක පීඒඑම්/148/2017 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී තිබුණි. පවතින උපකරණවල පැරණි බව හේතුවෙන් නව උපකරණ මිලදී ගැනීම කඩිනමින් සිදුකල යුතු වුවත් 2018 මැයි මාසය දක්වා සුදුසු සැපයුම්කරුවෙකු තෝරා ගෙන මිලදී ගැනීම් සිදු කිරීමට අපොහොසත් වී නොතිබුණි. ඉහත පරිදි දීර්ඝ කාලයක් තිස්සේ මෙහෙයුම් සඳහා භාවිතා කරනු ලබන තාක්ෂණික වශයෙන් යල් පැනීමට ලක් වී ඇති උපකරණ වල කාර්යක්ෂමතාව හීනවීම, නිතර නිතර අලුත්වැඩියා හා වර්තමානයේ වරාය වෙත පැමිණෙන

නැව් වල ධාරිතාවයට ගැලපෙන ලෙස උපකරණ නොතිබීම වැනි හේතු මත බහාළුම් මෙහෙයවීමට බාධා මතු වී තිබුණි. ඒ අනුව මෙම පර්යන්තවල කාර්යක්ෂමතාව අඩු වීමේ අවධානම බැහැර කළ නොහැකි වූ අතර මෙහෙයුම් ඵලදායිතාවය අඩු වීම හා කීර්ති නාමයට හානි සිදු වීමට ඉඩ ඇති බව විගණනයේ දී නිරීක්ෂණය විය. තවද දිග මීටර් 600 ක් හා ගැඹුර මීටර් 14.25 ක් වන ජය බහාළුම් පර්යන්තයෙහි දීග මීටර් 330 ක් වූ නැව් දෙකක් එකවර මෙහෙයුම් කටයුතු සඳහා නවතා තැබීමට හැකියාවක් නොමැති වීම හේතුවෙන් අධිකාරියට ව්‍යාපාර අවස්ථා අහිමි වී තිබුණි.

**4.1.2.3නාවික යාත්‍රා විශ්ලේෂණය**

(අ) 2017 වර්ෂයේ සියළු වරායන් වෙත පැමිණ නාවික යාත්‍රා සංඛ්‍යාව පහත පරිදි වී තිබුණි.

| | 2017 | 2016 | 2015 | 2014 | 2013 |
|---|---|---|---|---|---|
| කොළඹ | 4,329 | 4,405 | 4,197 | 3,742 | 3,667 |
| ත්‍රිකුණාමලය | 233 | 216 | 164 | 127 | 134 |
| ගාල්ල | 87 | 96 | 72 | 60 | 36 |
| කන්කසන්තුරේ | 63 | 25 | 32 | 34 | 48 |
| හම්බන්තොට | 230 | 281 | 295 | 335 | 139 |
| | **4,942** | **5,023** | **4,760** | **4,298** | **4,024** |

ඉහත තොරතුරු අනුව, 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේදී කොළඹ, ගාල්ල, හා හම්බන්තොට වරායන් වෙත පැමිණි යාත්‍රාවල අඩු වීමක් දක්නට ලැබුණි.

ආ) බහාළුම්ගත නාවික යාත්‍රා පැමිණීම පිළිබඳ 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා තොරතුරු පහත පරිදි වේ.

| වර්ෂය | 2017 නැව් සංඛ්‍යාව | 2016 නැව් සංඛ්‍යාව | 2015 නැව් සංඛ්‍යාව | 2014 නැව් සංඛ්‍යාව | 2013 නැව් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| වරාය අධිකාරිය | 1,352 | 1,460 | 1,616 | 1,926 | 2,084 |
| එස්.ඒ.ජී.ටී. | 1,073 | 1,087 | 1,026 | 855 | 1,011 |
| සී.අයි.සී.ටී | 1,258 | 1,257 | 1,001 | 458 | 47 |
| | **3,683** | **3,804** | **3,643** | **3,239** | **3,142** |

ඉහත තොරතුරුවලට අනුව, 2015 වර්ෂය හා සැසඳීමේදී 2016 වර්ෂයේ කොළඹ වරාය වෙත බහාළුම්ගත නාවික යාත්‍රා පැමිණීම සියයට 4 කින් වර්ධනය වී තිබූ අතර, 2016 වර්ෂය හා සැසඳීමේදී 2017 වර්ෂයේදී එය සියයට 3 කින් අඩු වී තිබුණි. එමෙන්ම අධිකාරිය වෙත පැමිණි බහලුම් මෙහෙයුම් යාත්‍රා සංඛ්‍යාව සමාලෝචිත වර්ෂයේදී සියයට 7 කින් අඩු වී තිබුණි. එසේම CICT වෙත පැමිණි යාත්‍රා සංඛ්‍යාවේද සැලකිය යුතු වර්ධනයක් සිදු වී නොතිබුණු අතර, කොළඹ වරාය වෙත බහලුම් යාත්‍රා පැමිණීමේ අඩුවීමක් නිරීක්ෂණය විය. නැව් සමාගම් ඒකාබද්ධකරණය වීම නිසා ගැඹුරින් වැඩි විශාල නෞකා මගින් බහාළුම් ගෙන ඒම මේ සඳහා හේතු වී තිබුණි.

**4.1.2.4බහාළුම් මෙහෙයුම් විශ්ලේෂණය**

(අ) 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කොළඹ වරායේ සියලු පර්යන්තවල දේශීය හා ප්‍රති අපනයන වශයෙන් බහාළුම් මෙහෙයුම්වලට අදාල විස්තර පහත දැක්වේ.

| | 2016 ඒකක | % | 2016 ඒකක | % | 2015 ඒකක | % | 2014 ඒකක | % | 2013 ඒකක | % |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **SLPA** | | | | | | | | | | |
| දේශීය | 388,282 | | 483,109 | | 541,152 | | 643,317 | | 676,937 | |
| ප්‍රති අපනයන | 1,609,114 | | 1,607,792 | | 1,691,267 | | 1,882,057 | | 1,779,882 | |
| වෙනත් | 13,306 | | 9,216 | | 19,904 | | 33,965 | | 45,044 | |
| එකතුව | **2,010,702** | **32** | **2,100,117** | **37** | **2,252,323** | **43** | **2,559,339** | **52** | **2,501,863** | **58** |
| **S.A.G.T.** | | | | | | | | | | |
| දේශීය | 375,944 | | 317,707 | | 327,750 | | 337.354 | | 341,510 | |
| ප්‍රති අපනයන | 1,406,265 | | 1,294,631 | | 1,028,538 | | 1,298,434 | | 1,385,552 | |
| වෙනත් | 27,626 | | 19,869 | | 14,957 | | 26,152 | | 19,740 | |
| එකතුව | **1,809,835** | **29** | **1,632,207** | **28** | **1,371,245** | **27** | **1,661,940** | **34** | **1,746,802** | **41** |
| **C.I.C.T.** | | | | | | | | | | |
| දේශීය | 619,325 | | 499,034 | | 349,069 | | 146,314 | | 13,530 | |
| ප්‍රති අපනයන | 1,726,203 | | 1,452,838 | | 1,168,516 | | 519,219 | | 42,683 | |
| වෙනත් | 43,003 | 39 | 50,727 | | 44,314 | | 21,103 | | 1,328 | |
| එකතුව | **2,388,531** | | **2,2002,599** | **35** | **1,561,899** | **30** | **686,636** | **14** | **57,541** | **1** |
| මුළු එකතුව | **6,209,068** | **100** | **5,734,923** | **100** | **5,185,467** | **100** | **4,907,918** | **100** | **4,306,206** | **100** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂ හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළ කොළඹ වරායේ බහාළුම් මෙහෙයුම්වල වර්ධනයක් මෙන්ම ප්‍රතිනැව්ගත කිරීම හා යළි ඇසිරීම්වල වර්ධනයක් දක්නට ලැබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසානයට වරාය අධිකාරියේ බහාළුම් මෙහෙයුම් සංඛ්‍යාව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී 2,100,117 සිට 2,010,702 දක්වා එනම් සියයට 4 කින් පහත වැටී තිබුණි. එසේ වුවත්, කොළඹ ජාත්‍යන්තර බහාළුම් පර්යන්ත සමාගම (CICT) සීඝ්‍ර ලෙස බහාළුම් හැසිරවීම තුළින් සිය වෙළඳපල කොටස වර්ධනය කරගෙන තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී සමස්ත බහාළුම් හැසිරවීම තුළින් අධිකාරිය සියයට 32 ක්ද, දකුණු ආසියානු පිවිසුම් පර්යන්තය (SAGT) සියයට 29 ක්ද, කොළඹ ජාත්‍යන්තර බහාළුම් පර්යන්ත සමාගම (CICT) සියයට 39 ක්ද වශයෙන් වෙළඳපල දායකත්වයක් හිමිකරගෙන තිබුණි. කොළඹ ජාත්‍යන්තර බහාළුම් පර්යන්ත සමාගම (CICT) වර්ෂ 3 ක කාලයක සිට ඉහළම දායකත්වය හිමිකරගෙන තිබූ අතර දැනට වරාය තුළ පිහිටි මීටර් 14.25 ට වැඩි නැව් පැමිණිය හැකි එකම පර්යන්තය එම පර්යන්තය වීම ඒ සඳහා හේතු වී තිබුණි.

(iii) අධිකාරියේ බහාළුම් මෙහෙයුම් කටයුතු සම්බන්ධ පර්යන්ත උපයෝජන අනුපාතය (Terminal Occupancy Ratio) සලකා බැලීමේදී 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා එය පිළිවෙලින් සියයට 68, 63 හා 60 ක් විය. ඒ අනුව අධිකාරියේ පර්යන්ත උපයෝජන අනුපාතය 2015 වර්ෂයේ සිට ක්‍රමානුකූලව අඩු වෙමින් පවත්නා බව නිරීක්ෂණය විය.

(ආ) කොළඹ වරාය තුළ අධිකාරිය සතු පර්යන්ත මගින් මෙහෙයුම් කළ බහාළුම් විශ්ලේෂණය

| | 2017 ඒකක | 2016 ඒකක | 2015 ඒකක | 2014 ඒකක | 2013 ඒකක |
|---|---|---|---|---|---|
| **ජයබහළුම් පර්යන්තය** | | | | | |
| JCT - 1 | 338,434 | 364,749 | 405,555 | 469,831 | 414,596 |
| JCT – 2 | 361,561 | 383,759 | 369,317 | 415,781 | 417.388 |
| JCT – 3 | 537,963 | 617,553 | 568,259 | 585,145 | 607,669 |
| JCT - 4 | 613,447 | 579,645 | 580,956 | 616,228 | 623,030 |
| JCT - CBN | - | - | - | - | - |
| JCT - CBS | 97,332 | 22,112 | 185,204 | 246,363 | 237,662 |
| JCT – NFB | - | 33,994 | 28,716 | 60,251 | 45,218 |
| **Total** | **1,948,737** | **2,001,812** | **2,138,007** | **2,393,599** | **2,345,563** |
| **සමගි බහළුම්** | | | | | |
| UCT-1 | 2,986 | 5,449 | 12,817 | 27,617 | 64,687 |
| UCT-2 | 58,903 | 92,852 | 101,494 | 138,119 | 91,604 |
| | **61,889** | **98,301** | **114,311** | **165,736** | **156,291** |
| Conventional Quays | 76 | 04 | 05 | 04 | 09 |
| | **2,010,702** | **2,100,117** | **2,252,323** | **2,559,339** | **2,501,863** |

ඉහත තොරතුරු අනුව, ජය බහාළුම් පර්යන්තයේ සහ සමගි බහාළුම් පර්යන්තයේ බහාළුම් මෙහෙයුම් 2015 වර්ෂයේ සිට අඛණ්ඩව අඩු වෙමින් පවතින බව නිරීක්ෂණය විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයේදී හම්බන්තොට වරායේ පළමු අදියර ඉදිකිරීම් අවසන් කර තිබූ අතර, අදියර II ඉදිකරමින් පැවතිය දී වරායෙහි මෙහෙයුම් කටයුතු ආරම්භ කර තිබුණි. 2018 ජුලි 31 දින වන විට වරායේ I හා II අදියර ඉදිකිරීම සඳහා විදේශ ණය, දේශීය ණය, වරාය අධිකාරියේ ඍජු දායකත්වය හා වක්‍ර පිරිවැය ඇතුලු සමස්ත වියදම පහත සඳහන් පරිදි එක්සත් ජනපද ඩොලර් මිලියන 1,541 ක් වී තිබුණි.

| | **එ.ජ.ඩො. මිලියන** |
|---|---|
| විදේශීය ණය, දේශීය ණය හා වරාය අධිකාරියේ ඍජු දායකත්වය | 1,302 |
| උපකරණ සඳහා තවදුරටත් ගෙවීමට ඇති මුදල | 60 |
| ඉඩම් අත්පත්කර ගැනීම, දේශීය බදු ගෙවීම්, ව්‍යාපෘති කළමනාකරණ ඒකක වියදම් ආදී අනෙකුත් වියදම් | 179 |
| | **1,541** |

2009 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ හම්බන්තොට වරායේ මෙහෙයුම් කටයුතු මාගම්පුර වරාය කළමනාකරණ සමාගම විසින් සිදු කර තිබූ අතර අධිකාරියේ මූල්‍ය වර්තා වලට අනුව 2017 දෙසැම්බර් 31 දින දක්වා වරායේ මෙහෙයුම් පාඩුව රු. මිලියන 21,904 ක් විය. රජයේ ප්‍රතිපත්තිමය තීරණයකට අනුව, 2016 දෙසැම්බර් 16 දිනැති අංක අමප/16/2592/752/033 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මගින් වරායට අයත් වූ වත්කම් 2017 වර්ෂයේදී රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය සහිත පෞද්ගලික සමාගම් දෙකකට එ.ජ.ඩො. මිලියන 1,400 කට අවුරුදු 99 ක කාලයකට පවරා තිබූ අතර 2017 අගෝස්තු 04 දිනැති

අමප/17/1580/737/018 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි එම ආයෝජනය පහත පරිදි සමන්විත වී තිබුණි.




| සමාගම් දෙකෙහිම මුළු කොටස් අයිතිය | එ.ජ.ඩො. (මිලියන) | කොටස් අයිතිය |
|---|---|---|
| චයිනා මර්චන්ට් පෝට් සමාගම 674.9 +298.758 = | 973.658 | % 69.55 |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය 119.1+307.242 = | 426.342 | 30.45 |
| | 1400.000 | 100.00 |

ඉහත ගනුදෙනුව යටතේ සීමාසහිත චයිනා මර්චන්ට් පෝර්ට් හෝල්ඩින් සමාගම විසින් සිය කොටස් මිලදී ගැනීම වෙනුවෙන් එ.ජ.ඩො. මිලියන 973.658 ක් වරාය අධිකාරිය වෙත 2018 ජුනි 30 දිනට වාරික තුනකින් ගෙවා තිබූ අතර අධිකාරිය එම මුදල් මහා භාණ්ඩාගාරය වෙත ලබාදී තිබුණි.

මේ පිළිබඳව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) පිළිගත් තක්සේරුකරුවෙකු මගින් වරාය දේපළ තක්සේරු කර එහි වටිනාකම මත ආයෝජන අගය තීරණය කර නොතිබුණු අතර එ.ජ.ඩො. මිලියන 1400 ක් වූ ආයෝජන අගය ගණනය කිරීම පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවුණි. පවරන ලද ඉඩම් හෙක්ටයාර් 1103 ක් සඳහා අවුරුදු 99 ක කාලයට අය කර ගත යුතු බදු වටිනාකම ආයෝජන අගය තීරණය කිරීමේදී සැලකිල්ලට ගත් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

(ii) වරාය මෙහෙයුම් කටයුතු 2017 දෙසැම්බර් 09 දින සිට නව සමාගම් වෙත පවරා දී තිබුණි. එහෙත් මාගම්පුර වරාය කළමනාකරණ සමාගමේ සේවකයින් වැඩි දෙනෙකු වන්දි ගෙවා සේවයෙන් ඉවත් කර තිබූ නමුත් මෙම වාර්තාවේ දින වන විටත් සමාගමේ කටයුතු අවසන් කිරීමට සැලසුමක් සකස් කර නොතිබුණු අතර නිළධාරීන් හත් දෙනෙකු තවදුරටත් සේවයේ යොදවා තිබුණි.

(ආ) 2011 වර්ෂයේ දී ශ්‍රී ලංකා රේගුව දැනුවත් කිරීමකින් තොරව ආනයනය කරන ලද දොඹකර 27 ක් සම්බන්ධයෙන් රේගුව විසින් පනවා තිබූ රු. මිලියන 1,580.00 ක් වූ රේගු දණ්ඩනය ලිහිල් කර ගැනීම සඳහා රේගු ආඥා පනතේ 165 වගන්තිය ප්‍රකාරව රේගු විමර්ශනයක තීන්දුවක් ලැබී මාසයක් ඇතුළත මුදල් අමාත්‍යවරයා වෙත අභියාචනයක් සිදු කල හැකි වුවද, අධිකාරිය විසින් අමාත්‍යවරයා වෙත එවැනි අභියාචනයක් ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් ගිණුම්වල රු. මිලියන 1,577.70 ක අසම්භාව්‍ය බැරකම් වෙන්කර තිබූ අතර අභියාචනාධිකරණයේ නඩුවක් විභාග වෙමින් පැවතුණි.

(ඇ) අධිකාරිය සතු ඉඩම් කට්ටි 27 ක් සම්බන්ධයෙන් පෞද්ගලික පාර්ශවයන් සමග අත්සන් කරන ලද කල්බදු ගිවිසුම්වල (Leasing Agreement) කාලය 2017 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් වී තිබුණ ද එම ගිවිසුම් කාලය නැවත අලුත් කිරීමට (renew) අවශ්‍ය කටයුතු අධිකාරිය විසින් සිදු කර නොතිබුණි.මේ හේතුවෙන් යාවත්කාලීන තක්සේරු මත බදු කුලී ආදායම් අය නොවීම නිසා අධිකාරියට ලැබිය යුතු ආදායම් අඩුවෙන් ලැබීම හා වලංගු ගිවිසුමක් නොමැතිවීම හේතුවෙන් නීතිමය ගැටළු ඇති වීමේ අවදානම බැහැර කළ නොහැකි විය.

(ඈ) 2017 දෙසැම්බර් 31 දිනට අධිකාරිය විසින් නිළධාරීන්ට ලබා දී තිබූ නිල නිවාස සම්බන්ධයෙන් කළ නියැදි පරීක්ෂාවට අනුව, 2017 සැප්තැම්බර් 20 දින නිකුත් කර ඇති අභ්‍යන්තර චක්‍රලේඛ අංක 26/2017 ප්‍රකාරව වසර 5 කින් ඉවත් විය යුතු වේ. එහෙත් වර්ෂ 6 ක් ඉක්මවූ පසුවද නිල නිවාසවලින් ඉවත් නොවූ සහ නැවතඉල්ලුම්කර තෝරාගෙන නොතිබූ නිළධාරීන් නිල නිවාසවල පදිංචිව සිටින අවස්ථා 359 ක් පැවතුණි.

(ඉ) ඔලුවිල් වරාය ඉදිකිරීමේදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අත්පත් කරගත් ඉඩම්වලින් ප්‍රයෝජනයට නොගෙන ඉතිරි වූ ඉඩම් අක්කර 13 ක් පමණ ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවා විකිණීමට 2016 ජනවාරි 26 දිනැති අංක අමප/16/0087/737/007 යටතේ ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අනුමැතිය ලැබී තිබූ නමුත් 2017 වර්ෂය අවසාන වන විටත් අදාල විකිණීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. කෙසේ වුවද වන්දි මුදල් වෙනුවට ඉඩම් ලබා ගැනීමට වන්දිලාභීන් කැමැත්ත ප්‍රකාශ කල බව සභාපතිවරයා විගණනය වෙත දන්වන ලදී.

(ඊ) 2016 ජනවාරි 05 දිනැති අංක පීජ්/එච්ඩී/32 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව වරාය අධිකාරිය විසින් එළඹෙන ගිවිසුම්වල පවතින අඩුපාඩු හේතුවෙන් අනාගතයේ වරාය අධිකාරියට මුහුණදීමට සිදුවන අලාභ සහ දුෂ්කරතා මගහරවා ගැනීමේ අපේක්ෂාවෙන් නීති අංශයට ගිවිසුම් කළමනාකරණ ඒකකයක් (Contract management Unit) පිහිටුවීමට අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වුවද, 2018 මැයි මාසය දක්වාම අදාල ගිවිසුම් කළමනාකරණ ඒකකය පිහිටුවීමට අධිකාරිය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(උ) අධිකාරියේ මහපොළ සමුද්‍රීය විද්‍යායතනය යටතේ ආරක්ෂක පුහුණු ඒකකයක් පිහිටුවීමට 2017මැයි 17 දිනැති අංක පීජ්/එච්ඩී/26 අධ්‍යක්ෂ මණ්ඩල තීරණය යටතේ අනුමැතිය ලබා දී තිබුණ ද සමාලෝචිත වර්ෂය තුළ අදාළ තීරණය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) පිඹුරුපත් අංක සීඕ/සීඕඑල්/2012/1047 දරණ කොළඹ ඩී.ආර්. විජේවර්ධන මාවතේ පිහිටි වපසරිය හෙක්ටයාර් 1.1372 ක් වූ ඉඩම සහ පිඹුරුපත් අංක එස්/එම්අයිඑස්/344 දරණ කොළඹ 01 කෙලින් වීදියට හා ඕල්කට් මාවතට මායිම් වන අක්කර 02 ක ඉඩම පිළිවෙලින් නෙළුම් කුළුන ඉදිකිරීම සඳහා සහ රේගු දෙපාර්තමේන්තුවට ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ලබා දී තිබූ නමුත් එම වත්කම තවදුරටත් අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අතර පැවරීම පිළිබඳව දෙපාර්ශවය අතර අවසාන එකඟතාවයකට පැමිණ නොතිබුණි.

(එ) හම්බන්තොට වරායේ මෙහෙයුම්, සමාගම් දෙකක් විසින් අත්පත් කර ගැනීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දින වන විට පරිපාලිත සමාගමක් වූ මාගම්පුර වරාය කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගමේ මෙහෙයුම් කටයුතු ද නතරකර තිබුණි. එහෙත් නැව් තෙල් තොග (Bunkering Oil) මිළදී ගැනීම සඳහා ලබාගෙන තිබූ ඇ.ඩො. මිලියන 24 ක් වූ ණය මුදල එම සමාගම විසින් පියවා නොතිබූ අතර මෙම වාර්තාවේ දින වන විට ණය පියවීම සඳහා සමාගම

සතුව ප්‍රමාණවත් මුදල් නොපැවතුණි. කෙසේ වුවද 2017 දෙසැම්බර් 31 දින වනවිට ගෙවිය යුතු ණය ශේෂය රු. මිලියන 3,151 ක් වූ අතර මෙම ණය සඳහා අධිකාරිය ඇපකරුවෙකු වී තිබුණි.

(ඒ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙනුවෙන් සූරිය වැව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනයේ නිර්මාණ හා ඉදිකිරීමේ කටයුතු මෙහෙයවීම, අධිකාරිය විසින් සිදුකර තිබුණි. මෙම ඉදිකිරීමට අදාළව කොන්ත්‍රාත්කරු හා අධිකාරිය අතර ඇති කර ගන්නා ලද කොන්ත්‍රාත් ගිවිසුම අනුව, හම්බන්තොට වරාය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ විචලන නියෝග (Variation Order) යටතේ ඉදිකළ ඉහත ඉදිකිරීම් වෙනුවෙන් අධිකාරියේ පොත් අනුව වරාය අධිකාරිය විසින් කොන්ත්‍රාත්කරුට රු. මිලියන 2,881 ක් පොළිය සමග එකතුව රු. මිලියන 5,838 ක් 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු විය. ජාත්‍යන්තර සමථකරණ තීරණයක් මත කොන්ත්‍රාත්තුව වෙනුවෙන් ඉදිකිරීම වියදම් රු. මිලියන 2,957 ක් හා නියමිත දිනට කොන්ත්‍රාත්කරුට මුදල් නොගෙවීම නිසා පොළී වශයෙන් රු. මිලියන 993.8 ක් ලෙස එකතුව රු. මිලියන 3950.8 ක් ගෙවීමට 2017 දෙසැම්බර් 29 දින දෙපාර්ශවය අතර එකඟතාවයකට පැමිණ තිබුණි. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙනුවෙන් ක්‍රීඩාංගණය ඉදිකර තිබුණද එම ආයතනය සමග විධිමත් ගිවිසුමකට එළඹ නොතිබීම හේතුවෙන් ඉහත ඉදිකිරීම් පිරිවැය සහ පොළිය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් දැරීමට එකඟ නොවීම නිසා එම මුදල් මහා භාණ්ඩාගාරය විසින් ගෙවීමට එකඟවී තිබුණි.

(ඔ) 1979 අංක 51 දරණ වරාය අධිකාරිය පනතේ 37 (1) වගන්තිය යටතේ 2017 වර්ෂයට අදාළව සකස් කළ අයකුම ලේඛනයේ ප්‍රතිදාන වගන්තිය විධිමත්ව සංශෝධනය කිරීමකින් තොරව පවතින අයකුම ලේඛණයට පටහැනිව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ප්‍රතිඅපනයන හා අනිකුත් බහාළුම් හැසිරවීමේ කටයුතු වල නිරතවන නැව් නියෝජිත ආයතන සමග ඇති කර ගත් ගිවිසුම් ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු. මිලියන 196.266 ක ප්‍රතිදාන ගෙවා තිබුණි.

(ඕ) අධිකාරිය සතු කැබලි අංක 8, අංක 484 වත්ත සහ අංක 486 වත්තේ පිහිටි නිවාස සංකීර්ණ නාගරික සංවර්ධන අධිකාරිය කඩා ඉවත් කර එම ඉඩම් අත්පත් කරගෙන තිබූ අතර ඒ වෙනුවට එම අධිකාරිය විසින් නිවාස 117 කි සමන්විත මහල් නිවාසයක් අධිකාරිය වෙත ලබා දී තිබුණ ද අධිකාරිය සතු ඉඩම්, නාගරික සංවර්ධන අධිකාරිය වෙත භාරදීම හා ඉදිකරන ලද නිවාස වරාය අධිකාරිය වෙත පවරා දීම නීත්‍යානුකූලව සිදු වී නොතිබුණි.

(ක) එකතුව රු. මිලියන 667.31 ක්වූ ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ සඳහා ශේෂ සනාථන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

අධිකාරියට අයත් ආශ්‍රිත සමාගමක් විසින් පෞද්ගලික ආයතනයක් සමග ඇතිකරගෙන තිබූ ගිවිසුමක් පසුව අවසන් කිරීම හේතුවෙන් එම පුද්ගලික ආයතනය විසින් ආශ්‍රිත සමාගමට එරෙහිව පවරා තිබූ නඩුවකට අදාලව දැරීමට සිදුවිය හැකි වන්දි මුදල් වෙනුවෙන් වරාය අධිකාරිය විසින් මූල්‍ය ප්‍රකාශන තුළ රු. මිලියන 75.4 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණි.

### 4.4 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය සතු කොළඹ වරායේ පිහිටි මෙට්‍රික් ටොන් 6,400 ක ධාරිතාවයකින් යුත් පැරණි තෙල් ටැංකි 10 ක් පෞද්ගලික සමාගම් වෙත කල්බදු පදනම මත ලබා දී තිබූ අතර අදාළ කල්බදු කාලය 2012/2013 වර්ෂයේ දී අවසන් වී තිබුණි. එතැන් සිට වරින් වර දෛනික පදනම මත භාවිතයට ලබා දී තිබූ අතර මෙම තෙල් ටැංකි ඌන උපයෝජිත වත්කමක් ලෙස පැවතුණි.

(ආ) 2014 නොවැම්බර් මාසයේදී ආරම්භ කරන ලද කොළඹ වරායේ නව මුළුතැන් ගෙය සඳහා රු. මිලියන 6.98 ක් වටිනා නවීන උපකරණ මිලදී ගෙන තිබූ අතර මුළුතැන්ගෙයි කටයුතු ආරම්භකර වසර ගණනාවක් ගත වී තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම උපකරණ ආහාර පිසීමේ කටයුතු සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් කොළඹ වරායේ ස්ථාවර වත්කම් ලේඛණයේ පැවති ඉඩම් අතුරින් රු. මිලියන 3,399.11 ක වටිනාකමකින් යුතු ඉඩම් හෙක්ටයාර් 6.79 ක් 2017 දෙසැම්බර් 31 වන විටත් කිසිදු ප්‍රයෝජනයක් නොගෙන පැවතුණි.

### 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලයට අමතරව මිනිස් බල සැපයුම් සමාගමක් වූ සීමා සහිත වරාය කළමනාකරණ හා උපදේශන සමාගම හරහා කොන්ත්‍රාත් පදනම මත අනුයුක්ත කරන ලද සේවකයන් 121 දෙනෙකු සහ තනතුරු 27 ක් සඳහා අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සේවකයින් 426 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. තවද අධිකාරියේ මෙහෙයුම් කටයුතු (Operation) සඳහා ඍජුවම සම්බන්ධතාවයක් දක්වන අංශයන්හි සේවකයන් 308 දෙනෙකුගේ ඌණතාවයන් දක්නට තිබූ අතර එම ඌණතාවයන් සපුරාලීමකින් තොරව අධිකාරියේ මෙහෙයුම් කටයුතු වෙනුවෙන් ඍජුවම සම්බන්ධතාවයන් නොදක්වන අංශ 12 ක 398 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණු බව නිරීක්ෂණය විය. එසේම එම අතිරික්තය පැවති අංශ සඳහා 2017 වර්ෂය තුළදී රු. මිලියන 533 ක් අතිකාල දීමනා ලෙස ගෙවා තිබුණි.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි, 9.3.1 වගන්තිය ප්‍රකාරව, බඳවාගැනීමේ පරිපාටියක් සකස් කර 2011 ජුලි 19 දින අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබූ නමුත් 2018 අගෝස්තු 10 දක්වාම ඒ සඳහා අනුමැතිය ලැබී නොතිබුණි. එසේම, චක්‍රලේඛය ප්‍රකාරව බඳවා ගැනීමේ පටිපාටිය තුල තනතුරුවලට බඳවා ගන්නා ආකාරය දක්වා නොතිබුණි.

(ඇ) 2017 වර්ෂය තුළදී විධිමත් ක්‍රමවේදයකින් තොරව තනතුරු 9 ක් සඳහා නිළධාරීන් 110 දෙනෙකු බඳවාගෙන තිබූ අතර අමාත්‍යවරයා වෙත මහජන දිනයේදී ලැබෙන අයදුම්පත් පදනම් කරගෙන මෙම බඳවා ගැනීම් සිදුකල බව කළමනාකරණය විසින් විගණනය වෙත දන්වන ලදී. ඒ අනුව විධායක නොවන තනතුරු සඳහා නිළධාරීන් බඳවා ගැනීම විනිවිදභාවයකින් සිදු නොකරන බව නිරීක්ෂණය විය.

(ඈ) අධිකාරියේ දැනට භාවිතා කරන පරිපාලන කාර්ය සංවිධාන සංග්‍රහය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා 2014 දෙසැම්බර් 12 දින යොමු කර ඇතත් සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක් ඒ සඳහා අනුමැතිය ලැබී නොතිබූ අතර ඒ හේතුවෙන් එහි වලංගුභාවය පිළිබඳ ගැටළු සහගත තත්ත්වයක් පවතින බව නිරීක්ෂණය විය.

(ඉ) එක් සේවකයෙකුට සාමාන්‍ය මාසික වැටුප් හා අතිකාල

| | 2017 | 2016 | 2015 | 2014 | 2013 |
|---|---|---|---|---|---|
| | Rs. | Rs. | Rs. | Rs. | Rs. |
| වැටුප්, වේතන හා දීමනා රු. | 111,814 | 103,205 | 107,345 | 85,315 | 84,310 |
| අතිකාල රු. | 33,835 | 32,574 | 33,244 | 29,283 | 27,297 |
| එකතුව රු. | 145,649 | 135,779 | 140,589 | 114,598 | 111,607 |

2013 වර්ෂයට සාපේක්ෂව අධිකාරියේ අතිකාල දීමනා ක්‍රමයෙන් වැඩිවන බව නිරීක්ෂණය විය.

(ඊ) මුළු සේවක මණ්ඩල පිරිවැය

| | 2017 | 2016 | 2015 | 2014 | 2013 |
|---|---|---|---|---|---|
| සේවක මණ්ඩල පිරිවැය (රු. මිලියන) | 16,389 | 15,725 | 16,112 | 13,196 | 13,114 |
| මුළු වියදමට සේවක මණ්ඩල පිරිවැය* | 51% | 36% | 47% | 47% | 40% |

*මුළු වියදම ගණනයේදී විදේශ විනිමය ලාභ/අලාභ නොසලකා හැර ඇත.

2013 වර්ෂයට සාපේක්ෂව සේවක මණ්ඩල පිරිවැය මුළු වියදමේ ප්‍රතිශතයක් ලෙස ගත්කල ක්‍රමයෙන් වැඩිවන බව නිරීක්ෂණය විය.

**4.6 වෙළඳපල කොටස**

2017 වර්ෂය සඳහා ලෝක වරාය මෙහෙයුම් පිළිබඳව නිකුත් කරන ලද ඇල්ෆා ලයිනර් වාර්තාව (Alpha Liner Report) අනුව කොළඹ වරාය විසිසම ඒකක (Twenty Equivalent Unit) 6,209,068 ක මෙහෙයුම් සිදුකරමින් ලෝකයේ 23 වෙනි ස්ථානයේ රැඳී සිටි අතර 2016 වර්ෂයට සාපේක්ෂව සියයට 8.27 ක වර්ධනයක් ලඟාකරගෙන තිබුණි. කෙසේ වුවද ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ දී බහාළුම් හැසිරවීම සියයට 4 කින් අඩුවී තිබුණි.

කොළඹ වරාය තුළ වරාය අධිකාරියේ බහාළුම් මෙහෙයවීමේ ධාරිතාවය 2001 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ කාලය තුළ සියයට 81 සිට සියයට 32 දක්වා සීඝ්‍රලෙස පහත වැටී තිබුණි. කෙසේ නමුත්, කොළඹ වරාය තුළ තරඟකාරීව කටයුතු කරන පුද්ගලික සමාගම් වන SAGT

ආයතනය එම කාලය තුළ සියයට 19 සිට සියයට 29 දක්වා හා CICT ආයතනය සියයට 01 සිට සියයට 39 දක්වා සීඝ්‍ර වර්ධනයක් ළඟාකරගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | SLPA | % | SAGT | % | CICT | % | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | බහලුම් ඒකක | | බහලුම් ඒකක | | බහලුම් ඒකක | | |
| 2001 | 1,396,946 | 81 | 229,670 | 19 | | | 1,726,616 |
| 2002 | 1,206,694 | 68 | 558,025 | 32 | | | 1,764,717 |
| 2003 | 1,334,900 | 68 | 624,439 | 32 | | | 1,959,339 |
| 2004 | 1,320,845 | 59 | 899,720 | 41 | | | 2,220,565 |
| 2005 | 1,523,794 | 62 | 931,526 | 38 | | | 2,455,300 |
| 2006 | 1,743,669 | 57 | 1,335,411 | 43 | | | 3,079,078 |
| 2007 | 1,834,734 | 54 | 1,546,497 | 46 | | | 3,381,231 |
| 2008 | 1,747,670 | 53 | 1,739,668 | 47 | | | 3,687,338 |
| 2009 | 1,714,488 | 49 | 1,749,809 | 51 | | | 3,464,297 |
| 2010 | 2,167,173 | 52 | 1,970,268 | 48 | | | 4,137,441 |
| 2011 | 2,299,446 | 54 | 1,963,441 | 46 | | | 4,262,887 |
| 2012 | 2,316,849 | 55 | 1,870,271 | 45 | | | 4,187,120 |
| 2013 | 2,501,863 | 58 | 1,746,802 | 41 | 57,541 | 1 | 4,306,206 |
| 2014 | 2,559,339 | 52 | 1,661,940 | 34 | 686,636 | 14 | 4,907,915 |
| 2015 | 2,252,323 | 44 | 1,371,245 | 26 | 1,561,899 | 30 | 5,185,467 |
| 2016 | 2,100,117 | 37 | 1,632,207 | 28 | 2,002,599 | 35 | 5,734,923 |
| 2017 | 2,010,702 | 32 | 1,809,835 | 29 | 2,088,531 | 39 | 6,209,068 |

ඒ අනුව වරායේ ප්‍රධාන කාර්යය වන බහාළුම් මෙහෙයවීමේ කාර්යය වරාය අධිකාරියෙන් ක්‍රමානුකූලව ගිලිහී එය පුද්ගලික අංශය විසින් නතුකර ගනිමින් සිටින බව නිරීක්‍ෂණය විය.

### 4.7 ආර්ථික නොවූ ගනුදෙනු

වරාය අධිකාරියේ සනීපාරක්‍ෂක සේවා, අබලි ද්‍රව්‍ය විකිණීම යනාදී අමතර සේවාවන් ඍජුව ඉටුකර ගැනීම වෙනුවට ආශ්‍රිත සමාගම හරහා ඉටුකරවා ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී කොමිස් ලෙස රු. මිලියන 57.9 ක අමතර වියදමක් දරා තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධනය අරමුණු ළඟා කර ගැනීම

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරණ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර ''2030 න්‍යාය පත්‍රය'' අනුව සෑම රාජ්‍ය ආයතනයක් විසින් කටයුතු කළ යුතුව පවතින අතර, සමාලෝචිත වර්ෂයට අදාලව අධිකාරිය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් තිරසාර සංවර්ධන අරමුණු ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු ආකාරය, ඉලක්ක මැන බැලීම සඳහා වන දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

#### 6.1.1 ප්‍රසම්පාදනය

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ප්‍රසම්පාදන කාල රාමුවක් සහිත විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

#### 6.1.2 ප්‍රමාද වූ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්‍ෂණ කරනු ලැබේ.

(අ) දක්ෂිණ ප්‍රදේශ සංවර්ධනය කිරීමේ අරමුණින් ගාල්ල වරායේ බහුකාර්ය පර්යන්තයක් ඉදිකිරීම සඳහා 2006 මාර්තු 28 වන දින ශ්‍රී ලංකා රජය හා අන්තර්ජාතික සහයෝගීතාවය සඳහා වූ ජපාන බැංකුව (JBIC) අතර ඇති කර ගන්නා ලද SL-P 85 දරණ ණය ගිවිසුම යටතේ, මිලියන 14,495 ක් ශ්‍රී ලංකා රජය වෙත ලබාදීමට එකඟවී තිබුණි. ගිවිසුමට අනුව 2014 ජුනි මාසය වන විට මෙම ව්‍යාපෘතියේ වැඩ අවසන් කළ යුතුව තිබුණි. කෙසේ වෙතත්, විස්තරාත්මක සැලැස්ම නිර්මාණය කිරීම සහ ටෙන්ඩර් වල තාක්‍ෂණික හා මූල්‍ය ඇගයීම් ඇතුළත්ව ව්‍යාපෘතියට අදාළ පෙර ඉදිකිරීම් අදියර දක්වා සියලුම සේවාවන් නිමකිරීම වෙනුවෙන් පෞද්ගලික උපදේශන සමාගමකට යෙන් මිලියන 458.85 කට සමාන රු. මිලියන 549.03 ක් ගෙවා තිබූ අතර ණය පොළී ලෙස 2017 දෙසැම්බර් 31 දිනට යෙන් මිලියන 1.33 කට සමාන රු. මිලියන 1.81 ක් දරා තිබුණි. මෙම ව්‍යාපෘතිය රජයේ කඩිනම් ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන තිබුණද ලෝක උරුමයක් ලෙස නම් කර ඇති ගාලු කොටුවේ යුනෙස්කෝ UNESCO සංවිධානයේ අනුමැතිය ලබා ගත යුතු අතර ඒ සඳහා වසර 3 කට අධික කාලයක් ගතකර තිබුණි. එහෙත් ණය ප්‍රදානකරු විසින් ණය කාලසීමාව දීර්ඝ නොකිරීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය අත්හැර දැමීමට තීරණය කර තිබූ අතර ඉහත පරිදි දරණ ලද උපදේශන වියදම අනාර්ථික වියදමක් වී තිබුණි.

(ආ) 2017 සැප්තැම්බර් 26 දිනැති අංක එම්පීඇන්ඩීඑස්/2017/43 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව සංචිතයේ හවිතා වන ටග් යාත්‍රාවලට වඩා වැඩි ඇදීමේ හැකියාවක් ඇති ටග් යාත්‍රා අධිකාරිය විසින් යෙදිය යුතු වීම, අධිකාරිය දැනට භාවිතා කරන ටග් යාත්‍රා තුනක් හම්බන්තොට වරායේ මෙහෙයුම් සිදු කරන සමාගමට යළි භාර දිය යුතු වීම යනාදී හේතු පදනම් කරගෙන තෙවසරක කාල පරිච්ඡේදයක් සඳහා වරායේ යෙදවීම වෙනුවෙන් ටග් යාත්‍රා 3 ක් කුලියට ගැනීම සඳහා යෝජනා කර තිබුණි. ඒ අනුව, ඊට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාදාමය ඉටු කිරීමට හා ඒ සඳහා වන නිර්දේශයන් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමටත් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුවක් හා ව්‍යාපෘති කමිටුවක් පත් කිරීමටත් 2017 ඔක්තෝම්බර් 17 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය තර තිබුණි. මුදල් අමාත්‍යාංශයේ නිරීක්ෂණ අනුව, කඩිනම් ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ මෙම යාත්‍රා කුළී පදනම මත ලබාගැනීම සඳහා යෝජනා කර තිබූ නමුත් 2018 මැයි 11 වන විටත් ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පැවති අතර ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂිතව පැවතුණි.

## 6.2 විගණන කමිටු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය ප්‍රකාරව විගණන කමිටුව අවම වශයෙන් මාස 03 කට වරක් රැස්වී වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම, ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය සහ අභ්‍යන්තර විගණන වාර්තාව හා බාහිර විගණන වාර්තා යනාදිය සමාලෝචනය කළ යුතුය. එහෙත් 2017 වර්ෂයේදී බාහිර විගණන වාර්තා සාමාලෝචනය කර තිබූ නමුත් එම වර්ෂයේදී අධිකාරියේ අභ්‍යන්තර විගණන වාර්තා 42 න් 40 ක් සමාලෝචනය කර නොතිබුණි.

(ආ) 2010 ජුලි 26 දිනැති අංක ඩීඑම්ජ්/2010-(5) දරණ කළමනාකරණ විගණන චක්‍රලේඛය අනුව විදේශාධාර හෝ දේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතු වුවත් වරාය අධිකාරිය යටතේ ක්‍රියාත්මක කරන ලද විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. රාජ්‍ය සම්පත් කාර්යක්ෂමව, ඵලදායීව හා අරපිරිමැස්මෙන් භාවිතා කර ඇති බව තහවුරු කර ගැනීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කර තිබූ නමුත් අභ්‍යන්තර විගණනයක් සිදු නොකිරීම හේතුවෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

## 6.3 පාරිසරික හා සමාජ වගකීම ඉටුකිරීම

අධිකාරිය විසින් භාවිතයෙන් ඉවත් කරනු ලබන ටයර් වර්ෂාවට නිරාවරණය වී දීර්ඝ කාලයක් තිස්සේ ඉවත් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් වර්ෂාව අධික කාලවලදී ටයර් තුළ ජලය එක්රැස් වීමෙන් මදුරුවන් බෝවී ඩෙංගු රෝගය පැතිරයාමේ අවදානමක් පවතින බවට නිරීක්ෂණය විය. එලෙස 2017 වර්ෂයේ භාවිතයෙන් ඉවත් කරන ලද ටයර් 153 ක් විගණිත දිනය වන විටත් වරාය පරිශ්‍රයේ අවිධිමත් ලෙස ගොඩගසා ඇති බවට නිරීක්ෂණය විය.

## 6.4 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දේශීය මිලදී ගැනීම් සඳහා රු. මිලියන 533.43 ක් අයවැය මගින් වෙන්කර තිබූ නමුත් රු. මිලියන 48 ක් වටිනා මිලදී ගැනීම් පමණක් සම්පූර්ණයෙන් නිම කර තිබූ අතර අයිතම 28 ක විදේශීය මිලදී ගැනීම් සඳහා රු. මිලියන 1,150.70 ක් වෙන්කිරීම සිදුකර තිබුණද රු. මිලියන 88.31 ක්වූ අයිතම 05 ක් පමණක් මිලදී ගෙන තිබුණි. එසේම අයවැය වටිනාකම රු. මිලියන 231.70 ක් වටිනා අයිතම 11 ක් මිලදී ගැනීම අවලංගු කර තිබූ අතර රු. මිලියන 571 ක් වටිනා

අයිතම 8 කට අදාලව මිලදී ගැනීම් කටයුතු මූලික අදියරේ පැවතුණි. තවද, අයවැය වටිනාකම රු. මිලියන 216 ක් වටිනා අයිතම 4 කට අදාලව මිලදී ගැනීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ආ) අධි ආරක්ෂිත කලාපයක් ලෙස නම් කර තිබෙන වරාය පරිශ්‍රයේ ආරක්ෂාව තහවුරු කර ගැනීම පිණිස 2017 වර්ෂයේ ප්‍රාග්ධන අයවැය තුලින් සියළු ගේට්ටු සහ බන්ධිත ගුදම් සඳහා රු. මිලියන 60 ක් වැය කර CCTV කැමරා පද්ධතියක් සවි කිරීම, තොරතුරු තාක්ෂණ අංශය සඳහා රු. මිලියන 400 ක් වැයකර බහාළුම් පර්යන්ත කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම, රු. මිලියන 50 ක් වැයකර පිවිසීමේ දොරටු ස්වයංකරණ පද්ධතිය (RFID) සකස් කිරීම හා විදුලි හා ඉංජිනේරු අංශය විසින් රු. මිලියන 20 ක් වැයකර සියලු අංශ සඳහා වූ ශබ්ද සංනිවේදන ක්‍රමය සකස් කිරීමට සමාලෝචිත වර්ෂයේ සැලසුම් කර තිබුණද අදාල කාර්යයන් කිසිවක් වර්ෂය තුලදී ආරම්භ කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) ඇතැම් ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම් පැවතීම. |
| | | (ii) සියලු බැරකම් හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම. |
| (ආ) | ණයගැති පාලනය | (i) දීර්ඝ කාලීනව අයකර නොගත් ණය ශේෂ පැවතීම. |
| | | (ii) ප්‍රතිදාන ලබා දීම සඳහා අනුමත විධිමත් වැඩ පිළිවෙලක් නොමැතිවීම. |
| | | (iii) ණය ශේෂ කපා හැරීම විධිමත් අනුමැතියක් යටතේ සිදු නොකිරීම. |
| (ඇ) | සේවක මණ්ඩල කළමනාකරණය | (i) බඳවාගැනීමේ පරිපාටිය අනුමත කර නොගැනීම |
| | | (ii) අතිරික්ත බඳවා ගැනීම් සිදු කිරීම. |
| | | (iii) අතිරික්ත සේවකයින් සිටින කොට්ඨාශවල සේවකයන්ට අතිකාල දීමනා ගෙවීම. |
| | | (iv) ඇතැම් චක්‍රලේඛවලට අනුකූල නොවීම් පැවතීම. |
| (ඈ) | ප්‍රසම්පාදන | විධිමත් කාලරාමු අනුව ප්‍රසම්පාදන කටයුතු ඉටු නොකිරීම. |

**එච්. එම්. ගාමිණී විජේසිංහ**

**විගණකාධිපති**

**නම**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය

**ව්‍යවස්ථාපිත තත්ත්වය**

1979 අංක 51 දරණ පාර්ලිමේන්තු පනතේ විධි විධාන ප්‍රකාරව කොළඹ වරායේ කොමිෂන් සභාව, වරාය නැව්බඩු සංයුක්ත මණ්ඩලය හා වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාව ඒකාබද්ධ කර 1979 අගෝස්තු 01 දින ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිහිටුවනු ලැබීය.

**සංස්ථාපිත වටිනාකම**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය දේශීය ආර්ථිකයට පුළුල් දායකත්වයක් දක්වන ආයතනයකි. ආදයම් උපයන හා සේවා සපයන ප්‍රධාන පෙළේ ආයතනයක් වශයෙන් අධිකාරිය ඉටු කරනු ලබන කාර්යභාරය තුළින් එය විශිෂ්ට සේවාවක සෘජුවම නිරත වී ඇත. වරාය අධිකාරිය සමග විවිධ කාර්යයන්හි නිරත ආයතන හා සේවා දායකයන් සමග පවත්නා ක්‍රියාකාරී සම්බන්ධතාවය එහි දියුණුවට පදනම් වී ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු ගුණාංග පහත සඳහන් අයුරින් වර්ග කළ හැක.

- රඳා පැවැත්මේ හැකියාව
- කාලීනත්වය හා නිරවද්‍යතාවය
- කාර්ය සාර්ථකත්වය සඳහා වගකීම
- කණ්ඩායම් හැඟීම
- කැපවීම
- ඵලදායිතාවය හා ප්‍රත්‍යාභිඥාණය
- අවංක කාර්යසාධනය

ඉහත සඳහන් සාරධර්ම වරාය අධිකාරියේ සියළුම සේවක කොටස් කෙරෙහි පවත්වාගෙන යාම සභාපතිතුමාගේ, ප්‍රධාන විධායක නිලධාරී, කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ සහ අනෙකුත් ජ්‍යෙෂ්ඨ කළමනාකාර කාර්ය මණ්ඩලයේ වගකීම වේ.

**ප්‍රධාන කාර්යාලය**

**කොළඹ වරාය**

අංක. 19, චෛත්‍ය පාර
කොළඹ 01
දුරකථන: (+94 11) 2421201, 2421231
ෆැක්ස්: (94 11) 2440651

**ගාල්ල වරාය**

ක්ලොසන්බර්ග් ජැටිය
මාගල්ල
ගාල්ල
දුරකථන: (+94 91) 2232213, 2234936

**ත්‍රිකුණාමලය වරාය**

ඇතුල් වරාය පාර
නව පරිපාලන ගොඩනැගිල්ල
චීන වරාය
ත්‍රිකුණාමලය
දුරකථන: (+94 26) 2222460

**බැංකුකරුවෝ**

ලංකා බැංකු (ප්‍රධාන බැංකුකරු)
මහජන බැංකුව
හැටන් නැෂනල් බැංකුව

**විගණකයින්**

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
නො.306/72,පොල්දූව පාර
බත්තරමුල්ල

**වෙබ් අඩවිය: www.slpa.lk**